# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

Annual Report 2011

# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

වාර්ෂික වාර්තාව 2011



# අතිගරු ජනාධිපතිතුමා ගේ පණිවුඩය

මෑත කාලීනව විදුලි සංදේශ ක්ෂේත්‍රය තුළ සිදු වූ ශීඝ්‍ර ව්‍යාප්තිය ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපයේ විශාල සම්බන්ධීකරණයන් ඇති සමාජයන් අතරට එක්කර ඇත.

පසුගිය දශකය තුළ ආර්ථික ප්‍රගතියට බොහෝ සෙයින් දායක වූ මෙම ක්ෂේත්‍රයේ සුවිශේෂී වර්ධනයට 2011 වසරේදී ග්‍රාහකයින් මිලියන 18ක් ඉක්මවූ ජංගම දුරකථන අංශය ප්‍රධාන වශයෙන් හේතු විය. එම කාලය තුළ ස්ථාවර දුරකථන සබඳතා සැලකිය යුතු වර්ධනයක් පෙන්වීම නිසා ද වර්තමානයේ රටේ දුරකථන සබඳතා ප්‍රමාණය රටේ ජනගහනය වන මිලියන විස්ස ද ඉක්මවා ඇත. මෙම දශකය තුළ ස්ථාවර සේවා අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් ග්‍රාහකයින් ද සුවිශේෂී වර්ධනයක් පෙන්නුම් කර තිබේ.

මෙම සංඛ්‍යා ප්‍රශංසනීය වූවද අප රටේ ජනගහනයෙන් සැලකිය යුතු කොටසකට

තවමත් දැනුම පදනම් වූ ක්‍රියාකාරකම් සඳහා නවීන ඩිජිටල් තාක්ෂණය ඔස්සේ තොරතුරු ලබා ගැනීමේ අවස්ථාවන් හිඟව සිටියි. ඩිජිටල් තාක්ෂණික සබඳතාව පුළුල් කරමින් නවීන තාක්ෂණයෙන් මෙම අත්‍යවශ්‍ය සේවාවන් රටේ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ පුළුල්ම කොටසට සහ ශ්‍රම බලකාය වෙත ලබාදීමේ සතුටුදායක අභියෝගයට විදුලි සංදේශ ක්ෂේත්‍රය අද වන විට මුහුන පා සිටී. රජයේ වැදගත් අභිමතාර්ථයක් වන ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ දැනුමේ කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීමට අවශ්‍ය මග මෙම ක්ෂේත්‍රයේ සාර්ථකත්වය හඹායාම තුළින් ඉටුකර ගත හැකිය.

මෑත කාලීනව ශ්‍රී ලංකාව විදුලි සංදේශ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සැලකිය යුතු මට්ටමකින් විදේශ ආයෝජනයන් ලබා ගැනීම ප්‍රශංසනීයයි. දුරකථන මෙහෙයුම් ආයතනයන්ද විදුලි සංදේශන සේවාවන් පුළුල් කිරීමට සහ සංවර්ධනයට සැලකිය යුතු මට්ටමේ ආයෝජනයන් සිදු කර ඇත. මෙම දායකත්වයන් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පුළුල් කිරීම තුළින් විශේෂයෙන් ජනගහනයෙන් වැඩි කොටසක් වෙසෙන ග්‍රාමීය අංශය වෙත එය රැගෙන යාම පහසු කර ඇත.

විදුලි සංදේශන ක්ෂේත්‍රය තුළ නොකඩවා සිදුවන වර්ධනයත් අන්තර්ජාල පහසුකම් පුළුල් වීම සහ තොරතුරු තාක්ෂණයේ ව්‍යාප්තිය සමගින් පුරවැසියන්ගේ දැනුම් මට්ටම ඉහළ දැමීමෙන් සමාජය තුළ තාක්ෂණික පරතරය ඇහිරීමට දායකත්වය සපයයි. ආර්ථික තරඟකාරිත්වය සහ ඵලදායී මට්ටම් නැංවීමට ද මෙය ප්‍රධාන වශයෙන් දායකත්වය සපයයි. විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා මඟ පෙන්වීම ලබා දෙන්නන් දැන සිටිය යුතු අත්‍යවශ්‍ය කරුණක් වන්නේ තාක්ෂණික පරතරය තුළින් සමාජයේ නව බෙදීම් ඇති කිරීමට තිබෙන හැකියාව පිළිබඳවයි.

රටේ සංවර්ධනයට බරපතල ලෙස බලපෑ දශක තුනක් දිගු අර්බුදය අවසන්ව වසර දෙකක් ඇතුළත මෙම ක්ෂේත්‍රයේ සාර්ථකත්වයන් අත්කර ගැනීම ප්‍රශංසනීයයි. අර්බුද කාලය තුළ මෙන්ම ඉන් පසුව ද නොකඩවා සංවර්ධනය සඳහා ජනතාව අතර සබඳතාවන්ට ඉතා වැදගත් බවක් ලබාදෙන සංවර්ධන ප්‍රතිපත්තීන් අනුගමනය කිරීම අපට ජාතියක් වශයෙන් ආඩම්බර විය හැකි කරුණකි.

විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණය වඩාත් ජනතාව අතරට යාමේදී එය සමාජයේ වර්ධනයට සහ පුද්ගල ප්‍රගතියට යොදා ගැනීමට අවශ්‍ය ආරක්ෂාවන් තිබිය යුතුය. දැනුම සහ තාක්ෂණයේ මෙම අගනා වස්තූන් විශේෂයෙන් ළමයින් හා තරුණයින් තර්ජනයට ලක්වෙන දරුණු සමාජ විෂමාචාරයන් සඳහා ද යොදාගත හැකි බව දැනගත යුතුයි. මෙවැනි වැදගත් අංශයන්හි නිසි සංවර්ධනය සුරක්ෂිත කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදයේ සම්මතයන් තුළ නිරන්තර පරීක්ෂාකාරී වීම තිබිය යුතුය.

ප්‍රතිසංස්කරණය හා සංහිඳියාවට විශේෂ අවධානයක් දෙමින් රට පුරා සාමය ස්ථාපිත කර ඇති කාලයක විදුලි සංදේශ ක්ෂේත්‍රය සහ තොරතුරු තාක්ෂණය, සාමය තවදුරටත් ස්ථාපිත කිරීමටත්, එක්සත් හා තිරසර සංවර්ධනය ඇතිකිරීමටත් ප්‍රධාන කාර්යභාරයක් ඉටුකළ හැකියි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම අප රටේ මෙම වැදගත් ක්ෂේත්‍රයන්හි වර්ධනය සඳහා අවශ්‍ය මග පෙන්වීමත් යහපත් වෘත්තීය නායකත්වයත් නොකඩවා ලබාදෙනු ඇතැයි මම විශ්වාස කරමි.





## සභාපති ගේ පණිවුඩය

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය විදහා දක්වමින්, එම ක්ෂේත්‍රයේ නව විශ්වීය ප්‍රවණතාවක් සහිත ව, සෙසු රටවල් සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගනු ලබන, දකුණු ආසියානු කලාපයේ අති නවීන විදුලි සංදේශ තාක්ෂණයෙන් හෙබි රටක් බවට ශ්‍රී ලංකාව වර්තමානයේ දී පත් වී ඇත.

ස්ථාවර සහ ජංගම දූරකථන භාවිතා කරන සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වර්ධනය වීම මඟින් දූරකථන සම්බන්ධතාවල පුළුල් ව්‍යාප්ති ප්‍රත්‍යක්ෂ වන අතර මෙම තත්ත්වය ව්‍යාපාරික ගනුදෙනු වර්ධනය වීමට, නව රැකියා අවස්ථා උත්පාදනය කිරීමට මෙන් ම ජීවන තත්ත්වය වැඩි දියුණු වීමට ද හේතු වී ඇත. දශක කිහිපයකට පෙර දූරකථනය සුඛෝපභෝගී මෙවලමක් වුවද වර්තමානයේ දී එය මහජනතාව අතර භාවිතයට ගැනෙන සුලභ උපකරණයක් වී ඇත. ප්‍රකාශිත සංඛ්‍යාලේඛනවලට අනුව 2011 වර්ෂයේ දී ජංගම සහ ස්ථාවර දූරකථන ව්‍යාප්ති අනුපාතය පිළිවෙලින් 87.8% සහ 17.3%වූ අතර මිලියන 20කට අධික ජනගහනයේ ව්‍යාප්ති වීම කෙරෙහි රජය සහ පෞද්ගලික අංශය අනුගමනය කරන සහයෝගී ප්‍රයත්නයන් හේතු වී ඇත. එහි දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට (TRCSL) මෙම සංවර්ධනයේ පාර්ශ්වකරුවෙකු වෙමින්, මෙම ක්ෂේත්‍රයෙහි ප්‍රවර්ධනයෙහිලා පූර්ණ වශයෙන් දායකවීමට හැකිවීම සතුටට කරුණකි.

විදුලි සංදේශ ජාල සහ ජංගම දුරකථන ව්‍යාප්ති තුලින් පෙන්නුම් කරන විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ශීඝ්‍ර සංවර්ධනය, අන්තර්ජාල භාවිතය අඛණ්ඩව සහ පුළුල්ව සැපයීමට ද හේතු වී ඇත. 2000 වර්ෂයේ දී 0.2% ක් වූ අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් භාවිතය 2011 වර්ෂයේ දී 4% දක්වා වාර්තාගත ලෙස වැඩි වී ඇත. නව තාක්ෂණය එකතුවීම, ව්‍යාපාරික, අධ්‍යාපනික සහ වෙනත් අවශ්‍යතා සඳහා පවත්නා ඉල්ලුම වැඩිවීම මෙම අන්තර්ජාල සම්බන්ධතාවල පුළුල් ව්‍යාප්තියට හේතු වී තිබේ. අන්තර්ජාල භාවිත කිරීමේ පහසුකම් වර්ධනය කිරීම ආර්ථික වර්ධනයට මෙන් ම සංවර්ධන අභියෝග ජය ගැනීම සඳහා අවශ්‍යම කාරණයකි. එහි දී විශේෂයෙන් ම ජනගහනයෙන් බහුතරයක් ජීවත් වන ග්‍රාමීය ප්‍රදේශවල අන්තර්ජාල භාවිතය වැඩිදියුණු කිරීම පිළිබඳ අවශ්‍යතාව රජයේ සංවර්ධන ක්‍රමෝපායන් තුළින් අවධාරණය කර තිබේ. එසේ වුව ද ග්‍රාමීය ජනතාවගේ අධ්‍යාපනික සහ ආර්ථික වර්ධනය සඳහා ප්‍රමාණවත් යෙදවුම් සහිතව තොරතුරු තාක්ෂණය ලබාදීමට තවත් බොහෝ කාර්යයන් සිදු කළ යුතුව ඇත. මේ නිසා ශ්‍රී ලාංකේය ප්‍රජාවට වැඩි වශයෙන් ප්‍රවේශ විය හැකි සහ දරාගත හැකි පරිදි අන්තර්ජාල සේවා සැපයීමට සැපයුම්කරුවන්ට ආරාධනය කරන්නෙමු.

වර්තමානය වන විට අධිවේගී අන්තර්ජාල සේවා භාවිත කිරීමේ වැදගත්කම ද වර්ධනය වී ඇති අතර අධිවේගී අන්තර්ජාල සේවා අප සන්නිවේදනය කරගන්නා ආකාරය තොරතුරුවලට ප්‍රවේශ වීම අත්දැකීම් සහ දැනුම් හුවමාරු කරගැනීම, ව්‍යාපාර පවත්වා ගෙන යාම සහ අන්‍යෝන්‍ය අන්තර් ක්‍රියාකාරිත්වය සැලකිය යුතු ලෙස වෙනස් කිරීමට හේතු වී ඇත. මේ නිසා අධිවේගී අන්තර්ජාල සේවා පුළුල් ලෙස භාවිත කිරීමේ වැදගත්කම හඳුනාගනිමින්, සියලුම පුරවැසියන්ට එම සේවාවල ප්‍රතිලාභ ලබාදීම සහතික කිරීමෙහි ලා ඉවහල්වන නව ක්‍රමෝපායන් මත අප ක්‍රියා කර ඇති අතර එම සේවා ලබාදීමේ වේගය අප සමාජයේ අධිවේගී අන්තර්ජාල සේවාවල පූර්ණ ශක්‍යතාව අවබෝධ කරගැනීමෙහි ලා ඉවහල් වන ප්‍රධාන සාධකයක් ද වී ඇත. මෙම තත්ත්වය අවබෝධ කරගෙන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අධිවේගී අන්තර්ජාල සේවා ආශ්‍රිත සේවා තත්ත්වය අධීක්ෂණය කිරීම සඳහා ඒකකයක් පිහිටුවා තිබේ. මෙහි දී කොමිෂන් සභාව මහජනතාව සඳහා සපයන අන්තර්ජාල සේවාවල ප්‍රමිතිය ඇති කිරීම සඳහා ජාතික අධිවේගී අන්තර්ජාල සේවා ප්‍රතිපත්තියක් සකස් කිරීමට ක්‍රියා කර ඇත.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සහයෝගිත්වයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද "විශේෂ අවශ්‍යතාවන් සහිත පුද්ගලයන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය" සහ "පාසල සහ ප්‍රජාව සම්බන්ධීකරණය කිරීමේ ව්‍යාපෘතිය" තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ රටේ පාසල් සහ වරප්‍රසාද නොලත් කණ්ඩායම්වලට සැපයීමට ඉවහල්ව තිබේ. අපගේ ඉලක්කය වන්නේ රටේ සියලුම පාසල්වලට පරිගණක සහ අන්තර්ජාල සේවා සැපයීමයි. මෙමගින් සියලුම පාසල් සිසු දරුවන් සහ ගුරුවරුන් සමාජයේ ප්‍රයෝජනය සහ ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය විශ්විය දැනුම ලබා ගැනීම පිණිස, තොරතුරු තාක්ෂණය උපරිම වශයෙන් භාවිත කරනු දැක්ම මගේ අපේක්ෂාවයි.

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා රජය විසින් දක්වන සුවිශේෂී උනන්දුව සහ සහාය පිළිබඳව අපගේ ප්‍රශංසාව පළ කිරීම මෙහිලා මාගේ යුතුකම වන අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නව යුගයක් කරා රැගෙන යාමට කැපවීමෙන් ක්‍රියා කරන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයට ද මාගේ ස්තුතිය පළ කරමි.

**ලලිත් වීරතුංග**
සභාපති



# අධ්‍යක්ෂ ජනරාල් ගේ පණිවුඩය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට (TRCSL) විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ ජාතික නියාමන නියෝජිතායතනය වශයෙන් වඩා තරඟකාරී වෙළඳපලේ අභියෝගවලට ප්‍රතිචාරීව නියාමන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සහ මහජන යහපත ආරක්ෂා කිරීම තුලින් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ වගකීම පැවරී ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වැඩි දියුණු විදුලි සංදේශ පහසුකම් ප්‍රවර්ධනය කිරීම සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නවීන තාක්ෂණයන් වර්ධනය කිරීමට ප්‍රමුඛතාවය ලබා දෙන අතර එමගින් විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් දිරිගැන්වීමෙහිලා ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම පිණිස ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වලට සහාය වේ. මීට අමතරව 2011 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වැඩිදුර සංවර්ධනය සඳහා ව්‍යාපෘති සහ වැඩසටහන් රැසක් ආරම්භ කර ඇත.

සමාලෝචන වර්ෂයේදී විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සැලකිය යුතු ජයග්‍රහණ අත් කරගෙන ඇති අතර රටේ දුරකථන සම්බන්ධතා සැපයීමේ සුවිශාල වර්ධනයක් පෙන්නුම් කලේය. 2011 වසර අවසානය වන විට පවත්නා විදුලි සංදේශ කුලුනු සංඛ්‍යාව 5083 ක්වූ අතර එය පසුගිය වසරට වඩා සියයට 25 වැඩිවීමකි. අතිගරු ජනාධිපතිතුමා විසින් කොකාවිල් බහුකාර්ය විදුලි සංදේශ කුලුන විවෘත කිරීම සහ කොළඹ නගරයේ තවත් බහු කාර්යය විදුලි

සංදේශ කුලුනක් සහ විනෝදාස්වාදය සපයන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම මෙම සමාලෝචන වර්ෂයේදී කුලුනු ඉදිකිරීම සම්බන්ධයෙන් සිදු කළ සුවිශේෂ සිදුවීම් දෙකක් විය.

විශ්ව විද්‍යාල විසින් පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍රය ආශ්‍රිතව වැදගත් පර්යේෂණ තුනක් තෝරා ගන්නා ලදී. සමාජයේ වරප්‍රසාද නොලත් ජනතාවගේ සහ දුෂ්කර පාසල්වල ශිෂ්‍යයන් සහ ගුරුවරුන් සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පහසුකම් සැපයීම පිණිස විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නිපුණතා සංවර්ධන වැඩසටහන සහ රාජ්‍ය - පෞද්ගලික මහජන සහභාගීත්ව රාමුව තුළ පාසල් සම්බන්ධීකරණය මගින් තොරතුරු තාක්ෂණය ලබා දීමේ ව්‍යාපෘතිය (4P model) සිදු කරන ලදී. ශ්‍රී ලංකාව පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ (CTO) සභාපතීත්වයට නැවත වරක් තේරී පත්වීමත් 2012 පවත්වන විදුලි සංදේශ නියාමකයන් පිළිබඳ ගෝලීය සමුළුවේ සත්කාරක රට වශයෙන් තෝරා ගැනීමත් ඉමහත් සතුටට කරුණකි. එය විදුලි සංදේශ ක්ෂේත්‍රයෙහි ශ්‍රී ලාංකීය ප්‍රතිරූපය වර්ධනය කිරීමටත් රටේ විදේශීය සෘජු ආයෝජන දිරි ගැන්වීමටත් ඉවහල් වේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සිය කාර්ය මණ්ඩලය සඳහා දැනුම වැඩි දියුණු කිරීම, නිපුණතා ප්‍රවර්ධනය කිරීම, ශීඝ්‍රයෙන් වෙනස්වන තාක්ෂණික පරිසරය තුළ ආකල්ප වෙනස් කිරීම පිණිස ශ්‍රී ලාංකීය සහ විදේශීය පුහුණු අවස්ථා රැසක් සපයා ඇත. අපගේ පුස්තකාල සේවාව විදුලි සංදේශ ක්ෂේත්‍රය ව්‍යාප්ත වීමේ තොරතුරු ලබාදීමෙහිලා පර්යේෂකයන්, ශිෂ්‍යයන් සහ මහජනතාව සඳහා ප්‍රයෝජනවත් වී ඇත.

නව තාක්ෂණ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රවීනයන්ගේ සහයෝගය ඇතිව ඇනලොග් සේවාව ඩිජිටල් තාක්ෂණයට මාරුකිරීම සඳහා සැලැස්මක් සකස් කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිත්වය යටතේ මෙම කාර්යය සඳහා අදාල සංවිධානවල නියෝජිතයන්ගෙන් සමන්විත ජාතික සැලසුම් කමිටුවක් ස්ථාපනය කර ඇත. ඇනලොග් සිට ඩිජිටල් තාක්ෂණය දක්වා සංක්‍රමණය වීම වර්ණාවලි කාර්‍යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, ශ්‍රව්‍ය සහ දෘශ්‍ය මාධ්‍යයන් ගුණාත්මකව සැපයීම, ව්‍යාපාරික අංශය සඳහා වන අවස්ථා ඉහල නැංවීම සඳහා ඉවහල් වේ එමෙන්ම මෙම සංක්‍රමණය ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා සහ වෙනත් සේවාවන් සඳහා විකාශන සංඛ්‍යාත පරාස වෙන් කිරීමටද හේතුවේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මෙම වගකීම් ඉටුකිරීමේදී සේවාවේ ඉහළ කාර්යක්ෂමතාවය සහ වැඩකිරීමේ තෘප්තිමත්භාවය ඇති කිරීම සඳහා කාර්ය මණ්ඩල සුභසාධනය සහ විනෝදාස්වාදය සපයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කරන ලදී.

මෙය සමාලෝචන වර්ෂය වන 2011 දී සිදු කරන ලද ක්‍රියාකාරකම් ඇතුලත් වන පරිදි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විවිධ අංශ සහ ඒකක විසින් සිදු කරන ලද කාර්යයන් සහ කාර්යසාධනය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවකි. එක් එක් අංශය\ඒකකයේ කාර්යසාධනය අදාල අංශ යටතේ සාකච්ඡා කර ඇත.

2011 වර්ෂයේදී ආයතනයේ සාර්ථකභාවය සාක්ෂාත් කිරීමෙහිලා දායක වූ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සමස්ථ කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පළ කිරීමට මෙය අවස්ථාව කර ගනිමි.

**අනූෂ පැල්පිට**
අධ්‍යක්ෂ ජනරාල්

## 2011 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සංයුතිය සහ කාර්ය මණ්ඩලය

### කොමිෂන් සභාව

**ලලිත් වීරතුංග මහතා**
*- සභාපති*

**අනූෂ පැල්පිට මහතා**
*- සාමාජික*

**එස්.එන්. සහබන්දු මහතා**
*- සාමාජික*

**ප්‍රසන්න ද සිල්වා මහතා**
*- සාමාජික*

### ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්ය මණ්ඩලය

**අනූෂ පැල්පිට මහතා**
*- අධ්‍යක්ෂ ජනරාල්*

### කොමිෂන් සභා කාර්යාලය

**ආර්.එස්. ගුණරත්න මහත්මිය**
*- කොමිෂන් සභාවේ ලේකම් (වැඩබලන)*

### පාලන අංශය

**යූ.එන්. රුද්‍රිගු මහතා**
*- උපදේශක / අධ්‍යක්ෂ පරිපාලන (වැඩබලන)*

**එස්.එස්.පී.එස්. පෙරේරා මහතා**
*- නියෝජ්‍ය අධ්‍යක්ෂ / පාලන සහ මානව සම්පත්*

**ඩබ්.එල්.ඒ.කේ.ඒ. ගුණතිලක**
*- සහකාර අධ්‍යක්ෂ / පරිපාලන*

### ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා අංශය

**එම්.කේ. ජයසේකර මහතා**
*- නියෝජ්‍ය අධ්‍යක්ෂ / ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා*

**අයි.එම්. ජවුසි මහතා**
*- සහකාර අධ්‍යක්ෂ / ජාත්‍යන්තර සම්බන්ධතා*

**ආර්.එම්.ජේ.කේ.බී. රත්නායක මහතා**
*- සහකාර අධ්‍යක්ෂ / ප්‍රතිපත්ති*

### ආර්ථික කටයුතු අංශය

**චම්පා වරාගොඩ මහත්මිය**
*- නියෝජ්‍ය අධ්‍යක්ෂ / අනුකූලතා*

**එච්.ඩබ්.කේ. ඉන්ද්‍රජිත් මහතා**
*- නියෝජ්‍ය අධ්‍යක්ෂ / තරඟකාරීත්වය සහ සහකාර අධ්‍යක්ෂ / ආංශික විශ්ලේෂණ*

**එච්.පී.එච්.එම්. පතිරණ මහත්මිය**
*- සහකාර අධ්‍යක්ෂ / මෙහෙයුම් විශ්ලේෂණ*

**සී.එන්. පළිහවඩන මහතා**
*- සහකාර අධ්‍යක්ෂ / අයකුම*

**ශ්‍රීයානි මාවැල්ලගේ මහත්මිය**
*- සහකාර අධ්‍යක්ෂ / පාරිභෝගික සම්බන්ධතා*

### වර්ණාවලි කළමනාකරණ අංශය

**ආර්.පී.එච්.කේ රණතුංග මහතා**
*- නියෝජ්‍ය අධ්‍යක්ෂ / වර්ණාවලි කළමනාකරණ*

ඊ.එන්.පී.කේ. රත්නපාල මහතා
- *සහකාර අධ්‍යක්ෂ / වර්ණාවලි කළමනාකරණ / විකාශන සහ පිරික්සුම්*

කේ.එස්.එම්. විශාකා මෙනවිය
- *සහකාර අධ්‍යක්ෂ / වර්ණාවලි කළමනාකරණ / ස්ථාවර සේවා / චන්ද්‍රිකා සේවා*

කේ.ඒ.ඩී. ප්‍රනාන්දු මහතා
- *සහකාර අධ්‍යක්ෂ / වර්ණාවලි කළමනාකරණ / තොරතුරු තාක්ෂණ*

ආර්.එම්.ටී.කේ.පී. ලීවේරා මහත්මිය
- *සහකාර අධ්‍යක්ෂ / වර්ණාවලි කළමනාකරණ / ජංගම සේවා*

එස්.වී.ආර්. කමලනයනා මහත්මිය
- *සහකාර අධ්‍යක්ෂ / ගුවන් සහ සමුද්‍රීය සේවා*

එස්.ඊ. වාකිෂ්ඨ මහතා
- *සහකාර අධ්‍යක්ෂ / අන්තර් මෙහෙයුම්*

එම්.පී. ගුණසිංහ මහතා
- *සහකාර අධ්‍යක්ෂ / පෞද්ගලික ජංගම ගුවන් විදුලි*

## ජාල අංශය

ඩබ්.ඩී. ද අල්විස් මහතා
- *නියෝජ්‍ය අධ්‍යක්ෂ / ජාල*

එල්. ගනේෂමූර්ති මහතා
- *සහකාර අධ්‍යක්ෂ / තාක්ෂණික ප්‍රමිති*

එම්.සී.එම්. ෆාරුක් මහතා
- *සහකාර අධ්‍යක්ෂ / මාදිලි අනුමැති හා දත්ත ස්ච්චීකරණ*

ජේ.වී.එස්. ගුණානන්ද මහතා
- *සහකාර අධ්‍යක්ෂ / පිරික්සුම් / දත්ත / ආධුනික ගුවන් විදුලි සේවා*

## බලපත්‍ර පරිපාලන අංශය

එච්.ජී. කරුණාරත්න මහතා
- *නියෝජ්‍ය අධ්‍යක්ෂ / බලපත්‍ර පරිපාලන*

## නීති අංශය

ජී.සී.පී. මොරගොඩ මහත්මිය
- *සහකාර අධ්‍යක්ෂ / නීති*

ආර්.එස්. ගුණරත්න මහත්මිය
- *සහකාර අධ්‍යක්ෂ / නීති*

## තොරතුරු සහ ප්‍රලේඛන අංශය

කපිල ජයවර්ධන මහතා
- *පරිගණක වැඩසටහන් / සම්පාදක සහ සහකාර අධ්‍යක්ෂ / තොරතුරු සහ ප්‍රලේඛන (වැඩබලන)*

ප්‍රියානි හෙට්ටිආරච්චි මහත්මිය
- *පුස්තකාලයාධිපති*

දමයන්ති සමරකෝන් මහත්මිය
- *පුස්තකාලයාධිපති*

## මූල්‍යය අංශය

ආර්.පී. අබයදීර මහතා
- *සහකාර අධ්‍යක්ෂ / වියදම්*

ඒ.එස්. හපුආරච්චි මහතා
- *සහකාර අධ්‍යක්ෂ / ආදායම්*

## අභ්‍යන්තර විගණන අංශය

යූ.ඒ.සමරතුංග මහත්මිය
- *ප්‍රධාන අභ්‍යන්තර විගණක*



# කොමිෂන් සභාව

1. ලලිත් වීරතුංග මහතා - *සභාපති*
2. අනුෂ පැල්පිට මහතා - *සාමාජික*
3. එස්.එන්. සහබන්දු මහතා - *සාමාජික*
4. ප්‍රසන්න ද සිල්වා මහතා - *සාමාජික*

# පාලන අධිකාරිය





1. ලලිත් වීරතුංග මහතා - *සභාපති* 2. අනුෂ පැල්පිට මහතා - *අධ්‍යක්ෂ ජනරාල්* 3. යූ. එන්. රුද්‍රිගු මහතා - *උපදේශක/අධ්‍යක්ෂ පරිපාලන (වැඩබලන)* 4. එච්. එන්. ජයවීර - *අධ්‍යක්ෂ ආර්ථික කටයුතු* 5. ඒ. පී. ඒ. ගුණසේකර - *උපදේශක* 6. මනෝද ගමගේ - *උපදේශක* 7. සනත් සිරිවර්ධන - *උපදේශක* 8. සේනක කුමාර වීරරත්න - *උපදේශක* 9. යූ. ඒ. සමරතුංග - *ප්‍රධාන අභ්‍යන්තර විගණක* 10. එම්. කේ. ජයසේකර - *නියෝජ්‍ය අධ්‍යක්ෂ/ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්බන්ධතා* 11. ඩබ්. ඩී. ද අල්විස් - *නියෝජ්‍ය අධ්‍යක්ෂ/ජාල* 12. ආර්. පී. එච්. කේ. රණතුංග - *නියෝජ්‍ය අධ්‍යක්ෂ/වර්ණාවලි කළමනාකරණය* 13. එච්. ඩබ්. කේ. ඉන්ද්‍රජිත් - *නියෝජ්‍ය අධ්‍යක්ෂ/තරඟකාරිත්වය සහ සහකාර අධ්‍යක්ෂ/ ආංශික විශ්ලේෂණ* 14. ඒ. ඒස්. හපුආරච්චි - *සහකාර අධ්‍යක්ෂ/ආදායම්* 15. ආර්. එස්. ගුණරත්න - *සහකාර අධ්‍යක්ෂ/නීති* 16. ආර්. එම්. ටී. කේ. පී. ලිවේරා - *සහකාර අධ්‍යක්ෂ/වර්ණාවලි කළමනාකරණ/ජංගම සේවා* 17. ටී. එන්. පී. කේ. රත්නපාල - *සහකාර අධ්‍යක්ෂ/වර්ණාවලි කළමනාකරණ/විකාශන සහ පිරික්සුම්*

18. එම්. සී. එම්. ෆාරුක් - *සහකාර අධ්‍යක්ෂ/මාදිලි අනුමැති හා දත්ත ස්වීචිකරණ* 19. ආර්. එම්. ජේ. කේ. බී. රත්නායක - *සහකාර අධ්‍යක්ෂ/ප්‍රතිපත්ති* 20. එච්. පී. එච්. එම්. පතිරණ - *සහකාර අධ්‍යක්ෂ/මෙහෙයුම් විශ්ලේෂණ* 21. එල්. ගණේෂමූර්ති - *සහකාර අධ්‍යක්ෂ/තාක්ෂණික ප්‍රමිති* 22. ආර්. පී. අභයධීර - *සහකාර අධ්‍යක්ෂ/වියදම්* 23. පී. සී. පී. මොරගොඩ - *සහකාර අධ්‍යක්ෂ/නීති* 24. ශ්‍රියානි මාවැල්ලගේ - *සහකාර අධ්‍යක්ෂ/පාරිභෝගික සම්බන්ධතා* 25. අයි. එම්. ජවුසි - *සහකාර අධ්‍යක්ෂ/ ජාත්‍යන්තර සම්බන්ධතා* 26. සී. එන්. පලිහවඩන - *සහකාර අධ්‍යක්ෂ/ අයක්‍රම* 27. එස්. ඒ. ආර්. කමලනායන - *සහකාර අධ්‍යක්ෂ/ ගුවන් සහ සමුද්‍රීය සේවා* 28. එස්. ටී. වාකිෂ්ට - *සහකාර අධ්‍යක්ෂ/ අන්තර් මෙහෙයුම්* 29. එම්. පී. ගුණසිංහ - *සහකාර අධ්‍යක්ෂ/ පෞද්ගලික ජංගම ගුවන් විදුලි* 30. ජේ. වී. එස්. ගුණනන්දන - *සහකාර අධ්‍යක්ෂ/ පිරික්සුම්/දත්ත/ආධුනික ගුවන් විදුලි සේවා* 31. කපිල ජයවර්ධන - *පරිගණක වැඩසටහන් සම්පාදක සහ සහකාර අධ්‍යක්ෂ/තොරතුරු සහ ප්‍රලේඛන (වැඩබලන)* 32. ඩබ්. එල්. ඒ. කේ. ඒ. ගුණතිලක - *සහකාර අධ්‍යක්ෂ/පරිපාලන*

## පටුන


20 1 පරිච්ඡේදය
විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ විමසුමක්

27 2 පරිච්ඡේදය
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ලං.වි.සං.නි.කො.ස.) ආරම්භය, දැක්ම, මෙහෙවර, අභිමතාර්ථ, වගකීම් සහ කාර්යයන්

33 3 පරිච්ඡේදය
ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා අංශය

41 4 පරිච්ඡේදය
ආර්ථික කටයුතු අංශය

49 5 පරිච්ඡේදය
අධිවේගී අන්තර්ජාල සේවා පිරික්සුම් අංශය

53 6 පරිච්ඡේදය
වර්ණාවලි කළමනාකරණ අංශය

64 7 පරිච්ඡේදය
ජාල අංශය


### වගු


*වගුව 1.1*
21 බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් - 2011

*වගුව 1.2*
සමුච්චිත ග්‍රාහක සංඛ්‍යාව සහ ග්‍රාහකයන්ගේ වාර්ෂික වර්ධන අනුපාතය 2000, 2005 - 2011

*වගුව 1.3*
22 දුරකථන ඝනත්වයේ වෙනස්වීම 2000 - 2011

*වගුව 1.4*
24 පරිගණක දැනුවත්භාවය සහ පරිගණක සාක්ෂරතාවය, 2004 - 2009

*වගුව 1.5*
25 ආයෝජන මණ්ඩල ව්‍යවස්ථාවේ 17 වන වගන්තිය යටතේ ආයෝජන මණ්ඩලය (BOI) විසින් අනුමත කළ විදුලි සංදේශ ව්‍යාපෘති සඳහා ලැබුණු විදේශීය සෘජු ආයෝජන

*වගුව 3.1*
38 දායක මුදල් ගෙවීම

*වගුව 4.1*
42 හඬ ඇමතුම් සහ කෙටි පණිවුඩ සේවා සඳහා පාදස්ථ මිල 2010-2011

*වගුව 4.2*
44 දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් කරන ලද අයෝජන. 2010-2011

70 8 පරිච්ඡේදය
බලපත්‍ර පරිපාලන අංශය

77 9 පරිච්ඡේදය
පාලන හා මානව සම්පත් අංශය

91 10 පරිච්ඡේදය
නීති අංශය

95 11 පරිච්ඡේදය
තොරතුරු සහ ප්‍රලේඛණ ඒකකය

100 12 පරිච්ඡේදය
මාධ්‍යය අංශය

102 13 පරිච්ඡේදය
අභ්‍යන්තර විගණන අංශය

105 14 පරිච්ඡේදය
මූල්‍යය අංශය

110 ගිණුම් වාර්තාව

130 විගණකාධිපති වාර්තාව

*වගුව 4.3*
45 ස්ථාවර සහ ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම්වල ආදායම, 2010-2011

*වගුව 4.4*
46 ස්ථාවර සහ ජංගම දුරකථන කර්මාන්තයේ ශුද්ධ ලාභය / පාඩුව, 2010-2011

*වගුව 4.5*
2010 වසරේ දී ක්‍රියා මාර්ග ගන්නා ලද අනුකූලතා ගැටලු

*වගුව 4.6*
47 පාරිභෝගික සම්බන්ධතා ඒකකය වෙත ලැබී ඇති පැමිණිලි - 2011

*වගුව 4.7*
48 නැති වූ ජංගම දුරකථන පිළිබඳ පැමිණිලි - 2011

*වගුව 5.1*
50 අධිවේගී අන්තර්ජාල සේවා ක්‍රියාකරුවන්, තාක්ෂණය සහ වේගය

*වගුව 6.1*
55 නිකුත් කරනු ලැබූ මුළු සංඛ්‍යාත සංඛ්‍යාව, 2010-2011

*වගුව 6.2*
56 සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කරන්නන් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව, 2010-2011

*වගුව 6.3*
56 ලැබුණු පැමිණිලි සහ පැවැත් වූ විමර්ශන, 2010-2011

*වගුව 6.4*
57 හඳුනාගත් නීති විරෝධී භාවිත කරන්නන් සංඛ්‍යාව සහ ගනු ලැබූ නිවාරණ ක්‍රියාමාර්ග 2010-2011

*වගුව 6.5*
නිකුත් කරන ලද නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව, 2011-2012

*වගුව 6.6*
60 ඩිජිටල් ස්විච්කරණ අරමුණු පිළිබඳ සාරාංශය

*වගුව 6.7*
63 2010/08/24 දින පවත්වන ලද ප්‍රථම ජාතික උපදේශන කමිටුවේ දී යාවත්කාලීන කළ පරිදි ශ්‍රී ලංකාවේ ඩිජිටල් රූපවාහිනී විකාශන සේවා රාමුව පිළිබඳ ප්‍රධාන කරුණු සහ ක්‍රියාත්මක උපලේඛනය

*වගුව 7.1*
65 ජාල අංශය පිළිබඳ සංඛ්‍යාලේඛන, 2010-2011

*වගුව 9.1*
79 1997-2006 ශ්‍රී.ලං.වි.සං.නි. කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව වෙනස්වීම

*වගුව 9.2*
82 ශ්‍රී.ලං.වි.සං.නි. කොමිෂන් කාර්ය මණ්ඩලය පුහුණු වැඩසටහන්/ශිෂ්‍යත්ව/සම්මන්ත්‍රණ වලට සහභාගි වීම 2011

*වගුව 11.1*
96 තොරතුරු තාක්ෂණය ඒකකය විසින් ඉටු කරනු ලැබූ කාර්යයන් - 2011

*වගුව 12.1*
101 2011 වසරේ දී මාධ්‍ය ඒකකය විසින් ආවරණය කළ සිදුවීම්

## ප්‍රස්ථාර

*1.1 ප්‍රස්තාරය*
22 ග්‍රාහක වර්ධනය, 2000-2011

*1.2 ප්‍රස්තාරය*
24 පළාත් පරිගණක සාක්ෂරතාවය

*4.1 ප්‍රස්තාරය*
43 ජංගම අය ක්‍රම ප්‍රවණතා

## කෙටි යෙදුම් ලැයිස්තුව

**3G** Third Generation
තෙවන පරම්පරාව

**ADS** Additional Domain Server
අතිරේක ගෘහස්ථ සර්වරය

**ADSL** Asymmetric Digital Subscriber Line
අසමමිතික සංඛ්‍යාංක ග්‍රාහක රැහැන

**APT** Asia Pacific Telecommunity
ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාව

**ARO** Amateur Radio Operator
ආධුනික ගුවන් විදුලි ක්‍රියාකරු

**ASO** Analogue Switch off
ඇනලොග් ස්විචය ක්‍රියාවිරහිත කිරීම

**BMU** Broadband Monitoring unit
අධිවේගී අන්තර්ජාල පිරික්සුම් ඒකකය

**BOI** Board of Investment
ආයෝජන මණ්ඩලය

**CDMA** Code Division Multiple Access
සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ

**CID** Criminal Investigation Department
අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව

**CLS** Computer Literacy Survey
පරිගණක සාක්ෂරතා සමීක්ෂණය

**CPE** Customer Premises Equipment
පාරිභෝගික පරිශ්‍ර උපකරණ

**CTO** Commonwealth Telecommunication Organization
පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය

*වගුව 13.1*
103 අභ්‍යන්තර විගණන වාර්තාවේ ආවරණය කරන ලද විෂයය ක්ෂේත්‍රයන් - 2011

*වගුව 14.1*
107 ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආදායම් 2010-2011

*වගුව 14.2*
108 ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද 2010-2011

*වගුව 14.3*
කොමිෂන් සභාවේ මුළු ආදායම 2009-2011

---

*4.2 ප්‍රස්තාරය*
45 ප්‍රතිශතයක් වශයෙන් සමස්ත ආදායමේ දායකත්වය

*5.1 ප්‍රස්තාරය*
50 අධිවේගී අන්තර්ජාල සේවා වර්ධනය

*5.2 ප්‍රස්තාරය*
52 දත්ත ලබා ගැනීමේ වේගය 2010 අගෝස්තු

*5.3 ප්‍රස්තාරය*
52 දත්ත ලබා ගැනීමේ වේගය 2011 අගෝස්තු

*9.1 ප්‍රස්තාරය*
80 වර්තමාන සංවිධාන ව්‍යුහය - ශ්‍රී.ල.වි.ස.නි.කො.ස

---

**DBNO** Digital Broadcast Network Operator
ඩිජිටල් විකාශන ජාල ක්‍රියාකරු

**DPM** Data Protection Manager
දත්ත ආරක්ෂණ කළමනාකරු

**DR** Disaster Recovery
ආපදා ආරක්ෂණය

**DSO** Digital Switch over
ඩිජිටල් අධි ස්විච්ය

**DTT** Digital Terrestrial Television
ඩිජිටල් භෞමික රූපවාහිනී

**DTTB** Digital Terrestrial Television Broadcast
ඩිජිටල් රූපවාහිනී විකාශන

**ECL** Environment Conservation Levy
පාරිසරික ආරක්ෂණ බද්ද

**EPF** Employees' Provident Fund
සේවක අර්ථසාධක අරමුදල

**EPG** Electronic Programme Guide
විද්‍යුත් වැඩසටහන් උපදේශනය

**ETF** Employees' Trust Fund
සේවක භාරකාර අරමුදල

**FDI** Foreign Direct Investment
විදේශීය සෘජු ආයෝජන

**FM** Frequency Modulation
සංඛ්‍යාත අනුකලනය

**FMMS** Frequency Management and Monitoring System
සංඛ්‍යාත කළමනාකරණය සහ පිරික්සුම් පද්ධතිය

| | | |
|---|---|---|
| **FTA** | Free to Air<br>වායු මුක්ත |
| **GA** | General Assembly<br>මහා සම්මේලනය |
| **GB** | Giga Byte<br>ගිගා බයිට් |
| **GDP** | Gross Domestic Product<br>දළ දේශීය නිෂ්පාදිතය |
| **GILF** | Global Industry Leader's Forum<br>ගෝලීය කාර්මික නායකයන්ගේ සමුළුව |
| **GPRS** | General Packet Radio Service<br>පොදු පැකට්ටු ගුවන් විදුලි සේවය |
| **GSM** | Global System for Mobile<br>ජංගම සන්නිවේදනය සඳහා ගෝලීය පද්ධතිය |
| **GSR** | Global Symposium for Regulators<br>විදුලි සංදේශ නියාමකයන් පිළිබඳ ගෝලීය සමුළුව |
| **HDTV** | High Definition Television<br>අධි යෙදුම් රූපවාහිනී |
| **HSPA** | High speed Packet Access<br>අධිවේගී පැකට්ටු ප්‍රවේශය |
| **ICT** | Information and Communication Technology<br>තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය |
| **IDF** | Institutional Development Fund<br>ආයතන සංවර්ධන අරමුදල |
| **IP** | Internet Protocol<br>අන්තර්ජාල මූල ලේඛය |
| **IPTV** | Internet Protocol Television<br>අන්තර්ජාල මූලලේඛ රූපවාහිනිය |
| **ISP** | Internet Service Provider<br>අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් |
| **IT** | Information Technology<br>තොරතුරු තාක්ෂණය |
| **LTE** | Long Term Evolution<br>දිගුකාලීන විකාශනය |
| **MCR** | Main Control Room<br>ප්‍රධාන පාලක මැදිරිය |
| **MMMI** | Ministry of Mass Media and Information<br>ජනමාධ්‍ය සහ තොරතුරු අමාත්‍යාංශය |
| **MSL** | Mobile and Fixed Subscriber Levy<br>ජංගම සහ ස්ථාවර ග්‍රාහක බද්ද |
| **MTV** | Mobile Television<br>ජංගම රූපවාහිනිය |
| **NBBC** | Nation Broadband Consultative Committee<br>ජාතික අධිවේගී අන්තර්ජාල උපදේශන කමිටුව |
| **NBT** | Nation Building Tax<br>ජාතිය ගොඩනැගීමේ බද්ද |
| **NGAN** | Next Generation Access Network<br>මතු පරම්පරා ප්‍රවේශ ජාලය |
| **NGN** | Next Generation Network<br>මතු පරම්පරා ජාලය |
| **NRT** | National Roadmap Team<br>ජාතික මාර්ග සිතියම් කණ්ඩායම |
| **OPAC** | Online Public Access Catalogue<br>මාර්ගගත පොදු ප්‍රවේශ සුචිය |
| **PABX** | Private Automated Branch Exchange<br>පෞද්ගලික ස්වයංක්‍රීය ශාඛා හුවමාරුව |
| **PC** | Procument Committee<br>ප්‍රසම්පාදන කමිටුව |
| **PPDR** | Public Protection Disaster Relief<br>පොදු ආරක්ෂණ ආපදා සහන |
| **PSTN** | Public Switched Telephone Network<br>පොදු ස්විචීකරණ දුරකථන ජාල |
| **QoS** | Quality of Service<br>සේවා තත්ත්ව |
| **RAM** | Random Access Memory<br>අහඹු ප්‍රවේශ ස්මරණය |
| **SAARC** | South Asian Association for Regional Co- operation<br>දකුණු ආසියානු කලාපීය සහයෝගීතාව පිළිබඳ සංගමය |
| **SATRC** | South Asian Telecom Regulators' Council<br>දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ සංගමය |
| **SCCM** | South Center Configuration Manger<br>පද්ධති මධ්‍යස්ථාන ව්‍යුහමය කළමනාකරු |
| **SIM** | Subscriber Identity Module<br>ග්‍රාහක අනන්‍යතා මොඩියුලය |
| **SLI** | Sign Language Interpreter<br>සංඥා භාෂා පරිවර්තනය |
| **SMS** | Short Message Service<br>කෙටි පණිවුඩ සේවා |
| **TEC** | Technical Evaluation Committee<br>තාක්ෂණික ඇගයීම් කමිටුව |

**TRCSL** Telecommunications Regulatory of Sri Lanka
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**TV** Television
රූපවාහිනීය

**USA** United States of America
ඇමරිකා එක්සත් ජනපදය

**UHF** Ultra High Frequency
අධිඋච්ච සංඛ්‍යාත

**VAT** Value Added Tax
එකතු කළ අගය මත බද්ද

**WG** Working Group
අධ්‍යයන කණ්ඩායම

**Wi-Fi** Wireless Fidelity
රැහැන් රහිත අනුකූලතාවය

**WIMAX** World Wide Interoperability for Micro Wave Access
ක්ෂුද්‍ර තරංග ප්‍රවේශ පිළිබඳ ලෝක ව්‍යාප්ත අන්තර් මෙහෙයුම්

**WSIS** World Summit on the Information Society
තොරතුරු සමාජ පිළිබඳ ලෝක සමුළුව

**WTISD** World Telecommunications and Information Society Day
ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය

**WTSA** World Telecommunication Standardization Assembly
ලෝක විදුලි සංදේශ ප්‍රමිතිකරණ සමුළුව

# විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ විමසුමක්

1 පරිච්ඡේදය

කොළඹ සහ ගාල්ල අතර ටෙලිග්‍රැෆික පරිපථය 1858 වර්ෂයේ ආරම්භයත් සමඟ වර්ෂ 150 ක අතීතයකට ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ඉතිහාසය දිව යයි. ප්‍රථම දුරකථන රැහැන 1880 වර්ෂයේ දී ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකාව 1991 මුල් භාගයේ දී විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පාලන රීති හා සීමා ඉවත් කර විවෘත වෙළෙඳපළ ප්‍රතිපත්ති හඳුන්වා දෙන තෙක් 1896 සිට 1991 දක්වා කාලය තුළ විදුලි සංදේශ අංශය රාජ්‍ය ඒකාධිකාරිත්වය යටතේ පැවතුණි. වර්තමානයේ විදුලි සංදේශ අංශය පාලනය වන්නේ 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සහ එම පනත යටතේ ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ලං.වි.සං.නි.කො.ස) මගිනි.

2011 වර්ෂය අවසාන වන විට 1.1 වගුවේ දැක්වෙන පරිදි බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් 63ක් පැවතුණි.

**බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් - 2011** (1.1 වගුව)

| සේවාවේ වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| ස්ථාවර ප්‍රවේශ දුරකථන සේවා | 04 |
| සෙලියුලර් ජංගම දුරකථන සේවා | 05 |
| දත්ත සන්නිවේදන (පහසුකම් පාදක කරගත්) | 06 |
| දත්ත සන්නිවේදන (පහසුකම් පාදක කර නොගත්) සහ අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් | 08 |
| දිගු දුර ජංගම ගුවන් විදුලි සේවා | 01 |
| බද්දට ගත් පරිපථ සැපයුම්කරුවන් | 01 |
| බලපත්‍රලාභී පේජෝන් සැපයුම්කරුවන් | 01 |
| බාහිර ප්‍රවේශ ක්‍රියාකරුවන් | 33 |
| සෘජු ගෘහස්ථ චන්ද්‍රිකා විකාශන සේවා | 02 |
| කේබල් රූපවාහිනී විබෙදුම් ජාල සේවා | 02 |
| එකතුව | 63 |

*සටහන: දුරකථන ක්‍රියාකාර සමාගම් හතරක්, ශ්‍රී ලංකා ටෙලිකොම්, සන්ටෙල්, ලංකා බෙල් සහ ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් සිය බලපත්‍ර ප්‍රකාරව පේජෝන් සහ දත්ත සේවා සැපයීමට සුදුසුකම් ලබයි.*

2011 වර්ෂය අවසාන වන විට සාපේක්ෂ වශයෙන් ස්ථාවර ප්‍රවේශ ග්‍රාහකයන් මිලියන 3.6, සෙලියුලර් ග්‍රාහකයන් මිලියන 18.3, සහ අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් ග්‍රාහකයන් (ස්ථාවර) මිලියන 0.359 සහ අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් ග්‍රාහකයන් (ජංගම) මිලියන 0.485කි. විදුලි සංදේශ ග්‍රාහකයන්ගේ සමුච්චිත සංඛ්‍යාවේ වෙනස්කම් සහ අදාල වාර්ෂික වර්ධන අනුපාත 1.2 වගුවේ දැක් වේ.

**සමුච්චිත ග්‍රාහක සංඛ්‍යාව සහ ග්‍රාහකයන්ගේ වාර්ෂික වර්ධන අනුපාතය 2000, 2005-2011** (1.2 වගුව)

| වර්ෂය | ග්‍රාහක වර්ගය | | | වාර්ෂික වර්ධන අනුපාතය (%) | | |
|---|---|---|---|---|---|---|
| | ස්ථාවර | ජංගම | ස්ථාවර හා ජංගම | ස්ථාවර | ජංගම | ස්ථාවර හා ජංගම |
| 2000 | 767411 | 430202 | 1197613 | 14.7 | 67.6 | 29.4 |
| 2005 | 1243994 | 3361775 | 4605769 | 25.5 | 52.2 | 43.8 |
| 2006 | 1884076 | 5412496 | 7296572 | 51.5 | 61.0 | 58.4 |
| 2007 | 2742059 | 7983489 | 10725548 | 45.5 | 47.5 | 47.0 |
| 2008 | 3446411 | 11082454 | 14528865 | 25.7 | 38.8 | 35.5 |
| 2009 | 3435958 | 14264442 | 17700400 | -0.3 | 28.7 | 21.8 |
| 2010 | 3534575 | 17267407 | 20801982 | 2.9 | 21.1 | 17.5 |
| 2011 | 3608932 | 18319447 | 21928379 | 2.1 | 6.1 | 5.4 |

2002 වර්ෂය මැද භාගය වන විට ජංගම දුරකථන සංඛ්‍යාව ස්ථාවර දුරකථන සංඛ්‍යාවට වඩා වැඩි විය. ඒ බව 1.2 වගුවෙන් පෙනී යන අතර එබැවින් සෑම වර්ෂයකදීම ස්ථාවර දුරකථනවලට වඩා ජංගම දුරකථන අංශයේ වාර්ෂික වර්ධන අනුපාතය ඉහළින් පවතී. ඇත්ත වශයෙන් ම 2000 වර්ෂය මැද භාගයේ දී ජංගම දුරකථන අංශයේ ඝාතීය වර්ධනයක් (Exponential Growth) පෙන්නුම් කර ඇත. 2005 -2011 කාල පරිච්ඡේදය තුළ ඉහලම වර්ධන අනුපාතයක් 2006 වර්ෂයේදී ප්‍රකාශ වූ අතර එය ස්ථාවර දුරකථන (51.5%) සහ ජංගම දුරකථන (61%) වශයෙනි. 1.2 වගුවේ දත්ත මගින් පෙනී යන්නේ සමස්ත ග්‍රාහක සංඛ්‍යාව ඉහළ ගොස් ඇති නමුත් 2006 සිට 2011 දක්වා කාලපරිච්ඡේදය තුළ ස්ථාවර සහ ජංගම දුරකථන වර්ධන අනුපාතය හීන වී ඇති බවයි. 2000 සිට 2011 දක්වා කාලපරිච්ඡේදය තුළ සමස්ත ග්‍රාහක සංඛ්‍යාවේ වර්ධන රටාව 1.1 සටහනේ ප්‍රස්ථාර ගත කර ඇත.

**2000 - 2011 දුරකථන ඝනත්වයේ වෙනස්වීම**
(1.3 වගුව)

| වර්ෂය | දුරකථන ඝනත්වය (%) | | |
|---|---|---|---|
| | ස්ථාවර | ජංගම | සංයුක්ත දුරකථන ඝනත්වය |
| 2000 | 4.0 | 2.3 | 6.3 |
| 2001 | 4.4 | 3.6 | 8.0 |
| 2002 | 4.7 | 4.9 | 9.6 |
| 2003 | 4.9 | 7.2 | 12.1 |
| 2004 | 5.1 | 11.4 | 16.5 |
| 2005 | 6.3 | 17.1 | 23.4 |
| 2006 | 9.5 | 27.3 | 36.8 |
| 2007 | 13.7 | 39.8 | 53.5 |
| 2008 | 17.1 | 54.8 | 71.9 |
| 2009 | 16.8 | 69.8 | 86.6 |
| 2010 | 17.1 | 83.6 | 100.7 |
| 2011 | 17.3 | 87.8 | 105.1 |

*සටහන: එක් එක් වර්ෂයේ ජන සංඛ්‍යාලේඛන මහ බැංකු වාර්තාවෙන් ලබා ගෙන ඇත.*

**ග්‍රාහක වර්ධනය** (1.1 ප්‍රස්ථාරය)



2000 වර්ෂයේ දී ජංගම දූරකථන භාවිතා කිරීමේ අනුපාතය (පුද්ගලයන් 100කට ඇති ජංගම සහ ස්ථාවර දූරකථන සංඛ්‍යාව) සියයට 2.3ක් වූ අතර 2011 වර්ෂයේ දී එය සියයට 87.8 දක්වා ශීඝ්‍රයෙන් වර්ධනය විය. දූරකථන භාවිතා කිරීම වශයෙන් පුද්ගලයන් 100කට අයත් ජංගම සහ ස්ථාවර දූරකථන සංඛ්‍යාව සඳහන් වේ. කෙසේ වෙතත් සක්‍රිය ග්‍රාහක අනන්‍යතා මොඩියුල්පත් (SIM) සැලකිය යුතු ප්‍රමාණයක් තනි හා එකම පුද්ගලයකු විසින් භාවිතා කරනු ලබන බව ඇස්තමේන්තු කර ඇති බැවින් මෙම 1.3 වගුවේ දැක්වෙන නියම තත්ත්වය පිළිබිඹු නොවන අතර සත්‍ය ජංගම දූරකථන භාවිතය පහළ මට්ටමක පවතී. 2010 වර්ෂය වන විට රටේ දූරකථනයක් හිමි පුද්ගලයන්ගේ සාමාන්‍ය අනුව 2010 වර්ෂයේ දී සියයට සියය දක්වා වැඩි වූ සංයුක්ත දූරකථන භාවිතය 2011 වර්ෂයේ දී 105 දක්වා වැඩි විය.

සමස්ත ජංගම දූරකථන අංශයේ වර්ධනයක් ඇති කරමින් ග්‍රාහකයන් ජංගම දූරකථන භාවිත කිරීමෙහි ලා පෙළඹීමට ජංගම දූරකථන ක්‍රියාකාර සමාගම් විසින් ලබාදෙන තරඟකාරී මිල සාපේක්ෂ වශයෙන් ජංගම දූරකථනවල අඩු පිරිවැය, මිල දී ගැනීමේ හැකියාව ඉහළ මට්ටමක පැවතීම, මිල දරාගත හැකි වීම වැනි විචලන තත්ත්වයන් සහිතව විවිධ ආදායම් කාණ්ඩවල පාරිභෝගිකයන් ආකර්ෂණ කර ගැනීමේ අභිප්‍රායෙන් පෙර ගෙවුම් සහ පසු ගෙවුම් වැනි විවිධ ගෙවීම් ක්‍රම හඳුන්වාදීම සහ ජනතාවගේ දැනුවත්භාවය හේතු විය. දශක 30ක් වැනි දීර්ඝ කාලයක් පුරා පැවති යුද්ධය අවසානවීම නිසා උතුරු නැගෙනහිර පළාත්වල දූරකථන සේවා සඳහා පවතින ඉල්ලුම ඉහළ යාම ද මෙයට හේතු වී ඇත. 2009 සහ 2010 වර්ෂ වල දී දූරකථන ක්‍රියාකාර සමාගම් විසින් සිය සමාගම් අතර මිල තරගකාරීත්වයක් ඇති කරමින් හඳුන්වාදුන් වෙළෙඳපළ ක්‍රමෝපායන් හේතුවෙන් වෙළෙඳපළ තුළ අර්බුදකාරී වාතාවරණයක් උද්ගත වූ අතර එය විදුලි සංදේශ අංශයේ ස්ථාවරත්වයට තර්ජනයක් විය. වඩා තරගකාරි අයක්‍රම පැකේජ සහ ප්‍රධාන වශයෙන් ජංගම දූරකථන අංශයේ ක්‍රියාකරුවන් බරපතළ මූල්‍ය අලාභ අත්විඳීම නිසා මෙය සිදු විය. 2009 වර්ෂයේ ජංගම දූරකථන මුළු අලාභය සාපේක්ෂ වශයෙන් රුපියල් බිලියන 17.4කි. විදුලි සංදේශ කර්මාන්තයේ පිරිහීම වළක්වාලීමේ අදහසින් 2009 වර්ෂය මැද භාගයේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ අංශය සඳහා අවම මිල සහ අන්තර්ජාල මිල නියමයන් හඳුන්වා දුන් අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් දූරකථන ක්‍රියාකරුවන් අතර මිල තරගකාරිත්වය අවම කිරීමට සහ විදුලි සංදේශ කර්මාන්තය ස්ථාවර කිරීමට හැකි විය.

මෙම ස්ථාවර සහ ජංගම දූරකථනවලට අමතරව පොදු මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා පොදු දූරකථන කුටි රැසක් රටපුරා ස්ථාපනය කර ඇත. 2011 වර්ෂයේ දී රටපුරා ව්‍යාප්ත පොදු දූරකථන කුටි සංඛ්‍යාව 6458කි. 2010 වර්ෂයේ දී 209,946ක් වූ මුළු අධිවේගී අන්තර්ජාල ග්‍රාහක සංඛ්‍යාවෙන් 443,487 ක් ජංගම අධිවේගී අන්තර්ජාල ග්‍රාහකයන් වූ අතර ඉතිරි 233,541 ස්ථාවර දූරකථන ග්‍රාහකයන් විය. 2011 වර්ෂයේ දී අනුරූපී සංඛ්‍යා පිළිවෙලින් 782,956, 485,165 සහ 297,791 ක් විය. ඒ අනුව 2010 සහ 2011 වර්ෂවල රටේ සමස්ත ජනගහණයේ ප්‍රතිශතයක් ලෙස අධිවේගී අන්තර්ජාල භාවිත කරන්නන් පිළිවෙලින් සියයට 2.1 සහ 3.8 විය. රටේ අධිවේගී අන්තර්ජාල පරිහණය කරන්නන්ගේ ප්‍රතිශතය සුළු ප්‍රමාණයකින් වැඩි වී ඇති අතර අධිවේගී අන්තර්ජාල ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා වැඩි ප්‍රයත්නයන් දැරිය යුතුව ඇති බොහෝ අවස්ථාවල දී එක් අන්තර්ජාල සම්බන්ධතාවයක් පුද්ගලයන් කිහිප දෙනෙකු විසින් ම

භාවිත කරන බැවින් (නිදඃ අන්තර්ජාල පහසුකම් සපයන මධ්‍යස්ථාන, රජයේ කාර්යාල, අධ්‍යාපනික ආයතන, සහ පෞද්ගලික අංශයේ ආයතන යනාදිය) අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල භාවිත කරන්නන් සංඛ්‍යාව යම් ප්‍රමාණයකට වැඩි විය හැකි බව සටහන් කළ යුතුය.

අන්තර්ජාලය දැනුම සහ තොරතුරු ලබා ගැනීමේ ඉතා ප්‍රබල මූලාශ්‍රයක් වුවද අසභ්‍ය අන්තර්ගතයන් සහිත වෙබ් අඩවිවලට ප්‍රවේශවීම, ප්‍රචණ්ඩත්වය, ක්‍රෙඩිට් කාඩ් වංචා, විකෘති/අසත්‍ය තොරතුරු ප්‍රචාරණය ඇතැම් විට පරිගණක ක්‍රමවත්ව ක්‍රියාත්මක නොකිරීම නිසා වෛරස් ඇතුළු වීම වැනි හේතු නිසා එහි යම් අවාසි ද පවතී.

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වර්ධනය සමඟ තොරතුරු තාක්ෂණය (IT) අතිනත ගෙන ඉදිරියට යාම බෙහෙවින් සතුටුදායකය. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද පරිගණක සාක්ෂරතා සමීක්ෂණය (CLS) අනුව ජනගහනයෙන් වයස අවුරුදු 5-69 අතර පිරිසකගේ පරිගණක දැනුම සහ පරිගණක සාක්ෂරතා මට්ටම පසුගිය වර්ෂවලදී වැඩි වී ඇත. (1.4 වගුව බලන්න) මෙම සමීක්ෂණයන්ට අනුව යම් තැනැත්තෙකුට පරිගණකයන් භාවිත කරමින් කාර්යයන් ඉටු කිරීමට හැකි නම් ඔහු/ඇය පරිගණක සාක්ෂරතාවය සහිත තැනැත්තකු බව හඳුනාගෙන ඇත. යම් තැනැත්තකුට පරිගණකය පිළිබඳ අවම අවබෝධයක් හෝ ඇත් නම් ඔහු/ඇය පරිගණක දැනුම සහිත තැනැත්තකු ලෙස සලකා ඇත.

**පරිගණක දැනුවත් භාවය සහ පරිගණක සාක්ෂරතාවය 2004 - 2009** (1.4 වගුව)

| වර්ෂය | පරිගණක දැනුම (%) | පරිගණක සාක්ෂරතාවය (%) |
|---|---|---|
| 2004 | 18 | 10 |
| 2006/07 | 37 | 16 |
| 2009 | 44 | 20 |

*මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව*

ශ්‍රී ලංකාවේ පළාත් අතර පරිගණක සාක්ෂරතාවය වැඩිම පළාත බස්නාහිර පළාත බව පෙනේ. 2009 වර්ෂයේ පළාත්වල පරිගණක සාක්ෂරතා අනුපාතය (උතුරු පළාත හැර) 1.2 ප්‍රස්ථාරයේ දැක් වේ.

**පළාත් පරිගණක සාක්ෂරතාවය - 2009** (1.2 ප්‍රස්ථාරය)




*මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව*

ජාල අභිප්‍රේරක දර්ශකය ශ්‍රේණිගත කිරීමේ දී 2010 වර්ෂයේ දී 3.65ක් වූ ශ්‍රී ලංකාවේ ලකුණු ප්‍රමාණය 2011 වර්ෂයේ දී 3.81ක් වී ඇත.

විදුලි සංදේශ කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජීය සංවර්ධනයෙහිලා වැදගත් භූමිකාවක් ඉටු කර තිබේ. පසුගිය දශක දෙක තුළ ශ්‍රී ලංකාවේ සේවා කර්මාන්තයේ වර්ධනයෙහි වැඩි ප්‍රමාණයකට දායක වී ඇත්තේ විදුලි සංදේශ කර්මාන්තයේ ප්‍රවර්ධනයයි. රට අභ්‍යන්තරයේ මෙන් ම ඉන් බාහිරවත් සන්නිවේදනයේ වැඩි දියුණු වීම් සහ තොරතුරු ලබා ගැනීමට ඉහළ ප්‍රවේශයක් තිබීමත් මගින් ජනගහනයේ සෑම කොටසකම දිවි පෙවෙත්, ජීවන රටා සහ ජීවන තත්ත්වයේ ගුණාත්මක

බව වැඩි දියුණු වී තිබේ. දශක තුනකට ආසන්න කාලයක් පැවති යුද ගැටුම් නිම වී සාමය නැවත ස්ථාපිත වීමත් සමග මෑත කාලයේ දී ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කර්මාන්තය සීඝ්‍රයෙන් වර්ධනය වී තිබේ. 2009 මැයි මාසයේ දී ජනවාර්ගික යුද්ධය අවසන් වීම නිසා විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් විසින් සිය ජාල ව්‍යාප්ත කිරීම සහ වැඩි දියුණු කිරීම සිදු කර ඇත. දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් 2011 වර්ෂයේ දී විදුලි සංදේශ කර්මාන්තය වෙනුවෙන් සිදු කළ මුළු ආයෝජනය රුපියල් බිලියන 50.7කි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් එක් දුරකථන ක්‍රියාකාර සමාගමකට හතරවන පරම්පරාවේ දිගු කාලීන පරිණාම තාක්ෂණය භාවිතා කරමින් නියමු ජාල ව්‍යාපෘතියක් කොළඹ නගරයේ පැවැත්වීමට අවසර ලබා දී තිබේ. කොකාවිල් ප්‍රදේශයේ විශාල බහුකාර්යය විදුලි සංදේශ කුලුනේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් වීමෙන් පසුව රජය එම කුලුන 2011 මැයි මාසයේ දී විවෘත කළ අතර එමගින් උතුරු පළාතේ ජීවත් වන ජනතාවගේ විදුලි සංදේශ අවශ්‍යතා සපයනු ලැබේ. 2011 වර්ෂයේ දී රටේ ව්‍යාප්ත මුළු විදුලි සංදේශ කුලුනු සංඛ්‍යාව 5083කි. තවත් බහු කාර්ය විදුලි සංදේශ කුලුනක් කොළඹ නගරයේ ඉදි කිරීමේ සැළසුම් ක්‍රියාත්මක වෙමින් පවතී.

ඉකුත් කාලයේ දී විදුලි සංදේශ අංශය සැලකිය යුතු විදේශීය සෘජු ආයෝජන (FDI) ප්‍රමාණයක් ලැබී ඇත. 2007 සිට 2010 ජුනි කාලපරිච්ඡේදයේ දී විදුලි සංදේශ අංශය සඳහා සපයන ලද විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණය 1.5 වගුවෙන් දැක් වේ. 2007 සිට 2009 දක්වා වසර තුනක කාලපරිච්ඡේදයේ දී යටිතල පහසුකම් සහ වෙනත් සේවා සඳහා ලබා ගෙන ඇති විදේශීය සෘජු ආයෝජනවලින් විදුලි සංදේශ අංශය සඳහා සපයන ලද ප්‍රමාණය සියයට 60කට වැඩිය. 2010 වර්ෂයේදී යටිතල පහසුකම් සහ වෙනත් සේවා සඳහා ලද විදේශීය සෘජු ආයෝජන සියයට 59කට ආසන්නය. 2007, 2008 සහ 2009 වර්ෂවල දී මෙම අංශ සඳහා ලැබුණු මුළු විදේශීය

**ආයෝජන මණ්ඩල ව්‍යවස්ථාවේ 17 වන වගන්තිය යටතේ ආයෝජන මණ්ඩලය (BOI) විසින් අනුමත කළ විදුලි සංදේශ ව්‍යාපෘති සඳහා ලැබුණු විදේශීය සෘජු ආයෝජන** (1.5 වගුව)

*(විදේශීය සෘජු ආයෝජනය - ඇමරිකානු ඩොලර් මිලියන)*

| විෂයය | වර්ෂය 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|
| රූපවාහිනී සහ විදුලි සංදේශ ජාල සඳහා විදේශීය සෘජු ආයෝජන | 403,632 | 553,097 | 296,064 | 205,164 |
| යටිතල පහසුකම් සහ වෙනත් සේවා සඳහා විදේශීය සෘජු ආයෝජන | 559,929 | 697,100 | 434,341 | 350,195 |
| යටිතල පහසුකම් සහ වෙනත් සේවා සඳහා ලැබුණු විදේශීය සෘජු ආයෝජන ප්‍රතිශතය අනුව විදුලි සංදේශ අංශය සඳහා විදේශීය සෘජු ආයෝජන | 72.1% | 79.3% | 69.2% | 58.6% |
| ලැබුණු මුළු වාර්ෂික විදේශීය සෘජු ආයෝජන | 734,362 | 888,935 | 601,250 | 516,296 |
| ලැබුණු මුළු විදේශීය සෘජු ආයෝජනවල ප්‍රතිශතයක් ලෙස විදුලි සංදේශ අංශය සඳහා විදේශීය සෘජු ආයෝජන | 55% | 62.2% | 49.2% | 39.7% |

*මූලාශ්‍රය ආයෝජන මණ්ඩලය*

සෘජු ආයෝජන ප්‍රමාණය සියයට 50කට ආසන්න වේ. 2010 වර්ෂයේ දී මෙම අංශය සඳහා විදේශීය සෘජු ආයෝජන ප්‍රතිශතය සියයට 40 දක්වා මඳ වශයෙන් අඩු විය.

ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කර්මාන්තය විශේෂයෙන් ජංගම අංශය ඉතා ඉහළ පිරිවැටුමක් වාර්තා කරයි. විදුලි සංදේශ කර්මාන්තය ජාතික නිමවුමට සෘජු සහ වක්‍ර ලෙස සැලකිය යුතු දායකත්වයක් දී තිබේ. 2010 වසරේ දී රජයේ ඒකාබද්ධ අරමුදලට රුපියල් බිලියන 27ක මුදලක් කර්මාන්තයෙන් ප්‍රේෂණය කර ඇති අතර එය 2011 වසරේ දී බිලියන 29.15 එනම් සියයට 8ක වර්ධනයකි. විදුලි සංදේශ කර්මාන්තය මඟින් ආර්ථිකයේ සෘජු මෙන් ම වක්‍ර රැකියා අවස්ථා ඇති කර ඇත. 2011 වසරේ දී සෘජු රැකියා අවස්ථා ප්‍රමාණය සාපේක්ෂ වශයෙන් 13,000කි.

දකුණු ආසියාතික රටවල් සහ වෙනත් ඒ සමාන රටවල් සංසන්දනය කිරීමේ දී ශ්‍රී ලංකාව විදුලි සංදේශ කර්මාන්තයේ සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගත් වාර්තාගත වර්ධනයක් සාක්ෂාත් කර ගත් රටක් වශයෙන් හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවට සිය අති නවීන විදුලි සංදේශ කර්මාන්තය පිළිබඳව ආඩම්බර විය හැකි අතර එය ඇතැම් විට බොහෝ සංවර්ධිත ජාතීන් සමඟ සම මට්ටමක පවතී. G.S.M. (ජංගම සන්නිවේදනය සඳහා ගෝලීය පද්ධතිය), CDMA (සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ), ADSL (අසමමිතික සංඛ්‍යාත ග්‍රාහක රැහැන), GPRS (පොදු පැකැට්ටු ගුවන් විදුලි සේවා) අන්තර්ජාල ප්‍රවේශය, WIMAX (ක්ෂුද්‍ර තරංග ප්‍රවේශ හඳුනා ලෝක ව්‍යාප්ත මෙහෙයුම් ශක්‍යතාව) පුළුල් පරාස සේවා, 3G (තෙවන පරම්පරාව) සහ 3.5.G ජංගම සන්නිවේදන සහ HSPA (අධිවේගී පැකැට්ටු ප්‍රවේශය) ජංගම අධිවේගී අන්තර්ජාල සේවා හඳුන්වාදීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ පුරෝගාමියෙකු වී තිබේ.

උතුරු නැඟෙනහිර ජනවාර්ගික අර්බුද අවසන්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා ආර්ථිකයේ සැලකිය යුතු වෙනස්කම් ඇති විය. රජය ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීමේ අරමුණින් රටේ බොහෝ ප්‍රදේශවල මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර ඇත. රජයේ සංවර්ධන සැලසුම් අනුව සමුද්‍රීය, නාවික, ගුවන්, වාණිජ, බලශක්ති සහ දැනුම සහිත පංචවිධ මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ප්‍රයත්නයේ දී විදුලි සංදේශ අංශය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත.

# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ලං.වි.සං.නි.කො.ස.)

## ආරම්භය, දැක්ම, මෙහෙවර, අභිමතාර්ථ, වගකීම් සහ කාර්යයන්

2 පරිච්ඡේදය

### 2.1 ආරම්භය

ප්‍රධාන ප්‍රඥප්තිය වූ 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම පිණිස පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත මඟින් ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයකි.

## 2.2 කොමිෂන් සභාව සහ කොමිෂන් සභා රැස්වීම්

2005 වර්ෂයේ සිට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සෘජුව ම අතිගරු ජනාධිපතිතුමාගේ විෂයය පථයට අයත් රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් වී ඇත. 2011 වසරේ දී කොමිෂන් සභාව ජනාධිපති ලේකම් (නිල බලයෙන් ම කොමිෂන් සභාවේ සභාපති), ශ්‍රී ලං.වි.සං.නි.කො. සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සහ පිළිගත් සුදුසුකම් ඇත්තාවූ සහ පිළිවෙලින් නීති, මුදල් සහ කළමනාකරණ ක්ෂේත්‍රවල විශිෂ්ටතාවක් ලබා ඇත්තාවූ තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්ගෙන් (පත් කළ සාමාජිකයන්) සමන්විත වී ඇත.

2011 මුදල් වර්ෂයේ දී කොමිෂන් සභාව විධිමත් පරිදි රැස්වීම් පවත්වා ඇත. කොමිෂන් සභාවේ සියලුම රැස්වීම් කොමිෂන් සභාවේ පූර්ණ සහභාගිත්වය යටතේ පවත්වා ඇත. කොමිෂන් සභාව විසින් කරුණු තීරණය කිරීම අනුමැතිය ලබාදීම සහ කොමිෂන් සභාවේ නියාමන විෂයයන්, වාර්ෂික අයවැය, අභ්‍යන්තර පරිපාලන කරුණු සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ව්‍යාපෘති පිළිබඳ ආවරණ අනුමැතිය ලබාදීම සිදු කරයි.

### 2.4.1 මෙහෙවර ප්‍රකාශනය අර්ථ නිරූපනය කිරීම

ශ්‍රී ලංකාවේ දිගු කාලීන සන්නිවේදන අවශ්‍යතාවයන් සපුරාලීම සහතික කරනු වස් සාධාරණත්වය, තරඟකාරිත්වය සහ ආයෝජන දිරිගන්වන නියාමන පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා සියලුම පාර්ශ්වකරුවන් සමඟ ස්වාධීන, විවෘත සහ පාරදෘශ්‍ය ආකාරයෙන් ක්‍රියාකිරීම තුළින් සියලු ම පරිහරණය කරන්නන්ට සාධාරණ, යුක්ති සහගත සහ දැරිය හැකි මිල ගණන් යටතේ වැඩි දියුණු සහ ගුණාත්මක බවෙන් ඉහළ සන්නිවේදන තාක්ෂණ සේවා සැපයිය හැකි බව සහතික කිරීම.

## 2.5 අරමුණු

විදුලි සංදේශ පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සාක්ෂාත් කළ යුතු අරමුණු පහත දැක් වේ:

**2.5.1** ජාතික අභිවෘද්ධියට හේතු වන හදිසි සේවා, පොදු දුරකථන කුටි සේවා, දුරකථන නාමාවලි තොරතුරු සේවා, සමුද්‍රීය සේවා සහ ග්‍රාමීය සේවා වැනි සේවාවන්වල , අවශ්‍යතාවය සපුරාලමින් ශ්‍රී ලංකාව තුළ, දේශීය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ

### 2.3 දර්ශනය

විද්‍යාත්මක හා නියාමන විශිෂ්ටතාව මඟින් දියුණු වෙමින් ඉදිරියට යන විදුලි සංදේශ කර්මාන්තයේ විශ්වීය නියාමකයකු වශයෙන් පිළිගැනීමට ලක් වීම.

### 2.4 මෙහෙවර

කුසලතාවෙන් පිරිපුන් සදාචාර සම්පන්න ශ්‍රම බලකායක් මඟින් තරඟකාරී වෙළෙඳපළෙහි සාධාරණත්වය හා යුක්තිය ප්‍රවර්ධනය කිරීමෙන් පිළිගත හැකි ගුණාත්මක බවකින් හා දැරිය හැකි මිලකින් යුක්ත සේවාවක් දීප ව්‍යාප්තව කලට වේලාවට ලබා දීමට වගබලා ගැනීම.

සේවා සාධාරණව හා කාර්යක්ෂමව සැපයීමට වගබලා ගැනීම.

**2.5.2** සෑම ක්‍රියාකරුවෙකුගේ ම බලපත්‍රයේ සඳහන් කර ඇති සේවාවන් සපයනු ලැබීම නිසැක කිරීම සඳහා එකී සෑම ක්‍රියාකරුවකුටම අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහ කළමනාකරණ සම්පත් ඇති බවට සහ ඔවුන් විසින් ඒවා යොදා ගනු ලබන බවට වගබලා ගැනීම.

**2.5.3** අය කරනු ලබන ගාස්තු සහ සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් මෙන් ම විදුලි සංදේශ උපකරණවල තත්ත්වය හා විවිධත්වය සම්බන්ධයෙන් පරිභෝගිකයන්ගේ, ගැනුම්කරුවන්ගේ සහ වෙනත් පාවිච්චි කරන්නන්ගේ සම්බන්ධතාවන් හා පොදුවේ මහජන යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

**2.5.4** විදුලි සංදේශ සේවා හා සම්බන්ධ වාණිජ කටයුතුවල නිරත තැනැත්තන් අතර ඵලදායි තරගකාරිත්වයක් පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධන කිරීම මෙන්ම ඒ තැනැත්තන්ගේ කාර්යක්ෂමතාව සහ පිරිමැසුම්දායක බව ප්‍රවර්ධනය කිරීම.

**2.5.5** අභ්‍යන්තර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් පිළිබඳව සීඝ්‍ර සහ අඛණ්ඩ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.

**2.5.6** අනවශ්‍ය ප්‍රමාදයන් හෝ බාධාවන් හෝ අවහිරතාවයන්ගෙන් තොරව විශ්වාසදායක සහ කාර්යක්ෂම සේවාවන් සැපයීමේ තම වගකීම ඉටු කිරීමට ක්‍රියාකරුවන්ට හැකිකම ඇති බවට නිසැක කිරීම.

**2.5.7** විදුලි සංදේශ සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර ගැන නව තාක්ෂණික ක්‍රම පිළිබඳව පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ඒ නව තාක්ෂණික ක්‍රම වැඩිදියුණු කිරීම සහ ඒ ක්‍රම භාවිතා කිරීම

**2.5.8** ශ්‍රී ලංකාවෙන් පිටත සිය ව්‍යාපාරික ස්ථාන ඇති විදුලි සංදේශ සේවා බහුල වශයෙන් පාවිච්චිකරන්නන් ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාරික ස්ථාන පිහිටුවීම පිණිස දිරි ගැන්වීම.

**2.5.9** ජාත්‍යන්තර සංක්‍රාන්ති සේවා සඳහා ශ්‍රී ලංකාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම.

## 2.6 ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වගකීම

රජයේ ප්‍රධාන ආයතනයක් වන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ ජාතික නියාමන නියෝජිතායතනය වේ. කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වන්නේ නියාමන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, මහජන යහපත ආරක්ෂා කිරීම සහ වැඩි වන තරගකාරී වෙළෙඳපළේ අභියෝගවලට ප්‍රතිචාරීව විදුලි සංදේශ කර්මාන්තයේ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ සේවා නොසපයන නමුත් කාර්යක්ෂමව සහ ක්‍රමවත්ව විදුලි සංදේශ සේවා සැපයීමෙහිලා විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් දිරිගන්වයි. එමෙන් ම ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාල පහසුකම් විශ්වීය මට්ටමට වැඩි දියුණු කිරීම පිණිස සියලුම විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වලට සහාය වේ. කොමිෂන් සභාවේ ප්‍රධාන වගකීම් පහත දැක්වේ:

**2.6.1** පනතේ විධිවිධාන සහ බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගේ බලපත්‍රයේ කොන්දේසි බලාත්මක කිරීම.

**2.6.2** බලපත්‍රලාභී ක්‍රියාකරුවන් අතර සාධාරණ සහ තිරසාර තරගකාරීත්වයක් පවත්වා ගැනීමට දිරිගැන්වීම.

i. දුරකථන ක්‍රියාකාර සමාගම් මහජන යහපත සහ අරමුණු සපුරන බව නිශ්චය කිරීම සඳහා තරඟකාරීත්වය පිරික්සීම.
ii. ජාල හා සේවා අතර අන්තර් සම්බන්ධතාවය ඇති කිරීමට වගබලා ගැනීම.
iii. විවෘත ප්‍රවේශය, අවහිරතා නැති කිරීම සහ විනිවිද පෙනෙන බලපත්‍ර ක්‍රියාවලියක් සහිත පොදු නිති රාමුවක් සකස් කිරීම.

**2.6.3 මිල**

දුරකථන ක්‍රියාකාර සමාගම්වල සාධාරණ මිල, මිල දරාගත හැකි බව පිළිබඳව සහතික කිරීම.

**2.6.4 පාරිභෝගික ආරක්ෂාව**

මහජනතාව සහ පාරිභෝගිකයන් විසින් ඉදිරිපත් කරන පැමිණිලි පිළිබඳව විමර්ශන පැවැත්වීමේ දී මහජන සහභාගීත්වය සහ පොදුවේ සාකච්ඡා කිරීම දිරිගැන්වීම සහ මහජන සුරක්ෂිතතාවය ඇති කිරීම.

**2.6.5 සමාජ නියාමනය**

i. විශ්වීය ප්‍රවේශ/සේවා
ii. විශ්වීය ප්‍රවේශ/සේවා ග්‍රාමීය ප්‍රජාවට වැඩිහිටි ජනතාවට සහ විවිධ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට ලබාදීමට වග බලා ගැනීම.
iii. හදිසි අවස්ථාවන්ට සූදානමින් සිටීම.
iv. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට විදුලි සංදේශ සේවා සැපයීම.

**2.6.6** අඩු පහසුකම් සහ සීමිත සම්පත් නියාමනය කිරීම

i. වර්ණාවලි කළමනාකරණය
ii. අංකනය
iii. නිත්‍යානුකූල අවසරය ලබාදීම
iv. අවකාශ කොටස්
v. ජාත්‍යන්තර සම්බන්ධතා මධ්‍යස්ථානවලට ප්‍රවේශ වීම
vi. ප්‍රධාන ජාතික ජාලවලට ප්‍රවේශවීම

**2.6.7** ගුණාත්මක විදුලි සංදේශ සේවා පාරිභෝගික අවශ්‍යතාවයන් සපුරාලන සාධාරණ හා දරාගත හැකි පරිදි විදුලි සංදේශ සේවා සැපයීමට වගබලා ගැනීම.

**2.6.8** යහපාලනය ප්‍රවර්ධනය කිරීම : ස්වාභාවික යුක්තියේ මූලධර්ම පිළිපදිමින් කාලෝචිත තීරණ ලබා දීම, මහජන සහභාගිත්වය දිරිගැන්වීම හා විනිවිද පෙනෙන තීරණ ක්‍රියාවලියක් ඇති කිරීමට වගබලා ගැනීම.

**2.6.9** සාධාරණ සහ ඒකපාර්ශවීය නොවූ තීරණ ලබාදීමට වගබලා ගැනීම.

**2.6.10** සිවිල් සමාජය නවීන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයෙන් හෙබි දැනුවත් සමාජයක් බවට ගොඩනැංවීමට සහාය වීම.

**2.6.11** ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ අදාළ ජාත්‍යන්තර සංවිධාන විසින් විදුලි සංදේශ උපකරණ සහ තාක්ෂණික ප්‍රමිතීන් සම්බන්ධයෙන් පනවන නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම විදුලි සංදේශ ක්‍රියාකරුවන් හා එක්ව කටයුතු කිරීම.

## 2.7 ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන්:

ඉහත අරමුණු සාක්ෂාත් කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පහත සඳහන් නියාමන කාර්යයන් ඉටු කරයි.:

**2.7.1** බලපත්‍ර සඳහා අයදුම් කිරීමේ පටිපාටිය සහ බලපත්‍ර නිකුත් කිරීම.

**2.7.1.1** පනතේ 17 වන වගන්තියට යටතේ ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රය.

17 වන වගන්තිය අනුකූලව කොමිෂන් සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් දෙන ලද බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක නොකළ යුතුය. කෙසේ වුව ද පනතේ 20 වන වගන්තියේ බලපත්‍ර ආදියෙන් නිදහස් කිරීම සඳහන් කර ඇත.

**2.7.1.2** පනතේ 22 වන වගන්තිය යටතේ ගුවන් විදුලි සංඛ්‍යාත හා ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ පාවිච්චි කිරීම සඳහා බලපත්‍රය

තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ හැර යම් ගුවන් විදුලි සංඛ්‍යාතයක් හෝ යම් ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජලතීරයේ යම් කොටසක හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද යම් නැවක හෝ ගුවන් යානයක පාවිච්චි නොකළ යුතුයි.

**2.7.1.3** පනතේ 21 වන වගන්තිය යටතේ වෙළෙඳ බලපත්‍ර

පනතේ 21(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කළ බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් යම් විදුලි සංදේශ උපකරණයක් වෙළෙඳාමක් වශයෙන් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, පැවරීම, කුලියට දීම, බදු දීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අලුත්වැඩියා කිරීම සිදු නොකළ යුතුයි.

**2.7.2** අයක්‍රම නියාමනය කිරීම

**2.7.2.1** පනතේ 5 (ඹ) වගන්තියේ නියමයන් ප්‍රකාරව කොමිෂන් සභාවට ඇති බලතල අනුව අමාත්‍යවරයා විමසා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාකරුවන් විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සම්බන්ධයෙන් ක්‍රියාකරුවන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, අය ක්‍රම හෝ අය ක්‍රම තීරණය කිරීමේ ක්‍රම නිශ්චය කිරීම.

**2.7.2.2** පනතේ 5.5 (ආ) ප්‍රකාරව අන්තර්ජාල ගාස්තු අනුමත කිරීම/ නිශ්චය කිරීම

**2.7.3** විදුලි සංදේශ පනත (ඒ යටතේ වූ නීති සහ රීති ඇතුළත්ව) සහ බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගේ බලපත්‍රවල අනුකූලතාවය පිරික්සීම සහ සහතික කිරීම.

**2.7.4** ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නිසි ලෙස පාවිච්චි කිරීමට වගබලා ගැනීම මෙන් ම පිරික්සීම සහ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමනාකරණය කිරීම.

**2.7.5** පාරිභෝගික පැමිණිලි සහ විමර්ශන/පරීක්ෂණ පැවැත්වීමට ප්‍රතිචාර දැක්වීම.

පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරුවකු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවය පිළිබඳව විදුලි සංදේශ සේවයේ දායකයකු හෝ මහජනයා අතුරෙන් කෙනෙකු විසින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කරනු ලැබූ විට, අවශ්‍ය යයි කොමිෂන් සභාව සලකන විමර්ශනයක් කොමිෂන් සභාව පැවැත්විය හැකි අතර කාරණය අදාළ අවස්ථාගත කරුණු අනුව ගත යුතු ප්‍රතිකර්ම යෙදීමටද සැලැස්විය යුතුයි.

පනතේ 9 (2) වගන්තිය අනුව යම් විමර්ශනයක් පැවැත්වීමේ දී, ඒ පැමිණිල්ලට හේතු වූ නිමිත්ත හෝ කාරණය නිරවද්‍ය කිරීම සඳහා යයි කොමිෂන් සභාව සලකන විමර්ශනයක් කොමිෂන් සභාව විසින් පැවැත්විය හැකි අතර කාරණයට අදාළ අවස්ථාගත කරුණු අනුව ගත යුතු ප්‍රතිකර්ම යෙදීමට ද කොමිෂන් සභාව විසින් සැලැස්විය යුතුයි.

**2.7.6** විදුලි සංදේශ සේවාවල ගුණාත්මකභාවය සහ විවිධත්වය සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු සැපයීම සහ මහජන ක්‍රියාවලීන් සහ ප්‍රසිද්ධ විභාග පැවැත්වීමේ දී ඔවුන්ගේ සහභාගීත්වය දිරිගැන්වීම.

**2.7.7** විදුලි සංදේශ ක්ෂේත්‍රයට සම්බන්ධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ/ජාත්‍යන්තර සහ විදේශීය ආයතනවල කටයුතුවල දී ශ්‍රී ලංකා රජය නියෝජනය කිරීම.

**2.7.8** කොමිෂන් සභාව විසින් නියෝග, උපදෙස් හා තීරණ නිකුත් කිරීම සහ එහි දී විනිවිද පෙනෙන ක්‍රියාවලියක් අනුගමනය කිරීම, ප්‍රසිද්ධ විභාග සහ සෙසු සමුළුවලට සහභාගීවීමේ දී විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ක්‍රියාකරුවන්ට, පාරිභෝගිකයන්ට සහ වෙනත් ඒ සම්බන්ධ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට වැඩි අවස්ථාවක් ලබා දීම.

**2.7.9** විදුලි සංදේශ උපකරණ සහ මාදිලි අනුමැතිය සඳහා තාක්ෂණික ප්‍රමිතීන් සඳහන් කිරීම.

ඉහත සඳහන් කාර්යයන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විවිධ අංශ/ඒකක මගින් ඉටු කරන ලදී. 2010 වසරේ කොමිෂන් 'සභාවේ විවිධ අංශ/ඒකකවල කාර්යයන් සහ ඒවායේ කාර්යසාධනය මතු දැක්වේ. ඇතැම් ක්‍රියාකාරකම/ක්‍රියාකාරකම් කිසියම් අංශයක්/ඒකකයක් යටතේ සඳහන් කර ඇතත් එම ක්‍රියාකාරකම/ක්‍රියාකාරකම් අදාල අංශය/ඒකකය මගින් ඉටු කරනු ලැබ ඇත්තේ අනෙකුත් අංශ/ ඒකකවල සහාය ඇතිව බව විශේෂයෙන් සඳහන් කළ යුතුයි.

# ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා අංශය

3 පරිච්ඡේදය

ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා අංශය ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා වශයෙන් ඒකක දෙකකින් සමන්විත වන අතර ඒ මඟින් පහත කාර්යයන් සිදු කරයි:

## 3.1 කාර්යයන්

1. ප්‍රතිපත්ති ඒකකය

- විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත කරුණු පිළිබඳව ප්‍රතිපත්තිමය උපදෙස් ලබාදීම.
- විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනවල සහයෝගිත්වය ඇතිව පර්යේෂණ අධ්‍යයන සිදු කිරීම.
- ව්‍යාපෘති.

## 2. ජාත්‍යන්තර සම්බන්ධතා අංශය

- විවිධ ජාත්‍යන්තර සංවිධානවලදී කොමිෂන් සභාවේ සහභාගිත්වය සම්බන්ධීකරණය කිරීම. (නිදා: ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT), කලාපීය සහයෝගිත්වය පිළිබඳව දකුණු ආසියානු සංගමය (SAARC)
- ජාත්‍යන්තර සංවිධාන මගින් කොමිෂන් සභාව වෙත ලැබෙන තොරතුරු බෙදාහැරීම.
- ශ්‍රී ලංකාව සාමාජිකත්වය දරන ජාත්‍යන්තර සංවිධානවලට අවශ්‍ය කරන පරිදි ශ්‍රී ලංකාව තුළ හා කොමිෂන් සභාව තුළ ඒකරාශී වන තොරතුරු සම්බන්ධීකරණය කිරීම.
- ජාත්‍යන්තර සංවිධානවලට අවශ්‍ය තොරතුරු සැපයීම.

## 3.2 කාර්ය සාධනය

### 3.2.1. විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධන

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ එක් කාර්යයක් වනුයේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනවල විදුලි සංදේශ කටයුතු ආශ්‍රිත පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකරුවන්ගේ සහයෝගයෙන් හෝ අන්‍යාකාරයෙන් ප්‍රවර්ධනය කිරීම වේ.

වැඩසටහනේ පරමාර්ථය වන්නේ:

- විදුලි සංදේශ අංශයේ පර්යේෂණ අධ්‍යයන ප්‍රවර්ධනය කිරීම.
- විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳව පර්යේෂණ පැවැත්වීමට විශ්වවිද්‍යාල කාර්යමණ්ඩල සහ ශිෂ්‍යයන් දිරිගැන්වීම.
- විදුලි සංදේශ අංශය ඵලදායීව ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණවල සොයා ගැනීම් භාවිතා කිරීම.

ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්බන්ධතා අංශය විශ්වවිද්‍යාල විසින් ඉදිරිපත් කළ පර්යේෂණ යෝජනා ඇගයීමට ලක්කර 2011\12 වසර සඳහා ඉන් පර්යේෂණ අධ්‍යයන 3ක් තෝරා ගන්නා ලදී.






අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වැඩසටහන සමාරම්භ කිරීම.

1. ගෙගාහර්ට්ස් 8 දක්වා සූක්ෂ්ම තරංග මැනීම සඳහා අඩු පිරිවැය මැණුම් සැළැස්මක් සංවර්ධනය කිරීම
   *-ආචාර්ය ඒ.යූ.ඒ.ඩබ්. ගුණවර්ධන,*
   *පේරාදෙණිය විශ්වවිද්‍යාලය.*

2. සංඥා භාෂා අර්ථ විනයාසකය
   *-ආචාර්ය එන්.ඩී.ජයසුන්දර*
   *රුහුණු විශ්වවිද්‍යාලය.*

3. කුඩා පරිමාණ ගුවන් විදුලි සංඛ්‍යාත රැස් කිරීමේ ඒකකය
   *-ආචාර්ය කේ. පිරපහරන්*
   *රුහුණු විශ්වවිද්‍යාලය.*

මූලික යෝජනා ඉදිරිපත් කිරීම 2011සැප්තැම්බර් මස 28 දින සිදු කරන ලදී. පර්යේෂකයන් විසින් පර්යේෂණ ක්‍රමවේදය විශ්ලේෂණ කිරීමේ ක්‍රමය, කාල රාමුව සහ පිරිවැය යනාදී කරුණු සිය පර්යේෂණ මාතෘකා පිළිබඳව ඉදිරිපත් කිරීම් කරන ලදී.

### 3.2.2. විශේෂ අවශ්‍යතා සහිත\අඩු ආදායම්ලාභී ප්‍රජාව සඳහා තොරතුරු සහ විදුලි සංදේශ සේවා - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව e-NABLE ව්‍යාපෘතිය 2010\2011

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා සැලසුම් කළ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නිපුණතා සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. 2010\2011 වසර සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපකරණ බෙදාහැරීම සනිටුහන් කිරීමේ උත්සවය 2011 ජූලි 09 දින පවත්වන ලදී. පරිගණක යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර අමතර කොටස්, මුද්‍රණ යන්ත්‍ර, සංයුක්ත තැටි පිටපත් කිරීමේ යන්ත්‍රය සහ බ්‍රේල් පත්‍රිකා ඇතුළු මිලියන 4.5 ක වටිනාකමකින් යුත් උපකරණ විශ්වවිද්‍යාල 01, පාසල් 39, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 04, රණවිරු ගම්මාන සහ රණවිරු සංසද 21 ක් සමන්විතව මධ්‍යස්ථාන 65ක් අතර බෙදා හරින ලදී.


පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය වීරක්කොඩි මහතා ප්‍රශංසාව පළ කිරීම


විශේෂ අවශ්‍යතා සහිත දරුවකු සිය අදහස් ප්‍රකාශ කිරීම

### 3.2.3 පාසල් සම්බන්ධිකරණ මගින් ප්‍රජාවට තොරතුරු තාක්ෂණය ලබාදීමේ ව්‍යාපෘතිය

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) 2011 මැයි මස 11 දින දකුණු පළාතේ අකුරැස්ස ප්‍රදේශයේ පාසල් 25ක් සම්බන්ධිකරණය කර ගෙන මෙම ව්‍යාපෘතිය සමාරම්භ කරන ලදී. පාසල සම්බන්ධීකරණය මගින් ප්‍රජාවට තොරතුරු තාක්ෂණය ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ මෙම පාසල් ප්‍රජා මධ්‍යස්ථාන සම්බන්ධීකරණය කිරීමේ

අරමුණින් පරිගණක, මුද්‍රණ යන්ත්‍ර මෙන් ම අන්තර්ජාල සම්බන්ධතා උපකරණ යනාදී තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපකරණ ලබා දෙන ලදී. මෙම ව්‍යාපෘතියෙන් ග්‍රාමීය සහ දුෂ්කර ප්‍රදේශ සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ව්‍යාප්ත කිරීම අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන හුදෙක් ගුරුවරුන්ට ශිෂ්‍යයන්ට පමණක් නොව රටේ අඩු ආදායම්ලාභි සහ වරප්‍රසාද නොලත් ප්‍රජාවට ප්‍රතිලාභ සලසයි. එමෙන්ම රාජ්‍ය සහ පෞද්ගලික - මහජන හවුල්කාරීත්වය තුළ (4P) නියමු විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් සහ රාජ්‍ය නොවන සංවිධාන (NGOs) හවුල්කරුවන් ලෙස මෙම ව්‍යාපෘතියට සම්බන්ධ වී ඇත. මෙම වැඩසටහන යටතේ ඉන්ටෙල් සමාගම ගුරුවරුන් වඩා ඵලදායි අධ්‍යාපනකයින් කිරීමට සහාය වීම පිණිස පුහුණු වැඩසටහනක් කරන ලදී. මෙම වැඩසටහන ගුරුවරුන්ගේ පාඩම් කටයුතු ආශ්‍රිතව තාක්ෂණය යොදා ගැනීම වැඩි දියුණු කිරීම, ශිෂ්‍යයන් අතර ප්‍රශ්න නිරාකරණය, විචාරාත්මක චින්තනය, සහ සහයෝගීත්ව නිපුණතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීම සිදුවේ. මොබිටෙල් පෞද්ගලික සමාගම සහ ඩයලොග් ඇක්සියටා සමාගම යන බලපත්‍රලාභී ක්‍රියාකාර සමාගම් දෙක විසින් පාසල් සඳහා සහනදායක මිල ගණන් යටතේ අන්තර්ජාල පහසුකම් සැපයීම සිදු කර ඇති තවත් දේශීය ආයතන දෙකක් විසින් පරිගණක, පුටු සහ මේස පරිත්‍යාග කර ඇත. පාසල සම්බන්ධීකරණය මගින් ප්‍රජාවට තොරතුරු තාක්ෂණය ලබාදීමේ ව්‍යාපෘති පසුගිය වසරේ දී සාර්ථකව අවසන් කිරීම නිසා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් ශ්‍රී ලංකාව 2012 වර්ෂය සඳහා ප්‍රතිලාභියෙකු ලෙස තෝරා ගෙන ඇත.





පාසල් සම්බන්ධීකරණය මගින් තොරතුරු තාක්ෂණය ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ පරිගණක බාරදීමේ උත්සවය

## 3.3 ජාත්‍යන්තර සම්බන්ධතා

### 3.3.1 ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය (WTISD) 2011

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 2011 මැයි මස 17 දින ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය සමරන ලදී. 2011 වසරේ ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනයේ තේමාව වූයේ තොරතුරු සහ සන්නිවේදනය තාක්ෂණය තුළින් ග්‍රාමීය ප්‍රජාවට වඩා හොඳ ජීවිතයක් යන්නයි. 2011 ලෝක විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ දිනය සැමරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සංවිධානය කළ සැමරුම් උත්සවයේ අරමුණ වූයේ ආර්ථිකමය හා සමාජයීය වශයෙන් මෙන් ම සන්නිවේදන

ක්ෂේත්‍රයේ ප්‍රතිලාභ ලබන්නන් හා නොලබන්නන් අතර පරතරය අවම කළ හැකි පරිදි අන්තර්ජාලය මෙන් ම වෙනත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන් භාවිත කිරීමේ අවස්ථා වැඩි දියුණු කිරීමට සහාය වීමයි.

ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය නිමිත්තෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කළ පණිවුඩයේ ප්‍රකාශ කර ඇත්තේ තොරතුරු තාක්ෂණයෙන් උසස් ග්‍රාමීය ජීවිතයක් යනුවෙන් 2011 වසර සඳහා තෝරා ගෙන තිබෙන තේමාව වඩා වැඩි ඉඩ ප්‍රස්තා සමඟ ග්‍රාමීය ප්‍රජාව බලාත්මක කිරීම සඳහා වූ රජයේ ප්‍රතිපත්තීන් අනුගමනය කරන අප රටට වඩාත් උචිත බවත් දිළිඳුකම තුරන් කිරීම, ආදායම් ඉපයීමේ හැකියාව ඉහළ දැමීම, වඩා හොඳ අධ්‍යාපනයක්, සෞඛ්‍යය සේවාවක් සහ ග්‍රාමීය ජනතාව අතර ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා අර්ථාන්විත පියවරක් ගැනීමට තොරතුරු තාක්ෂණයෙන් ලද හැකි පිටිවහල ඉමහත් බවත් ය.

### 3.3.2 පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ සභාපතිත්වයට යළිත් ශ්‍රී ලංකාව තේරී පත්වීම.

පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය යනු පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල විදුලි සංදේශ, තොරතුරු තාක්ෂණ හා ගුවන් විදුලි ප්‍රචාරණ කටයුතු මෙන් ම අන්තර්ජාල කටයුතු සම්බන්ධයෙන් දැනුම හුවමාරු කිරීම මෙන් ම විදුලි සංදේශ කටයුතුවල නියැළෙන ආයතනයකි. පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය පිළිබඳව උපදේශනාත්මක සේවා සපයමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාර්ශවකරුවන්ට සහාය වේ.

පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ මූලස්ථානය ලන්ඩනයේ පිහිටා ඇති අතර, පූර්ණ සහ ආංශික සාමාජිකත්වය දරන පොදු රාජ්‍ය මණ්ඩලීය සාමාජික රටවල් 50 කින් සමන්විත වේ.

ජනාධිපති ලේකම් හා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති ලලිත් වීරතුංග මහතා 2010 වසරේ කොළඹ දී පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ 50 වැනි සමුළුවේ දී සභාපතිත්වයට තේරී පත් විය. 2011 සැප්තැම්බර් 15-16 ස්පාඤ්ඤයේ ට්‍රිනිඩෑඩ් හා ටොබැගෝහි දී පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ 51 වැනි සමුළුවේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් අනුෂ පැල්පිට මහතා එහි සභාපතිත්වයට තේරී පත් විය.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් අනුෂ පැල්පිට මහතා එහි දී ප්‍රකාශ කළේ ශ්‍රී ලංකාව පිළිබඳව විශ්වාසය තබා තවත් වසරක කාලයක් සඳහා සභාපතිත්වය පිරිනැමීම සම්බන්ධයෙන් සිය ස්තුතිය පිරිනමන බවයි. පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ කටයුතු තව තවත් ශක්තිමත් කරමින් එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපරිමයෙන් ක්‍රියා කරන බවත්, නව ප්‍රධාන විධායක නිලධාරි මහාචාර්ය ටිම් අන්වින් සමඟ සමීපව ක්‍රියා කරමින් පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය වැඩිදියුණු කිරීමේ දර්ශනය පෙරදැරිව ඵලදායි සැලසුම් රැසක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බවත් ඔහු එහි දී ප්‍රකාශ කළේ ය. පොදුරාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය ගෝලීය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ ප්‍රමුඛයෙකු

බවට පත් කිරීමට සාර්ථකව මග පෙන්වමින් සිය දැඩි පරිශ්‍රමය දැක් වූ හිටපු ප්‍රධාන විධායක නිලධාරි ආචාර්ය එක්වොව් ස්ප්‍රියෝග්‍රාබ් වෙත ඔහු මෙහි දී සිය ස්තුතිය පළ කළේ ය.



ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් අනුෂ පැල්පිට මහතා සමඟ පොදු රාජ්‍ය මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරි මහාචාර්ය ටිම් අන්වින්.

### 3.3.3 දායකත්වය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT), පොදුරාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය (CTO), වැනි ජාත්‍යන්තර සංවිධාන ගණනාවක් වෙනුවෙන් ශ්‍රී ලංකා රජය නියෝජනය කරයි. සාමාජිකත්වය ආරක්ෂා කිරීම සඳහා දායක මුදල් වාර්ෂික පදනමක් මත ගෙවනු ලැබේ. සමාලෝචන වර්ෂය තුළ 3.1 වගුවේ දක්වා ඇති පරිදි රුපියල් මිලියන 29.7ක් ආයතන සඳහා දායක මුදල් වශයෙන් ගෙවා ඇති අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අදාළ ආයතනවල සාමාජිකයකු වශයෙන් අදාළ ක්‍රියාකාරකම් වලදී ඵලදායි ලෙස සහභාගි වී ඇත.

**3.4.4.** ශ්‍රී ලංකා කොරියා තොරතුරු තාක්ෂණ ස්වේඡා වැඩසටහනට තෝරා ගත් කණ්ඩායම් සඳහා (ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යමණ්ඩල සාමාජිකයන් සහ විශේෂ පාසල්, තෝරාගත් පාසල්වල තොරතුරු තාක්ෂණ උපදේශකයන් සහ තොරතුරු තාක්ෂණ ගුරුවරු) උසස් තොරතුරු තාක්ෂණ දැනුම බෙදා දීමේ අරමුණින් තොරතුරු තාක්ෂණ (IT) දැනුමැති කොරියානු ස්වේච්ඡා කණ්ඩායමක් ශ්‍රී ලංකාවට පැමිණෙන ලදී. මෙම පුහුණුව සඳහා පුද්ගලයන් 50 දෙනෙකු තෝරා ගැණිනි. දකුණු කොරියානු රජය විසින් උසස් තොරතුරු තාක්ෂණ දැනුම සැපයීම පිණිස පුද්ගලයන් 150 දෙනෙකුගෙන් සමන්විත විශාල කණ්ඩායමක් ග්‍රීෂ්ම ඍතුවේ වාර්ෂිකව සංවර්ධනය වෙමින් පවතින රටවලට යවනු ලැබේ. කොරියා තොරතුරු තාක්ෂණ ස්වේච්ඡා (KIV)

**දායක මුදල් ගෙවීම** (3.1 වගුව)

| ආයතනය | දායක මුදල - ශ්‍රී ලංකා රුපියල්වලින් |
|---|---|
| ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය | 19,671,086 |
| ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය | 1,398,844 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය | |
| දායක මුදල | 3,613,539 |
| විශේෂ පරිත්‍යාග | 4,516,021 |
| ප්‍රධාන විධායක නිලධාරියකු බඳවා ගැනීම | 545,098 |
| එකතුව | 29,744,588 |

වැඩසටහන සඳහා කොරියා රාජ්‍ය පරිපාලන සහ ආරක්ෂක අමාත්‍යාංශය විසින් අනුග්‍රාහකත්වය දක්වන අතර 2001 වසරේ සිට එම වැඩසටහන කොරියාවේ ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය විසින් කළමනාකරණය කරයි. දකුණු කොරියාවේ Arirang කණ්ඩායම යනුවෙන්හඳුන්වනකොරියාතොරතුරු තාක්ෂණ සාමාජිකයන් මහාචාර්ය ෂිම් වොන් බෝ සහ ශිෂ්‍යයන් චෝයි සිඔක් හවාන්, කිම් හැන්ග් වොන් (චුන්ග් වොන්ග් විශ්වවිද්‍යාලය) කිවැක් වෝ ජන්ග් (විදේශ අධ්‍යයනය පිළිබඳ හැන්කක් විශ්වවිද්‍යාලය) සමන්විත වේ. එම විෂය මාලාවට Photoshop, Visual Basic, C-Language සහ PHP ඇතුළු කොරියානු සංස්කෘතිය පිළිබඳ විවිධ ලක්ෂණ හඳුන්වාදීම ඇතුළත්ය.

මෙම කණ්ඩායමේ නායකයා වන මහාචාර්ය ෂිම් වොන් බෝ ප්‍රකාශ කළේ විවිධ රටවල් අතර පවත්නා තොරතුරු තාක්ෂණයේ පරතරය අවම කිරීමට ඔහුට අවශ්‍ය බවයි. ඔවුන්ගේ අරමුණ වන්නේ දකුණු කොරියාව විසින් විද්‍යුත් - රාජ්‍යය වැඩි දියුණු කිරීමෙහිලා ලබා ගෙන ඇති අත්දැකීම් සහ උසස් තොරතුරු තාක්ෂණ දැනුම ශ්‍රී ලංකාව ඇතුළු ලොව සෙසු රටවල්වලට ලබා දීමයි. එමෙන්ම මෙම තොරතුරු තාක්ෂණ ස්වේච්ඡා ක්‍රියාකාරකම් මගින් කොරියානු සංස්කෘතිය පිළිබඳව හඳුන්වා දීම ද සිදු කරනු ඇත. වැඩිදුරටත් පන්ති කාමරය තුළ සහභාගි වන්නන් සමඟ අන්‍යෝන්‍යව ක්‍රියා කිරීමෙන් සහ ප්‍රසිද්ධ ඓතිහාසික ස්ථාන සහ මනස්කාන්ත ප්‍රදේශ නැරඹීමෙන් ශ්‍රී ලාංකීය සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම ද සිදු කරනු ලැබේ.



ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් කොරියානු ස්වේච්ඡා කණ්ඩායම සමඟ සාකච්ඡාවක නිරත වීම.




පුහුණු සැසිය ආරම්භ කිරීම.

### 3.3.5. දකුණ ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ සංගමය (SATRC) අධ්‍යයන කණ්ඩායම.

දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ සංගමයේ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ දෙවන අධ්‍යයන කණ්ඩායම් රැස්වීම දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ සාමාජික රටවල සහභාගිත්වය ඇතිව 2011 දෙසැම්බර් 12 සහ 13 දිනවල පවත්වන ලදී. ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, ඉරාන මුස්ලිම් සමූහාණ්ඩුව, මාලදිවයින, නේපාලය, පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව යන රටවල නිලධාරීන් මෙම රැස්වීමට සහභාගි විය. කලාපයේ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කිරීම පිණිස 2010 - 2011 ක්‍රියාකාරී සැලැස්මේ 111 අදියර ක්‍රියාත්මක කිරීම පිණිස 2009 නොවැම්බර් 24-26 දිනවල ශ්‍රී ලංකාවේ කොළඹ දී පවත්වන ලද 11 වන දකුණු ආසියානු

විදුලි සංදේශ නියාමකයන්ගේ රැස්වීමේ දී ගත් තීරණවලට අනුකූලව ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ අධ්‍යයන කණ්ඩායම ස්ථාපනය කර ඇත. දෙවන අධ්‍යයන කණ්ඩායම් රැස්වීමේ දී දිගු කාලීන විකාශනය (LTE), Tampere සම්මුතිය අනුව හදිසි ආපදා අවස්ථාවලදී විදුලි සංදේශනය, හදිසි ආපද විදුලි සංදේශනය - මහජන ආරක්ෂණ හදිසි සහන (PPDR) සඳහා සංකලන සංඛ්‍යාත පරාස හඳුනා ගැනීම, සංජානනීය ගුවන් විදුලිය භාවිතා කරමින් ගතික ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමනාකරණය කිරීම. ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය බෙදා වෙන් කර දීම සහ අලෙවි කිරීම, ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය මිලකරණය සහ අනාගත කාර්යයන් පිළිබඳ යෝජනා සාකච්ඡා කරන ලදී.



අධ්‍යයන කණ්ඩායම් සඳහා සහභාගිවූවන්

### 3.3.6 විදේශ නියෝජිතයන් පැමිණීම සම්බන්ධීකරණය කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා අංශය විසින් පුහුණු වැඩසටහන්, වැඩමුළු යනාදී විදුලි සංදේශනය පිළිබඳ ක්‍රියාකාරකම් සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශ නියෝජිතයන් සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලැබේ.

## 3.4 කාර්ය මණ්ඩලය

2011 වසරේ දී ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා අංශයේ කාර්යයන් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු (1), සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු (2) සංවර්ධන සහකාර නිලධාරීන් තිදෙනෙකු (3) සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩල සේවකයකු (1) ඇතුළු කාර්ය මණ්ඩල සාමාජිකයන් හත් දෙනෙකු (7) විසින් සිදු කරන ලදී

# ආර්ථික කටයුතු අංශය

4 පරිච්ඡේදය

ආර්ථික කටයුතු අංශය තරඟකාරීත්වය සහ අනුකූලතා වශයෙන් උප අංශ දෙකකින් සමන්විත වන අතර මෙම උප අංශ දෙකේ කාර්යයන් සහ ඒ මගින් 2011 වසරේ ඉටු කරනු ලැබූ ක්‍රියාකාරකම් පහත දැක්වේ:

## 4.1 තරඟකාරීත්ව උප අංශයේ කාර්යයන්:

- පිරිවැය පාදක අයක්‍රම නියාමනය තුළින් පිරිවැය අධ්‍යයනය සහිත අයක්‍රම විශ්ලේෂණය සිදු කිරීම සහ අනුමැතිය සඳහා නව අයක්‍රම යෝජනා පරීක්ෂා කිරීම.
- බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම්වල මූල්‍යය සහ මෙහෙයුම් කාර්යය සාධනය විශ්ලේෂණය කිරීම තුළින් නව ප්‍රවණතා පිරික්සීම.

- ආර්ථික ආංශික විශ්ලේෂණය සිදු කිරීම.
- අන්තර්සම්බන්ධතාවය සහ අන්තර් මෙහෙයුම් අන්තර් සම්බන්ධිය විධිවිධාන පිළිබඳව වාණිජමය කොන්දේසි විශ්ලේෂණය කිරීම.
- කාලානුරූපව බලපත්‍ර සහ සෙස් ගාස්තු රැස්කිරීමට වගබලා ගැනීම.
- ග්‍රාමීය ප්‍රදේශවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ වැඩසටහන් කොමිෂන් සභාවට නිර්දේශ කිරීම.
- ග්‍රාමීය විදුලි සංදේශ සේවා කඩිනම් කිරීම පිණිස ආර්ථිකමය දිරිගැන්වීම් සඳහා යෝජනා සකස් කිරීම.
- සංඛ්‍යාන තොරතුරු රැස්කිරීම සහ විශ්ලේෂණය කිරීම.
- ආංශික විශ්ලේෂණය තුළින් ආංශික කාර්ය සාධනය පිරික්සීම.
- විදුලි සංදේශ කර්මාන්ත මගින් රජයට ලැබිය යුතු බදු (විදුලි සංදේශ බද්ද, ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද) එකතු කිරීම අධීක්ෂණය කිරීම.

## 4.2 කාර්ය සාධනය

### 4.2.1 අයකුම නියාමනය කිරීම

විදුලි සංදේශ පනතේ 5 (ඇ) ප්‍රකාරව, පොදු විදුලි සංදේශ සේවා සැපයීම පිළිබඳ අයකුම, මිල, සහනාධාර, සහ නිත්‍යානුකූල ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රතිපත්ති ඇතුළු විදුලි සංදේශ අංශය ආශ්‍රිත කරුණු පිළිබඳ රජයට උපදෙස්දීම කොමිෂන් සභාවේ කාර්ය භාරය වේ.

#### 4.2.1.1 පාදස්ථ මිල සංශෝධනය කිරීම

විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් විසින් සිය සේවා සඳහා අය කරනු ලැබිය හැකි අවම මිල පාදස්ථ මිල වන අතර දුරකථන සමාගම් විසින් කොමිෂන් සභාව විසින් නිශ්චය කරන පාදස්ථ මිලට පහළින් මිල ගණන් භාවිතා නොකළ යුතුය. එකම ජාලය (On-net) සහ ජාල අතර (Off net) හඬ ඇමතුම් සහ කෙටි පණිවුඩ සේවා (SMS) සඳහා පාදස්ථ මිල වෙන් වෙන් වශයෙන් නිශ්චය කර ඇත. එකම ජාලයකින් ආරම්භ කරන සහ අවසන් කරන ඇමතුම් හෝ පණිවුඩ On- net යනුවෙන් හඳුන්වන අතර එක් ජාලයකින් ආරම්භ කර වෙනත් ජාල මගින් අවසන් කරන ඇමතුම් හෝ පණිවුඩ Off net යනුවෙන් හැඳින්වේ.

හඬ ඇමතුම් සහ කෙටි පණිවුඩ සේවා සඳහා පාදස්ථ මිල 2010 - 2011 (4.1 වගුව)

| විෂයය | ජාල අතර (Off net) | | එකම ජාලය (On net) | |
|---|---|---|---|---|
| | 2010 | 2011 | 2010 | 2011 |
| මිනිත්තුව පාදක හඬ ඇමතුම් (මිනිත්තුවකට රු.) | 2.00 | 1.50 | 1.00 | 1.00 |
| තත්පරය පාදක හඬ ඇමතුම් (මිනිත්තුවකට රු.) | 2.50 | 2.00 | 1.25 | 1.25 |
| කෙටි පණිවුඩ සේවා (මිනිත්තුවකට රු.) | 0.25 | 0.25 | 0.10. | 0.10 |

කොමිෂන් සභාව විසින් 2011 ජූලි මස 15 දින සිට බලපවත්වන පරිදි ජාල අතර ඇමතුම් (Off net voice call) සඳහා වන පාදස්ථ මිල ශත 50කින් සංශෝධනය කර ඇති අතර එකම ජාල අතර හඬ ඇමතුම් (On net voice call) සඳහා මිල නොවෙනස්ව පවතී. එකම ජාල සහ ජාල අතර කෙටි පණිවුඩ සේවා සඳහා පාදස්ථ මිල සංශෝධනය කර නොමැත. දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් සංශෝධිත පාදස්ථ මිල පිළිබඳ අයක්‍රම යෝජනා ඉදිරිපත් කිරීමේ දී ඒවා බාහිර

#### 4.2.1.2 ජංගම අයක්‍රම ප්‍රවණතා

2004 සිට 2011 වසර දක්වා එකම ජාලය සහ ජාල අතර මිනිත්තුව පාදක කර ගත් හඬ ඇමතුම් අයක්‍රම ප්‍රවණතා 4.1 ප්‍රස්ථාරයේ දැක් වේ. 4.1 ප්‍රස්ථාරය හා 4.1 වගුවේ සංඛ්‍යා සංසන්දනය කිරීමේ දී 2011 වසරේ දී වෙළෙඳපළේ මිනිත්තුව පාදක ජංගම ජාල අතර සහ වෙනත් ජාල අතර හඬ ඇමතුම් ගාස්තුව අනුරූප පාදස්ථ මිලට වඩා ශත 50 කින් වැඩි විය.

### 4.2.2 බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම්වල මෙහෙයුම් සහ මූල්‍යය කාර්ය සාධනය

**ජංගම අයක්‍රම ප්‍රවනතා** (ප්‍රස්ථාර 4.1)




විගණකවරයකු විසින් සහතික කර පිරිවැය සාධාරණය කිරීම් සහිතව ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. කෙසේ වුව ද 2011 වසර තුළ සංශෝධිත පාදස්ථ මිල ප්‍රකාරව යෝජිත අයක්‍රම කිසිම දුරකථන ක්‍රියාකාර සමාගමක් විසින් ඉදිරිපත් කර නොමැත.

#### 4.2.2.1 මෙහෙයුම් කාර්යසාධනය

2011 වර්ෂය අවසාන වන විට මුළු ග්‍රාහක සංඛ්‍යාව (ස්ථාවර සහ ජංගම) මිලියන 21.9ක් වූ අතර එය 2010 වර්ෂය හා සළකා බැලීමේ දී සියයට 5.4 වැඩිවීමකි. 2010 සහ 2011 වර්ෂවල ස්ථාවර දුරකථන ග්‍රාහක සංඛ්‍යාව පිළිවෙලින් 3,534,575

සහ 3,608,392 වූ අතර එය මෙම කාල පරිච්ඡේදය තුළ සියයට 2.1 සුළු වර්ධනයක් පෙන්වයි. එම කාලපරිච්ඡේදය තුළ සියයට 6.1 වර්ධනයක් පෙන්වන ජංගම දුරකථන ග්‍රාහක සංඛ්‍යාව 2010 වසරේ දී 17,267,407 සිට 2011 වසරේ 18,319,447 දක්වා වැඩි විය.

2010 වසරේ දී සමස්ත අධිවේගී අන්තර්ජාල සේවා (Broadband) ග්‍රාහක සංඛ්‍යාව 444,487 වූ අතර එයින් ජංගම අධිවේගී අන්තර්ජාල සේවා ග්‍රාහක සංඛ්‍යාව 209,946ක් විය. ඉතිරි 233,541 ස්ථාවර අධිවේගී අන්තර්ජාල ග්‍රාහකයන් ය. 2011 වසරේ දී අනුරූප අගයන් පිළිවෙලින් 782,956, 485,165 සහ 297,791 විය. ඒ අනුව 2010 සහ 2011 වර්ෂවල රටේ සමස්ත ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස අධිවේගී අන්තර්ජාල භාවිත කරන්නන්ගේ සංඛ්‍යාව 2010 වසරේ සියයට 2.1ක් වූ අතර 2011 වසරේ සියයට 3.8 දක්වා වැඩි විය.

### (ආ) දියුණු සහ නොදියුණු ප්‍රදේශවල දුරකථන ජාල ව්‍යාප්ත කිරීම සඳහා අරමුදල් යෙදවීම

ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා අංශ ලිහිල්කරණයත් සමඟ දියුණු සහ නොදියුණු ප්‍රදේශවල පොදු ස්විචීකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකාර සමාගම්වල සිය ජාල සහ සේවා ව්‍යාප්ත කිරීම සඳහා රජය විශේෂ යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ඇත. පොදු ස්විචීකරණ දුරකථන ජාල ක්‍රියාකාර සමාගම් යටතේ වාර්තා කරන ලද සහ එකතු කරන ලද ජාත්‍යන්තර ලැබෙන ඇමතුම් මත පනවන ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්දෙන් කොටසක් ඔවුන් විසින් සිදු කරන දියුණු සහ නොදියුණු ප්‍රදේශවල විදුලි සංදේශ යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාකාරකම් වෙනුවෙන් යෙදවීම පිණිස ලබා දී ඇත. කොමිෂන් සභාව දියුණු සහ නොදියුණු ප්‍රදේශ යනුවෙන් අර්ථ නිරූපණය කරන ප්‍රදේශවල ආයෝජනය කිරීම සඳහා

**දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් කරන ලද ආයෝජන, 2010 - 2011** (4.2 වගුව)

| වර්ෂය | ආයෝජනය (රු. මිලියන) | | එකතුව |
|---|---|---|---|
| | ස්ථාවර ක්‍රියාකරුවන් | ජංගම ක්‍රියාකරුවන් | (රු.මිලියන) |
| 2010 | 15,989 | 17,946 | 33,935 |
| 2011 | 22,413 | 28,281 | 50,694 |

සටහන : දේපල පිරියත සහ උපකරණ ඇතුළත්ව කරන ලද ආයෝජන)

### 4.2.2.2 මූල්‍යය කාර්ය සාධනය

#### අ) ආයෝජන

4.2 වගුව මගින් 2010 සහ 2011 වර්ෂවල දී ස්ථාවර අංශයට වඩා ජංගම අංශයේ සිදු කළ ආයෝජන වැඩි බව පැහැදිලි වේ. මුළු ආයෝජනවල ප්‍රතිශතයක් ලෙස ජංගම අංශයේ කළ ආයෝජනය 2010 වසරේ සියයට 52.9 වූ අතර 2011 වසරේ සියයට 55.8 දක්වා වැඩි විය.

වසර තුනක කාලපරිච්ඡේදයක් තුළ වාර්තාගත විදුලි සංදේශ සංවර්ධන ගාස්තුවෙන් (TDC) 2/3ක් සඳහා හිමිකම් කීමට විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වලට අවසර ලැබේ.

ඒ අනුව 2003 - 2008 කාලපරිච්ඡේදය තුළ පොදු ස්විචීකරණ දුරකථන ජාල ක්‍රියාකරුවන්ගේ සෙලියුලර් ජංගම සේවා සහ ස්ථාවර ප්‍රවේශ (රැහැන් රහිත) සේවාවල කුලුනු 909ක් ඉදිකිරීම

සඳහා රුපියල් මිලියන 3,457ක මුදලක් ලබා දී ඇත. 2008/2009 වර්ෂවල ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පොදු ස්විචීකරණ දුරකථන ජාල ක්‍රියාකරුවන්ගේ සෙලියුලර් ජංගම සේවා සහ ස්ථාවර (රැහැන් රහිත) සේවා සඳහා රුපියල් මිලියන 2,563ක මුදලක් සහ ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම්වල නව දුරකථන සම්බන්ධතා 71,118 සඳහා රුපියල් මිලියන 177ක් වැය කරමින් එම කාර්යයන් අවසන් කිරීමට ක්‍රියා කර ඇත. 2011 වර්ෂයේ දී මේ සඳහා වැය කරන ලද මුළු වියදම රුපියල් මිලියන 1,104 ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම් සඳහා වියදම් කර ඇත. 2010 ජූලි මාසයේ දී මෙම අරමුදල් ලබා දීමේ යෝජනා ක්‍රමය වෙනස් කර ඇති නමුත් දුරකථන ක්‍රියාකාර සමාගම්වලට සිය හිමිකම් ඉදිරිපත් කිරීම පිණිස වසර තුනක

කාලපරිච්ඡේදයේ දී ජංගම දුරකථන කර්මාන්තයෙන් ලද ආදායම සියයට 15.8 දක්වා වැඩි විය. මෙම කාලපරිච්ඡේදය තුළ අංශ දෙකෙන්ම ලද සමස්ත ආදායම සියයට 8.7 දක්වා වැඩි වී ඇත. 2010 වසරේ දී ස්ථාවර දුරකථන සහ ජංගම දුරකථන මගින් සමස්ත ආදායමේ දායකත්වය පිළිවෙළින් සියයට 39 සහ සියයට 61ක් විය. 2011 වර්ෂයේ

සමස්ථ ආදායම සඳහා දායකත්ව ප්‍රතිශතය (ප්‍රස්ථාර 4.2)




ස්ථාවර සහ ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම්වල ආදායම, 2010- 2011 (4.3 වගුව)

| වර්ෂය | ආයෝජනය (රු. මිලියන) ස්ථාවර ක්‍රියාකරුවන් | ජංගම ක්‍රියාකරුවන් | එකතුව (රු.මිලියන) |
|---|---|---|---|
| 2010 | 45,299 | 72,159 | 117,458 |
| 2011 | 44,108 | 83,529 | 127,637 |

කාලපරිච්ඡේදයක් පවත්නා බැවින් අරමුදල් වියදම් කිරීම 2013 වසර දක්වා අඛණ්ඩව පවතිනු ඇත.

### ඇ) ආදායම

2010 සහ 2011 වර්ෂයේ ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම් සහ ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම්වල ආදායම 4.3 වගුවේ දැක් වේ.

2010 සිට 2011 වසර වන විට ස්ථාවර දුරකථන කර්මාන්තයේ ආදායම සියයට 2.6කින් අඩු වූ අතර එම අනුරූප අගයන් පිළිවෙළින් සියයට 35 සහ සියයට 65ක් විය. (4.2 ප්‍රස්ථාරය) එබැවින් ජංගම දුරකථන කර්මාන්තය මෙම වසර දෙකේදීම සමස්ත ආදායමෙන් සියයට 60 කට නොවැඩි දායකත්වයක් ලබා දී ඇත.

### ඈ) කර්මාන්තයේ ශුද්ධ ලාභය / පාඩුව

2010 වසරේ දි ස්ථාවර දුරකථන ක්‍රියාකරුවන්ගේ ශුද්ධ ලාභය රුපියල් මිලියන 181ක් වූ අතර 2011 වසරේ දී එය රුපියල් මිලියන 1298 දක්වා වැඩි විය. ඒ අනුව

2011 වසරේ දී ස්ථාවර දුරකථනවල ලාභයේ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කර ඇත. ජංගම දුරකථන අංශය සැලකීමේ දී 2010 වසරේ දී මෙන් ම 2011 වසරේදී ද ක්‍රියාකරුවන්ට පාඩු සිදු වී තිබේ. අනුරූප අගයන් පිළිවෙලින් රුපියල් මිලියන 3.652 සහ රුපියල් මිලියන 1.016 වන අතර 2010 සිට 2011 දක්වා කාලය තුළ කර්මාන්තයේ පාඩුව 72%කින් අඩු වී තිබේ. අංශ

- දුරකථන ක්‍රියාකාර සමාගම් සඳහා නිකුත් කරන ලද වි.සං.නි.කො.ස. විධිවිධාන, නියෝග සහ තීරණ අධීක්ෂණය කිරීම.
- සේවා තත්ත්ව අධීක්ෂණය කිරීම සහ ආර්ථික දිරිගැන්වීම් යෝජනා කිරීම.
- පාරිභෝගික සම්බන්ධතා කළමනාකාරණය කිරීම සහ

**ස්ථාවර සහ ජංගම දුරකථන කර්මාන්තයේ ශුද්ධ ලාභය/ පාඩුව 2009 - 2010** (4.4 වගුව)

| වර්ෂය | ශුද්ධ ලාභය/පාඩුව (රු. මිලියන) | | එකතුව |
|---|---|---|---|
| | ස්ථාවර | ජංගම | (රු.මිලියන) |
| 2010 | 181 | -3.652 | -3,471 |
| 2011 | 1298 | -1,016 | 282 |

දෙකෙහිම මුළු පාඩුව 2010 දී රුපියල් බිලියන 3.5ක් වූ අතර 2011 දී එය රුපියල් මිලියන 282ක ශුද්ධ ලාභයක් දක්වා වෙනස් වී ඇත. (4.4 වගුව)

## 4.3 අනුකූලතා උප අංශයේ කාර්යයන්:

- දුරකථන ක්‍රියාකාර සමාගම් අණ පනත්වලට සහ බලපත්‍රවලට අනුකූලව කටයුතු කරන්නේදැයි අධීක්ෂණය කිරීම.

පාරිභෝගික ආරක්ෂණය සුරක්ෂිත කිරීම.

- විදුලි සංදේශ කර්මාන්තයට අදාළ අධීක්ෂණ කටයුතු සිදු කිරීම

### 4.3.1. අනුකූලතා ගැටලු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම:

අනුකූලතා අංශය විසින් දුරකථන ක්‍රියාකාර සමාගම්වල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සිදු කරන අධීක්ෂණ

**2010 වසරේ දී ක්‍රියා මාර්ග ගන්නා ලද අනුකූලතා ගැටලු** (4.5 වගුව)

| ගැටලුව | උල්ලංඝනය/ අපගමනය | ගනු ලබන ක්‍රියාමාර්ගය |
|---|---|---|
| අයකුම පිළිබඳ අනුකූලතා ගැටලුව (37) | අදාළ දුරකථන ක්‍රියාකරුවන්ගේ පාදස්ථ මිල තීරණය සහ බලපත්‍ර කොන්දේසි | අනුමත නොකළ අයකුම ඉදිරිපත් කිරීම වළක්වමින් ලිපි නිකුත් කිරීම සහ ප්‍රවෘත්ති නිවේදන මගින් මහජනතාවට අනුමත නොකළ අයකුම සැලසුම් භාවිතා නොකරන ලෙස දැනුවත් කිරීම සහ උපදෙස් ලබා දීම. |
| අනුමත නොකළ පෞද්ගලික ස්වයංක්‍රීය ශාඛා හුවමාරුව (PABX) | විදුලි සංදේශ පනතේ 21(1) වගන්තිය | අනුමත නොකළ පෞද්ගලික ස්වයංක්‍රීය ශාඛා හුවමාරුව මිල දී නොගන්නා ලෙස උපදෙස් දෙමින් ජාතික පුවත්පත්වල නිවේදන ප්‍රසිද්ධ කිරීම. |

කටයුතු දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් සිදු කරන බලපත්‍ර කොන්දේසි සහ අණපනත් උල්ලංඝනය කිරීම/ අපගමනය අවම කිරීමෙහිලා හේතු වේ. 2011 වසරේ දී අනුකූලතා අංශය විසින් අයක්‍රම, ග්‍රාහක බදු සෙස් බදු සහ වෙළෙඳ බලපත්‍ර ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් කටයුතු කර ඇත. මෙම ගැටලු පිළිබඳ තොරතුරු 4.5 වගුවේ දැක් වේ.

### 4.3.2 පාරිභෝගික පැමිණිලි පිළිබඳ ක්‍රියාකිරීම

ශ්‍රී.ලං.ස.නි.කො. සභාවේ පාරිභෝගික සම්බන්ධතා අංශය දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් සපයන විදුලි සංදේශ සේවා සම්බන්ධයෙන් පරිභෝගිකයන්ගේ යහපත සඳහා ස්ථාපනය කර ඇත. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව ග්‍රාහකයකුට හෝ මහජනයා අතුරෙන් කෙනෙකුට විදුලි සංදේශ ක්‍රියාකරුවකු විසින් සපයන විදුලි සංදේශ සේවා සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිය. කොමිෂන් සභාව අවශ්‍යයැයි සලකන විමර්ශනයක් පැවැත්විය හැකි අතර කාරණයට අදාළ අවස්ථාගත කරුණු අනුව ගත යුතු ප්‍රතිකර්ම යෙදීමට ද සලස්වනු ලැබේ. පනතේ 9(1) වගන්තිය යටතේ යම් විමර්ශනයක් පැවැත්වීමේ දී ඒ පැමිණිල්ලට හේතු වූ නිමිත්ත හෝ කාරණය නිරවද්‍ය කිරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාවට පෙනී යන පියවර ගන්නා ලෙස කොමිෂන් සභාව විසින් ඒ ක්‍රියාකරුට විධාන කළ හැකි අතර උචිත අවස්ථාවල දී මුදල් සහන සලසන ලෙස ද විධාන කළ හැකි බව විදුලි සංදේශ පනතේ 9 (2) වගන්තියේ දක්වා ඇත.

පාරිභෝගික සම්බන්ධතා අංශය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආර්ථික කටයුතු අංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර බිල්පත් ආරාවුල්, දුරකථන ස්ථාපනය කිරීම ප්‍රමාදවීම, දෝෂ අලුත්වැඩියා කිරීම, දුරකථන සම්බන්ධතා දෝෂ, හිංසාකාරී ඇමතුම්, ජංගම දුරකථන නැතිවීම, ADSL, අන්තර්ජාල සහ අධිවේගී අන්තර්ජාල සේවා වැනි විවිධ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ පැමිණිලි භාර ගැනේ. මෙම ඒකකය විසින් පාරිභෝගිකයන්ගේ මෙන් ම සේවා සැපයුම්කරුවන්ගේ ආරක්ෂාව සහ තෘප්තිමත්භාවය නිසැක කිරීමෙහිලා

**පාරිභෝගික සම්බන්ධතා ඒකකය වෙත ලැබී ඇති පැමිණිලි - 2011** (4.6 වගුව)

| පැමිණිල්ලේ ස්වභාවය | පැමිණිලි සංඛ්‍යාව* | % |
|---|---|---|
| දුරකථන බිල්පත් (ස්ථාවර සහ ජංගම) | 480 | 3.2 |
| ස්ථාවර දුරකථන සම්බන්ධතා | 720 | 4.8 |
| හිංසාකාරී ඇමතුම් | 240 | 1.6 |
| අන්තර්ජාල පහසුකම් | 470 | 3.2 |
| ජංගම දුරකථන සම්බන්ධතා | 490 | 3.3 |
| වෙනත් | 310 | 2.1 |
| විවිධ අපරාධ පිළිබඳ පොලිස් විමර්ශන සඳහා සේවා සැපයුම්කරුවන්ගෙන් පාරිභෝගික තොරතුරු ලබා ගැනීම සඳහා මැදිහත් වීමට අවශ්‍ය පැමිණිලි | 384 | 2.6 |
| ජංගම දුරකථන නැතිවීම | 11,775 | 79.2 |
| එකතුව | 14,869 | 100 |

* තාවකාලික

පැමිණිලිකරුවන්ට කඩිනම් සහ කාර්යක්ෂම පිළියම් ලබා දීම පිණිස අදාළ සේවා සැපයුම්කරුවන්, නීති බලාත්මක කිරීමේ බලධාරීන්, සහ වෙනත් අදාළ ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලැබේ. එමෙන් ම පාරිභෝගික සම්බන්ධතා අංශය විසින් උසාවි නියෝග ප්‍රකාරව තොරතුරු සපයනු ලැබේ.

2011 වසරේ දී පාරිභෝගික සම්බන්ධතා අංශය වෙත ලැබුණු පැමිණිළි සංඛ්‍යාව පිළිබඳ තොරතුරු 4.6 වගුවේ දැක් වේ. සමස්ත පැමිණිලි සංඛ්‍යාවෙන් නැති වූ ජංගම දුරකථන පිළිබඳ පැමිණිලි සංඛ්‍යාව 3/4කට වඩා වැඩි බව 4.6 වගුවෙන් පෙන්වයි. ස්ථාවර දුරකථන සම්බන්ධතා පිළිබඳ පැමිණිලි සංඛ්‍යාව ආසන්න වශයෙන් 5%කි.

වූ දුරකථනය යම් වෙනත් අරමුණක් සඳහා භාවිතා කරන්නේ නම් හෝ දුරකථනය කොටස් කරන්නේ නම් එම දුරකථනය ස්ථානගතවීම නිශ්චය කිරීම අපහසු වන අතර මෙය නැති වූ ජංගම දුරකථන සෙවීමේ කාර්යයේ දී මුහුණපාන බරපතල ප්‍රශ්නයකි.

පරිභෝගික සම්බන්ධතා ඒකකයේ මැදිහත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් සේවා සැපයුම්කරුවන් ඔවුන්ගේ අංශයෙන් දුරකථන දෝෂ නිදොස් කිරීම පිණිස කඩිනම් පියවර ගෙන ඇති අතර, මෙමගින් පාරිභෝගිකයන්ට ප්‍රතිලාභ අත් වී ඇත. එමෙන් ම පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳව මනා දැනුවත්භාවයක් ලබා ගෙන ඇති අතර විදුලි සංදේශ කර්මාන්තය වඩා තරගකාරී වී ඇත.

**නැති වූ ජංගම දුරකථන පිළිබඳ පැමිණිලි - 2011** (4.7 වගුව)

| වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| නැති වූ ජංගම දුරකථනයේ වර්තමාන පරිහරණය කරන්නන් පිළිබඳ තොරතුරු අනාවරණය කරගත් පැමිණිලි | 1922 |
| නැති වූ ජංගම දුරකථන පිළිබඳ තොරතුරු අනාවරණය කර නොගත් පැමිණිලි | 6,082 |
| අවුල්සහගත බව, අපහැදිලිකම වැනි කරුණු නිසා අත්හැර දමන ලද පැමිණිලි | 876 |
| දුරකථන ක්‍රියාකරුවන් වෙත යොමු කරන ලද පැමිණිලි | 2,895 |
| එකතුව | 11,775 |

2011 වසරේ දී පාරිභෝගික සම්බන්ධතා අංශය කටයුතු කරන ලද නැති වූ ජංගම දුරකථන පැමිණිලි පිළිබඳ වර්ගීකරණයක් 4.7 වගුවේ දැක්වේ. ශ්‍රී.ල.වි.සං.නි.කො. සභාව වෙත ලැබුණු සමස්ත පැමිණිලි සංඛ්‍යාව අතුරෙන් නැති වූ ජංගම දුරකථන 1/6ක් සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය වී ඇත. නැති වූ ජංගම දුරකථන සම්බන්ධ තොරතුරු එම දුරකථනය යම් විදුලි සංදේශ පද්ධතියක භාවිත කරන විට පමණක් පහසුවෙන් ලබා ගත හැකිය. නැති

## 4.4 කාර්ය මණ්ඩලය

2011 වසරේ දී ආර්ථික කටයුතු අංශය අධ්‍යක්ෂවරයකු (1), වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු (1), සහකාර අධ්‍යක්ෂවරු (4) කළමනාකරණ සහකාර මට්ටමේ නිලධාරීන් (24) සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩල සේවකයන් තිදෙනෙකු (3) විසින් සිදු කරන ලදී.

# අධිවේගී අන්තර්ජාල සේවා (Broadband) පිරික්සුම් ඒකකය

5 පරිච්ඡේදය

## 5.1 සමාලෝචනය

අධිවේගී අන්තර්ජාල සේවා ප්‍රවේශය අපගේ සන්නිවේදනය, තොරතුරු ප්‍රවේශය, අත්දැකීම් හා දැනුම හුවමාරු කර ගැනීම, ව්‍යාපාර පවත්වාගෙන යාම සහ අන්‍යෝන්‍ය අන්තර් සම්බන්ධතාවය පවත්වන ආකාරය මත වෙනස් වේ. ආර්ථිකය මත අධිවේගී අන්තර්ජාලය මගින් සිදු වන බලපෑම බෙහෙවින් ඉහළ ගොස් ඇත. ස්ථාවර අධිවේගී අන්තර්ජාල ක්‍රමෝපායන් සහ සැලසුම් සකස් කිරීමට වගබලා ගැනීම දැන් අවශ්‍ය වී ඇති අතර සියලුම පුරවැසියන්ට අධිවේගී අන්තර්ජාල ලෝකයේ නව භාවිතයන්, සේවා සහ ව්‍යාපාරික අවශ්‍යතා මගින් ප්‍රතිලාභ ලබා ගත හැකිය. අධිවේගී අන්තර්ජාල සේවා ව්‍යාප්ත කිරීමේ ප්‍රධාන සාධකය වන්නේ වේගයයි. එබඳු කාලයක වේගය වැඩි වන තෙක් සේවාවේ සැබෑ ශක්‍යතාවය අවධාරනය කර ගත නොහැක. අධිවේගී අන්තර්ජාල සේවාවක මන්දගාමී වේගය රටේ අධිවේගී අන්තර්ජාල සේවා වර්ධනයට අහිතකර ලෙස බලපාන අතර අනෙක් අතට රටේ සමාජ ආර්ථික සංවර්ධනයට එමගින් ලැබෙන දායකත්වයට බාධා පමුණුවයි.

## 5.2 ශ්‍රී ලංකාවේ අධිවේගී අන්තර්ජාල සේවාවල ඓතිහාසික සංවර්ධනය

ප්‍රධාන දුරකථන ක්‍රියාකාර සමාගම වන ශ්‍රී ලංකා ටෙලිකොම් (SLTL) සමාගම විසින් 2003 වසරේ දී ප්‍රථම වරට ශ්‍රී ලංකාවට අධිවේගී අන්තර්ජාල සේවාව හඳුන්වා දෙන ලදී. ප්‍රථම අදියරේ දී කොළඹ මහනගර සහා ප්‍රදේශය ආවරණය කරමින් ADSL (අසමමිතික සංඛ්‍යාංක ග්‍රාහක රැහැන්) තාක්ෂණ භාවිත කර ග්‍රාහකයන් සම්බන්ධ කිරීම පිණිස

තනි තඹ වයර් භාවිත කර ඇත. 2003 වසරේ දී වාණිජ සේවා ආරම්භ කිරීමට පෙර ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම නියමු ව්‍යාපෘතියක් ලෙස කොළඹ නගර සීමාව තුළ අසමමිතික ග්‍රාහක රැහැන් තාක්ෂණය පිළිබඳ පර්යේෂණාත්මක ව්‍යාපෘතියක් සිදු කර ඇත.

2003 වසරේ ADSL ප්‍රධාන ක්‍රියාකාරී සමාගම වන ශ්‍රී ලංකා ටෙලිකොම් SEA- ME- WE 3 සබ්මැරීන් කේබල් (අග්නිදිග ආසියාව, මැදපෙරදිග, බටහිර යුරෝපය) ඔස්සේ ජාත්‍යන්තර ප්‍රධාන කොටස්වල DS-3 පරිපථ දෙකක් (ඒකක මෙගාබයිට්ස් 45 බැගින් NTT/Verio ජපානය සහ (UNET - ඇ.එක්සත් ජනපදය) මත ප්‍රධාන වශයෙන් රඳා පවතී. දෙවනුව මෙම ධාරිතාව SEA- ME- WE 3 භාවිත කරමින් ඉහළ ධාරිතාවයක් දක්වා වැඩිදුරටත් වර්ධනය කර ඇති අතර ගෝලීය අන්තර්ජාලය සඳහා SEA- ME- WE 4 අලුතින් ස්ථාපනය කර ඇත. අද මෙය STM - 1, STM - 4, STM -64 සමන්විත වන අතර ආසන්න වශයෙන් ගිගාබයිට්ස් 15.6ක් එක් කරන ලද GE පරිපථ ජාත්‍යන්තර කොටස්වල ධාරිතාවය භාවිතා කරනු ලැබේ.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ අධිවේගී අන්තර්ජාල සේවා වෙළෙඳපළ දූරකථන

**අධිවේගී අන්තර්ජාල සේවා ක්‍රියාකාරුවන්, තාක්ෂණය සහ වේගය** (5.1 වගුව)

| ක්‍රියාකාර සමාගම | තාක්ෂණය | | නිවේදනය කළ උපරිම කලාප පරාසය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ටෙලිකොම් | ADSL2+ | රැහැන් සහිත | තත්පරයට මෙගාබයිට්ස් 1.6 |
| ඩයලොග් බ්‍රෝඩ් බෑන්ඩ් | WiMAX | රැහැන් රහිත | තත්පරයට මෙගාබයිට්ස් 4 |
| ඩයලොග් මොබයිල් | HSDPA | රැහැන් රහිත | තත්පරයට මෙගාබයිට්ස් 3.6 |
| ලංකාබෙල් | WiMAX | රැහැන් රහිත | තත්පරයට මෙගාබයිට්ස් 4 |
| එටිසලාට් | HSPA+ | රැහැන් රහිත | තත්පරයට මෙගාබයිට්ස් 7.2 |
| මොබිටෙල් | HSDPA | රැහැන් රහිත | තත්පරයට මෙගාබයිට්ස් 3.6 |
| එයාර්ටෙල් | HSDPA | රැහැන් රහිත | තත්පරයට මෙගාබයිට්ස් 3.6 |
| සන්ටෙල් | WiMAX | රැහැන් රහිත | තත්පරයට මෙගාබයිට්ස් 4 |
| ස්කයි නෙට්වර්ක්ස් | WiMAX | රැහැන් රහිත | තත්පරයට මෙගාබයිට්ස් 4 |
| හච් | HSPA | රැහැන් රහිත | තත්පරයට මෙගාබයිට්ස් 3.6 |

(5.1 ප්‍රස්ථාරය)




**අධිවේගී අන්තර්ජාල සේවා වර්ධනය**

ක්‍රියාකාර සමාගම් 10 සමන්විත වන අතර රැහැන් රහිත දුරකථන ක්‍රියාකාර සමාගම් 10ක් හා ග්‍රාහකයන් සම්බන්ධ කිරීම සඳහා තඹ ජාලය භාවිතා කරන රැහැන් සහිත දුරකථන ක්‍රියාකාර සමාගමකින් සමන්විත වේ. අධිවේගී අන්තර්ජාල සේවා ක්‍රියාකාර සමාගම් පිළිබඳ තොරතුරු තාක්ෂණය සහ වේගය 5.1 වගුවේ දැක්වේ.

ඉවත් කොට තබන ලද තන්තු ජාල වැඩි ප්‍රමාණයක් එකිනෙකා අතර සන්නිවේදනය කිරීමේ අරමුණින් ප්‍රධාන වශයෙන් භාවිත කර ඇති බැවින් රටේ පරිභෝගිකයාගේ ප්‍රයෝජනය පිණිස ගෘහස්ථ තන්තු කිසිවක් (FTTH) ලබා ගැනීමට නොහැකි වී ඇත. එමෙන් ම මෙට්‍රෝ ඊතනෙට් සේවාවන් ආයතනික අංශයෙන් ලබාගත හැකි අතර ගොඩනැගිලි තන්තු (FTTB) තන්තු ප්‍රයෝජනය සඳහා පවත්නා ක්ෂේත්‍රයන්වල දැකිය හැකිය.

## 5.3 අධිවේගී අන්තර්ජාල සේවා පිරික්සුම් ඒකකයේ ආරම්භය

2010 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ක්‍රියාකාර සමාගම් විසින් මහජනතාව සඳහා සපයන අන්තර්ජාල සේවා ආශ්‍රිත සේවා තත්ත්ව පිරික්සීම ආරම්භ කර ඇත. මෙම කාර්යය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා කාර්යාල පරිශ්‍රයේ අධිවේගී අන්තර්ජාල සේවා මෙහෙයුම් ඒකකයක් (BMU) ස්ථාපනය කරන ලදී. මෙම ඒකකය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ නිර්දේශය යටතේ ස්ථාපනය කරන ලද අතර ජාතික අධිවේගී අන්තර්ජාල සේවා උපදේශන කමිටුවේ (NBCC) තාක්ෂණික සහාය ලබා ගෙන ඇත. මෙම ඒකකයේ ප්‍රධානියා වශයෙන් ඒ පිළිබඳ උපදේශකවරයකු ක්‍රියා කරන


අධිවේගී අන්තර්ජාල සේවා පිරික්සුම් ඒකකය

අතර ADSL අසමමිතික සංඛ්‍යාංක ග්‍රාහක රැහැන, WiMAX ක්ෂුද්‍ර තරංග ප්‍රවේශ සඳහා ලෝක ව්‍යාප්ත අන්තර් මෙහෙයුම් සහ HSPA අධිවේග පැකට්ටු ප්‍රවේශය ඇතුළු විවිධ අධිවේගී අන්තර් සේවා නිරීක්ෂණය කිරීම සඳහා වන උපකරණවලින් සමන්විත වේ.

## 5.4 අධිවේගී අන්තර්ජාල සේවා පිරික්සුම් ඒකකයේ (BMU) කාර්යයන්

රටේ ග්‍රාහකයන් හමුවේ පවත්නා අධිවේගී අන්තර්ජාල සේවා ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම මෙම ඒකකයේ ප්‍රධාන කාර්යය වේ. සමස්ත අධිවේගී අන්තර්ජාල සේවා තත්ත්ව (QoS) පිළිබඳ නිවැරදි චිත්‍රයක් ලබා ගැනීම පිණිස අදාළ පරීක්ෂණ අධිවේගී අන්තර්ජාල සේවා ලබා ගත හැකි දිවයිනේ විවිධ ප්‍රදේශවල සිදු කෙරේ.

අධිවේගී අන්තර්ජාල සේවා වේගය මැනීමේ දී දේශීය සහ ජාත්‍යන්තර කොටස් වෙන් වෙන් වශයෙන් අධීක්ෂණය කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ඉල්ලීම සැලකිල්ලට ගෙන අධිවේගී අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් මෙම පරීක්ෂණ නිවැරදිව පැවැත්වීමට හැකි වන සේ සිය ජාලවල යාන්ත්‍රණය ඇති

කර ඇත. මෙම යාන්ත්‍රණය යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ක්‍රියාකරුවන්ගේ ප්‍රවේශ ජාල නිරීක්ෂණය කිරීමටත් සේවා තත්ත්ව පිරික්සීම සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමටත් අවසර ලබා දී ඇත.

සේවා තත්ත්වය වැඩි දියුණු වීමට අමතරව ක්‍රියාකාර සමාගම් අතර තරඟකාරිත්වය ඇතිවීම මගින් රටේ අධිවේගී අන්තර්ජාල සේවාවල ප්‍රවේශ ගාස්තු අඩුවිය හැකි වේ.

මහජනතාවගේ දැන ගැනීම පිණිස අධිවේගී අන්තර්ජාල සේවා වේග

**දත්ත ලබා ගැනීමේ වේගය 2010 අගෝස්තු** (5.2 ප්‍රස්ථාරය)




**දත්ත ලබා ගැනීමේ වේගය 2011 අගෝස්තු** (5.3 ප්‍රස්ථාරය)




## 5.4 වේග පරීක්ෂණ ප්‍රතිඵල

ග්‍රාහකයන්ගේ දැන ගැනීම සහ යොමු කිරීම සඳහා වේග පරීක්ෂණ ප්‍රතිඵල කලින් කල ප්‍රසිද්ධ කරනු ලැබේ. 5.2 සහ 5.3 ප්‍රස්ථාරවලින් පිළිවෙලින් 2010 අගෝස්තු සහ 2011 අගෝස්තු කාලපරිච්ඡේදයේ ස්ථාවර සේවා සැපයුම්කරුවන්ගේ දත්ත ලබා ගැනීමේ වේගය දක්වයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධිවේගී අන්තර්ජාල සේවා වේගය පිරික්සීමට මුලපිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ක්‍රියාකාර සමාගම් විසින් ස්ථාවර අන්තර්ජාල සේවාවල වේගය සැලකිය යුතු ලෙස වැඩි කිරීමට පියවර ගෙන ඇත. 5.2 සහ 5.3 ප්‍රස්ථාර සන්සන්දනය කිරීමේ දී පසුගිය වසරක කාලය තුළ සේවා සැපයුම්කරුවන්ගේ දත්ත ලබා ගැනීමේ වේගය සැලකිය යුතු ලෙස වැඩි වී ඇති බව පෙනී යයි.

පරීක්ෂණ ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීමට අමතරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ග්‍රාහකයන්ට සිය අධිවේගී අන්තර්ජාල සේවා දත්ත ලබා ගැනීමේ වේගය නිවැරදිව පරීක්ෂා කර ගැනීම සඳහා පහසුකම් සලසන උපකරණයක් වැඩි දියුණු කර ඇත. මෙම පද්ධතිය ග්‍රාහකයා සහ දුරස්ථව ස්ථානගත කර ඇති සර්වරය අතර ලබාගත හැකි වේගය පරීක්ෂා කිරීම පිණිස පහසුකම් සලසන ඇමරිකා එක්සත් ජනපදයේ සහ යුරෝපයේ ස්ථානගත විබෙදුම් සර්වර් දෙකක් මත ක්‍රියා කරයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ලොව සෙසු නියාමකයන්ගේ ප්‍රවීණතාවය ලබා ගැනීමේ අදහසින් අධිවේගී අන්තර්ජාල සේවා පිරික්සුම් ඒකකයේ පහසුකම් සහ එහි විෂයය පථය මෙන්ම එහි පරීක්ෂණාත්මක කටයුතු පුළුල් කිරීමට සැලසුම් කරනු ලැබේ.

# වර්ණාවලි කළමනාකරණ අංශය

6 පරිච්ඡේදය

## 6.1 සමාලෝචනය

ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය ජාතික සම්පතක් වන අතර එබැවින් එය රජයේ සීමාසහිත දේපළකි. මෙම වටිනා සීමිත සම්පත කළමනාකරණය කිරීමේ වගකීම වර්ණාවලි කළමනාකරණ අංශයට පවරා ඇත. වර්ණාවලිය කළමනාකරණය කිරීමේ අරමුණ වන්නේ භාවිතයට ගන්නා ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලියේ ප්‍රයෝජන උපරිම කිරීම සහ ගුවන් විදුලි සංඛ්‍යාත බාධාවන් අවම කිරීමයි.

ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කිරීම, කාර්යක්ෂම කිරීම සහ ඵලදායි කිරීම, බාධාකාරී ගැටලු වැළැක්වීම සහ අවම කිරීම, නව රැහැන් රහිත තාක්ෂණය හඳුන්වාදීම, ප්‍රවර්ධනය කිරීම, ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලියට ප්‍රශස්ත

ආර්ථික වටිනාකමක් ලබා දීම සඳහා වර්ණාවලි බලපත්‍ර ගාස්තු ව්‍යුහය වැඩි දියුණු කිරීම, ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සම්බන්ධයෙන් ආසන්න රටවල් සහ වෙනත් කළමනාකාරීත්ව සම්බන්ධීකරණය කිරීම ඇතුළුව ගුවන් විදුලි සංඛ්‍යාත කළමනාකරණය කිරීම මෙම අංශයේ අරමුණ වේ. මෙම ඉලක්කය පරිපාලනමය සහ තාක්ෂණික පටිපාටි මගින් සාක්ෂාත් කෙරේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව කොමිෂන් සභාවේ වගකීම් ඉටු කිරීමෙහිලා වර්ණාවලි කළමනාකරණ අංශය විසින් 2011 වර්ෂයේ දී සිදු කළ කාර්යයන් පහත දැක් වේ:

## 6.2 කාර්යයන්

- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) ගුවන් විදුලි නියාමනය සහ ඒ සම්බන්ධ නිර්දේශ ප්‍රකාරව ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සැලසුම් කිරීම.
- නව තාක්ෂණය හඳුන්වාදීම පිණිස නව වර්ණාවලිය සැපයීම.
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සඳහා අදාල සංඛ්‍යාත පරාස හඳුනා ගැනීම සහ වෙන්කිරීම.
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සම්බන්ධ අවශ්‍ය උපදෙස්, නියමයන් සහ අයක්‍රම ව්‍යුහය සකස් කිරීම.
- ගුවන් විදුලි සංඛ්‍යාත සහ ඒ ආශ්‍රිත උපකරණ භාවිත කිරීම සඳහා බලපත්‍ර ලබාදීම සහ ලේඛනගත කිරීම.
- සියලුම සංඛ්‍යාත භාවිත කරන්නන්ගේ සංඛ්‍යාත වෙන් කිරීම්, සම්ප්‍රේෂක ස්ථානගත කිරීම්, සම්ප්‍රේෂක පිළිබඳ තාක්ෂණික දත්ත ලේඛන ගත කිරීම සහ බලපත්‍ර ලබාදීම පිළිබඳ දත්ත සමුදායක් කළමනාකරණය කිරීම.
- අදාල ගුවන් විදුලි උපකරණ සඳහා මාදිලි අනුමැති ලියකියවිලි නිකුත් කිරීම.
- ආයෝජන මණ්ඩලය, ආනයනය හා අපනයන පාලක දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව වැනි සෙසු රාජ්‍ය ආයතන සඳහා විදුලි සංදේශ උපකරණ නිෂ්කාශනය කිරීමෙහිලා නිර්දේශ කිරීම සහ අවසරය ලබා දීම.
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමනාකරණය කිරීම.
- ගුවන් විදුලි සංඛ්‍යාත බාධාවන් සහ ගුවන් විදුලි සංඛ්‍යාත බාධාවන් අවම කිරීම ආශ්‍රිත පැමිණිලි විමර්ශනය කිරීම.
- අධ්‍යයන ආයතනවල ශිෂ්‍යයින්ගේ පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය තොරතුරු සහ උපදෙස් සැපයීම.
- ගුවන් විදුලි සංඛ්‍යාත සහ උපකරණ භාවිතය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT), ජාත්‍යන්තර සමුද්‍ර සංවිධානය (IMO), වැනි ජාත්‍යන්තර ආයතන සහ වෙනත් රටවල නියාමන ආයතන සම්බන්ධීකරණය කිරීම.

විදුලි සංදේශ පනතේ 22 වැනි වගන්තිය ප්‍රකාරව (2.7.1.2 බලන්න) ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් භාවිත කරන කිසියම් තැනැත්තෙකුට ඒ සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන

ලද වලංගු බලපත්‍රයක් තිබිය යුතුවේ. අන්‍යාකාරයකින් නිශ්චිත සඳහනක් තිබෙන අවස්ථාවක හැර බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් වූ නියමයන්ට අනුව ගාස්තුවක් ගෙවීමෙන් පසු බලපත්‍රය නිකුත් කරනු ලැබේ. බලපත්‍රය සමඟ බලපත්‍ර කොන්දේසි නිකුත් කරනු ලැබේ. කොන්දේසි සේවාවෙන් සේවාවට වෙනස් විය හැකිය. කිසියම් කොන්දේසියක් කඩ කරනු ලැබූ අවස්ථාවක උපකරණය මුද්‍රා තැබීමට සහ බලපත්‍රය අවලංගු කිරීමට ශ්‍රී.ලං.වි.සං.නි. කොමිෂන් සභාවට බලය තිබේ.

සේවා වර්ගය අනුව විවිධ පරාස සඳහා ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය බෙදා වෙන් කරනු ලැබේ. ගුවන් විදුලි තරංගවල ගති ලක්ෂණ, උපකරණ හා යෙදුම් ක්‍රමලේඛවල තාක්ෂණික පරාමිතීන් අනුව සේවාවන් එකිනෙකට වෙනස් වේ. එබැවින් වර්ණාවලි කළමනාකරණ අංශයේ කාර්යයන් සේවා කාණ්ඩ කිහිපයකට බෙදා වෙන් කොට ඇත.

ඕනෑම ගුවන් විදුලි සංඛ්‍යාත උපකරණයක් ආනයනය කිරීම සඳහා ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවේ අවසරය (නිෂ්කාශනය) ලබා ගත යුතු වේ. නිෂ්කාශන ලිපිය නිකුත් කිරීමට පෙර උපකරණය නියමිත ප්‍රමිතීන්ට අනුකූල වන බවට හා උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව විසින් අනුමත කරන ලද සංඛ්‍යාතයක් තිබෙන බවට වර්ණාවලි කළමනාකරණ අංශය වග බලා ගනී. මෙමගින් නීති විරෝධී සංඛ්‍යාත භාවිතය හා වර්ණාවලිය භාවිත කරන බලපත්‍රලාභීන්ට සිදු වන ගුවන් විදුලි අවහිරතා අවම කෙරේ.

කෙසේ වෙතත්, සිය සම්ප්‍රේෂණවලට අවහිරතා ඇති වන අවස්ථාවල දී භාවිත කරන්නන්ගෙන් වර්ණාවලි කළමනාකරණ අංශය වෙත පැමිණිලි ලැබේ. අවහිරතාවල මූලය හඳුනා ගැනීමට සහ අදාළ වන විසඳුම් ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රම සකස් කර තිබේ.

## 6.3 කාර්යසාධනය

2011 වසර තුළ නිකුත් කරන ලද සංඛ්‍යාත හා බලපත්‍ර සංඛ්‍යාව මෙන්ම අවහිරතා පැමිණිලි සහ වර්ණාවලි කළමනාකරණ අංශය විසින් හඳුනාගනු ලැබූ අනවසර භාවිතා කරන්නන් පිළිබඳව සංඛ්‍යාලේඛන පහත දැක් වේ.

### 6.3.1 සංඛ්‍යාත වෙන් කිරීම

**නිකුත් කරනු ලැබූ මුළු සංඛ්‍යාත සංඛ්‍යාව, 2010 - 2011** (6.1 වගුව)

| සේවා වර්ගය | සංඛ්‍යාත සංඛ්‍යාව | |
|---|---|---|
| | 2010 | 2011 |
| ස්ථාවර සේවාව | 4724 | 4810 |
| විකාශන සේවාව | 66 | 28 |
| සෙලියුලර් ජංගම දුරකථන සේවාව | 02 | 01 |
| දත්ත සහ ගුවන් විදුලි දුරවේදනය | 28 | 33 |
| ගුවන් සහ සමුද්‍ර සේවා | | |
| i. සමුද්‍ර ජංගම සේවා | 08 | 11 |
| ii. ගුවන් ජංගම සේවා | 04 | 06 |
| පුද්ගලික ජංගම ගුවන් විදුලි සේවාව | 13 | 13 |

### 6.3.2 සංඛ්‍යාත බලපත්‍ර නිකුත් කිරීම

**සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කරන්නන් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව, 2010 - 2011** (6.2 වගුව)

| සේවා වර්ගය | බලපත්‍ර සංඛ්‍යාව | |
|---|---|---|
| | 2010 | 2011 |
| ස්ථාවර සේවාව | 38 | 59 |
| විකාශන සේවාව (රූපවාහිනී හා ගුවන් විදුලි) | 25 | 28 |
| සෙලියුලර් ජංගම සේවාව | 5 | 5 |
| ට්‍රන්කින් /පේජින් / සිටිසන් බෑන්ඩ් | 8 | 9 |
| දත්ත හා ගුවන් විදුලි දුරවේදන සේවාව | 24 | 38 |
| ගුවන් හා සමුද්‍ර සේවාව | | |
| i. ගුවන් යානා මධ්‍යස්ථාන | 34 | 34 |
| ii. නැවී මධ්‍යස්ථාන | 65 | 65 |
| iii. සමුද්‍ර ජංගම | 78 | 78 |
| iv. ගුවන් ගමන් ජංගම | 5 | 5 |
| පුද්ගලික ජංගම ගුවන් විදුලි සේවාව | 185 | 185 |

### 6.3.3 වර්ණාවලිය භාවිත කරන්නන්ගෙන් පැමිණිලි ලැබීම හා අවහිරතා සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම

**ලැබුණු පැමිණිලි සහ පැවැත්වූ විමර්ශන, 2010 - 2011** (6.3 වගුව)

| සේවාව | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | | පැවැත්වූ විමර්ශන සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | 2010 | 2011 | 2010 | 2011 |
| රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශනය | 13 | 17 | 8 | 17 |
| වෙනත් සේවාවන් | 53 | 68 | 53 | 68 |

6.3 වගුවෙන් 2011 වසරේ දී ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශය විසින් අවහිරතා සම්බන්ධයෙන් වර්ණාවලිය භාවිතා කරන්නන්ගෙන් ලැබුණු සියලුම පැමිණිලි සම්බන්ධයෙන් පවත්වන ලද විමර්ශන දක්වා ඇත.

### 6.3.4 සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස භාවිත කරන්නන් හඳුනා ගැනීම

ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස භාවිත කරන අය හඳුනා ගැනීම සඳහා විශේෂ සංඛ්‍යාත පිරික්සුම් උපකරණ භාවිත කරනු ලැබේ. මේ කාර්යය සඳහා නිර්මාණය කරන ලද විශේෂ රථවල මෙම උපකරණ සවිකර තිබේ.

හඳුනාගත් නීති විරෝධී භාවිත කරන්නන් සංඛ්‍යාව සහ ගනු ලැබූ නිවාරණ ක්‍රියා මාර්ග 2010 - 2011 (6.4 වගුව)

| වර්ගය | හඳුනාගත් නීති විරෝධී භාවිත කරන්නන් සංඛ්‍යාව | | ලැබූ ක්‍රියාමාර්ගය |
|---|---|---|---|
| | 2010 | 2011 | |
| විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන් විදුලිය) | 5 | 2 | සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස භාවිත කිරීම වැලැක්වීමට පියවර ගන්නා ලදී. |
| වෙනත් සේවාවන් | 3 | 2 | |

## 6.3.5 රැහැන් රහිත විදුලි සංදේශ උපකරණ ආනයනය සඳහා නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම.

නිකුත් කරන ලද නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව 2011-2012 (6.5 වගුව)

| සේවා වර්ගය | නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව | |
|---|---|---|
| | 2010 | 2011 |
| ස්ථාවර සේවාව | 720 | 845 |
| විකාශන සේවාව (රූපවාහිනී හා ගුවන් විදුලි) | 105 | 245 |
| සෙලියුලර් ජංගම සේවාව | | |
| i. වෙළෙඳ බලපත්‍ර | 4058 | 4897 |
| ii. ජංගම ක්‍රියාකරුවන් | 927 | 1278 |
| iii. ට්‍රන්කින් / පේජින් / සිටිසන් බෑන්ඩ් | 7 | 6 |
| ගුවන් සහ සමුද්‍ර සේවා | | |
| i. ගුවන් යානා මධ්‍යස්ථාන | 6 | 11 |
| ii. නැව් මධ්‍යස්ථාන | 3 | 15 |
| iii. සමුද්‍රීය ජංගම | 85 | 278 |
| iv. ගුවන් ජංගම | 2 | 21 |
| v. ගුවන් ගමන් හැසිරවීම | 1 | 4 |
| vi. විවිධ | 29 | 95 |
| පෞද්ගලික ජංගම ගුවන් විදුලි සේවා | | |
| i. පෞද්ගලික ජංගම ගුවන් විදුලි | 159 | 609 |
| ii. සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ | 245 | 170 |
| දත්ත සේවාව | 482 | 368 |
| චන්ද්‍රිකා සේවාව | 1020 | 904 |
| ආධුනික ගුවන් විදුලි සේවාව | 11 | 28 |
| අඩු බලැති උපකරණ | 982 | 1360 |

2011 වසරේ දී රැහැන් රහිත විදුලි සංදේශ උපකරණ ආනයනය කිරීම සඳහා නිකුත් කළ නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව 2010 වසරට වඩා වැඩි වීමක් පෙන්නුම් කරන අතර ඇතැම් සේවා වර්ගවල (නිදා: ට්‍රන්කින්/පේජින්/ සිටිසන් බෑන්ඩ් සේවා/ දත්ත සේවා සහ චන්ද්‍රිකා සේවාවල සංඛ්‍යාත්මක අඩුවීමක් පෙන්නුම් කර ඇත.

2011 වසරේ දී වර්ණාවලි කළමනාකරණ අංශය විසින් සිදු කරන ලද වෙනත් වැදගත් කාර්යයන් පහත විග්‍රහ කෙරේ:

## 6.4 ශ්‍රී ලංකාවේ ඇනලොග් රූපවාහිනී ඩිජිටල් රූපවාහිනී දක්වා මාරුවීම

ශ්‍රී ලංකාවේ ඇනලොග් රූපවාහිනී ඩිජිටල් භෞමික රූපවාහිනී බවට මාරු කිරීමේ නිර්නායකයන් සකස් කිරීමට මුල පුරන ලද්දේ වර්ණාවලි කළමනාකරණ අංශය විසිනි. මෙය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) ප්‍රවීනයකු වන පීටර් වු සහ ජාතික උපදේශන කමිටුව (NRT) විසින් ඒකාබද්ධව වැඩිදියුණු කර ඇත. ජාතික උපදේශන කමිටුවේ සභාපතිත්වය දරන ලද්දේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වර්ණාවලි කළමනාකරණ අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ හෙළසිරි රණතුංග මහතා විසිනි.

ජාතික උපදේශන කමිටුව පහත සඳහන් ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත වේ.

- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
- ආරක්ෂක අමාත්‍යාංශය
- මොරටුව විශ්ව විද්‍යාලය
- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (ජාතික රූපවාහිනී ජාලය)
- සීමාසහිත ස්වාධීන රූපවාහිනී ජාලය (ජාතික රූපවාහිනී ජාලය)
- සීමාසහිත ඊ.ඒ.පී. නෙට්වර්ක් (පෞද්ගලික) (වෙළෙඳ ප්‍රචාරක)
- සීමාසහිත එම්.ටී.වී. නාලිකා (පෞද්ගලික) (වෙළෙඳ ප්‍රචාරක)
- සීමාසහිත ඩයලොග් රූපවාහිනී (පෞද්ගලික) (වෙළෙඳ ප්‍රචාරක)

ඇනලොග් සිට ඩිජිටල් විකාශන දක්වා මාරුවීමේ ක්‍රියාවලිය තුළින් වර්ණාවලියේ කාර්යක්ෂමතාවය, උසස් ශ්‍රව්‍ය සහ දෘශ්‍ය තත්ත්ව සහ නව ව්‍යාපාරික අවස්ථා වැනි වාසි සැලසේ. එමෙන් ම එමගින් ජාත්‍යන්තර ජංගම විදුලි සංදේශ සේවා සහ වෙනත් භාවිතයන් සඳහා විකාශන පරාස වෙන් කිරීමට අවස්ථාව සැලසේ.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සියලුම සාමාජික රටවල් ඇනලොග් සිට ඩිජිටල් විකාශන දක්වා මාරුවීම ආරම්භ කර ඇත. ප්‍රධාන වශයෙන් ඇමරිකා එක්සත් ජනපදය ඇතුළු රටවල් ගණනාවක මෙන්ම යුරෝපා සංගමයේ බොහෝ රටවල් ඇනලොග් භාවිතය සම්පූර්ණයෙන් ම අවසන් කර ඇත. එමෙන් ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල් රැසක් ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීමට සැලකිල්ල යොමු කරයි. ඇනලොග් සිට ඩිජිටල් විකාශන දක්වා පහසුවෙන් සංක්‍රමණය වීමට සහ අභියෝග මැඩ පැවැත්වීමට සංවර්ධනය වෙමින් පවත්නා සාමාජික රටවලට සහායවීම පිණිස ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් භෞමික රූපවාහිනී, ජංගම රූපවාහිනී සහ ශබ්ද විකාශන ආවරණය කරන වර්ණාවලියේ කාර්යක්ෂමතාවය පිළිබඳ පූර්ණ ප්‍රතිලාභ රටවල්වලට ලබාදීමෙහිලා සහාය වන වැඩසටහනක් වැඩි දියුණු කර ඇත.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් ඇනලොග් සිට ඩිජිටල් විකාශන දක්වා මාරුවීම පිණිස නිර්නායකයන් ප්‍රසිද්ධ කර ඇත. මෙම නිර්නායකයන් ඇනලොග් සිට ඩිජිටල් විකාශන දක්වා පහසුවෙන් සංක්‍රමණය වීම පිණිස සාමාජික රටවලට සහාය ලබා දේ. ඩිජිටල් විකාශන ස්වීචීකරණය කිරීම පිණිස රටවල් වලට සහාය දැක්වීමේ ප්‍රයත්නයේ දී ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය ඩිජිටල් ස්වීචිකරණය ක්‍රියාවලිය (DSO) පිළිබඳ ජාතික සැලසුම් කෙටුම්පත් කරමින් ඔවුන්ට සහාය වීම පිණිස රටවල් තෝරා ගෙන ඇත. ශ්‍රී ලංකාව වැඩිදුර සහාය හිමි වන ප්‍රතිලාභී රටවල් අතරින් එකකි.

ශ්‍රී ලංකාවේ රූපවාහිනී වෙළෙඳපලේ රූපවාහිනිය භාවිතා කරන්නන්ගේ

සංඛ්‍යාව මිලියන 3.5 වෙතැයි ඇස්තමේන්තු කර ඇති අතර ප්‍රධාන වශයෙන් ඇනලොග් භෞමික රූපවාහිනී වැඩසටහන් සේවා සහිත භෞමික රූපවාහිනී Free to Air (FTA) වෙළෙඳපළක් පවතී. ඩිජිටල් රූපවාහිනී චන්ද්‍රිකා ඇනලොග් සහ ඩිජිටල් කේබල් රූපවාහිනී මෙන්ම අන්තර්ජාල සම්මුති රූපවාහිනී (IPTV) වැනි ඇනලොග් භෞමික රූපවාහිනියට අමතරව රූපවාහිනී බෙදාහැරීමේ මාධ්‍යයන් පුළුල් වශයෙන් තිබේ.

2011 වසරේ දී ප්‍රති ශීර්ෂ වශයෙන් ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ඇමරිකානු ඩොලර් 2400 ක් විය. මෙම සාපේක්ෂ වශයෙන් අවම දළ දේශීය නිෂ්පාදිත අගයන් සහ ඉතා තරඟකාරී රූපවාහිනී වෙළෙඳපළ ඩිජිටල් ස්විචිකරණය ක්‍රියාවලියේ දී හමුවන විශාලතම අභියෝගය වේ. රජයේ, විකාශන ආයතනවල මෙන්ම ප්‍රේක්ෂකයන්ගේ පිරිවැය අවම මට්ටමක පවතින්නේ නම් ඩිජිටල් ස්විචිකරණය සාර්ථක විය හැකියි. අනෙක් අතට ඩිජිටල් රූපවාහිනිය දක්වා සංක්‍රමණය වීම තුළින් වාසි රැසක් ලබා ගත හැකිය. නරඹන්නන්ට වැඩි සේවයන් මෙන් ම වඩා හොඳ තත්ත්වයේ රූපරාමු ලබා ගත හැකි අතර විකාශන ආයතනවලට නව සේවා ලබා දීමට සහ ජාලවල පිරිවැය අඩු කර ගැනීමට හැකි වේ. රජයට ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය භාවිත කර වැඩි කාර්යක්ෂමතාවයක් සාක්ෂාත් කර ගත හැකි අතර වෙනත් සන්නිවේදන සේවා සඳහා විකාශන සංඛ්‍යාත පරාස වෙන් කළ හැකි වේ.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය පහත සඳහන් කාර්යයන් සඳහා ශ්‍රී ලංකාවට සහාය වේ:

1. තොරතුරු එක් රැස් කිරීම සහ දේශීය අධ්‍යයනයන් සූදානම් කිරීම.
2. සැලසුම් වාර්තාව කෙටුම්පත් කිරීම.
3. කෙටුම්පත් සැලසුම් වාර්තා සාකච්ඡා කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ දෙවන දේශීය අධ්‍යයනය සිදු කිරීම.
4. අවසාන සැලසුම් වාර්තාව කෙටුම්පත් කිරීම.

ඩිජිටල් විකාශන සේවා සඳහා සංක්‍රමණය වීම පිණිස එම නිර්නායකයන් සකස් කරන ලද ප්‍රවීනයන් 2011 අගෝස්තු 15 සිට 26 දක්වා සහ 2011 සැප්තැම්බර් 26 සිට 2011 ඔක්තෝබර් 4 දක්වා ශ්‍රී ලංකාවට පැමිණ ඇත. පැමිණි ප්‍රථම අවස්ථාවේ දී ජාතික උපදේශන කමිටුව සමඟ මෙම ප්‍රවීනයන් විසින් මතු දැක්වෙන කරුණු පිළියෙල කරන ලදී.

- රූපවාහිනී වෙළෙඳපළ සහ නියාමන තත්ත්වය විශ්ලේෂණය කිරීම
- දිගු කාලීන සහ කෙටි කාලීන ඩිජිටල් ස්විචිකරණය අරමුණු සමාලෝචනය කිරීම.
- මූලික අරමුණු සම්බන්ධයෙන් ගත් තීරණ පිළිබඳව ලේඛනයක් සකස් කිරීම.

## සැලැස්මේ විෂය පථය

අ. ශ්‍රී ලංකාවේ ඇනලොග් සිට ඩිජිටල් රූපවාහිනිය දක්වා සංක්‍රමණය වීමේ සැලැස්ම තුළින් කෙටි කාලීන ඩිජිටල් ස්විචිකරණ අරමුණු සහ දිගු කාලීන ඩිජිටල් ස්විචිකරණය අරමුණු මෙන් ම ජාතික උපදේශන කමිටුව විසින් කළමනාකරණය කරන කාර්යයන් ඉටු කරයි.

ආ. ශ්‍රී ලංකාවේ රූපවාහිනී වෙළෙඳපළ දේශීය සහ වාණිජ රූපවාහිනී සේවා සහ පුළුල් වරණීය රූපවාහිනී මාධ්‍යයන් (ඇනලොග් සහ ඩිජිටල් කේබල් චන්ද්‍රිකා රූපවාහිනී (IPTV) රැසකින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ රූපවාහිනී වෙළෙඳපලේ ප්‍රධාන වශයෙන් රූපවාහිනී බලපත්‍රලාභී විකාශන

ආයතන 23 අතරින් 16ක් වර්තමානයේ මෙහෙයුම් කටයුතු සිදු කරයි.

ඇ. ඩිජිටල් ස්විචීකරණ පරමාර්ථ සඳහන් කිරීම සැලැස්මේ අරමුණ වේ. පහත 6.6 වගුවේ සාරාංශ ගත කර ඇති පරිදි ජාතික උපදේශන කමිටු රැස්වීමේ පරීක්ෂණාත්මක ක්‍රියාවලියේ දී ජාතික උපදේශන කමිටුව විසින් කෙටි කාලීන සහ දිගු කාලීන ඩිජිටල් ස්විචීකරණ අරමුණු දක්වා ඇත.

**ඩිජිටල් ස්විචීකරණ අරමුණු පිළිබඳ සාරාංශය** (6.6 වගුව)

| අංකය | අරමුණ | කෙටි කාලීන (වසර 1 පසු - ඇනලෝග් ස්විචිකරණය රහිත) | දිගුකාලීන (වසර 5-6 පසු ඇනලෝග් ස්විචිකරණය රහිත) |
|---|---|---|---|
| 1 | කලාපීය සේවා ප්‍රවේශ සහ අපේක්ෂිත ක්‍රමෝපායන් භාවිත කිරීම මගින් ඇනලොග් සිට ඩිජිටල් තාක්ෂණය දක්වා පහසුවෙන් සංක්‍රමණය වීම ඩිජිටල් භෞමික රූපවාහිනී සේවා 2012 වසර මැද භාගය වීමට පෙර බස්නාහිර සහ උතුරු පළාතට දීමට සැලසුම් කිරීම. | වර්තමාන සියලුම ඇනලොග් රූපවාහිනී වැඩසටහන් දිවයින පුරා ආවරණය වන පරිදි සියලුම ඇනලොග් සේවා ඩිජිටල් තාක්ෂණයට පරිවර්තනය කිරීම. | ජාතික උපදේශන කමිටුව ජනමාධ්‍ය සහ තොරතුරු අමාත්‍යාංශ කමිටුව ජනමාධ්‍ය සහ තොරතුරු අමාත්‍යාංශයේ නියමයන් ප්‍රකාරව කටයුතු කරන අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ඩිජිටල් ලාභාංශ සැලසුම්කරණය කිරීමෙහි ලා මඟ පෙන්වයි |
| 2 | ඩිජිටල් විකාශන ජාල ක්‍රියාකරුවන් (DBNO) සඳහා පද්ධති බලපත්‍ර නිකුත් කිරීම. | ඇනලොග් ස්විචීකරණය රහිතව ප්‍රයෝජනයට ගන්නා ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලියේ ස්වභාවය මත දෙවන ඩිජිටල් විකාශන ජාල ක්‍රියාකරුවන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම. | නැත |
| 3 | ඩිජිටල් විකාශන ජාල ක්‍රියාකරුවන් විවෘත DVB-12 ඩිජිටල් භෞමික රූපවාහිනී සම්ප්‍රේෂණ ජාල ස්ථාපනය කිරීම. | නැත | නැත |
| 4. | විකාශන ආයතන නරඹන්නන් සඳහා සිය රූපවාහිනී වැඩසටහන් බෙදා හැරීම සඳහා ඩිජිටල් විකාශන ජාල ක්‍රියාකරුවන්ගේ සේවා භාවිත කළ යුතුය. මූලික අවශ්‍යතාවයක් ලෙස සියලුම නාලිකාවලට මුල් ආරම්භයේ සිට අදාළ ඩිජිටල් විකාශන ජාල ක්‍රියාකරුවන් සකස් කරන ලද ඩිජිටල් මාධ්‍යයන් ප්‍රයෝජනයට ගන්නා ලෙස දැනට පවත්නා සියලුම විකාශන ආයතනවලට උපදෙස් ලබා දිය යුතුය. | නැත | නැත |

| | | | |
|---|---|---|---|
| 5 | ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී උද්ගත වන ප්‍රායෝගික ගැටලු විසඳීම නියාමකයා විසින් අදාල විසඳුම් සම්බන්ධ වගකීම ගත යුතුය. | නැත | නැත |
| 6 | බදු ප්‍රතිපත්තිය | 2012 සිට 2015 දක්වා වර්තමාන විකාශන ආයතන ප්‍රවර්ධනය කිරීම සඳහා බදු සහන ලබා දීම. | 2012 සිට 2018 දක්වා පාරිභෝගික පරිශ්‍ර උපරණ සඳහා බදු සහන ලබාදීම. |
| 7 | ඇනලොග් ස්විච්කරණය ක්‍රියාවිරහිත කිරීමට පෙර ඇනලොග් තාක්ෂණයේ සිට ඩිජිටල් රූපවාහිනී තාක්ෂණයට මාරුවීමේ රාමුවට ආධාරක වශයෙන් ගුවන් විදුලි සංඛ්‍යාත සැලසුම්කරණය කිරීම. | දෙවන ඩිජිටල් විකාශන ජාල ක්‍රියාකරුවන් සහ වෙනත් ඩිජිටල් විකාශන සේවා සඳහා විකාශන සැලසුම්කරණ ප්‍රතිඵල භාවිත කරනු ලැබේ. | ඩිජිටල් විකාශන ජාල ක්‍රියාකාර බලපත්‍ර ලබා දිය හැකිය. |
| 8 | වැඩි දියුණු කරන ලද රූපරාමුවල ප්‍රමිතිය | ඇනලොග් ස්විච්කරණය ක්‍රියාවිරහිත කිරීමෙන් පසුව දීප ව්‍යාප්තව ආවරණය වන බහුපථවල ස්වභාවය මත වෙළෙඳපලේ උච්ච සීමා රූපවාහිනී ප්‍රමිතීන් ලබා ගත හැකි වීම. | වෙළෙඳපලේ 3D රූපවාහිනී |
| 9 | අධික ඩිජිටල් විකාශන සේවා | නැත | ජංගම රූපවාහිනී (MTV ) සහ හෝ ඩිජිටල් ගුවන් විදුලි |
| 10 | ඩිජිටල් ලාභාංශ | කෙටුම්පත් කිරීමට සාකච්ඡා මට්ටමේ පවතී | අධි උච්ජ සංඛ්‍යාත (UHF) වර්ණාවලිය නැවත එක් කිරීම. |

ඇ. ඇනලොග් සිට ඩිජිටල් රූපවාහිනී තාක්ෂණය දක්වා සංක්‍රමණය වීමේ ක්‍රියාවලියේ කාලපරිච්ඡේදය ජාතික උපදේශන කමිටුව විසින් නිශ්චය කරනු ලැබේ. පොදුවේ කාලය පදනම් කරගත් යාවත්කාලීන කරන ලද විශේෂ කරුණු ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කර ඇත.

- 2011 අග භාගයේ සිට 2012 මැද භාගය දක්වා උතුරු සහ බස්නාහිර පළාත්වල ඩිජිටල් රූපවාහිනී විකාශන නියමු සම්ප්‍රේෂණ සේවා ව්‍යාප්ත කිරීම.
- 2014 මැද භාගය: ප්‍රධාන ඩිජිටල් රූපවාහිනී මධ්‍යස්ථාන අටක සිට ඩිජිටල් රූපවාහිනී විකාශන සේවා ව්‍යාප්ත කිරීම.
- 2015 අග භාගය : බස්නාහිර පළාතේ ඇනලොග් ස්විච්කරණය ක්‍රියා විරහිත කිරීම.
- 2017 අග භාගය ඇනලොග් ස්විච්කරණය ක්‍රියාවිරහිත කිරීම සම්පූර්ණ කිරීම.

වසර 5ක් 6ක් තුළ පාරිභෝගිකයන් ඇනලොග් තාක්ෂණයේ සිට ඩිජිටල් තාක්ෂණය දක්වා මාරු කිරීමට තක්සේරු කර ඇත.

### කාර්යයන් සහ වගකීම්:

මෙම වාර්තාවේ නියාමන අධිකාරී ආයතනවල සහ ඩිජිටල් තක්සේරු මාලාවේ කාර්යයන් සහ වගකීම් වැඩිදුරටත් නිර්වචනය කර ඇත.

### ඩිජිටල් ජාල විකාශන ක්‍රියාකරුවන්ගේ කාර්යයන් සහ වගකීම්:

- වර්තමාන සියලු රූපවාහිනී විකාශන ආයතන සඳහා සමානව සාධාරණ මිල ගණන් සැපයීම.

- විකාශන ආයතනවල ප්‍රධාන පාලක මැදිරියේ (MCR) සිට විෂයය කරුණු රැස් කිරීම.
- විකාශන ආයතනවල සිට නරඹන්නන් වෙත විෂයය කරුණු බෙදා හැරීම.
- රූපවාහිනී විකාශන ආයතන වෙත විශේෂ සේවා සැපයීම.
- බලපත්‍රලාභී රූපවාහිනී විකාශන ආයතන මගින් ඉල්ලීම් පහසුකම් සැලසීම.
- උපකරණය අක්‍රියව පවත්නා කාලය අවම කිරීමට වග බලා ගැනීම පිණිස තාක්ෂණික සහාය සහිත සම්ප්‍රේෂණ පහසුකම් පවත්වාගෙන යාම.
- දීප ව්‍යාප්ත ආවරණය, අවශ්‍ය විශ්වාසනීයත්වය, සහ තාක්ෂණික ප්‍රමිතීන් සහිතව සම්ප්‍රේෂණ ජාල පවත්වා ගෙන යාම.
- සියලුම වැඩසටහන් නාලිකාවල නරඹන්නන් සඳහා විද්‍යුත් වැඩසටහන් මාර්ගෝපදේශන සැපයීම.
- නරඹන්නන් සහ විකාශකයන්ගේ අවශ්‍යතාවය සඳහා 24 × 7 ප්‍රමාණයේ සහායක අංශයක් පවත්වාගෙන යාම.

### රූපවාහිනී විකාශන ආයතනවල කාර්යයන් සහ වගකීම්

- ප්‍රධාන පාලක මැදිරිය වෙත ඩිජිටල් ආකෘතිය සහිතව බාරදීම පිණිස විෂය කරුණු සැපයීම.
- ඩිජිටල් විකාශන ජාල ක්‍රියාකරුවන් විසින් විද්‍යුත් වැඩසටහන් උපදෙස් සඳහා අවශ්‍ය දත්ත සැපයීම.

### මාධ්‍ය අමාත්‍යාංශයේ /අධිකාරියේ කාර්යයන් සහ වගකීම්

- ස්වකීය සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා නව රූපවාහිනී විකාශන බලපත්‍ර නිකුත් කිරීම නැවැත් වීම.
- ඩිජිටල් විකාශන ජාල ක්‍රියාකරුවන් විධිමත් කිරීම.
- ඩිජිටල්කරණ සැලැස්ම ප්‍රකාරව චන්ද්‍රිකා සහ කේබල් සැපයුම්කරුවන් අනාවරණය කර ගැනීම.
- රූපවාහිනී විකාශන කාර්යයන්හි භාවිතා කරන විකාශන තත්ත්ව ඩිජිටල් දෘශ්‍ය නිෂ්පාදන උපකරණවලට මාදිලි අනුමැතිය ලබාදීම.

### ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන් සහ වගකීම්

- මූලික වශයෙන් සියලු ඩිජිටල් විකාශන ජාල ක්‍රියාකරුවන් සඳහා සංඛ්‍යාත පරාස තුනක් වෙන් කිරීම.
- විදුලි සංදේශ පනත ප්‍රකාරව ඩිජිටල් විකාශන ජාල ක්‍රියාකරුවන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- සම්ප්‍රේෂණය ආශ්‍රිත මාදිලි අනුමැතිය ලබා දීම.
- වර්තමාන ඇනලොග් සම්ප්‍රේෂණ ව්‍යාප්ත කිරීම සඳහා අදාළ දින හෝ එදිනට පෙර අනුමැතිය ලබාදීම නැවැත්වීම.
- ඩිජිටල්කරණ සැලැස්ම ප්‍රකාරව චන්ද්‍රිකා සහ කේබල් සැපයුම්කරුවන් අනාවරණය කර ගැනීම.
- ආපදා ආරක්ෂණ පහසුකම් ලබාගන්නා විට ඩිජිටල් විකාශන ජාල ක්‍රියාකරුවනගේ විශේෂ උපයෝගිතා මට්ටම් පවත්වාගෙන යාමට වග බලා ගැනීම.

## 6.5 කාර්ය මණ්ඩලය

2011 වසරේ දී වර්ණාවලි කළමනාකරණ අංශය නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු (1), සහකාර අධ්‍යක්ෂවරු (7), කළමනාකරණ සහකාර මට්ටමේ නිලධාරීන් (22) සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩල සේවකයන් පස්දෙනෙකු (5) ඇතුළු 35 දෙනෙකුගෙන් සමන්විත විය.

**2011/08/24 දින පවත්වන ලද ප්‍රථම ජාතික උපදේශන කමිටුවේ දී යාවත්කාලීන කළ පරිදි ශ්‍රී ලංකාවේ ඩිජිටල් රූපවාහිනී විකාශන සේවා රාමුව පිළිබඳ ප්‍රධාන කරුණු සහ ක්‍රියාත්මක උපලේඛනය** (6.7 වගුව)

| | ක්‍රියාකාරකම් | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|
| යෝජිත කරුණු | 2011 අගභාගය – උතුරු සහ බස්නාහිර පළාත්වල ඩිජිටල් රූපවාහිනී විකාශන සේවා (DTTB) ආරම්භ කිරීම (ප්‍රථමයෙන් උතුරු පළාතේ දෙවනුව නැගෙනහිර පළාතේ) | | | | | | | |
| | 2014 මැද භාගය - සියළුම ස්ථානවල ඩිජිටල් රූපවාහිනී විකාශන සේවා ආරම්භ කිරීම | | | | | | | |
| | 2015 අගභාගය – බස්නාහිර පළාතේ ඇනලොග් තාක්ෂණය ක්‍රියාවිරහිත කිරීම | | | | | | | |
| | 2017 අගභාගය – ඇනලොග් තාක්ෂණය ක්‍රියාවිරහිත කිරීම අවසන් කිරීම | | | | | | | |
| 1 | වර්තමාන ජාල ක්‍රියාකරුවන්ගේ ඇනලොග් ch 41 සහ ch 43 අවලංගු කිරීම | | | ආරම්භය: 2011 2 වන කාර්තුව අවසානය: 2012 2 වන කාර්තුව | | | | |
| 2 | ශ්‍රී.ලං.වි.ස.නි.කො.ස විසින් පාලනය කරන ඩිජිටල් රූපවාහිනී සම්ප්‍රේෂණ ජාල සඳහා ගුවන් විදුලි සංඛ්‍යාත සැළසුම් කිරීම | | | ආරම්භය: 2011 2 වන කාර්තුව අවසානය: 2012 2 වන කාර්තුව | | | | |
| 3 | ඩිජිටල් රූපවාහිනී සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන 8 යටිතල පහසුකම් ශක්‍යතා අධ්‍යයනය ඉහළ ප්‍රමුඛතාවය ලබාදීම | | | ආරම්භය: 2011 2 වන කාර්තුව අවසානය: 2012 1 වන කාර්තුව (ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව/ජනමාධ්‍ය සහ තොරතුරු අමාත්‍යාංශය) | | | | |
| 4 | යෝජිත ඩිජිටල් විකාශණ ජාල ක්‍රියාකරුවන්ගේ පද්ධති බලපත්‍ර සම්බන්ධයෙන් ක්‍රියා කිරීම | | | ජනමාධ්‍ය සහ තොරතුරු අමාත්‍යාංශයේ උපදෙස් අපේක්ෂාවෙන් සිටී | | | | |
| 5 | මුල් ඩිජිටල් විකාශන ජාල ක්‍රියාකරුවන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම | | | ආරම්භය: 2012 1 වන කාර්තුව අවසානය: 2012 2 වන කාර්තුව | | | | |
| 6 | ඩිජිටල් විකාශන ජාල ක්‍රියාකරුවන් විසින් ඩිජිටල් රූපවාහිනී සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන අංක සැලසුම් සකස් කිරීම/පද්ධති ක්‍රියාත්මක කිරීම ඇතුළු උපකරණ සවි කිරීම | | | | | මෙය අවසන් කිරීම සඳහා මාස 24 ගත වන අතර 2014 මැද භාගය වන විට සේවා ඉලක්ක සම්පූර්ණ කිරීම | | |

# ජාල අංශය

7 පරිච්ඡේදය

විදුලි සංදේශ පනත ප්‍රකාරව කොමිෂන් සභාවේ වගකීම් ඉටු කිරීමෙහිලා 2011 වසරේ දී ජාල අංශය විසින් පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී:

## 7.1 කාර්යයන්

- ජාතික අංකන සැලැස්ම කළමනාකරණය කිරීම.
- විදුලි සංදේශ යටිතල පහසුකම් සංවර්ධනය සම්බන්ධයෙන් ආයතනික වශයෙන් සහ ස්වාධීනව ඉදිරිපත් කරන ව්‍යාපෘති යෝජනා අධ්‍යයනය කිරීම සහ එම වාර්තා නිර්දේශ කිරීම.
- ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ අංශය සඳහා තාක්ෂණික ප්‍රමිතීන් ක්‍රියාවට නැංවීම හා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රමිතිකරණ අංශය (ITU - T) සහ ලෝක විදුලි සංදේශ ප්‍රමිතිකරණ අංශය (WTSA) ආශ්‍රිත සියලුම කාර්යයන් ඉටු කිරීම.

- තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා සහභාගිවීම සහ විදුලි සංදේශනය ආශ්‍රිත තාක්ෂණික යෙදවුම් සැපයීම.
- ජාල අංශය හා සම්බන්ධ ජාල උපකරණ සහ පර්යන්ත සඳහා මාදිලි අනුමැතිය ලබාදීම සහ රේගුව මගින් භාණ්ඩ නිෂ්කාශනය කිරීමේ ක්‍රියාවලිය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- දුරකථන ක්‍රියාකාර සමාගම් සඳහා සංඥා ඒකක සංකේත සැලසුම් කිරීම සහ පරිපාලනය කිරීම.
- වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීමේ අයදුම්පත් ක්‍රියාවලිය පරීක්ෂාවට භාජනය කිරීම (2.7.1.3 බලන්න) සහ වෙළෙඳ බලපත්‍ර පරිපාලනය කළමනාකරණය කිරීම.
- මහජන ආරක්ෂක නීති හා නියෝග සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශනවලට සහාය වීම.
- අනුකූලතාවය සම්බන්ධයෙන් යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳව බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ට උපදෙස් ලබාදීම.
- විභාග දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ආධුනික ගුවන් විදුලි ක්‍රියාකරු (ARO) විභාගය පැවැත්වීම.

## 7.2 කාර්යසාධනය

2011 වසර තුළ දී ජාල අංශය නියාමන කාර්යයන් (වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම, උපකරණ ආනයනය සඳහා නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම, පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම, විදුලි සංදේශ යටිතල ව්‍යුහයන් සංවර්ධනය කිරීමට අදාළ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ සකස් කිරීම වැනි සහ කුලුනු ඉදි කිරීම, ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා ප්‍රදර්ශන ආදී කාර්යයන් ඉටු කිරීමට දායක විය.

ජාල අංශය විසින් ඉටු කරනු ලැබූ කාර්යයන්ට අදාල සංඛ්‍යාලේඛන 7.1 වගුවේ දැක් වේ.

**ජාල අංශය පිළිබඳ සංඛ්‍යාලේඛන, 2010-2011** (7.1 වගුව)

| විස්තරය | 2010 | 2011 |
|---|---|---|
| නිකුත් කරන ලද මුළු වෙළෙඳ බලපත්‍ර සංඛ්‍යාව | 487 | 875 |
| ඉදි කරන ලද සමුච්චිත කුලුනු සංඛ්‍යාව | 4067 | 5083 |
| කුලුනු පිළිබඳව ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව | 149 | 203 |
| පවත්වන ලද මුළු පැමිණිලි සංඛ්‍යාව (කුලුනු ආශ්‍රිතව) | 78 | 69 |
| කුලුනු ඉදිකිරීම සම්බන්ධයෙන් මුළු පැමිණිලි සංඛ්‍යාව | 17 | 3 |
| කුලුනු සම්බන්ධයෙන් සමථයකට පත් වූ මුළු මහජන පැමිණිලි සංඛ්‍යාව | 10 | 147 |
| පවත්වන ලද මුළු මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 17 | 16 |
| ප්‍රදානය කරනු ලැබූ මුළු නව මාදිලි අනුමැතීන් සංඛ්‍යාව | 28 | 66 |
| මුළු ආනයනය නිෂ්කාශනය නිකුත් කරනු ලැබූ සංඛ්‍යාව | 3217 | 3654 |
| මුළු තනි පුද්ගල නිෂ්කාශන සංඛ්‍යාව | 88 | 201 |
| ආධුනික ගුවන් විදුලි ක්‍රියාකරු විභාගය සඳහා පෙනී සිටි මුළු අයදුම්කරුවන් සංඛ්‍යාව | 50 | 20 |
| නිකුත් කරන ලද මුළු සමුච්චිත නව කෙටි සංකේත අංක සංඛ්‍යාව | 22 | 26 |
| පවත්වන ලද වෙනත් ප්‍රදර්ශන සංඛ්‍යාව | 04 | 03 |

### 7.2.1 වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම

විදුලි සංදේශ පනතේ (2.7.1.3 බලන්න) 21(1) වගන්තිය යටතේ විදුලි සංදේශ උපකරණ විකිණීමේ වෙළෙඳ බලපත්‍ර නිකුත් කරන අතර මහජනතාව මෙම කරුණ සම්බන්ධයෙන් දැනුවත් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2011 වසරේ දී නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 875කින් එනම් සියයට 80 කින් වැඩි වී ඇත.

### 7.2.2 විදුලි සංදේශ කුලුනු ඉදි කිරීම

2011 වසරේ දී ඉදි කරන ලද විදුලි සංදේශ කුලුනු සංඛ්‍යාව 5083ක් වූ අතර එය 2010 වසරේ දී ඉදි කරන ලද මුළු කුලුනු සංඛ්‍යාව හා සන්සන්දනය කිරීමේ දී සියයට 25ක වැඩිවීමකි. මෙමගින් සේවාවේ ප්‍රශස්ත ප්‍රමිතිය සහිතව දූරකථන ක්‍රියාකාර සමාගම්වල ආවරණ ප්‍රදේශය වර්ධනය වී ඇත. කුලුනු බෙදා ගැනීමේ ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නව කුලුන ඉදිකිරීමේ ප්‍රවණතාවය අවම කිරීමෙහිලා අවශ්‍ය පියවර ගෙන ඇත. කුලුනු ඉදි කිරීම සම්බන්ධයෙන් 2011 වසරේ දී වැදගත් කාර්යයන් දෙකකට මුල පුරන ලද අතර කොකාවිල් බහු කාර්යය කුලුන සහ සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය විවෘත කිරීම, තවත් බහු කාර්යය විදුලි සංදේශ කුලුනක් සහ විනෝදාස්වාදය සපයන මධ්‍යස්ථානයක් කොළඹ නගරයේ ඉදි කිරීම මේ අතර වේ.

#### 7.2.2.1 කොකාවිල් බහුකාර්යය කුලුන සහ සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය

කොකාවිල් බහු කාර්යය සන්නිවේදන සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය අතිගරු ජනාධිපතිතුමා විසින් 2011 ජූනි 06 දින විවෘත කරන ලදි.

ශ්‍රී ලංකාවේ විශාලතම සහ උසම සන්නිවේදන සම්ප්‍රේෂණ කුලුන වන කොකාවිල් කුලුනේ උස මීටර් 174කි. මෙය රජයේ උතුරු වසන්තය වැඩසටහන යටතේ රුපියල් මිලියන 310ක පිරිවැයක් දරමින් ආශ්‍රිත පහසුකම් සහිතව ඉදි කරන ලදී. මෙම කුලුන දකුණු ආසියාවේ උසම ස්වයං ආධාරක සම්ප්‍රේෂණ කුලුන වශයෙන් ප්‍රවීනයන් හඳුනා ගෙන ඇත. මෙම කුලුනු අවකාශය විදුලි සංදේශනය, රූපවාහිනී, ගුවන් විදුලි සහ වෙනත් රජයේ ආයතනික පහසුකම් සඳහා



කොකාවිල් කුලුන උත්සවාකාරයෙන් විවෘත කිරීමේ අවස්ථාව

භාවිතා කරනු ලැබේ. මෙම බහු කාර්යය සන්නිවේදන සම්ප්‍රේෂණ කුලුන ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ ජීවත් වන ප්‍රජාවට බලපාන විදුලි සංදේශ, රූපවාහිනී, ගුවන් විදුලි සහ සන්නිවේදන සේවා ආශ්‍රිත ගැටලු ඉවත් කිරීමට සහාය වේ. එමෙන් ම මෙය උතුරු පළාතේ ඉහළ ප්‍රමිතියෙන් යුතු පැහැදිලි රූපවාහිනී, ගුවන් විදුලි සහ විදුලි සංදේශ ආවරණ සැපයීමට ඉවහල් වේ. කලාපයේ අදාළ විදුලි සංදේශ සේවා ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රමාණවත් අවකාශ සහ පහසුකම් සැපයීමට මෙම කුලුනෙන් අපේක්ෂිතය.

#### 7.2.2.2 කොළඹ නෙළුම් කුලුන

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් කොළඹ බේරේ වැවට මුහුණ ලා බහු කාර්යය විදුලි සංදේශ කුලුනක් සහ විනෝදාස්වාදය සපයන මධ්‍යස්ථානයක් ඉදි කිරීමට අවශ්‍ය සැලසුම් කර ඇති අතර එය කොළඹ නෙළුම් කුලුන යනුවෙන් නම් කර ඇත. මෙම කුලුන විද්‍යුත් මාධ්‍ය සහ විදුලි සංදේශ සේවා මෙන් ම විනෝදාස්වාදය සපයන ක්‍රියාකාරකම් සඳහා භාවිත කරනු ලැබේ. මෙය අවම වශයෙන් FM නාලිකා 50කින්, රූපවාහිනී විකාශන සේවා 50කින් සහ විදුලි සංදේශ සේවා සැපයුම්කරුවන් 10කින් සමන්විත වන අතර මීට අමතරව වක්‍රව කොළඹ නගරයේ විවිධ ගොඩනැගිලිවල අසීමිතව ස්ථාපනය කර ඇති අධි බලැති රූපවාහිනී සහ FM ඇන්ටෙනා ඉවත් කිරීමටත් පරිසරය හරිත වර්ණ ගැන්වීමටත් දායක වේ. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 104.3කි.

#### 7.2.2.3 කුලුනු ඉදිකිරීම ආශ්‍රිත ගැටලු

- විදුලි සංදේශ කුලුනු අනුමත කිරීමේ ක්‍රියාවලියේ දී ආවස්ථික ආකාරයෙන් විවිධ පළාත් පාලන ආයතන අය කරන විවිධ ගාස්තු පවත්නා නිසා ඉතා ඉහළ අගයක් ගන්නා බැවින් දුරකථන ක්‍රියාකාර සමාගම්වලට පළාත් පාලන ආයතනවල අනුමැතිය ලබා ගැනීමේ දී ඇතිවන අසීමිත ප්‍රමාදවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වේ.
- කුලුනු නිසා අකුණු ගැසීම ඉහළ යතැයි බිය පොදු මහජනතාව අතර පවත්නා මතයකි. මෙම කරුණ පිළිබඳව සාකච්ඡා කිරීම පිණිස ජාල අංශය විසින් මෙම ක්ෂේත්‍රය පිළිබඳව විශේෂඥ දැනුම සහිත වෘත්තිකයන්ගේ සහාය ඇතිව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

### 7.2.3 යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ පැමිණිලි

විදුලි සංදේශ කුලුනු ඉදිකිරීම ඉහළ යාමත් සමඟ කුලුනු ඉදි කිරීමට විරුද්ධ පැමිණිලි සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. විවිධ හේතු නිසා කුලුනු ඉදි කිරීමට විරුද්ධව මහජනතාවගෙන් පැමිණිලි ලැබී ඇති අතර 2011 වසරේ දී ජාල අංශය විසින් මෙම කාරණය පිළිබඳව විමර්ශන 69ක් පවත්වා ඇත. 2010 වසර හා සන්සන්දනය කිරීමේ දී 2011 වසරේ දී විදුලි සංදේශ කුලුනු ආශ්‍රිත අධිකරණ නඩු සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අඩු වී ඇත. 2011 වසරේ දී කුලුනු ආශ්‍රිත මහජන පැමිණිලි විශාල සංඛ්‍යාවක් (147) සමථයකට පත් කර ඇත.

### 7.2.4 මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

නිර්දේශිත කාලපරිච්ඡේදය තුළ විදුලි සංදේශ යටිතල පහසුකම් සංවර්ධනය සහ විදුලි සංදේශ උපකරණ විකිණීමට අදාළ නීත්‍යානුකූල

අවශ්‍යතාවයන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 16ක් පවත්වා ඇත. මෙම වැඩසටහන් පැවැත්වීමේ අරමුණ වූයේ විදුලි සංදේශ කුලුනු ඉදිකිරීම සම්බන්ධ ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ විදුලි සංදේශ උපකරණ නීත්‍යනුකූල නොවන ආකාරයෙන් විකිණීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සහ මහජන අදහස්වලට අවධානය යොමු කිරීම වේ. මීට පෙර සඳහන් කර ඇති පරිදි මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් 2011 වසරේ දී වෙළෙඳ බලපත්‍ර සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි කිරීමට දායක වී ඇත.

### 7.2.5. මාදිලි අනුමැතිය සහ ආයතන නිෂ්කාශන නිකුත් කිරීම

විදුලි සංදේශ පනතේ 5(Q) නියමයන් ප්‍රකාරව පර්යන්ත උපකරණ සඳහා කොමිෂන් සභාවේ මාදිලි අනුමැතිය අවශ්‍ය වේ. ඒ අනුව, දුරකථන උපකරණ, ෆැක්ස් යන්ත්‍ර PABXs (පෞද්ගලික ස්වයංක්‍රිය ශාඛ හුවමාරුව), මෝඩම් යන්ත්‍ර, රැහැන් රහිත දුරකථන සහ වෙනත් පාරිභෝගික පරිශ්‍ර උපකරණ බලපත්‍රලාභී ජාලයකට සම්බන්ධ කිරීම පිණිස මාදිලි අනුමැතිය අවශ්‍ය වේ. 2011 වසරේ දී කොමිෂන් සභාව විසින් උපකරණ 66ක් සඳහා නව මාදිලි අනුමැතිය ලබා දී ඇත. 7.1 වගුව මගින් ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ උපකරණ ආනයනය කිරීම සම්බන්ධයෙන් ආනයන නිෂ්කාශන සහ තනි පුද්ගල නිෂ්කාශන නිකුත් කිරීම ප්‍රමාණාත්මකව වැඩි වී ඇති බව පෙනී යයි.

### 7.2.6 ආධුනික ගුවන් විදුලි ක්‍රියාකාරු (ARO) විභාගය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ආධුනික ගුවන් විදුලි ක්‍රියාකරු විභාගය සඳහා අයදුම්පත් කැඳවන ලද අතර විභාග දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව විභාගය පවත්වන ලදී. 2011 වසරේ දී මෙම විභාගය සඳහා අයදුම්කරුවන් 22ක් පෙනී සිට ඇත.

ඉහත කරුණුවලට අමතරව 2011 වසරේ දී ජාල අංශය විසින් මතු දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටු කරන ලදී.

### 7.2.7 කෙටි සංකේත අංක වෙන් කිරීම

රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන විසින් ඔවුන්ගේ සේවා මහජනතාව වෙත පහසුවෙන් ප්‍රවේශ කිරීම පිණිස කෙටි සංකේත අංක වෙන් කිරීම සඳහා ඉල්ලීම් කර ඇත. එම ඉල්ලීම් ලැබුණු විට ජාල අංශය අදාළ ආයතනවලින් ව්‍යාපෘති යෝජනා ලබා ගන්නා අතර සීමිත සම්පතක් වෙන් කිරීමේ දී උපරිම අවධානයක් ලබා දිය යුතු බැවින් යෝජනාව විස්තරාත්මකව අධ්‍යයනය කරයි. අධ්‍යයන කටයුතු අවසන් කිරීමෙන් පසුව අදාල ඉල්ලීම් සම්බන්ධයෙන් ජාල අංශය කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කරයි. 2011 වසර දක්වා වෙන් කරන ලද නව කෙටි සංකේත අංක සංඛ්‍යාව 26කි.

### 7.2.8 ඇන්ටෙනා ආකෘති ඉදිකිරීම, නඩත්තු කිරීම පිළිබඳ නිර්නායකයන් සංවර්ධනය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

විදුලි සංදේශ සේවා සංවර්ධනය කිරීම අයුතු ලෙස සීමා නොකරමින් මහජන යහපත සහ පරිසරය ආරක්ෂා කිරීමේ අදහසින් මෙම කාර්යය සිදු කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ඇන්ටෙනා ආකෘති සම්බන්ධ කරුණු සාකච්ඡා කිරීම සහ ඇන්ටෙනා ආකෘති ඉදිකිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ ප්‍රතිපත්තිමය නිර්නායකයන්

කෙටුම්පත් කිරීම පිණිස තාක්ෂණික උපදේශක කමිටුවක් පත් කරන ලදි. කොමිෂන් සභාව විසින් මෙම ප්‍රතිපත්තිමය නිර්නායකයන් අනුමත කර ඇති අතර අදාළ පාර්ශවයන් විසින් මෙම නිර්නායකයන් පිළිපදින බැවින් කුලුනු ඉදිකිරීම සහ ඒවායේ නඩත්තුව පිළිබඳ ගැටලු අවම කිරීමට අපේක්ෂිතය.

### 7.2.9. නීත්‍යනුකූල නොවන වෙළෙන්දන් විමර්ශනය කිරීම

මීට පෙර සඳහන් කර ඇති පරිදි විදුලි සංදේශ උපකරණ විකිණීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මගින් බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය වේ. ජංගම දුරකථන ඇතුළු විදුලි සංදේශ උපකරණ නීත්‍යනුකූලව අලෙවි කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම බලාත්මක කිරීම/ දිරිගැන්වීම පිණිස ශ්‍රී ලංකා පොලීසියේ සහයෝගය ඇතිව නීත්‍යනුකූල නොවන වෙළෙන්දන් විමර්ශනය කිරීම සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ජාල අංශය මගින් සිදු කෙරේ.

### 7.2.10. නීත්‍යනුකූල නොවන ආකාරයෙන් පවත්වාගෙන යන කේබල් රූපවාහිනී සේවා පාලනය කිරීම.

විදුලි සංදේශ පනතේ 22(අ) (1) වගන්තිය ප්‍රකාරව කිසිම තැනැත්තෙකු තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කළ බලපත්‍රයක අධිකාරිත්වය යටතේ හැර කිසිම පරිශ්‍රයක කේබල් වැඩ සිදු නොකළ යුතුය. 2011 වසරේ දී ජාල අංශය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව නීත්‍යනුකූල නොවන කේබල් රූපවාහිනී සේවා පාලනය කිරීම දීප ව්‍යාප්තව සිදු කර ඇත.

## 7.3. කාර්ය මණ්ඩලය

2011 වසරේ දී ජාල අංශය නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු (1) සහකාර අධ්‍යක්ෂවරු (3), කළමනාකරණ සහකාර මට්ටමේ නිලධාරීන් (18) සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩල සේවකයන් තිදෙනෙකු (3) ඇතුළු (25) දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් විසින් සිදු කරන ලදි.

# බලපත්‍ර පරිපාලන අංශය

8 පරිච්ඡේදය

විදුලි සංදේශ පනත ප්‍රකාරව කොමිෂන් සභාවේ වගකීම් ඉටුකිරීමෙහිලා 2011 වසරේදී බලපත්‍ර පරිපාලන අංශය විසින් පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී:-

## 8.1 කාර්යයන්:

- විදුලි සංදේශ ක්‍රම බලපත්‍ර සම්බන්ධ කටයුතු කළමනාකරණය කිරීම සහ බලපත්‍ර කොන්දේසි බලාත්මක කිරීම.
- තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූලව ආයෝජකයන්ගේ ව්‍යාපාරික සැළසුම් ඇති කිරීම, අයදුම්පත්‍ර තක්සේරු කිරීම සහ අදාල ආර්ථිකමය, නීතිමය සහ පාරිභෝගික අංශ සම්බන්ධීකරණය කිරිම.
- බලපත්‍රයේ කොන්දේසි මත බලපත්‍රලාභියාගේ තාක්‍ෂණික අනුකූලතාවය සහතික කිරීම.
- විදුලි සංදේශ සේවා සැපයීමේදී නව භාවිතයන් පිළිබඳ නීති රීති හා පටිපාටි පවත්වා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම.

- විදුලි සංදේශ කටයුතු, ප්‍රතිපත්ති සහ නියාමනයේදී කොමිෂන් සභාවේ සෙසු අංශ සම්බන්ධීකරණය කිරීම.
- වෙළඳපල සංවර්ධනය, ආර්ථික නියාමනය සහ ආරාවුල් නිරාකරණය කිරීම, ඇතුළුව අන්තර් සම්බන්ධතාවය සහ ප්‍රවේශය, ජාල සහ විශ්වීය සේවා බැඳීම් පිළිබඳ කරුණු කළමනාකරණය කිරීම.
- නියාමන ක්ෂේත්‍රය විශ්ලේෂණය කිරීම පිළිබඳ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනෙකුත් අංශවලට උපදෙස් ලබාදීම, ප්‍රශස්ත නියාමන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට දායකත්වය ලබාදීම සහ නියාමන වාර්තා සමාලෝචනය කිරීම.
- කොමිෂන් සභාවේ සෙසු අංශ සමඟ තාක්ෂණික, නියාමන සහ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් අත්දැකීම් සහ අදහස් හුවමාරු කර ගැනීමෙහිලා මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම.
- වෙනත් විදුලි සංදේශ නියාමන ආයතනවල විදුලි සංදේශ/තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ ප්‍රවණතා විශ්ලේෂණය කිරීම සහ කොමිෂන් සභාවේ අවධානය යොමු විය යුතු නියාමන සහ ප්‍රතිපත්තිමය ගැටළු හඳුනා ගැනීම සහ සුදුසු නිර්දේශ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.

## 8.2 කාර්ය සාධනය

### 8.2.1 බලපත්‍ර සංශෝධනය කිරීම/ අලුත් කිරීම

දූරකථන ක්‍රියාකාර සමාගම් වෙතින් සිය බලපත්‍ර සංශෝධනය කිරීම/ අලුත් කිරීම සඳහා වන ඉල්ලීම් කොමිෂන් සභාව වෙත ලැබුණු විට එම ඉල්ලීම් පිළිබඳව බලපත්‍ර පරිපාලන අංශය විසින් අවධානය යොමු කරන අතර, කොමිෂන් සභාව වෙත සුදුසු නිර්දේශ ඉදිරිපත් කරයි. පුවත්පත් නිවේදන සහ මහජනතාවගේ කරුණු සැළකිරීම්/ විරෝධතා ලබාගැනීම මගින් එම ඉල්ලීම් සම්බන්ධ කොමිෂන් සභාවේ නිර්දේශ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා පියවර ගනු ලැබේ. මෙම කරුණු සැළකිරීම්/ විරෝධතා සළකා බැලීමෙන් පසුව කොමිෂන් සභාව එහි නිර්දේශ අනුමැතිය සඳහා අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරයි.

#### 8.2.2.1 බලපත්‍රය සංශෝධනය කිරීම:

2011 වසරේදී පනතේ 18 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත පවරන ලද අධිකාරිත්වය ප්‍රකාරව යෝජිත සංශෝධන සඳහා සැළකිරීම් හෝ විරෝධතා ලබාගැනීමෙහිලා අදාල පාර්ශ්වයන්ට දෙන ලද බලපත්‍රවල සංශෝධන කිරීම පිළිබඳ යෝජනා සම්බන්ධයෙන් ප්‍රසිද්ධ නිවේදන කරනු ලැබේ. යෝජිත බලපත්‍ර සංශෝධනය පිළිබඳ කෙටුම්පත් මහජනතාවට www.trc.gov.lk කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකි බව දැනුම් දී ඇත. වැඩිදුරටත් මෙම සංශෝධන පිළිබඳ කරුණු සැළකිරීම් හෝ විරෝධතා 2012.01.10 ට පෙර ඉදිරිපත් කළ හැකි බවද නිවේදනය කර ඇත.

#### i. සීමාසහිත ඩයලොග් ඇක්සියටා පුද්ගලික සමාගම

අස්ථානගතවූ හෝ සොරකම් කරන ලද ජංගම දූරකථන සියළුම ජංගම ජාල ඔස්සේ සම්බන්ධ කළ නොහැකි බවට වග බලා ගැනීම පිණිස අනෙකුත් ජංගම ක්‍රියාකාර සමාගම් අතර මෙම අස්ථානගතවූ

හෝ සොරකම් කරන ලද ජංගම දුරකථන පිළිබඳ තොරතුරු හුවමාරු කරගැනීමට සීමාසහිත ඩයලොග් ඇක්සියටා පුද්ගලික සමාගමට අවශ්‍යවීම බලපත්‍රය සංශෝධනය කිරීමේ අරමුණ වේ.

### ii. සීමාසහිත එටිසලාට් ලංකා පුද්ගලික සමාගම

ජාල අවහිරතා අවම කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සේවා තත්ත්වය සැළකිය යුතු ලෙස වැඩිදියුණු කරන (Wi-Fi) රැහැන් රහිත අනුකූලතා තාක්‍ෂණය භාවිතා කරමින් අන්තර්ජාල සේවා හෝටල්, වෙළඳ සංකීර්ණ යනාදී අධික ජනගහනයක් සහිත ප්‍රදේශවලට සැපයීම පිණිස දුරකථන ක්‍රියාකාර සමාගම්වලට අවසර ලබාදීම පිණිස සංශෝධනය කරන ලදී.

### iii. සීමාසහිත හච්සන් ටෙලිකොමියුනිකේෂන්ස් ලංකා පුද්ගලික සමාගම

අස්ථානගතවූ හෝ සොරකම් කරන ලද ජංගම දුරකථන සියළුම ජංගම ජාල ඔස්සේ සම්බන්ධ කළ නොහැකි බවට වගබලා ගැනීම පිණිස අනෙකුත් ජංගම ක්‍රියාකාර සමාගම් අතර මෙම අස්ථානගතවූ හෝ සොරකම් කරන ලද ජංගම දුරකථන පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීමට සීමාසහිත ඩයලොග් ඇක්සියටා පුද්ගලික සමාගමට අවශ්‍යවීම බලපත්‍රය සංශෝධනය කිරීමේ අරමුණ වේ.

### iv. සීමාසහිත මොබිටෙල් පුද්ගලික සමාගම

ජාල. අවහිරතා අවම කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සේවා තත්ත්ව සැලකිය යුතු ලෙස වැඩිදියුණු කරන (Wi-Fi) රැහැන් රහිත අනුකූලතා තාක්‍ෂණය භාවිතා කරමින් අන්තර් ජාල සේවා හෝටල්, වෙළඳ සංකීර්ණ යනාදී අධික ජනගහනයක් සහිත ප්‍රදේශවලට සැපයීම පිණිස දුරකථන ක්‍රියාකාර සමාගම්වලට අවසර ලබාදීම පිණිස සංශෝධනය කරන ලදී. අස්ථානගතවූ හෝ සොරකම් කරන ලද ජංගම දුරකථන සියළුම ජංගම ජාල ඔස්සේ සම්බන්ධ කළ නොහැකි බවට වග බලා ගැනීම පිණිස අනෙකුත් ජංගම ක්‍රියාකාර සමාගම් අතර මෙම අස්ථානගතවූ හෝ සොරකම් කරන ලද ජංගම දුරකථන පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීමට සීමාසහිත ඩයලොග් ඇක්සියටා පුද්ගලික සමාගමට අවශ්‍යවීම බලපත්‍රය සංශෝධනය කිරීමේ තවත් අරමුණක් විය.

### 8.2.1.2 බලපත්‍රය අලුත් කිරීම

ශ්‍රී ලංකාව තුළ දත්ත සන්නිවේදන සේවා සැපයීම සඳහා විදුලි සංදේශ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට විදුලි සංදේශ පනතේ 17 (2) වගන්තිය යටතේ 1991.07.04 දින අමාත්‍යවරයා විසින් ප්‍රදානය කරන ලද ක්‍රියාකරු බලපත්‍රය අලුත් කර දෙන ලෙස සීමාසහිත ලංකා කම්යුනිකේෂන් පුද්ගලික සමාගම ඉල්ලා සිටියේය. 2006.03.10 දිනැති අංක 1435/20 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද පනත ප්‍රකාරව බලපත්‍රය අලුත් කිරීමේ නිර්නායකයන් හා පටිපාටිවල සඳහන් අවශ්‍යතාවයන් සීමාසහිත ලංකා කම්යුනිකේෂන් පුද්ගලික සමාගම සපුරා ඇති බවට කොමිෂන් සභාව සෑහීමකට පත්වූ බැවින් 2011.07.04 දින සිට බලපවත්වන පරිදි වසර 10 ක කාලපරිච්ඡේදයක් සඳහා ලංකා කම්යුනිකේෂන් පුද්ගලික සමාගමට බලපත්‍රයක් ප්‍රදානය කිරීමට කොමිෂන් සභාව අතිගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ කිරීමට යෝජනා කර ඇති බව මහජනතාවගේ දැනගැනීම පිණිස දැන්වීමක් ප්‍රසිද්ධ කරන ලදී.

යෝජිත බලපත්‍රය පිළිබඳ කෙටුම්පත කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.trc.gov.lk ඔස්සේ ලබා ගත හැකි බව මහජනතාවට දැනුම් දෙන ලදී. සීමාසහිත ලංකා කමියුනිකේෂන් සර්විසස් (පුද්ගලික) සමාගමට බලපත්‍රය ප්‍රදානය කිරීම සම්බන්ධව කරුණු සැළකිරීම් හෝ විරෝධතා 2012.01.10 දිනට පෙර ඉදිරිපත් කළ යුතු බවට මහජනතාව වෙත දැනුම් දෙන ලදී.

### 8.2.2 මතු පරම්පරා ජාල (NGN) ප්‍රතිපත්තිය සහ නියාමන රාමුව

සියළුම සේවා සඳහා උපකාර කිරීමට හැකියාව ඇති තනි පරිමාණුකූල මතු පරම්පරා ජාලයක් සහිතව ක්‍රියාකාර සමාගම් විසින් පවත්වා ගෙන යන සියලුම පැරණි මධ්‍ය ජාල ප්‍රතිස්ථාපනය කිරීම මතු පරම්පරා ජාල තාක්‍ෂණය ඔස්සේ සිදු කළ හැකිවේ. මතු පරම්පරා ජාලයක් ක්‍රියාත්මක වීමත් සමග තනි මෙහෙයුම් කණ්ඩායමකට මුළු ජාලයම ක්‍රියාකරවීමට හා නඩත්තු කිරීමට හැකිවන බැවින් මෙහෙයුම් පිරිවැය (Operational Expenditure) සැළකිය යුතු ලෙස අඩුවේ. තවද මතු පරම්පරා ජාලයෙහි භාවිතා කරනු ලබන්නේ අන්තර්ජාල මූල ලේඛය (Internet Protocol) ආකෘතිකව පාදක කරගත් තනි තාක්ෂණයක් වීම සහ ජාලයේ සියලුම උපකරණ එකම මාදිලියේ ජීවාවීම යන හේතූන් නිසා අනුපාතිකව ඉතුරුම් වැඩිවීමට සහ එමගින් ක්‍රියාකරුගේ ප්‍රාග්ධන වියදම අඩුවීමට මං සැලසේ.

තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ ක්ෂේත්‍රයේ නියාමන ප්‍රතිසංස්කරණයේ දෙවන පියවර නිර්මාණය කර ක්‍රියාවට නැංවීමට හැකිවන පරිදි දැනුම (Knowledge base) ක්‍රියාවට යෙදවීමේ හැකියාව (Implementation Capacity) වර්ධනය කිරීම පිණිස ආයතනික සංවර්ධන පදනමෙන් ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවට ප්‍රදානයක් ලැබුණි. ඒ අනුව ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව මතු පරම්පරා ජාල සඳහා ප්‍රතිපත්තියක් හා නියාමන රාමුවක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කළේය. මෙම කාර්යය සඳහා ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කොට උපදේශකයකුගේ සේවාව ගනු ලැබිණි.

මතු පරම්පරා ජාල සහ වෙනත් නව සැසඳිය හැකි තාක්‍ෂණවලට කාර්යක්ෂම ලෙස ආයෝජනය කිරීම පහසුකරලීම සහ පාරිභෝගික යහපත ආරක්‍ෂා කරමින් යටිතල ව්‍යුහ හා සේවා සැපයුම්කරුවන් අතර ඵලදායි තරඟකාරිත්වයක් පවත්වා ගැනිම සඳහා ප්‍රතිපත්ති හා නියාමන රාමුවක් ස්ථාපනය කිරීම උපදේශක සේවා ලබා ගැනීමේ සමස්ථ පරමාර්ථය විය. විශේෂිත වශයෙන් උපදේශකයන්ගෙන් පහත දැක්වෙන දෑ ඉටුකර ගැනිමට අදහස් කරන ලදී:-

1. ජාත්‍යන්තර පටිපාටි හා අත්දැකීම් පදනම් කර ගනිමින්, එහෙත් ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ සිට ශ්‍රී ලංකාව සඳහා මතු පරම්පරා ජාල ප්‍රතිපත්තියක් හා නියාමන රාමුවක් සකස් කිරීම.
2. තොරතුරු විමසීමේ ලේඛනයක්, නිර්දේශ කෙටුම්පත් හා අවසාන නිර්දේශ සහ අවසන් වාර්තාව ආදී ලේඛන පිළියෙල කිරීම.
3. මෙම ලේඛන සකස් කිරීම පිළිබඳව උනන්දුවක් දක්වන සියලුම තැනැත්තන්ට දැනුම්දීම පිණිස විස්තීර්ණ තොරතුරු විමසීමේ ක්‍රියාවලියක් භාවිතා කිරීම.
4. මතු පරම්පරා ජාල ප්‍රතිපත්තිය හා නියාමන රාමුව නිර්මාණය කිරීමේ අරමුණ ඉටුකර ගැනීමට

ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවට සහායවීම පිණිස කරුණු ඉදිරිපත් කිරීම (Presentation) හා වෙනත් සම්බන්ධිත උපකාරී ලේඛන ඉදිරිපත් කිරීම.

අන්තර්ජාල මූල ලේඛ පාදක කරගත් මධ්‍ය ජාලවලට සම්බන්ධ ගැටළු සහ අවසානයේදී ප්‍රයෝජනය ලබන්නන් මතු පරම්පරා ජාලවලට සම්බන්ධ කරනු ලබන අන්තර්ජාල මූලලේඛ පාදක කරගත් මතු පරම්පරා ප්‍රවේශ ජාල ආශ්‍රිත ගැටළු පිළිබඳව සලකා බැලීම ද උපදේශක විසින් කළ යුතු විය.

තොරතුරු විමසුම් ලේඛනය සකස් කර අවසන් කරනු ලැබූ අතර, ශ්‍රී ලංකාවේ සියළුම ප්‍රධාන විදුලි සංදේශ පාර්ශවයන් වෙත 2010 සැප්තැම්බර් මාසයේදී, මතු පරම්පරා ජාල සඳහා ප්‍රතිපත්ති හා නියාමන රාමුව, පිළිබඳ උපදේශන පත්‍රිකාව නිකුත් කරන ලදී. උපදේශනයේ අභිමතාර්ථ හතරක් විය.

- මතු පරම්පරා ජාල පිළිබඳව සහ මෙම ජාල භාවිතයෙන් ලබා දිය හැකි සේවාවන් පිළිබඳ සාමාන්‍ය හැඳින්වීමක් කිරීම.
- ශ්‍රී ලංකාව තුළ මතු පරම්පරා ජාල සහ අනුරූප සේවාවන් හඳුන්වාදීමෙන් අත්වන වාසි පිළිබඳ පැහැදිලි කිරීම.
- ශ්‍රී ලංකා පාරිභෝගිකයින්ගේ සුභ සිද්ධිය ආරක්ෂා කරමින් මතු පරම්පරා ජාලවලට සංක්‍රමණයවීම සහ ඒවා උපයෝගී කර ගැනීමේදී විසඳා ගැනීමට සිදුවිය හැකි ප්‍රධාන තාක්ෂණික, ආර්ථික හා නියාමන ගැටළු පිළිබඳව තරමක ගැඹුරු අවබෝධයක් ලබාදීම.
- මතු පරම්පරා ජාල ප්‍රතිපත්ති සහ නියාමන රාමුව සම්පාදනය පිණිස මෙම කාරණය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවවල අදහස් ලබාගැනීම.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත පාර්ශ්වකරුවන් රැසකගේ ප්‍රතිචාර ලැබුණි. උපදේශන ක්‍රියාවලියෙන් පසුව 2011 වසරේදී මතු පරම්පරා ජාල ප්‍රතිපත්තිය හා නියාමන රාමුව කෙටුම්පත් කර කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

### 8.2.3 විදුලි සංදේශ නියාමකයන් පිළිබඳ ගෝලීය සම්මන්ත්‍රණය (GSR)

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) විදුලි සංදේශ නියාමකයන් පිළිබඳ ගෝලීය සම්මන්ත්‍රණය (GSR) නියාමන කරුණු පිළිබඳව සංවර්ධනය හා සංවර්ධනය වෙමින් පවත්නා රටවල ජාතික නියාමන ආයතන සහ ප්‍රධාන තොරතුරු හා සන්නිවේදන පාර්ශ්වකරුවන් අතර තොරතුරු බෙදා හදා ගැනීමට හා හුවමාරු කර ගැනීමට වාර්ෂිකව පවත්වනු ලබන ඉහළ පෙළේ ගෝලීය සම්මන්ත්‍රණයකි. 2000 වසරේ එහි ආරම්භයේ සිට විදුලි සංදේශ නියාමකයන් පිළිබඳ ගෝලීය සම්මන්ත්‍රණය සංවර්ධනය හා සංවර්ධනය වෙමින් පවත්නා රටවල ජාතික නියාමන ආයතනවල අවධානයට ලක්වී ඇති අතර, එය ඔවුන්ගේ අදහස් හා අත්දැකීම් හුවමාරු කර ගැනීමට හැකි ගෝලීය මධ්‍යස්ථානයක් ලෙස ප්‍රසාදයට පත් වී ඇත. මෙම රැස්වීම විදුලි සංදේශ නියාමකයන් සහ ප්‍රධාන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාර්ශ්වකරුවන්, පෞද්ගලික අංශය, ආයෝජකයන් හා පාරිභෝගිකයන් වැනි දීප ව්‍යාප්ත ප්‍රජාව අතර සාකච්ඡාවට විවෘත වී ඇත.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් මෙම සම්මන්ත්‍රණය

සත්කාරක රටේ ජාතික නියාමන ආයතනයේ සහයෝගීත්වය ඇතිව සංවිධානය කරනු ලැබේ. විදුලි සංදේශ නියාමකයන් පිළිබඳ ගෝලීය සම්මන්ත්‍රණය සඳහා වසරින් වසරට විශේෂිත වූ තේමාවන් වේ. 2011 වසරේ තේමාව වූයේ අන්තර් ජාල ලොව සඳහා ප්‍රශස්ත නියාමනයක් යන්නයි. විදුලි සංදේශ නියාමකයන් පිළිබඳ ගෝලීය සම්මන්ත්‍රණයට සමගාමීව පවත්වන ගෝලීය කාර්මික නායකයන්ගේ සමුළුව (GILF) තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සංවර්ධනයේ නව ප්‍රවනතා සාකච්ඡා කිරීම පිණිස තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ කර්මාන්තයේ ප්‍රධාන විධායකයන් සහභාගි වන විදුලි සංදේශ සංවර්ධන ක්ෂේත්‍රයේ රැස්වීමකි.

11 වැනි විදුලි සංදේශ නියාමකයන් පිළිබඳ ගෝලීය සම්මන්ත්‍රණය සහ 4 වන ගෝලීය කර්මාන්ත නායකයන්ගේ සමුළුවට සහභාගි වූවන් සියළුම දෙනාට අන්තර් ජාලය, නව සොයා ගැනීම් සඳහා දිරිගැන්වීම සහ ගැටළු සාකච්ඡා කිරීම මෙන්ම අධිවේගී අන්තර්ජාල පද්ධති පිළිබඳ අභියෝග සාක්ෂාත් කර ගැනීමට හැකි ප්‍රශස්ත නියාමන ක්‍රියාවලියක් අධීක්‍ෂණය කිරීමට හැකිවේ. අප විසින් සන්නිවේදන කර ගන්නා ආකාරය, තොරතුරු ප්‍රවේශය, අත්දැකීම් සහ දැනුම හුවමාරු කර ගැනීම, ව්‍යාපාර පවත්වා ගෙන යාම සහ අන්‍යෝන්‍ය අන්තර් ක්‍රියාකාරිත්වය මත අධිවේගී අන්තර්ජාල ප්‍රවේශය සැළකිය යුතු ලෙස වෙනස් වේ. ආර්ථිකය මත අධිවේගී අන්තර්ජාලය මගින් වන බලපෑම ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. අන්තර්ජාල ලොව තුළින් ලැබෙන නව භාවිතයන්, සේවා සහ ව්‍යාපාරික අවස්ථාවලින් සියළුම පුරවැසියන්ට ප්‍රතිලාභ ලැබිය හැකි බව නිසැක කිරීම සඳහා වර්තමානයේ දී ප්‍රධාන අන්තර්ජාල ක්‍රමෝපායන් සහ සැළසුම් අවශ්‍ය වේ.

2011 ඔක්තෝබර් 24 – 27 දක්වා ජිනීවාහිදී පවත්වන ලද 2011 ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ විදුලි සංදේශ පිළිබඳ සමුළුවට සහභාගි වූ නිලධාරීන් කලාපීය සහ ගෝලීය මට්ටමින් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය ආරම්භ කරන තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකාවට කළ හැකි කාර්ය භාරය පිළිබඳව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මහලේකම් සහ කාර්යාංශ තුනක අධ්‍යක්‍ෂවරුන් සමඟ සාකච්ඡා කරන ලදී. ශ්‍රී ලංකාවට 2012 වසරේ විදුලි සංදේශ පිළිබඳ ගෝලීය සම්මන්ත්‍රණයට සත්කාරකත්වය දැක්වීමෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ක්‍රියාකාරකම්වලට ගෝලීය මට්ටමින් ඵලදායීව දායක විය හැකි බව මෙම නිලධාරීන් සඳහන් කරන ලද අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන් මෙම සම්මන්ත්‍රණය සඳහා සත්කාරකත්වය දැක්වීමට සිය කැමැත්ත ප්‍රකාශ කරන ලදී. ඉන් පසුව 2012 වසරේදී විදුලි සංදේශ නියාමකයන් පිළිබඳ ගෝලීය සම්මන්ත්‍රණය සඳහා සත්කාරකත්වය දැක්වීම පිණිස අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කරන ලද අතර, මිල ගණන් ඉදිරිපත් කරන ලදී. විදුලි සංදේශ නියාමකයන් පිළිබඳ ගෝලීය සම්මන්ත්‍රණය – 12 සඳහා සත්කාරකත්වය දැක්වීමේ අවස්ථාව ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පරිශ්‍රමය සාර්ථක වූ අතර, අදාල මිළ ගණන් පිළිගනිමින් 2011 දෙසැම්බර් මස 05 දින තොරතුරු දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ ස්ථිර කිරීමේ විද්‍යුත් ලිපිය ලැබුණි. ඒ අනුව ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ විදුලි

සංදේශ නියාමකයන් පිළිබඳ ගෝලීය සම්මන්ත්‍රණය - 2012 සහ ගෝලීය කාර්මික නායකයන්ගේ සමුළුව සඳහා සත්කාරකත්වය දැක්වීමට අවස්ථාව ලැබිණි. මෙම සම්මන්ත්‍රණය 2012 ඔක්තෝබර් මස 2 – 4 දක්වා කොළඹ හිල්ටන් හෝටලයේදී පවත්වනු ලැබේ. විදුලි සංදේශ අමාත්‍යවරුන් ඇතුළු සාමාජික රටවල් 192 ක සහභාගිවන්නන් 2012 විදුලි සංදේශ නියාමකයන් පිළිබඳ ගෝලීය සම්මන්ත්‍රණය සඳහා සහභාගී වේ.

මෙම සම්භාවනීය ගෝලීය සම්මන්ත්‍රණය ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය සහ සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනයෙහිලා හේතුවේ.

### 8.2.4 පද්ධති බලපත්‍ර නිකුත් කිරීම සහ වෙනත් අංශවලට සහායවීම

බලපත්‍ර පරිපාලන අංශය විසින් ක්‍රියාකරු බලපත්‍ර (පද්ධති බලපත්‍ර) තුළින් එදිනෙදා පැන නගින ගැටළු සම්බන්ධයෙන් ක්‍රියාකරන අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවේ අනෙකුත් අංශවලට තාක්‍ෂණික සහ නියාමන කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය විස්තර ලබාදේ.

## 8.3 කාර්ය මණ්ඩලය

2011 වසරේදී බලපත්‍ර පරිපාලන අංශය නියෝජ්‍ය අධ්‍යක්‍ෂවරයකු (1), උපදේශකවරයකු (1), කළමනාකරණ සහකාර මට්ටමේ නිලධාරීන් තිදෙනෙකු (3), සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩල සේවකයන් දෙදෙනෙකු (2) ඇතුළු හත් (7) දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් විසින් සිදුකරන ලදී.

# පාලන සහ මානව සම්පත් අංශය

9 පරිච්ඡේදය

ආයතනයේ කාර්යයන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම පිණිස 2011 වසරේදී පාලන සහ මානව සම්පත් අංශය විසින් පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

## 9.1 කාර්යයන්

- මානව සම්පත් කළමණාකරනය සහ පොදු පරිපාලනය සම්බන්ධයෙන් නීති, රෙගුලාසි සහ පටිපාටි පිළියෙල කිරීම.
- කාර්ය මණ්ඩලයේ බඳවා ගැනීම්, ස්ථිර කිරීම්, උසස් කිරීම්, නිවාඩු වාර්තා, පැමිණීම, ස්ථාන මාරු, කාර්ය සාධන ඇගයීම් සහ විනය පරීක්ෂණ, සේවයෙන් නිදහස් කිරීම හා විශ්‍රාම ගැන්වීම සම්බන්ධ සියළුම කටයුතු සිදු කිරීම.
- කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු පවත්වා ගැනීම.

- අදාල ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ උපදෙස් සහිතව එක් එක් තනතුරු සඳහා රැකියා පිරිවිතරයන් සැපයීම ඇතුළුව කොමිෂන් සභාව සඳහා කාර්ය මණ්ඩල සැලැස්මක් සකස් කිරීම.
- ජ්‍යෙෂ්ඨ කාර්ය භාර ප්‍රධානීන් සමඟ එක්ව මානව සම්පත් සංවර්ධන අයවැය පිළියෙල කිරීම.
- වාර්ෂික කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් පිළියෙල කිරීම.
- දේශීය සහ විදේශීය කාර්ය මණ්ඩල පුහුණු පාඨමාලා සම්බන්ධීකරණය කිරීම සහ පුහුණුලාභීන් සඳහා ගමන් බිමන්, ලියාපදිංචි කිරීම් සහ අවශ්‍ය සෙසු කටයුතු පිළියෙල කිරීම.
- වාර්ෂික වාර්තා, ආයතනික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම සඳහා අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ආරක්ෂක සේවා, පවිත්‍රතා සේවා, ගොඩනැගිලි නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම මෙන්ම යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම ආශ්‍රිත කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- විදුලිය, ජලය සහ දුරකථන සේවා කාර්යක්ෂමව සැපයීමට වගබලා ගැනීම.
- කොමිෂන් සභාවේ සෙසු අංශ මගින් සිදුකරන කාර්යයන් සඳහා නිසි සහයෝගය ලබාදීම.
- ගෙවීම් අනුමත කිරීම/නිර්දේශ කිරීම.
- කොමිෂන් සභාවේ භාණ්ඩ පිළිබඳව ලේඛනය සහ ලේඛනාගාරය පවත්වාගෙන යාම.
- වාර්ෂික සමීක්ෂණ මණ්ඩල පැවැත්වීම සහ අවශ්‍ය නොවන අයිතමයන් බැහැර කිරීම.
- මාධ්‍ය ඒකකය පාලනය කිරීම.
- පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම, විගණකාධිපති සහ රාජ්‍ය ව්‍යවසායක කමිටුව (COPE) සඳහා වාර්තා ඉදිරිපත් කිරීම මෙන්ම අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වැනි ආයතන සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම.
- වාර්ෂිකව පවත්වන දැයට කිරුළ ප්‍රදර්ශනයට සහභාගිවීම සම්බන්ධ සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- වෘත්තීමය හිතකරභාවය සහ ආරක්ෂා අවශ්‍යතා සපුරාලීමට වගබලා ගැනීම.
- කාර්ය මණ්ඩලය සඳහා වන වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම.
- කාර්ය මණ්ඩලය සඳහා සුභ සාධන සේවා සැපයීම පිණිස සුභ සාධන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ මූල්‍ය සහ මූල්‍ය නොවන දිරිදීමනා පැකේජ සැපයීමට උපදෙස් ලබාදීම මෙන්ම අඩුපාඩු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.
- ආයතනික සමාජ වගකීම් අරමුදල පවත්වාගෙන යාම.

## 9.2 කාර්ය සාධනය

### 9.2.1 ආයතනික වැඩකටයුතු

2011 දෙසැම්බර් මාසය වන විට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විධායක මට්ටමේ නිලධාරීන් 30, විධායක නොවන නිලධාරීන් 129 සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩල සේවකයින් 44 දෙනෙකු ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලය දෙසිය තුන් දෙනෙකුගෙන් (203) සමන්විත වේ. 2011 වසරේ ශ්‍රී.ලං.වි.ස.නි.කො. සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 265 ක් වේ. 2011 දෙසැම්බර් වන විට සංවිධාන ව්‍යුහය 9.1 ප්‍රස්ථාරයෙන් දැක්වේ.

පුද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම, බඳවා ගැනීම්, ස්ථිර කිරීම, උසස් කිරීම, නිවාඩු වාර්තා, පැමිණීම, කාර්ය මණ්ඩලයේ කාර්ය සාධන ඇගයීම්, විනය පරීක්ෂණ යනාදී කාර්ය මණ්ඩලයේ ආයතනික වැඩ කටයුතු පාලන අංශය මගින් සිදු කෙරේ. ශ්‍රී.ලං.වි.ස.නි.කො. සභාවේ කාර්ය මණ්ඩලයේ බඳවා ගැනීම් සහ උසස් කිරීමේ පටිපාටි, සේවක සංඛ්‍යාව අනුමත කිරීම, බදු සහන යටතේ වාහන මිලදී ගැනීම සඳහා අවසර ලබාදීම වැනි කරුණු සම්බන්ධයෙන් ජාතික වැටුප් හා සංඛ්‍යාලේඛන කොමිෂන් සභාව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම මෙම අංශය මගින් සිදු කෙරේ.

### 9.2.2 කාර්ය මණ්ඩලය සහ සංවිධාන ව්‍යුහය සංශෝධනය කිරීම

2006 වන විට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සහ සංවිධාන ව්‍යුහයේ කිසිදු සංශෝධනයක් සිදු කර නැත. 1997 වසරේදී වැටුප් සහ සංඛ්‍යාලේඛන කොමිෂන් සභාව අනුමත සේවක සංඛ්‍යාව සහ සංවිධාන ව්‍යුහය නිර්දේශ කරන ලදී. 1997 සහ 2006 අතර අවස්ථා 5 ක දී කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර ඇත. 1997 වන විට ශ්‍රී.ලං.වි.ස.නි කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාවේ සිදු කරන ලද වෙනස්කම් 9.1 වගුවේ දැක්වේ.

**1997 – 2006 ශ්‍රී.ලං.වි.ස.නි. කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාවේ වෙනස්වීම** (9.1 වගුව)

| වර්ෂය හා මාසය | 1997 දෙසැම්බර් | 2001 ජනවාරි | 2001 අගෝස්තු | 2002 මැයි | 2005 අප්‍රේල් | 2006 පෙබරවාරි |
|---|---|---|---|---|---|---|
| අනුමත සේවක සංඛ්‍යාව | 149 | 175 | 189 | 202 | 245 | 265 |

# වර්තමාන සංවිධාන ව්‍යුහය - ශ්‍රී.ලං.වි.ස.නි.කො.ස



පහත සඳහන් කරුණු නිසා දැනට පවතින අනුමත සේවක සංඛ්‍යාව සහ සංවිධාන ව්‍යුහය සංශෝධනය කිරීමට අවශ්‍ය වී ඇත:

- විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සීඝ්‍ර සංවර්ධනයත් සමග ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන් ව්‍යාප්තවීම.
- බලපත්‍රලාභීන් විසින් උපයා ගන්නා ආදායම මනා ලෙස අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාවය ඇතිවීම.
- නීතයානුකූල නොවන විකාශන මධ්‍යස්ථාන සහ අනවසරයෙන් සංඛ්‍යාත භාවිතා කිරීම ඉහළ යාම.
- ජාත්‍යන්තර විදුලි සංදේශ සේවාවල ප්‍රමිතිය වැඩිදියුණු කිරීමේ අවශතාවය ඇතිවීම.
- 2007.01.17 දිනැති කළමණාකරන චක්‍රලේඛ අංක 30 උපදෙස් ප්‍රකාරව නව බඳවා ගැනීම් පටිපාටියක් හා නව අනුමත සේවක සංඛ්‍යා යෝජනාවලියක් හඳුන්වාදීමේ අවශ්‍යතාවය ඇතිවීම.

ඒ අනුව ශ්‍රී.ලං.වි.ස.නි. කොමිෂන් සභාව 2011 වසරේදී අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට පියවර ගෙන ඇති අතර, සමාලෝචන වර්ෂය තුළදී මෙම කාර්යය පාලන අංශය විසින් සිදු කර ඇත. 2011 දෙසැම්බර් මාසයේදී සංශෝධිත අනුමත සේවක සංඛ්‍යාව සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන ඇති අතර, අනතුරුව යෝජනා ක්‍රියාත්මක කිරීම පිණිස අනුමැතිය ලබා ගැනීමට එම යෝජනා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

### 9.2.3 චක්‍රලේඛ ලිපි නිකුත් කිරීම සහ අදාල පරිපාටි හඳුන්වාදීම

2011 වසරේදී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අදාල ක්ෂේත්‍රයන් කාර්යක්ෂම කිරීම සහ ආයතනයේ ඵලදායිතාවය වැඩිදියුණු කිරීම පිණිස පාලන අංශය විසින් චක්‍රලේඛ ලිපි නිකුත් කරන ලදී.

- පිටතින් පැමිණෙන දුරකථන ඇමතුම් සඳහා ප්‍රතිචාර නොදැක්වීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා තොරතුරු තාක්‍ෂණ උපකරණ සහ සේවා මිලදී ගැනීම සහ සැපයීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ රියදුරු මහත්වරුන් වෙත නිකුත් කළ උපදෙස් මාලාව.
- ආයතනය සතු බස් රථය ආයතනයේ සේවකයින්ගේ සුභසාධන කාර්යයන් සඳහා භාවිතා කිරීම.
- කාර්යාල ක්‍රම පිළිපැදීම මගින් වඩාත් නිවැරදි හා කාර්යක්ෂම සේවයක් සලසාලීම.
- රාජකාරි කටයුතුවලදී මතුවන නෛතික කරුණු පිළිබඳව ක්‍රියා කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ගන්නා ලද තීරණ ක්‍රියාවට නැංවීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ලේඛනාගාරයේ රාජකාරි කටයුතු ආරම්භ කිරීම.
- නිවාස දීමනා/නිවාස කුලී දීමනා.
- කාර්යාලයට ලැබෙන දුරකථන ඇමතුම් සඳහා කඩිනමින් හා ආචාරශීලීව ප්‍රතිචාර දැක්වීම.

- රාජකාරී කටයුතු සඳහා සංචිත වාහන ඉල්ලීම හා ලබාදීම.
- ලබා නොගත් විවේක නිවාඩු සඳහා මුදල් ගෙවීම.
- අංක 135 – 139 දක්වා වන මුදල් රෙගුලාසි යටතේ මූල්‍යමය බලය පැවරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා Microsoft Office පැකේජය මිලදී ගැනීම.
- අතිකාල සේවය සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

### 9.2.4 පුහුණු කිරීම

කාර්ය මණ්ඩලයේ දැනුම වර්ධනය කිරීම, නිපුනතා වර්ධනය කිරීම හා ආකල්ප වෙනස් කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දේශීය මෙන්ම විදේශීය පුහුණු අවස්ථා සේවකයන්ට ලබා දීමට කටයුතු කළේය. 2011 වසර තුළ පුහුණු වැඩසටහන්/ශිෂ්‍යත්ව/සම්මන්ත්‍රණවලට අදාල තොරතුරු 9.2 වගුවේ දැක්වේ.

**ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවේ කාර්ය මණ්ඩලය පුහුණු වැඩසටහන්/ශිෂ්‍යත්ව/සම්මන්ත්‍රණවලට සහභාගිවීම් -2011** (9.2 වගුව)

*(අ) විදේශීය පුහුණු වැඩසටහන්*

| පුහුණුවේ/ශිෂ්‍යත්වයේ/සම්මන්ත්‍රණයේ විෂය පථය | රට | කාලසීමාව | | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| අධිවේගී අන්තර්ජාල සන්නිවේදනයේදී තොරතුරු ආරක්ෂණය පිළිබඳ පුහුණුව | ජපානය | 2011.01.19 | 2011.01.28 | 1 |
| අවකාශ සන්නිවේදනය පිළිබඳ පුහුණුව | ජපානය | 2011.02.01 | 2011.02.09 | 1 |
| GSM ජංගම ලෝක සංගමයේ අමාත්‍ය වැඩසටහන | ස්පාඤ්ඤය | 2011.02.14 | 2011.02.16 | 1 |
| යහපාලනය අවබෝධ කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණයේ ජාතික දත්ත සමුදාය පිළිබඳව පුහුණු කිරීම | ජපානය | 2011.02.24 | 2011.03.02 | 1 |
| 12 වන දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ රැස්වීම | ඉරානය | 2011.02.27 | 2011.03.01 | 1 |
| අධිවේගී අන්තර්ජාල සන්නිවේදනය භාවිතා කරමින් ආපදා ආරක්ෂණ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම පිළිබඳ පුහුණුව | ජපානය | 2011.02.28 | 2011.03.18 | 1 |
| ඩිජිටල් භෞතික රූපවාහිනී ආවරණය සහ සංඛ්‍යාත සැලසුම්කරණය | මැලේසියාව | 2011.03.07 | 2011.03.08 | 1 |
| මීළඟ දශකය සඳහා IMT වැඩමුළුව/ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ රැහැන් රහිත විදුලි සංදේශනය පිළිබඳ කණ්ඩායමේ 10 වන රැස්වීම | තායිලන්තය | 2011.03.21 | 2011.03.25 | 1 |
| තොරතුරු ආරක්ෂණය සහ පරිගණක සන්නිවේදනය පිළිබඳ පුහුණු පාඨමාලාව | චීනය | 2011.03.21 | 2011.03.29 | 1 |
| අධ්‍යයන කණ්ඩායම 3 රැස්වීම, ඒකාබද්ධ කමිටු නියෝජිතයන්ගේ රැස්වීම සහ අන්තර්ජාල මූලලේඛ ප්‍රවාහ මැනීම පිළිබඳ වැඩමුළුව | ස්විට්සර්ලන්තය | 2011.03.24 | 2011.04.01 | 1 |

| පුහුණුවේ/ශිෂ්‍යත්වයේ/සම්මන්ත්‍රණයේ විෂය පථය | රට | කාලසීමාව | | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| කේන්ද්‍රීය පරිසරයක බලපත්‍රය සංක්‍රමණය කිරීම පිළිබඳ වැඩමුළුව | මැලේසියාව | 2011.04.05 | 2011.04.08 | 1 |
| අන්තර්ජාල මූලලේඛ නාගරික ප්‍රදේශවල ජාල සහ එහි භාවිතයන් පිළිබඳ පුහුණුව | චීනය | 2011.04.13 | 2011.04.21 | 1 |
| 4 පරම්පරාවේ ජංගම IMT වැඩිදියුණු කළ පද්ධති භාවිතයන් | කොරියාව | 2011.04.25 | 2011.04.28 | 1 |
| 2 වන ප්‍රතිපත්ති සහ නියාමනය පිළිබඳ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ 2 වන වැඩමුළුව | මාලදිවයින | 2011.05.03 | 2011.05.05 | 1 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ සම කමිටු රැස්වීම | එක්සත් රාජධානිය | 2011.05.08 | 2011.05.16 | 1 |
| 11 වන ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රතිපත්ති සහ නියාමන සමුළුව | වියට්නාමය | 2011.05.17 | 2011.05.19 | 1 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ භාවිතයන් පිළිබඳ ආසියා - ශාන්තිකර කලාපීය සමුළුව | තායිලන්තය | 2011.05.18 | 2011.05.21 | 1 |
| මීළඟ පරම්පරාව සඳහා ජාල සැලසුම් කිරීම සහ සේවා සැලසුම්කරණය | චීනය | 2011.05.19 | 2011.05.27 | 1 |
| ඩිජිටල් විකාශන පරිවය ශක්තිමත් කිරීම පිළිබඳ කලාපීය වැඩමුළුව සහ මාධ්‍ය සමුළුව | වියට්නාමය | 2011.05.22 | 2011.05.27 | 1 |
| 18 වන ASTPA සහ WTSA – 12 සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ප්‍රාරම්භක රැස්වීම | තායිලන්තය | 2011.05.23 | 2011.05.27 | 1 |
| 1B කාර්ය කණ්ඩායම සහ අධ්‍යයන කණ්ඩායම 1 රැස්වීම | ස්විට්සර්ලන්තය | 2011.05.25 | 2011.06.03 | 1 |
| 1A කාර්ය කණ්ඩායම සහ අධ්‍යයන කණ්ඩායම 1 රැස්වීම | ස්විට්සර්ලන්තය | 2011.05.25 | 2011.06.03 | 1 |
| ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ කාර්ය කණ්ඩායම 5A | ස්විට්සර්ලන්තය | 2011.06.13 | 2011.04.28 | 1 |
| ජාත්‍යන්තර ජංගම රෝමින් පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ වැඩමුළුව | චීනය | 2011.06.13 | 2011.06.15 | 1 |
| ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයෙ 5A කාර්යය අධ්‍යයන රැස්වීම | ස්විට්සර්ලන්තය | 2011.06.13 | 2011.06.23 | 1 |
| IPTV තාක්ෂණය සහ භාවිතය පිළිබඳ පුහුණු පාඨමාලාව | තායිලන්තය | 2011.06.20 | 2011.06.24 | 1 |
| සියළුම දෙනා පිළිබඳ ඩිජිටල් අන්තර්ගතයන් සඳහා ආසියා ශාන්තිකර කලාපීය සමුළුව | සිංගප්පූරුව | 2011.06.21 | 2011.06.23 | 2 |
| ආර්ථික වර්ධනය සඳහා මෙහෙයවීම පිළිබඳ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සමුළුව | ස්වීඩනය | 2011.06.27 | 2011.06.30 | 1 |

| පුහුණුවේ/ශිෂ්‍යත්වයේ/සම්මන්ත්‍රණයේ විෂය පථය | රට | කාලසීමාව | | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| 8 වන ආසියා ශාන්තිකර විදුලි සංදේශනය සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සංවර්ධන සමුළුව | චීනය | 2011.06.28 | 2011.06.30 | 1 |
| අන්තර්ජාල මූලලේඛ තාක්ෂණය සහ රවුටර් ආකෘති | ඉන්දියාව | 2011.07.11 | 2011.07.15 | 1 |
| 3G ජංගම අධිවේගී අන්තර්ජාලය පිළිබඳ පුහුණු පාඨමාලාව | තායිලන්තය | 2011.07.25 | 2011.07.29 | 1 |
| අධිවේගී අන්තර්ජාල ප්‍රතිපත්ති සහ නියාමනය පිළිබඳ පුහුණුව | තායිලන්තය | 2011.08.02 | 2011.08.02 | 1 |
| GA සැකසුම සහ APT රීති පිළිබඳ AD-HOC කණ්ඩායමේ 3 වන රැස්වීම | තායිලන්තය | 2011.08.09 | 2011.08.12 | 1 |
| IPV6 සහ එහි භාවිතයන් පිළිබඳ පුහුණුව | තායිලන්තය | 2011.08.22 | 2011.08.26 | 1 |
| ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ WRC5 ආරම්භක කණ්ඩායමේ සමුළුව | කොරියාව | 2011.08.129 | 2011.09.03 | 1 |
| ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ විදුලි සංදේශන සේවා සහ ආශ්‍රිත නිෂ්පාදිතයන් පිළිබඳ සමුළුව | ස්විට්සර්ලන්තය | 2011.09.01 | 2011.09.03 | 1 |
| අධ්‍යයන කණ්ඩායම් 1 සහ 2 රැස්වීම | ස්විට්සර්ලන්තය | 2011.09.05 | 2011.09.16 | 1 |
| විදුලි සංදේශ පරිසරය සඳහා නියාමන රාමුව පිළිබඳ පුහුණුව | ඉන්දියාව | 2011.09.06 | 2011.09.09 | 1 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ 51 රැස්වීම සහ වාර්ෂික සමුළුව | ට්‍රිනිඩෑඩ් සහ ටොබෑගෝ | 2011.09.12 | 2011.09.16 | 1 |
| APT රැහැන් රහිත කණ්ඩායම් රැස්වීමේ 11 වන රැස්වීම | තායිලන්තය | 2011.09.14 | 2011.09.17 | 1 |
| 4A කාර්යය කණ්ඩායම් සහ 4 අධ්‍යයන කණ්ඩායම් රැස්වීම | ස්විට්සර්ලන්තය | 2011.09.21 | 2011.09.30 | 1 |
| ග්‍රාමීය ප්‍රදේශවල සමාජ ගැටළු නිරාකරණය කිරීමේදී තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සහිත සේවා සහ විසඳුම පිළිබඳ සිද්ධි අධ්‍යනය | ජපානය | 2011.09.27 | 2011.10.07 | 1 |
| විද්‍යුත් භාවිතයන්/ විද්‍යුත් රාජ්‍යය පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සමුළුව | ඕස්ට්‍රේලියාව | 2011.10.04 | 2011.10.06 | 1 |
| ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මහා සභා රැස්වීම - 2011 | ස්විට්සර්ලන්තය | 2011.10.11 | 2011.10.21 | 1 |
| අධ්‍යයන කණ්ඩායම 3 සහ කාර්යය කණ්ඩායම 3M | ස්විට්සර්ලන්තය | 2011.10.17 | 2011.10.28 | 1 |
| මීළඟ පරම්පරාවේ ජංගම විදුලි සංදේශ තාක්‍ෂණය හා ජාල | චීනය | 2011.10.17 | 2011.10.28 | 1 |
| අධිවේගී අන්තර්ජාල සහ Backhaul සමුළුව | ඉන්දුනීසියාව | 2011.10.19 | 2011.10.20 | 1 |
| ආපදා කළමණාකරනය / සන්නිවේදනය පිළිබඳ වැඩමුළුව | ජපානය | 2011.10.19 | 2011.10.21 | 1 |

| පුහුණුවේ/ශිෂ්‍යත්වයේ/සම්මන්ත්‍රණයේ විෂය පථය | රට | කාලසීමාව | | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ විශ්ව විදුලි සංදේශනය | ස්විට්සර්ලන්තය | 2011.10.24 | 2011.10.27 | 1 |
| ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ විශ්ව විදුලි සංදේශනය සහ අධ්‍යයන කණ්ඩායම - 12 | ස්විට්සර්ලන්තය | 2011.10.24 | 2011.11.05 | 1 |
| 9 වන ASTAP/WTSA – 12 සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ප්‍රාරම්භක රැස්වීම | පිලිපීනය | 2011.10.24 | 2011.10.28 | 1 |
| ගුවන් විදුලි මධ්‍යස්ථාන පරිපාලනය සහ ගුවන් විදුලි උපකරණ සහතික කිරීම | ජපානය | 2011.11.08 | 2011.11.16 | 1 |
| අධිවේගී අන්තර්ජාල සන්නිවේදනය සඳහා සයිබර් ආරක්‍ෂණ ප්‍රතිපත්ති සහ තාක්‍ෂණය පිළිබඳ පුහුණුව | ජපානය | 2011.11.09 | 2011.11.18 | 1 |
| අධිවේගී අන්තර්ජාල සේවා වැඩිදියුණු කිරීමට සහායවීම සඳහා FITH සහ රැහැන් රහිත ප්‍රවේශ තාක්‍ෂණය | ජපානය | 2011.12.01 | 2011.12.07 | 1 |
| ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සයිබර් ආරක්‍ෂණ සමුළුව | ජපානය | 2011.12.05 | 2011.12.07 | 1 |
| මීළඟ පරම්පරාවේ ජංගම සන්නිවේදන පද්ධතිය සඳහා වන ක්‍රියාකාරකම් පිළිබඳව පුහුණු පාඨමාලාව | ජපානය | 2011.12.06 | 2011.12.14 | 1 |
| තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ මූල්‍යකරණය: පවත්නා වෙළඳපල පිළිබඳ ගෝලීය සමුළුව 2011 | එක්සත් රාජධානිය | 2011.12.12 | 2011.12.15 | 1 |
| ජංගම සන්නිවේදනය සහ පුළුල් කලාප පිළිබඳ පුහුණුව | කොරියාව | 2011.12.12 | 2011.12.20 | 1 |
| අධිවේගී අන්තර්ජාල සහ කේන්ද්‍රීය ප්‍රතිපත්ති පිළිබඳ පුහුණුව | කොරියාව | 2011.12.12 | 2011.12.28 | 1 |
| ඩිජිටල් අත්සන පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ පුහුණුව | ජපානය | 2011.12.13 | 2011.12.14 | 1 |
| බුද්ධිමය දේපල අයිතිය හා ප්‍රමිතීන් පිළිබඳ වැඩමුළු | ඉන්දියාව | 2011.12.19 | 2011.12.20 | 1 |
| ජාල සහ සේවා පිළිබඳ SATRC WG | ඉරානය | 2011.12.19 | 2011.12.20 | 1 |
| ප්‍රතිපත්ති හා නියාමනය පිළිබඳ SATRC අධ්‍යයන කණ්ඩායම 2 රැස්වීම | ඉන්දියාව | 2011.12.28 | 2011.12.29 | 1 |

*(ආ) දේශීය පුහුණු වැඩසටහන්*

| වැඩසටහන | කාල පරිච්ඡේදය සහ ස්ථානය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| 3D Amination & Visual Effects පිළිබඳ ඩිප්ලෝමාව | වර්ෂයකි. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLITT) | 1 |
| තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව | 2011.05.15 – 2011.11.31 – ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) | 13 |
| තොරතුරු තාක්ෂණ පදනම් කරගත් ව්‍යාපාරික ලිපි ලිවීම | 2011.05.15 – 2011.11.31 – ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) | 7 |
| තොරතුරු තාක්ෂණ කළමණාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 2011 - කොළඹ විශ්ව විද්‍යාලය | 1 |
| රජයේ සේවක වැටුප් ලැයිස්තු කළමණාකරන පද්ධතිය | 2011 අප්‍රේල් 25 – 30, මූල්‍ය අධ්‍යයන ආයතනය | 1 |
| ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 2010/2011 කැළණිය විශ්ව විද්‍යාලය | 1 |
| Is Corporate Governance in Sri Lanka Really working in practice or is it only an apology" සම්මන්ත්‍රණය | 2012 මැයි 27 – හිල්ටන් හෝටලය කොළඹ | 1 |
| පුස්තකාල සහ ප්‍රලේඛන විද්‍යාව පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය | 2011 ජූනි 28 – ගලධාරි හෝටලය | 2 |
| තොරතුරු හුවමාරුව විකාශනය වීම පිළිබඳ සම්මන්ත්‍රණය | 2011 ජූලි 22 – ගලධාරි හෝටලය | 6 |
| ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීමේ දී ශාස්ත්‍රීය හා ප්‍රවර්ධිත මධ්‍යස්ථානයක් කිරීම - සමාරම්භක සම්මන්ත්‍රණය | 2011 ජූලි 25 - සිනමන් ලේක් සයිඩ් හෝටලය | 2 |
| සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් සහතික පත්‍ර පාඨමාලාව | ශ්‍රී සුමංගල විද්‍යාලය - කොළඹ | 1 |
| ගබඩා කළමණාකරනය පිළිබඳ වැඩමුළුව | 2011 අගෝස්තු 5 – ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය (ICTAD) | 2 |
| රැකියා අවස්ථා සඳහා ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව | ඉරිදා දිනවල – ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLAIDA) | 7 |
| තිරසාර බලශක්ති තාක්ෂණය පිළිබඳ පුහුණුව | 2011 සැප්තැම්බර් 15, 16 සහ 17 - මොරටුව විශ්ව විද්‍යාලය | 1 |
| මෝටර් යාන්ත්‍රිකකරණය පිළිබඳ එක් දින පුහුණු වැඩමුළුව | 2011 ඔක්තෝබර් 25 – ජාතික වෘත්තීය පුහුණු ආයතනය | 2 |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරන ආයතනයේ 32 වන ජාතික සම්මේලනය | 2011 ඔක්තෝබර් 20 – 22 | 1 |
| සේ.අ.අ. (EPF), සේ.භා.අ. (ETF) සහ මනා සේවක සම්බන්ධතාවය | 2011 ඔක්තෝබර් 28 – ජාතික වාණිජ මණ්ඩලය | 2 |
| අයවැය සම්මන්ත්‍රණය | 2011 නොවැම්බර් 23 – ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරන ආයතනය | 1 |
| බදු යෝජනා සහ වෙළඳ බලපෑම් | 2011 නොවැම්බර් 25 – ටාජ් සමුද්‍රා හෝටලය | 1 |

### 9.2.5 සේවා සැපයීම සම්බන්ධ කටයුතු

පාලන අංශය මගින් උපදේශක සේවය, ආරක්ෂක සේවය හා පවිත්‍රතා සේවය වැනි සේවාවන් සැපයීමට අදාල සියළුම ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සිදු කරන ලදී. මෙම ක්‍රියාකාරකම්වලට ලංසු ලේඛන පිළියෙල කිරීම දැන්වීම් පළ කිරීම, තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීම, වාර්තා සකස් කිරීම, අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා වාර්තා ඉදිරිපත් කිරීම, තෝරාගත් පාර්ශ්වයන්ට තිරණ දැනුම් දීම, අවශ්‍ය අවස්ථාවලදී නීති අංශයේ සහයෝගය ඇතිව සේවා ගිවිසුම් සකස් කිරීම සහ සේවා සැපයුම්කරුවන්ගේ වැඩ අධීක්ෂණය සහ සේවා ගිවිසුම් උල්ලංඝනය වූ අවස්ථා දක්නට ලැබුනු විට ඒවා නිවැරදි කිරීමට පියවර ගැනීම ඇතුළත් විය. ගොඩනැගිල්ල නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම, යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම සහ ඒවා නඩත්තු කිරීම වැනි කටයුතු වලදී ද ඉහත සඳහන් ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කරන ලදී. ගොඩනැගිල්ල ඇතුළත සහ ගොඩනැගිල්ල අවට ප්‍රදේශය තුළ සිදුවන සිදුවීම් නිරීක්ෂණය කිරීම සඳහා අන්තර්ජාල පාදක ආරක්ෂණ පද්ධතියක් ස්ථාපනය කිරීම විශේෂ ප්‍රසම්පාදන ක්‍රියාකාරකමක් විය. අනෙක් ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පැරණි ගොඩනැගිල්ලේ නාන කාමර නවීකරණය කිරීමයි.

සමාලෝචන කාලපරිච්ඡේදය තුළ කැඳවන ලද මිල ගණන් සංඛ්‍යාව 209 ක් වූ අතර, පවත්වන ලද කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ ටෙන්ඩර් මණ්ඩල සංඛ්‍යාව පිළිවෙලින් 04 සහ 08 ක් විය. කණිෂ්ඨ ටෙන්ඩර් මණ්ඩලය විසින් රුපියල් මිලියන 4.1 සහ ජ්‍යෙෂ්ඨ ටෙන්ඩර් මණ්ඩලය විසින් රුපියල් මිලියන 97.3 අනුමත කරන ලද මුළු ප්‍රසම්පාදන අගයන් විය. ඒ අනුව මෙම ටෙන්ඩර් මණ්ඩල දෙක විසින් අනුමත කරන ලද මුළු ප්‍රසම්පාදන අගය විය.

පාලන අංශය විසින් කාර්යාල වේලාවන් තුළදී මෙන්ම කාර්යාල වේලාවෙන් බැහැර අවස්ථා වලදී ද විදුලි සැපයුම සහ දුරකථන සේවා බිඳ වැටුන අවස්ථා වලදී වහාම අදාල ආයතනවලට දැනුම් දී එම සේවා යථා තත්ත්වයට පමුණුවාලීමට වගබලා ගන්නා ලදී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සියළුම අංශ/ ඒකක වලට සිය වැඩ කටයුතු කිසිදු අවහිරතාවයකින් තොරව කර ගෙන යාම සඳහා ලිපි ද්‍රව්‍ය, කාර්යාල උපකරණ, යන්ත්‍ර වැනි දෑ කලට වේලාවට සැපයීමට පාලන අංශය වගබලා ගත්තේය.

ඉහත ක්‍රියාකාරකම්වල ප්‍රධාන පරමාර්ථය වූයේ ආයතනයේ වැඩ කටයුතු මැනවින් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය සේවා සහ ද්‍රව්‍ය නිසි කලට පාරදෘශ්‍ය, පිරිවැය ඵලදායි හා සාධාරණ ලෙස සැපයීම විය.

### 9.2.6 වාහන පද්ධතිය නඩත්තු කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වාහන පද්ධතිය කාර් දහනවයකින්, ඩබල් කැබ් රථ තුනකින්, ජීප් තුනකින්, වෑන් පහකින්, එක් බසයකින්, ලොරි හතරකින් හා එක් ත්‍රිවීල් රථයකින් සමන්විත විය.

බස් රථය චාරිකා, ප්‍රදර්ශන වැඩ කටයුතු සඳහා නිලධාරීන් ප්‍රවාහනය කිරීම සහ කාර්ය මණ්ඩලයේ සුභ සාධන කටයුතු වැනි කාර්යයන්ට යොදවන ලදී. වාහන කිහිපයක් වාහන පහසුකම් ලබා ගැනීමට හිමිකම් තිබෙන නිලධාරීන්ට වෙන් කරනු ලැබූ අතර, ඉතිරි වාහන නිරීක්ෂණ චාරිකා, රැස්වීම්/වැඩමුළු/සම්මන්ත්‍රණ ආදියට සහභාගි වීම, ප්‍රදර්ශන සංවිධානය කිරීම, තැපැල රැගෙන ඒම, කාර්යාල ලිපි අතින් බෙදීම වැනි කටයුතු සඳහා භාවිතා කරන ලදී. වාහන පද්ධතිය අළුත්වැඩියා කිරීම හා ටයර් සහ බැටරි ප්‍රතිස්ථාපනය කිරීම සඳහා 2011 වසර තුළදී රුපියල් මිලියන 8.54 ක මුදලක් වැය කරන ලදී.

### 9.2.7 සමීක්ෂණ මණ්ඩලය

2010 වර්ෂය සඳහා වන වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය 2011 ජනවාරි මාසයේදී සිදු කරන ලදී. මෙම සමීක්ෂණය ඒ සඳහා පත් කරන ලද සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් විසින් සිදු කරන ලදී. ඉවත් කළ යුතු අයිතමයන් හඳුනාගත් අතර, නියමිත පටිපාටිය ප්‍රකාරව එම අයිතමයන් ඉවත් කිරීමට පියවර ගන්නා ලදී.

### 9.2.8 දැයට කිරුළ ප්‍රදර්ශනයේ වැඩ කටයුතු සම්බන්ධීකරණය

දැයට කිරුළ ප්‍රදර්ශනය රජයේ වාර්ෂික වැඩසටහනක් වන අතර, රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ආයතනද එයට සහභාගි වේ. 2011 වසරේදී මෙම ප්‍රදර්ශනය ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනයට ප්‍රමුඛතාවය ලබාදීමේ මහින්ද චින්තන අරමුණුවලට අනුව මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තලදී පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ ජාතික නිදහස් දිනයට සමගාමීව මෙම ප්‍රදර්ශනය 2011 පෙබරවාරි 04 දින අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් විවෘත කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රදර්ශන කුටිය සඳහා පාලන අංශය නායකත්වය දැරීය. ප්‍රදර්ශන කුටිය සංවිධානය කිරීමේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනෙකුත් අංශ පාලන අංශයට සහාය විය. පාලන අංශය ප්‍රදර්ශන සංවිධාන කමිටුව සමඟ සම්බන්ධීකරණය වී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රදර්ශන කුටිය සඳහා සුදුසු ප්‍රදේශයක් ප්‍රදර්ශනය භූමියෙන් ලබා ගත්තේය. ප්‍රදර්ශන කුටිය වෙත ප්‍රදර්ශන භාණ්ඩ ප්‍රවාහනය සඳහා වැඩපිළිවෙල යොදනු ලැබීය. ප්‍රදර්ශන කුටියේ රාජකාරී සඳහා නතරවීමට සිදුවූ නිලධාරීන්ට නවාතැන් පහසුකම් සැළසීමටද කටයුතු කරන ලදී. විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නව සංවර්ධන අවස්ථාවන් ප්‍රදර්ශන කුටියෙහි ප්‍රදර්ශනය කළ අතර, ප්‍රදර්ශන කාලය තුළ පාසැල් සිසුන් ඇතුළුව දහස් ගණනක් කුටිය නැරඹීමට පැමිණයහ.

### 9.2.9 සුභ සාධක කටයුතු

සමලෝචන කාලපරිච්ඡේදය තුළ පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඉටු කරන ලදී:-

i. පිළියන්දල, දම්පෙ සේවක පවුල් සුහද හමුව පැවැත් වීම.

ii. ශ්‍රී.ලං.වි.ස.නි. කොමිෂන් සභාවේ ක්‍රීඩා සමාජයේ සහාය ඇතිව ක්‍රීඩා තරඟයක් පැවැත් වීම.

iii. කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඥාතීන් අභාවයට පත්වූ අවස්ථාවල මුදල් උපකාර ලබාදීම.

iv. සුභ සාධන කමිටුව විසින් සුභ සාධන වෙළඳ සලක් පවත්වාගෙන යාම.

### 9.2.9.1 සේවක පවුල් සුහද හමුව

මෙය 2011 ඔක්තෝබර් මස 15 දින පැවැත්වූ එක්දින වැඩසටහනකි. වැඩසටහනේ අරමුණ වූයේ විනෝදාස්වාදය සැපයීම හා කාර්ය මණ්ඩල සාමාජිකයන් අතර මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් අතර සුහදතාවය ඇති කිරීමයි.



පිළියන්දල දම්පේ පවත්වන ලද සේවක පවුල් සුහද හමුවට එක්රැස් වූ පවුල් සාමාජිකයන්



ක්‍රීඩා තරඟය ආරම්භ කිරීමේ අවස්ථාව

### 9.2.9.2 ක්‍රීඩා තරඟය

ක්‍රීඩා තරඟය 2011 සැප්තැම්බර් මස 04 දින පවත්වන ලදී. කාර්ය මණ්ඩලයේ ඉහළ සිට පහළ දක්වා වූ සියළුම දෙනා නිවාස තුනකට එනම් පරාක්‍රම, විජය හා ගැමුණු යන නිවාස තුනට බෙදන ලද අතර, ඔව්හු ගෘහස්ථ ක්‍රීඩා, එළිමහන් ක්‍රීඩා, ධාවන හා පිටියේ ඉසව් රැසකට උද්‍යෝගිශීලීව සහභාගි වූහ. ක්‍රීඩා තරඟය නිසා කාර්ය මණ්ඩලයට යම් විවේකයක් ලැබුණු අතර, ඔවුන්ගේ ක්‍රීඩා හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට හැකි විය.

### 9.2.9.3 අවමඟුල් ආධාර

තම ඥාතියකු අභාවයට පත් වූ අවස්ථාවක කාර්ය මණ්ඩල සාමාජිකයකුට කිසියම් හෝ සහනයක් සැලසීම පිණිස සුභ සාධක සංගමයේ අරමුදලෙන් මුදල් ආධාර ලබාදීමේ පිළිවෙත ශ්‍රී.ලං.වි.සං.නි. කොමිෂන් සභාවේ සුභ සාධක සංගමය අඛණ්ඩව සිදු කරන ලදී.

### 9.2.9.4 සුභ සාධන වෙළඳසල

සුභ සාධක සංගමයේ වෙළඳසලෙන් කාර්ය මණ්ඩලයට සාධාරණ මිලකට භාණ්ඩ මිලදී ගැනීමට හැකි වූ අතර, ගෙවීම් ක්‍රමයට භාණ්ඩ මිලදී ගැනීමට කැමැත්තක් දැක්වූ අයට ඒ සඳහා අවස්ථාව ලැබිණි. කාර්ය මණ්ඩලයට සිය කැමැත්ත අනුව භාණ්ඩ මිලට ගැනීම පිණිස සුභ සාධක සංගමය විසින් වෙළඳ ආයතන ශ්‍රී.ලං.වි.සං.නි. කොමිෂන් සභා පරිශ්‍රයට ගෙන්වීමට කටයුතු කර ඇත.

### 9.2.10 ප්‍රවර්ධන (Logistic) සහාය දැක්වීම

පාලන අංශය විසින් රැස්වීම්, වැඩමුළු, සම්මන්ත්‍රණ පැවැත්වීම, නිරීක්ෂණ චාරිකා, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම වැනි ශ්‍රී.ලං.වි.සං.නි. කොමිෂන් සභාවේ අනෙකුත් අංශවල කාර්යයන් සඳහා අවශ්‍ය දෑ සැපයීමට පාලන අංශය කටයුතු කර ඇත.

### 9.2.11 ගෙවීම් නිර්දේශ කිරීම/අනුමත කිරීම

වැටුප් වර්ධක, අතිකාල, හිඟ වැටුප්, ගමන් වියදම් හා සංයුක්ත දීමනා, විනය පරීක්ෂණ සඳහා ගෙවීම්, වාහන අළුත්වැඩියා කිරීම, විනාශවන සුළු අයිතම මිලදී ගැනීම, උපකරණ හා යන්ත්‍ර, පොත් සඟරා මිලදී ගැනීම සහ (ආරක්ෂක, පවිත්‍රතා, ජලය, දූරකථන, විදුලිය) සැපයීම ආදියට සම්බන්ධ විවිධ ගෙවීම් සඳහා අනුමැතිය ලබාදීම පාලන අංශයේ ප්‍රධාන කාර්යයක් විය. පාලන අංශය අදාල වවුචර පරීක්ෂාවට භාජනය කළ අතර, ගෙවීමේ ස්වභාවය සහ මූල්‍ය අධිකාර සීමාව අනුව ගෙවීම් නිර්දේශ කිරීම/ අනුමැතිය ලබාදීම සිදු කර ඇත.

## 9.3 කාර්ය මණ්ඩලය

2011 වසරේදී පාලන සහ මානව සම්පත් අංශය අධ්‍යක්ෂවරයකු (1) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු (1), සහකාර අධ්‍යක්ෂවරයකු (1) කළමණාකරන සහකාර මට්ටමේ නිලධාරීන් විසිඑක් දෙනෙකු (21) සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩල සේවකයන් විසිහතර දෙනෙකු (24) ඇතුළු හතළිස් අට දෙනෙකුගෙන් (48) සමන්විත කාර්ය මණ්ඩලයක් විසින් සිදු කරන ලදී.

# නීති අංශය

10 පරිච්ඡේදය

විදුලි සංදේශ පනත ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්යයන් සහ බලතල ක්‍රියාත්මක කිරීම පිණිස 2011 වසරේදී නීති අංශය විසින් පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී:-

## 10.1 කාර්යයන්

- නීති උපදෙස් අවශ්‍ය කරුණු/ලේඛන සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත නීතිමය මත/උපදෙස් ලබාදීම.
- කොමිෂන් සභාව සඳහා නීති, රෙගුලාසි, නියෝග නිර්නායකයන් සහ බලපත්‍ර කෙටුම්පත් කිරීම.
- නඩු සම්බන්ධයෙන් ගරු නීතිපති හෝ පුද්ගලික නීතිඥයන් වෙත කරුණු යොමු කිරිම.

- අධිකරණය ඉදිරියේ පවත්නා නඩු සහ අදාල කෙටුම්පත් සැකසීම, ලිපිගොනු ඉදිරිපත් කිරීම යනාදී සියළුම කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව නියෝජනය කිරීම.
- කොමිෂන් සභාව සඳහා රාජකාරී ලිපි, වෙනත් ලිපි ලේඛන, කොමිෂන් සභා පත්‍රිකා, කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් කෙටුම්පත් කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 18 අ වගන්තිය ක්‍රියාත්මක කිරීම.
- කොමිෂන් සභාවේ අනෙක් අංශවලට නීති සහාය ලබාදීම සහ විදුලි සංදේශ පනත, 2004 අංක 11 දරණ මුදල් පනත නීති, රීති, බලපත්‍ර, නියෝග තීන්දු ප්‍රකාරව ගතයුතු පියවර බලාත්මක කිරීම.
- වෙනත් ආයතනවලට නීති සහාය ලබාදීම.

## 10.2 කාර්ය සාධනය

නීති අංශය විසින් සංඛ්‍යාත සඳහා බලපත්‍ර දීම, වෙළඳ බලපත්‍ර දීම, අයක්‍රම, අනුකූලතා ගැටළු, පාරිභෝගිකයන් පිළිබඳ නියාමන කරුණු මෙන්ම පාලන සහ මානව සම්පත් කාර්යයන් සම්බන්ධ අභ්‍යන්තර නීතිමය කටයුතුවලදී කොමිෂන් සභාවට සහ කොමිෂන් සභාවේ අනෙකුත් අංශ/ඒකක වලට සහාය ලබා දී ඇත. මෙම අංශය විසින් නඩුවලදී ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව වෙනුවෙන් අධිකරණයේ පෙනී සිට ඇත. ඇතැම් අධිකරණ නඩුවලදී ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව නීතිපති දෙපාර්තමේන්තුවේ සහ වෙනත් නීතිඥයන්ගේ සහාය ලබා ගත්තේය. නීති අංශයේ වියදම් සඳහා 2011 වර්ෂයේදී වෙන් කළ අයවැය කොමිෂන් සභාව සම්පූර්ණයෙන් වියදම් කර ඇත. නීති අංශය 2011 වර්ෂයේදී ඉටු කළ කාර්යයන් පිළිබඳ කෙටි විස්තරයක් පහත දැක්වේ.

### 10.2.1 නඩු මගට බැසීම

2011 වසරේදී ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවට එරෙහිව නඩු කිහිපයක් ගොනු කර ඇත. ඒ අතර ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව විසින් වෙබ් අඩවි වාරණය කිරීම අභියෝගයකට ලක් කර පහත සඳහන් පාර්ශ්වයන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනු කර ඇත. මෙය ශ්‍රී ලංකාවේ ආරම්භ කළ පුවත් බෙදාහැරීමේ වෙබ් අඩවියක් වාරණය කිරීමට එරෙහිව ශ්‍රී ලංකාවේ ගොනු කළ ප්‍රථම නඩුව වේ.

- කැලුම් ශිවන්ත රොඩ්රිගු සහ තවත් පස් දෙනෙකු ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවට එරෙහිව.
- සුනිල් ජයසේකර සහ උදය කළුවිතාරණ සහ තවත් දහ දෙනෙකු ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවට එරෙහිව.

වෙබ් අඩවියේ කතෘ මෙන්ම හිමිකරු වන කැලුම් ශිවන්ත රොඩ්රිගු යන අය අංක 548/2011 දරණ මූලික අයිතිවාසිකම් නඩුව ගොනු කර වෙබ් අඩවියට www.srilankamirror.com ප්‍රවේශවීම ශ්‍රී ලංකාව තුළ වාරණයට ලක් කිරීමෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10, 12(1), 14(1)(අ) සහ 14(1)(උ) වගන්ති උල්ලංඝනය කර ඇති බවට චෝදනා කර ඇත.

මෙහිදී මෙය ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකාව තුළ ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීමේ වෙබ් අඩවියක් වශයෙන් ලියාපදිංචි කිරීමටත් ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව විසින් පිළිනොගත් වෙබ් අඩවි සම්බන්ධතා ඉවත් කිරීමටත් පාර්ශ්වයන් විසින් අධිකරණයේදී එකඟතාවයට එළැඹී ඇත.

www.srilankamirror.com, www.srilankaguardaian.org, www.lankaenews.com, www.lankanewsweb.com සහ www.paparacinews.com යන වෙබ් අඩවි අවහිර කිරීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 12(1), 14(1)(අ) සහ 14(1)(උ) වගන්ති උල්ලංඝනය කර ඇති බවට දක්වමින් 2011 දෙසැම්බර් මාසයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ කැඳවුම්කරු විසින් අංක SCFR 569/2011 දරණ නඩුව ගොනු කර ඇත.

සේවක කරුණු සම්බන්ධ මූලික අයිතිවාසිකම් නඩු වෙනුවෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විත්තිය වෙනුවෙන් සාර්ථකව පෙනී සිට ඇත.

### 10.2.2 මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කළ නඩු

පාර්ශ්වයන් දෙකක් විසින් ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවට එරෙහිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ (HRC 1655/11 සහ HRC 2734/2011) නඩු දෙකක් පවරන ලදී.

මුල් නඩුවට අනුව විදුලි සංදේශ ග්‍රාහකයකු වන්දි මුදල් ලබාගැනීම පිණිස ශ්‍රී.ලං.වි.සංනි.කො. සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබිණි. මෙම කරුණ විමර්ශනය කර එම වන්දි මුදල ගෙවන ලෙස අදාල දූරකථන ක්‍රියාකාර සමාගම වෙත නියෝගයක් නිකුත් කරන ලදී. මෙසේ තිබියදීත් ග්‍රාහකයා විසින් මෙම නඩුව ගොනු කර ඇත. ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව මේ සම්බන්ධයෙන් ගත් පියවර සැළකිල්ලට ගෙන මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙම නඩුව සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග නොගන්නා ලදී.

දෙවන නඩුව ප්‍රකාරව ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව විසින් අදාල පැමිණිල්ල පිළිබඳව සමාලෝචනය කරන අතරතුර ග්‍රාහකයා විසින් මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිල්ලක් ගොනු කර ඇත. කොමිෂන් සභාව විසින් මෙම ගැටළුව ග්‍රාහකයා සහ අදාල දූරකථන සේවා සැපයුම්කරු අතර පවතින වෙළඳ ගණුදෙනුවක් ලෙස පිළිගෙන විදුලි සංදේශ පනත ප්‍රකාරව විදුලි සංදේශ සේවා සම්බන්ධ පැමිණිලි භාර ගැනීම සහ ඒ සම්බන්ධ ආරාවුල් විසඳීම පිණිස නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ අදහස් පිළිගෙන ඇති අතර නඩුව නිශ්ප්‍රභා කර ඇත.

### 10.2.3 අධිකරණ/විනිශ්චය මණ්ඩල ඉදිරියේ වෙනත් නඩු වලට පෙනී සිටීම.

2011 වර්ෂයේදී අන්තර්ජාලය හා සම්බන්ධ පැමිණිලිවල සැලකිය යුතු වැඩිවීමක් සිදු විය. අසභ්‍ය දෑ අන්තර්ගතවීම නිසා ඒවා නියාමනය කිරීමේ බලතල සහ උසාවි නියෝග මත ඇතැම් විදේශීය වෙබ් අඩවි/ලිපිනයන් අවුරන ලදී.

කම්කරු උසාවිය, කර්මාන්ත අධිකරණය ඉදිරියේ 2011 වර්ෂයේදී ගොනු කළ නඩු සහ මානව සම්පත් කාරණා පිළිබඳව විහිදුනු කරුණු සම්බන්ධයෙන් ඉකුත් වර්ෂ වලින් ඉදිරියට ගෙන ආ නඩු රැසක් පැවතිණි. බලාත්මක කිරීමේ පරිශ්‍රමයේ කොටසක් වශයෙන් කොමිෂන් සභාවේ නියාමන තීරණ වලට අනුකූල නොවන පනත යටතේ සිදුකරන වැරදි වෙනුවෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමේ ක්‍රියාමාර්ග ගැනීමට මුලපුරා ඇත.

### 10.2.4 අනෙකුත් රාජ්‍ය ආයතනවලට සහාය වීම

2011 වර්ෂයේදී නීති අංශය 2004 අංක 25 දරණ මුදල් පනතේ 111 කොටස යටතේ පනවන ලද ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද සම්බන්ධයෙන් නව රෙගුලාසි සහ සංශෝධන සකස් කිරීමට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ මහ භාණ්ඩාගාරයට සහාය විය.

## 10.3 කාර්ය මණ්ඩලය

2011 වසරේදී නීති අංශය සහකාර අධ්‍යක්ෂවරු දෙදෙනෙකු (2), කළමණාකරන සහකාර මට්ටමේ නිලධාරීන් පස්දෙනෙකු (5) සහ කනිෂ්ඨ මණ්ඩල සේවකයකු (1) ඇතුළු අට දෙනෙකුගෙන් (8) සමන්විත කාර්ය මණ්ඩලයක් විසින් සිදු කරන ලදී.

# තොරතුරු සහ ප්‍රලේඛන ඒකකය

11 පරිච්ඡේදය

තොරතුරු සහ ප්‍රලේඛන ඒකකය තොරතුරු තාක්ෂණ ඒකකය සහ පුස්තකාල සේවා ඒකකය වශයෙන් අංශ දෙකකින් සමන්විත වේ.

## 11.1 තොරතුරු තාක්ෂණ ඒකකයේ කාර්යයන්:

- පවත්නා යෙදුම් පද්ධතිය පවත්නා ගැනීම සහ ප්‍රලේඛන කිරීම.
- කොමිෂන් සභාව සඳහා නව තොරතුරු තාක්ෂණ යෙදුම් සකස් කිරීම.
- කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් තාක්ෂණික සහාය ලබාදීම.

- කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණ පුහුණුව ලබාදීම.
- ලේඛන හා නිවේදන පත්‍රිකා සේවා ඇතුලු කොමිෂන් සභාවේ සියලුම අන්තර්ජාල කටයුතු පවත්වා ගෙන යාම.
- වෙබ් අඩවි කමිටුවේ උපදෙස් යටතේ කොමිෂන් සභාවේ වෙබ් අඩවිය පවත්වා ගැනීම.
- අභ්‍යන්තර තොරතුරු ජාල නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ප්‍රදර්ශන මගින් තොරතුරු රැස්කිරීම සහ බෙදාහැරීම.
- විද්‍යුත් තැපැල් සේවා පරිගණකය (Server) පාලනය කිරීම සහ නඩත්තු කිරීම.

## 11.2 තොරතුරු තාක්ෂණ ඒකකයේ කාර්ය සාධනය

තොරතුරු තාක්ෂණ ඒකකය විසින් ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ විස්තර 11.1 වගුවේ දැක්වේ.

**තොරතුරු තාක්ෂණ ඒකකය විසින් ඉටුකරනු ලැබූ කාර්යයන් – 2011** (11.1 වගුව)

| කාර්යය | විස්තරය |
|---|---|
| ESET ස්මාර්ට් ආරක්ෂක බලපත්‍රය යාවත් කාලීන කිරීම. | පරිගණකයේ ආරක්ෂාව සඳහා වෛරස් ආරක්ෂණයක් (Virus Guard) සවි කරන ලද අතර, එම බලපත්‍රය වාර්ෂිකව යාවත් කාලීන කළ යුතු අතර, 2011 වසරේදී එම කාර්යය සඳහා වැය කරන ලද මුදල රු. 220,000.00 කි. |
| දෘඩාංග ආරක්ෂක පද්ධතියක් (Hardware Firewall) මිලදී ගැනීම. | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ දේශීය ජාලය (LAN) ආරක්ෂා කිරීම සඳහා මෙම පද්ධතිය සවිකිරීම සඳහා දරන ලද පිරිවැය ඇමරිකානු ඩොලර් 13,339.50 කි. |
| සර්වර් දෙකේ සසම්භාවී ප්‍රවේශ මෙමරිය (RAM) වැඩිදියුණු කිරීම. | මුළු පිරිවැය රු. 79,600.00 දරමින් (අගය එකතු කළ බද්ද) ගිගා බයිට්ස් 32 (ගිගාබයිට්ස් 8*4) සර්වරයක් මිලයට ගැනීමෙන් සර්වර් දෙකේ (RAM) ධාරිතාවය ගිගාබයිට්ස් 8 (එක් එක් ගිගාබයිට්ස් 4) සිය ගිගාබයිට්ස් 40 දක්වා (එක් එක් ගිගාබයිට්ස් 20) වැඩි දියුණු කර ඇත. |
| සියළුම අසමමිතික සංඛ්‍යාංක ග්‍රාහක රැහැන් සහ වෙනත් කුලියට ගත් සම්බන්ධතා වෙනුවට කුලියට ගත් ඩයලොග් ප්‍රකාශ තන්තු සම්බන්ධතාවයක් මිලදී ගැනීම. | දැනට පැවති අසමමිතික සංඛ්‍යාංක ග්‍රාහක සම්බන්ධතාවය සහ කුළියට ගත් වෙනත් සම්බන්ධතා වෙනුවට මෙගාබයිට්ස් 12 වේගයක් සහිත කුලියට ගත් එක් අධිවේගී ප්‍රකාශ තන්තු සම්බන්ධතාවයක් ප්‍රතිස්ථාපනය කර ඇත. මෙම ප්‍රකාශ තන්තු සම්බන්ධතාවය සඳහා මාසික කුලිය රු. 22,000/- කි. |
| තොරතුරු තාක්ෂණ අංශයේ අසමමිතික සංඛ්‍යාංක ග්‍රාහක රැහැන් අධිවේගී අන්තර්ජාල සම්බන්ධතා ශ්‍රී ලංකා ටෙලිකොම් සිට ලංකා බෙල් වෙත මාරු කිරීම. | ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අසමමිතික සංඛ්‍යාංක ග්‍රාහක සම්බන්ධතාවල වේගය අඩු බැවින් වේගය වැඩිකිරීම (එක් සම්බන්ධතාවයකට තත්පරයකට මෙගා බයිට්ස් 4) සඳහා මෙය සිදු කරන ලදී. |
| අමතර ඩොමේන් සර්වර්යක් මිලදී ගැනීම (ADS) | මෙය අයිතමයන්වල සැපයුම්කරුවන් (ඩොමෙන් සර්වරය, SCCM, සහ දත්ත ආරක්ෂණ පාලකය ප්‍රසම්පාදන පටිපාටිය මත තෝරාගෙන ඇති අතර, තෝරාගත් පාර්ශ්වයන් විසින් අයිතමයන් සවිකිරීම 2011 වර්ෂයේදී ආරම්භ කර ඇත. |
| පද්ධති කේන්ද්‍රීය ආකෘතිමය පාලකයක් (SCCM) මිලදී ගැනීම. | |
| දත්ත ආරක්ෂණ පාලකයක් (DPM) මිලදී ගැනීම. | |

| කාර්යය | විස්තරය |
|---|---|
| ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කිරීම. | රාජ්‍ය ආයතනවල වෙබ් අඩවි ත්‍රෛභාෂිකව (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි) නිර්මාණය කිරීම අවශ්‍ය වේ. එබැවින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය නවීකරණය කිරීමට පියවර ගැණිනි. මෙම කාර්යය සඳහා කමිටුවක් පත් කරන ලදී. සුදුසු වෙබ් අඩවි නිර්මාණ සමාගමක් තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන පටිපාටියක් යොදා ගැනිණි. තෝරා ගැනීමේ ක්‍රියාවලියේදී සමාගම් සමඟ ඔවුන්ගේ යෝජනා පිළිබඳ විස්තර ලබාගැනීම පිණිස සම්මුඛ පරීක්ෂණයක් පැවැත්විණි. |

## 11.3 පුස්තකාල සේවා ඒකකය

**කාර්යයන්:**

- අභ්‍යන්තර කාර්ය මණ්ඩලය, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්, පාසැල් ශිෂ්‍යයන්, පර්යේෂකයන් සහ පුස්තකාලය පරිහරනය කරන සෙසු තැනැත්තන් සඳහා පුස්තකාලය පවත්වා ගෙන යාම.
- මහජන පුස්තකාලය සහ බ්‍රිතාන්‍ය කවුන්සිලය වැනි සෙසු පුස්තකාලවලට පුස්තකාල පහසුකම් ලබාදීම.
- අන්තර් පුස්තකාල ණය පහසුකම් ලබාදීම සඳහා වෙනත් ආයතන සම්බන්ධීකරණය කිරීම.
- වැදගත් තොරතුරු රැස් කිරීම සහ සුචියක් පිළියෙල කිරීම.
- පූර්ණා (PURNA) දත්ත සමුදාය වැඩි දියුණු කිරීම.
- පුස්තකාලය ශක්තිමත් කිරීම.
- කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සඳහා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.
- පුවත්පත් සුචියක් පිළියෙල කිරීම.
- අනවශ්‍ය ද්‍රව්‍ය ඉවත් කිරීම.

## 11.4 පුස්තකාල සේවා ඒකකයේ කාර්ය සාධනය

### 11.4.1 ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පුස්තකාලය පවත්වාගෙන යාම සහ තොරතුරු සැපයීම.

පුස්තකාල සේවා ඒකකවල විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාල ලේඛන, පොත්පත් සහ සඟරා රැසක් අඩංගු පුස්තකාලය පවත්වාගෙන යාමේ කටයුත්ත අඛණ්ඩව සිදු කළේය. මීට අමතරව විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාල පොත් සහ සඟරාවලට අතිරේකව කළමනාකරණය, නීතිය, ආර්ථික විද්‍යාව, ගිණුම්කරණය වැනි අනෙකුත් විෂයය ක්ෂේත්‍රයන් පිළිබඳව වැදගත් පොත්පත් පුස්තකාලය සතුව තිබේ. මෙම පුස්තකාලයේ සේවාලාභීන් අභ්‍යන්තර කාර්ය මණ්ඩලය, විශ්ව විද්‍යාල සිසුන්, ගුරුවරුන්, පාසැල් සිසුන්, පර්යේෂකයන් මෙන්ම පුස්තකාලයාධිපතිවරුන්ගෙන් සමන්විත වේ. අන්තර්ජාලය සහ වෙනත් පුස්තකාල දත්ත සමුදායන් භාවිතා කරමින් සේවාලාභීන් සඳහා තොරතුරු සැපයීම සිදු කෙරේ. එමෙන්ම සේවාලාභීන්ට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් ඡායා පිටපත් පහසුකම් ලබාගත හැකි වේ. සේවාලාභීන්ට අවශ්‍ය තොරතුරු කඩිනමින් සැපයීම සඳහා පුස්තකාලයේ විද්‍යුත් තැපැල් සහ අන්තර්ජාල පහසුකම්, ෆැක්ස් පහසුකම් සහ දුරකථන පහසුකම් භාවිතා කරනු ලැබේ.

### 11.4.2 සාමාජිකත්වය යාවත්කාලීන කිරීම මගින් මහජන පුස්තකාලය සහ බ්‍රිතාන්‍ය කවුන්සිලය වැනි වෙනත් පුස්තකාල සඳහා පුස්තකාල පහසුකම් සැපයීම:

පහත සඳහන් සංවිධාන වල ආයතනික සාමාජිකත්වය ලබාගැනීමේදී පුස්තකාල සේවා ඒකකය විසින් වැදගත් වැඩ කොටසක් ඉටු කරනු ලැබීය.

1. මහජන පුස්තකාලය
2. ජාතික පුස්තකාලය
3. බ්‍රිතාන්‍ය පුස්තකාලය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව බ්‍රිතාන්‍ය කවුන්සිලයේ සාමාජිකත්වය ලබාගැනීම සඳහා අරමුදල් සපයා ඇත. කෙසේ වෙතත් මහජන පුස්තකාලයේ පුද්ගලික සාමාජිකත්වය ලබාගැනීමට කාර්ය මණ්ඩල සාමාජිකයින් පුද්ගලිකව මුදල් ගෙවිය යුතුවේ. ආයතනික සාමාජිකත්වය තිබීම නිසා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ඉහත පුස්තකාල වලින් පහසුවෙන් සේවා ලබා ගැනීමට හැකි විය. තවද ආයතනික සාමාජිකත්වය තිබීම නිසා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට මහජන පුස්තකාලයේ ජංගම පුස්තකාල සේවාවෙන් පොත්/සඟරා ලබාගැනීමට හැකි විය. 2011 වර්ෂය තුළ ජංගම පුස්තකාල සේවාව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පරිශ්‍රයට 24 වාරයක් පැමිණියේය.

### 11.4.3 අන්තර් පුස්තකාල ණය පහසුකම් ලබාගැනීම සඳහා වෙනත් ආයතන සම්බන්ධීකරණය කිරීම.

පුස්තකාල සේවා ඒකකය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා අන්තර් පුස්තකාල ණය පහසුකම් සේවා සැපයීම සඳහා ජාතික පුස්තකාලය මෙන්ම ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව ආයතනය (NIBM), කම්කරු දෙපාර්තමේන්තුව, ජාතික විද්‍යා පදනම (NSF) වැනි වෙනත් ආයතන සම්බන්ධීකරණය කළේය.

### 11.4.4 වැදගත් තොරතුරු එක්රැස් කිරීම සහ සුචිය පිළියෙළ කිරීම

වැදගත් නිර්දිෂ්ට තොරතුරු එක්රැස් කිරීම සහ සුචිය පිළියෙල කිරීම පුස්තකාල සේවා ඒකකය විසින් සිදුකරන ප්‍රධාන කාර්යයක් වේ. මෙම ඒකකය විසින් විදුලි සංදේශනය, සෞඛ්‍යය, අධ්‍යාපනය, පරිසරය ආශ්‍රිත පුවත්පත් සහ සඟරාමය ලිපි එක්රැස් කරන අතර, ඒවා කාලානුක්‍රමිකව පිළියෙළ කරනු ලැබේ. එමෙන්ම සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ පුස්තකාල සේවාව විසින් පුස්තකාල නිවේදන සහ කොමිෂන් සභා ප්‍රකාශන පිළිබඳ සුචියක් පිළියෙළ කර ඇත. මෙම ඒකකය විසින් කාර්ය මණ්ඩලයේ විදේශ පුහුණු, අතිවිශේෂ ගැසට් නිවේදන, සහ කොමිෂන් සභාව මෙන්ම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, විසින් කලින් කල නිකුත් කරන චක්‍රලේඛ වැනි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට අදාල වැදගත් වන කරුණු පිළිබඳ සුචියක් පිළියෙල කිරීම ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පවත්වන ආධුනික ගුවන් විදුලි විභාගය සඳහා අයදුම් කරන අයදුම්කරුවන්ගේ ප්‍රයෝජනය සඳහා විභාග දෙපාර්තමේන්තුවේ සහයෝගිත්වය ඇතිව පසුගිය ප්‍රශ්න පත්‍ර එකතුවක් පවත්වාගෙන යනු ලැබේ.

### 11.4.5 Purna පද්ධතිය වැඩිදියුණු කිරීම.

මෙම ඒකකය විසින් පරිහරණය කරන්නන්ට තොරතුරු පහසුවෙන් සැපයීම සහ ප්‍රශස්ත සේවාවක් සැපයීම සඳහා වෙබ් අඩවි මාර්ගගත පොදු ප්‍රවේශ සුචියක් (OPAC) සුචිකරණ පද්ධතිය සහිතව නවීකරණය කිරීම සහ නිර්මාණය කිරීම සිදු කර ඇත.

### 11.4.6 පුස්තකාලය ශක්තිමත් කිරීම.

පුස්තකාල සේවා ඒකකය විසින් ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ පොදු රාජ්‍ය

මණ්ඩලීය විදුලි සංදේශ සංගමයෙන් (CTO) පොත් මිලදී ගැනීමෙන් පුස්තකාලය ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇත. මිල දී ගත් පොත්වල වටිනාකම පවුම් 25,000 කි. පුද්ගල සහ ආයතනික පරිත්‍යාග වශයෙන් පොත් සහ සඟරා පුස්තකාලයට ලැබී ඇත. රු. 285,285.00 ක වටිනාකමින් යුත් පරිගණක තුනක්, රුපියල් 20,000.00 ක වටිනාකමකින් යුත් ෆැක්ස් යන්ත්‍රයක් මිලදී ගැනීම තුළින් පුස්තකාල පහසුකම් වැඩි දියුණු කර ඇත.

### 11.4.7 අවශ්‍ය ද්‍රව්‍ය ඉවත් කිරීම.

පුස්තකාලය ප්‍රසම්පාදන පටිපාටියට අනුකූලව පුවත්පත් තොගයක් ඉවත් කරන ලද අතර, මෙම ගණුදෙනුවෙන් රු. 34,466.00 ක මුදලක් ලබාගත හැකි විය.

## 11.5 කාර්ය මණ්ඩලය

2011 වසරේදී තොරතුරු සහ ප්‍රලේඛන අංශය සහකාර අධ්‍යක්ෂවරයකු - වැඩ බලන (1), කළමනාකරණ සහකාර මට්ටමේ නිලධාරීන් හය දෙනෙකු (6) සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩල සේවකයකු (1) ඇතුළු අට දෙනකුගෙන් (8) සමන්විත කාර්ය මණ්ඩලයක් විසින් සිදු කරන ලදී.

# මාධ්‍යය අංශය

12 පරිච්ඡේදය

මෙම ඒකකයේ ප්‍රධාන කාර්යය වන්නේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සිදු කරන වැදගත් කටයුතු සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම, කොමිෂන් සභාවේ වැදගත් සිදුවීම් ආවරණය කිරීම, වාර්තා වැඩසටහන් පිළියෙල කිරීම, අදාල තොරතුරු සහ ඡායාරූප මෙන්ම ගුවන් විදුලිය, රූපවාහිනිය මෙන්ම පුවත්පත් සඳහා වීඩියෝ ඉදිරිපත් කිරීම වේ. බාහිර මාධ්‍යය ප්‍රභවයන්ට තොරතුරු ඉදිරිපත් කිරීමේදී මෙම ඒකකය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අදාල අංශ/ඒකක මගින් විෂයය කරුණු පිළිබඳ තොරතුරු ලබා ගනී.

## 12.1 කාර්ය සාධනය

2011 වසරේදී මාධ්‍යය ඒකකය විසින් ආවරණය කරන ලද සිදුවීම් 12.1 වගුවේ දැක්වේ.

**2011 වසරේදී මාධ්‍යය ඒකකය විසින් ආවරණය කරන ලද සිදුවීම්** (12.1 වගුව)

| අංකය | සිදුවීම | දිනය |
|---|---|---|
| 1 | නව වසර සැමරීමේ උත්සවය | 2011.01.03 |
| 2 | ඩයලොග් පරිත්‍යාග | 2011.01.22 |
| 3 | මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල පවත්වන ලද දැයට කිරුළ ප්‍රදර්ශනය | 2011.02.04 |
| 4 | පිටකොටුව ව්‍යාපාරික ප්‍රජාව සඳහා ජංගම දුරකථන ලියාපදිංචි කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 2011.04.09 |
| 5 | ප්‍රජාව - පාසල සම්බන්ධීකරණය කිරීමේ ව්‍යාපෘතිය | 2011.05.03 |
| 6 | කොකාවිල් විදුලි සංදේශ කුලුන ඉදිකිරීම පරීක්ෂා කිරීම | 2011.05.27 |
| 7 | කොකාවිල් විදුලි සංදේශ කුලුන විවෘත කිරීම | 2011.06.06 |
| 8 | නෙළුම් කුලුන ඉදිකිරීම සඳහා යෝජිත භූමිය පරීක්ෂා කිරීම | 2011.06.21 |
| 9 | විශේෂ අවශ්‍යතා සහිත/අඩු ආදායම්ලාභී ප්‍රජාව සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය ලබාදීමේ ව්‍යාපෘතිය | 2011.07.09 |
| 10 | IPV6 වෙබ් අඩවිය | 2011.07.05 |
| 11 | කොරියානු තොරතුරු තාක්ෂණ ස්වේච්ඡාදායකයන් | 2011.08.14 |
| 12 | Micromax ජාත්‍යන්තර හඳුන්වාදීම | 2011.08.16 |
| 13 | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ක්‍රීඩා උත්සවය | 2011.08.26 |
| 14 | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ක්‍රීඩා උත්සවය – මලල ක්‍රීඩා අවසාන | 2011.09.05 |
| 15 | සංජානනී ප්‍රදර්ශනය | 2011.09.20 |
| 16 | විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ අධ්‍යයන | 2011.09.28 |
| 17 | අධිවේගී අන්තර්ජාලයේ වේගය පිළිබඳ මාධ්‍යය සම්මන්ත්‍රණය | 2011.11.04 |
| 18 | රුක් රෝපණ දිනය | 2011.11.18 |
| 19 | මහරගම පිළිකා රෝහලට උපකරණ ලබාදීම | 2011.12.05 |
| 19 | දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ සමුළුව | 2011.12.12 - 13 |

## 12.2 කාර්ය මණ්ඩලය

2011 වසරේදී මාධ්‍යය අංශයේ කාර්ය මණ්ඩලය කළමනාකරණ සහකාර මට්ටමේ නිලධාරීන් හතර දෙනෙකුගෙන් (4) සමන්විත විය.

# අභ්‍යන්තර විගණන අංශය

13 පරිච්ඡේදය

## 13.1 සමාලෝචනය

අභ්‍යන්තර විගණන අංශය ආයතනයේ මෙහෙයුම් කටයුතු වැඩි දියුනු කිරීම සහ වටිනාකම එකතු කිරීමේ අරමුණින් ක්‍රියාකරන ස්වාධීන අංශයකි. දත්ත සහ ව්‍යාපාරික ක්‍රියාවලිය විශ්ලේෂණය කිරීම සහ ඇගයීම පදනම් කරගෙන දර්ශනය සහ නිර්දේශය සැපයීම මගින් ආයතනයේ ඵලදායීත්වය සහ කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කිරීමේ උත්ප්‍රේරකයක් වේ. විගණන අංශය ස්වාධීනව උපදෙස් ලබාදෙන විෂයානුබද්ධ ප්‍රභවයක් වශයෙන් පරිපූර්ණ සහ වගකිව යුතු විධිවිධාන යෙදීමේදී රාජ්‍ය ආයතනවලට සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයට ප්‍රයෝජනවත් වේ. ආයතනයේ අභ්‍යන්තර විගණන අංශයේ විෂයය පථය පුළුල් අතර මෙහෙයුම් කටයුතුවල ඵලදායිතාවය, මූල්‍යය වාර්තාවල විශ්වාසනීත්වය, වංචාවලට දඬුවම් ලබාදීම සහ විමර්ශනය කිරීම, වත්කම් ආරක්ෂා කිරීම නීති සහ රීති වලට අනුකූලතාවය දැක්වීම වැනි විෂයය ක්ෂේත්‍රයන් පිළිබඳව කටයුතු කරනු ලැබේ.

ප්‍රධාන අභ්‍යන්තර විගණක අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා වශයෙන් සෘජුවම කොමිෂන් සභාවට වාර්තා කළ යුතු අතර, විගණන වාර්තා විගණන කමිටුවට ඉදිරිපත් කළ යුතුවේ. පරිපාලනමය වශයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක අධ්‍යක්ෂ ජානරාල්වරායාට වාර්තා කළ යුතුවේ.

## 13.2 කාර්යයන්

- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පවත්නා ගිණුම් තැබීම සහ වාර්තාකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා ඒවා සමාලෝචනය කිරිම සහ ඇගයීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කිසියම් ගැටළු පැනනැඟී තිබේ නම් ඒවාට අදාල හේතු සහ බලපෑම් විමර්ශනය කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වත්කම් අලාභහානි සහ වංචාවලින් ආරක්‍ෂා වී තිබේදැයි නිශ්චිතව දැන ගැනීම.
- ගණුදෙනුවල අවශ්‍යතාවය, ගණුදෙනුවල ප්‍රතිලාභ විමර්ශනය කිරිම සහ නාස්තිය සහ පමණ ඉක්මවා වියදම් කිරීම ඉවත් කිරීම තුළින් වියදම් අඩුකිරීමේ මාර්ග පිළිබඳව ගවේෂණය කිරීම.
- ඉහත දැක්වූ ක්‍රියාමාර්ග වලින් සොයා දැන ගන්නට ලැබෙන කරුණු පාදක කර ගනිමින් විගණන කමිටුව වෙත වාර්තා ඉදිරිපත් කිරීම සහ විගණන කමිටු රැස්වීම් කැඳවීමට පියවර ගැනීම.
- විගණන කමිටු තීරන සකස් කිරීම සහ අදාල නිසි ක්‍රියාමාර්ග ගැනීම පිණිස ඒවා අංශ ප්‍රධානීන් වෙත බෙදාහැරීම.
- විගණකාධිපති දෙපාර්තමේන්තුවට අර්ධ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම.
- අධ්‍යක්‍ෂ ජනරාල්/කොමිෂන් සභා සාමාජිකයන් ඉල්ලා සිටින විට විශේෂ විමර්ශණ පැවැත්වීම.
- අධ්‍යක්ෂ ජනරාල්/කොමිෂන් සභාව විසින් කලින් කල පත් කරනු ලබන විවිධ කමිටුවලට සහායවීම සහ නිර්දේශ ලබාදීම.

## 13.3 කාර්ය සාධනය

2011 වසර තුලදී විගණන කමිටු රැස්වීම් තුනක් පවත්වා ඇති අතර, විගණන අංශය විසින් අභ්‍යන්තර විගණන වාර්තා විසි හතක් (27) විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අතර, එම රැස්වීම් වලදී ඒවා සාකච්ඡා කරන ලදී.

වාර්තාවේ ආවරණය කරන ලද විෂයය ක්‍ෂේත්‍ර 13.1 වගුවේ දැක්වේ.

**අභ්‍යන්තර විගණන වාර්තාවේ ආවරණය කරන ලද විෂය ක්‍ෂේත්‍රයන්** (13.1 වගුව)

| වාර්තා අංකය | වාර්තාවේ දිනය | සිදුවීම |
|---|---|---|
| CIA/11/01 | 2011/01/12 | දේපළ ණය |
| CIA/11/02 | 2011/01/26 | ශ්‍රී.ලං.වි.සං.නි. කොමිෂන් සභාවට අයත් වාහන අළුත්වැඩියා කිරිම |
| CIA/11/03 | 2011/01/31 | කාර්යාලයෙන් බැහැර රාජකාරි සඳහා ඉන්ධන මිලදී ගැනීම |
| CIA/11/04 | 2011/02/09 | ආපදා ණය ගෙවීම |

| | | |
|---|---|---|
| CIA/11/05 | 2011/02/09 | ආපදා ණය ගෙවීම සීමා කිරීම |
| CIA/11/06 | 2011/03/01 | සී/ස ට්‍රයිටෙල් (පුද්ගලික) සමාගම විසින් සෙස් සහ ක්‍රියාකරු ගාස්තු ගෙවීම |
| CIA/11/07 | 2011/03/07 | රාජකාරි කටයුතු සඳහා විදේශ ගමන් |
| CIA/11/08 | 2011/03/07 | ණය අයකර ගැනීම |
| CIA/11/09 | 2011/03/15 | නිවාඩු පටිපාටිය |
| CIA/11/10 | 2011/04/12 | කාර්ය සාධන දිරි දීමනා යෝජනා ක්‍රමය |
| CIA/11/11 | 2011/04/27 | පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු |
| CIA/11/12 | 2011/04/27 | විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ වාර්තා |
| CIA/11/13 | 2011/04/27 | කොන්ත්‍රාත් සේවකයන් |
| CIA/11/14 | 2011/04/27 | ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම |
| CIA/11/15 | 2011/05/19 | අත්තිකාරම් පියවීම |
| CIA/11/16 | 2011/05/30 | විදේශ ගමන් - අතිරේක දිනයක් සඳහා වියදම් ප්‍රතිපූර්ණය කිරීම |
| CIA/11/17 | 2011/07/07 | මාසික කොමිෂන් සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කළ යුතු ප්‍රකාශන |
| CIA/11/18 | 2011/07/28 | ප්‍රසූත නිවාඩු |
| CIA/11/19 | 2011/08/10 | නිවාඩු පටිපාටිය |
| CIA/11/20 | 2011/08/19 | වැටුප් සහ දීමනා ගෙවීම |
| CIA/11/21 | 2011/10/20 | ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම |
| CIA/11/22 | 2011/10/31 | වාහන ණය |
| CIA/11/23 | 2011/11/09 | ණය අය කිරීම් |
| CIA/11/24 | 2011/11/15 | විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ වාර්තා |
| CIA/11/24 | 2011/11/28 | ගුවන් විදුලි සංඛ්‍යාත බලපත්‍ර ලදුපත් |
| CIA/11/24 | 2011/12/02 | වැටුප් ගෙවීම |
| CIA/11/24 | 2011/12/05 | ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම |

## 13.4 කාර්ය මණ්ඩලය

2011 වසරේදී අභ්‍යන්තර විගණන අංශය ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකු (1), කළමණාකරන සහකාර මට්ටමේ නිලධාරීන් දෙදෙනෙකු (2) සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩල සේවකයකු (1) ඇතුළු හතර දෙනකුගෙන් (4) සමන්විත කාර්ය මණ්ඩලයක් විසින් සිදු කරන ලදී.

# මූල්‍යය අංශය

14 පරිච්ඡේදය

## 14.1 සමාලෝචනය

මූල්‍යය අංශය විසින් මූල්‍යය කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කරන අතර, එහි ප්‍රධාන කාර්යය වන්නේ මූල්‍යය කළමනාකරණයයි. ආදායම එකතු කිරීම, වියදම් කිරීම, පාලනය කිරීම සහ අරමුදල් අධීක්ෂණය කිරීම මූල්‍ය කළමනාකරණයේ මූලිකාංග වන අතර, ඒවා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වැනි ආයතනවල කාර්යයන් මනා ලෙස පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍යයෙන්ම කළ යුතු වේ. නිවැරදි මූල්‍ය වාර්තා පවත්වා ගැනීම මූල්‍ය කළමනාකරණයේ ඉතා වැදගත් කාර්යයක් වේ. ගණුදෙනුවල නිරවද්‍යතාවය සහ පරිපූර්ණත්වය නිශ්චය කිරීම, සියළුම මූල්‍ය

ප්‍රතිපත්ති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් ප්‍රසිද්ධ කළ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට සහ ගිණුම් ප්‍රමිතීන්ට සහ රජයේ මූල්‍යය රෙගුලාසිවලට අනුකූලව සිදු කරන බවට වගබලා ගැනීම පිණිස රාජ්‍ය ආයතන විගණකාධිපති වෙත මූල්‍යය වාර්තා ඉදිරිපත් කිරීම සඳහා නීතියෙන්ම බැඳී සිටී. මූල්‍යය කළමනාකරණ අංශයේ කාර්යයන් ඓතිහාසික දත්ත වාර්තාකරණය සඳහා සීමා නොවේ. එමෙන්ම මූල්‍යය පරිපාලනය, පිරිවැය පාලනය, සංවර්ධන සැලසුම්කරණය සහ උපායමාර්ගික තීරණ ගැනීම සඳහා සහභාගිවීම මෙම අංශය මගින් සිදු කරන වැදගත් කාර්යයන් වේ. එමෙන්ම වැඩිදුරටත් මූල්‍යය අංශය විසින් කාර්යක්ෂම සහ ඵලදායි කළමනාකරණය මෙන්ම මූල්‍යය තොරතුරු ක්‍රමයක් පවත්වා ගනී. ඒ අනුව මූල්‍යය අංශයේ කාර්යයන් පහත දැක්වේ:

## 14.2 කාර්යයන්

- ඓතිහාසික දත්ත විශ්ලේෂණය කරමින් කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍යය බලපෑම වාර්තාකරණය කිරීම.
- කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව සියළුම අංශවල සම්බන්ධීකරණයෙන් වාර්ෂික අයවැය පිළියෙල කිරීම.
- ආදායම, වියදම, වත්කම සහ වගකීම් පිළිබඳව මූල්‍යකරණ සහ සංඛ්‍යාලේඛන වාර්තා පවත්වාගෙන යාම.
- නීති, මූල්‍යය රෙගුලාසි, ප්‍රතිපත්ති සහ පටිපාටි ප්‍රකාරව සියළුම ආදායම් සහ ගෙවීම් පිළියෙල කිරීම.
- ආයතනයේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම මෙන්ම කොමිෂන් සභාවේ සමස්ථ මෙහෙයුම් කටයුතු වලට අදාල මූල්‍යය පටිපාටි සහ ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කිරීමට වගබලා ගැනීම.
- ප්‍රාග්ධනය සහ ආදායම වියදම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඉහළ කළමනාකාරිත්වයට සහායවීම සහ උපදෙස් ලබාදීම පිණිස පිරිවැය සහ මූල්‍යය පාලනය පවත්වාගෙන යාම.
- අදාල බදු පනතේ විධිවිධානවල ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීම සහ බදු සැලසුම්කරණය කිරීම මෙන්ම වැරදි ඇත්නම් ඒවා නිවැරදි කිරීමට පියවර ගැනීම.
- සියළුම බැංකු ගිණුම් සහ වාර්තා සැසඳීම සහ රජය විසින් පනවන බදු වහාම එකතු කිරීමට වගබලා ගැනීම.
- විදුලි සංදේශ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු පනත් යටතේ විවිධ බදු ආකාරයෙන් එකතු කරන අරමුදල් කළමනාකරණය කිරීම සහ එම මුදල් මහා භාණ්ඩාගාරය වෙත වහාම ප්‍රේෂණය කිරීමට වගබලා ගැනීම මෙන්ම අතිරික්ත අරමුදල් ඇත්නම් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමට වගබලා ගැනීම.
- කොමිෂන් සභාවේ කාර්තු සහ වාර්ෂික මූල්‍යය ප්‍රකාශන පිළියෙල කිරීම.

## 14.3 කාර්ය සාධනය

### 14.3.1 ආදායම

1996 අංක 27 දරණ විදුලි සංදේශ පනතේ විධිවිධාන ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ගුවන්විදුලි සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු, සෙස්

ගාස්තු. පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු, වෙළඳ බලපත්‍ර ගාස්තු මෙන්ම පොදු ස්විචීකරණය දුරකථන ජාල (PSTN) වලින් අදාල වෙනත් ගාස්තු එකතු කරනු ලැබේ. සන්සන්දනය කිරීමේ අරමුණ ඇතිව 2010 ආදායම සහ 2011 වර්ෂයේ ආදායම පිළිබඳ සාරාංශයක් 14.1 වගුවේ දක්වේ.

ක්‍රියාකරු ගාස්තු සහ සෙස් ගාස්තු වෙනුවට ක්‍රියාකරුගේ වාර්ෂික දළ පිරිවැටුම මත රජය විසින් සියයට 2 ක සෙස් ගාස්තුවක් හඳුන්වා දෙන ලදී.

ඉහත ආදායමට අමතරව 2009 අංක 13 දරණ මුදල් පනතින් සංශෝධිත

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආදායම 2010 – 2011** (14.1 වගුව)

| ආදායම් ප්‍රභවය | 2011 (රු. '000) | 2010 (රු. '000) |
|---|---|---|
| පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු | 24,388 | 235,598 |
| සෙස් ගාස්තු | 2,377,597 | 340,095 |
| ගුවන් විදුලි සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු | 6,073,988 | 5,116,864 |
| ගුවන් විදුලි සංඛ්‍යාත පූර්ව ගාස්තු | 1,758,967 | - |
| විකුණුම් බලපත්‍ර ගාස්තු | 11,825 | 6,077 |
| ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු | 52 | 30 |
| නැව් මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු | 302 | 296 |
| ගුවන් යානා මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු | 307 | 230 |
| රැහැන් රහිත දුරකථන වෙළඳ ගාස්තු | 3,739 | 1,927 |
| විභාග ගාස්තු | 13 | 7 |
| අයදුම්පත් සැකසීමේ ගාස්තු | 2,245 | 206 |
| කෙටි සංකේත ගාස්තු | 5,612 | 3,608 |
| විවිධ ආදායම් (නිද.: කාර්ය මණ්ඩල ණය සඳහා පොලියෙන් ලැබෙන ආදායම් තැන්පතු හා වෙනත් දෑ සඳහා ලැබෙන පොලී ආදායම | 87,572 | 8,830 |
| එකතුව | 10,346,607 | 5,713,768 |

2011 වසරේ අය වැය යෝජනා අනුව සියයට 12 එකතු කළ අගය මත බද්ද (VAT), සියයට 10 ජංගම සහ ස්ථාවර ග්‍රාහක බද්ද (MSL), සියයට 3 ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT), සහ සියයට 2 ක පාරිසරික ආරක්ෂණ බද්ද (ECL), වෙනුවට රජය විසින් 2011 ජනවාරි 01 දින සිට බලපවත්වන පරිදි විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් විසින් සපයන විදුලි සංදේශ සේවා මත සියයට 20ක විදුලි සංදේශ බද්දක් පනවන ලදී. එමෙන්ම පද්ධති

2004 අංක 11 දරණ මුදල් පනත ප්‍රකාරව ලැබෙන ජාත්‍යන්තර ඇමතුම් වෙනුවෙන් විදුලි සංදේශ සංවර්ධන ගාස්තුවක් වශයෙන් මිනිත්තුවකට ඇමරිකානු ඩොලර් 0.30 සහ පිටතට යන ජාත්‍යන්තර ඇමතුම් වෙනුවෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු මගින් මිනිත්තුවකට රු. 2.00 ක බද්දක් කොමිෂන් සභාව විසින් එකතු කරන ලදී. ඉහත සඳහන් ප්‍රභවයන්ගෙන් එකතු කළ ආදායම 14.2 වගුවේ දැක්වේ.

ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද 2010 – 2011 (14.2 වගුව)

| ආදායම් ප්‍රභවය | 2011 (රු. 000) | 2010 (රු. 000) |
|---|---|---|
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | 1,774,458 | 418,436 |
| ජාත්‍යන්තර ලැබෙන ඇමතුම් මත බද්ද | 1,258,570 | - |

2009, 2010, 2011 වර්ෂ සඳහා කොමිෂන් සභාවේ මුළු ආදායම 14.3 වගුවේ දැක්වේ. 2010 වසරේදී බිලියන 5.9 ක් වූ කොමිෂන් සභාවේ මුළු ආදායම 2011 වසරේදී බිලියන 29.8 දක්වා සියයට 400 වැඩි ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත.

කොමිෂන් සභාවේ මුළු ආදායම 2009 – 2011 (14.3 වගුව)

| 2009 (රු. 000) | 2010 (රු. 000) | 2011 (රු. 000) |
|---|---|---|
| 6,091,312 | 5,932,148 | 29,839,187 |

### 14.3.2 කොමිෂන් සභාවේ වියදමට වැඩි ආදායම

2011 වසරේදී ආදායම් බද්දට පෙර කොමිෂන් සභාවේ මුළු වියදමට වැඩි ආදායම රුපියල් මිලියන 29,350 ක් වූ අතර, එය 2010 වසරේදී රුපියල් මිලියන 1,767 ක් විය. කෙසේ වුවද 2011 වසරේදී ආදායම් බදු වශයෙන් ගෙවිය යුතු මුදල රු. මිලියන 31 වූ අතර, පසුගිය වර්ෂ (නිද.: 2007, 2008) සඳහා හිඟ මුදල් වශයෙන් ආදායම් බදු ගෙවීම නිසා 2010 වසරේදී රුපියල් මිලියන 1.767, 2011 වසරේදී බෙහෙවින් වැඩි විය. ඒ අනුව 2011 සහ 2010 වසරවල ආදායම් බදු ගෙවීමෙන් පසුව වියදමට වැඩි ආදායම පිළිවෙලින් රුපියල් මිලියන 29,319 සහ රුපියල් මිලියන 3,611 ක් විය.

### 14.3.3 ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ

2011 වසරේදී කොමිෂන් සභාව රු. බිලියන 27 ක අතිරික්ත අරමුදල් ප්‍රේෂණය කිරීමෙන් සැළකිය යුතු ලෙස රජයේ ආදායමට දායක වී ඇති අතර, මෙය 2010 ප්‍රේෂණය කරන ලද ප්‍රමාණයට වඩා 610% වැඩි වීමකි. මීට අමතරව ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු සහ රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදල් වශයෙන් පිළිවෙලින් එකතු කර ගත් රු. බිලියන 1.5 සහ රු. මිලියන 750 ක් ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලදී. ඒ අනුව 2011 වසරේදී ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලද මුළු මුදල් ප්‍රමාණය රු. බිලියන 29.25 කි.

### 14.3.4 දේපළ, පිරියත සහ උපකරණ

2011 ජනවාරි 01 දින වන විට ක්ෂය කිරීම් වලින් අනතුරුව දේපල පිරියත සහ උපකරණවල වටිනාකම රු. මිලියන 305 ක් වන අතර, එය වර්ෂය අවසාන වන විට රු. මිලියන 570 ක් විය. ඊට අමතර වශයෙන් දිවයිනේ උතුරු පළාතේ විදුලි සංදේශ සේවා ව්‍යාප්ත කිරිම සඳහා විදුලි සංදේශ ජාල ක්‍රියාකරුවන් සඳහා ඉදි කරන ලද රු. මිලියන 262 (කොකාවිල්) සහ රු. මිලියන 29.9 (වවුනියා) වටිනාකමකින් යුතු

විදුලි සංදේශ කුලුනු ඇතුළත් වේ. කදිරාන පිරික්සුම් මධ්‍යස්ථානයේ රු. මිලියන 11.8 ක වටිනාකමකින් යුතු මායිම් තාප්පය ඉදිකරන ලද අතර, දේපළ පිරියත සහ උපකරණ අතරට එයද එක් විය. රු. මිලියන 2.9 ක වටිනාකමකින් යුතු සංඛ්‍යාත කළමනාකරණ සහ පිරික්සුම් පද්ධතියේ (FMMS) ඇතැම් උපකරණ බැහැර කිරීම මත ඉවත් කරන ලද අතර, රුපියල් මිලියන 3.1 ක වටිනාකමකින් යුතු නව උපකරණ ප්‍රතිස්ථාපනය කරන ලදී. වෙනත් සුළු එකතු කිරීම් සහිතව 2011 වසරේදී තක්සේරු කළ මුළු එකතුව රු. මිලියන 327.7 කි.

### 14.3.5 ආයෝජන

කොමිෂන් සභාව 2011 වසරේදී ප්‍රති ගැණුම්කරන ගිවිසුම යටතේ රජයේ සුරැකුම්පත් සඳහා රු. බිලියන 3.034ක මුදලක් ආයෝජනය කර ඇති අතර, මහජන බැංකුවේ ස්ථාවර තැන්පතු මුදල් රු. මිලියන 120 කි. මීට අමතරව විදුලි සංදේශ සංවර්ධන ගාස්තු වශයෙන් එකතු කරන සියයට 50 ක් වූ රු. බිලියන 2.7 රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාරකාර අරමුදලේ ආයෝජනය කරන ලදී.

## 14.4 කාර්ය මණ්ඩල

2011 වසරේදී මුල්‍යය අංශය සහකාර අධ්‍යක්‍ෂවරයකු - වැඩ බලන (1) කළමණාකරන සහකාර මට්ටමේ නිලධාරීන් හය දෙනෙකු (6) සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩල සේවකයකු (1) ඇතුළු අට දෙනෙකුගෙන් (8) සමන්විත කාර්ය මණ්ඩලයක් විසින් සිදුකරන ලදී.

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

# ගිණුම් වාර්තා

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
## 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය
(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතයි)

| | සටහන් | | 2010.12.31 (ප්‍රති ප්‍රකාශිත) |
|---|---|---|---|
| **ප්‍රාග්ධන යෙදවීම්** | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 2 | 570,390,458 | 304,822,367 |
| කෙරීගෙන යන වැඩ | 3 | 3,237,415 | 258,438,062 |
| | | **573,627,872** | **563,260,429** |
| ආයෝජන | 4 | 7,412,615,501 | 7,749,665,954 |
| **ජංගම වත්කම්** | | | |
| ප්‍රති ගැණුම් ගිවිසුම යටතේ රාජ්‍ය සුරැකුම්පත් | 4අ | 3,034,654,795 | 0 |
| ලැබිය යුතු ගිණුම් | 5 | 1,671,871,743 | 2,698,708,649 |
| වෙනත් ලැබීම් | | 610,000 | 610,000 |
| ආපදා ණය | | 21,198,207 | 23,165,326 |
| පෙර ගෙවීම් | | 521,020 | 322,500 |
| විශේෂ අත්තිකාරම් | | 0 | 13,575 |
| උත්සව අත්තිකාරම් | | 137,258 | 123,758 |
| මෝටර් රථ ණය | | 55,428,682 | 57,005,466 |
| නිවාස ණය | | 5,700,209 | 6,612,609 |
| යතුරු පැදි ණය | | 1,261,354 | 2,101.329 |
| එකතු කළ අගය මත බද්ද පාලන ගිණුම | | 64,408,810 | 0 |
| මිලදී ගැණුම් අත්තිකාරම් | | 208,784 | 292,080 |
| ලැබිය යුතු ගුවන් ටිකට්පත් | | 653,836 | 285,906 |
| ලැබිය යුතු ගුවන් ටිකට්පත් - ලෝක බැංකුව | | 44,291 | 0 |
| අයවිය යුතු වැටුප් අඩුකිරීම් | | 25,587 | 12,982 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී | | 47,746,536 | 1,664,313 |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (රඳවා ගැනීමේ බදු) | | 721,197 | 713,080 |
| හිමිවිය යුතු ආර්ථික සේවා ගාස්තු | | 11,153,596 | 0 |
| අයවිය යුතු විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | | 496,320,394 | 0 |
| අයවිය යුතු ජාත්‍යන්තර සෘජු දුරකථන ඇමතුම් | | 178,142,201 | 0 |
| අයවිය යුතු විදුලි සංදේශ බදු | | 1,418,062,606 | 0 |
| බැංකු මුදල් | 6 | 136,059,478 | 1,474,454,041 |

| | | | |
|---|---|---|---|
| අතැති මුදල් | 6ආ | 96,207 | 16,525 |
| | | 7,145,026,791 | 4,266,102,139 |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු ගිණුම් | 7 | 43,796,749 | 27,125,752 |
| අයවීමට ඇති කාර්ය මණ්ඩල ණය | | 1,175 | 1,175 |
| වැඩියෙන් අයවීමට ඇති විශේෂ අත්තිකාරම් | | 4,175 | 0 |
| විලම්භිත ආදායම (ප්‍රදාන) | | 166,624 | 0 |
| එකතු කළ අගය මත බද්ද පාලන ගිණුම | | 0 | 87,450,766 |
| ආදායම් බදු සඳහා වෙන් කිරීම් | | 30,520,632 | 236,409,096 |
| සී.ටී.ඕ. ටෙලි මධ්‍යස්ථාන ව්‍යාපෘති ගෙවීම් | | 924,492 | 924,492 |
| ණය හිමියෝ ඉදිකිරීම් | | 751,650 | 751,650 |
| අත්තිකාරම් වශයෙන් ලැබුණු ආදායම | | 2,898,667,108 | 2,715,896,911 |
| ටෙන්ඩර් සඳහා ආපසු ගෙවිය යුතු තැන්පතු | | 1,173,132 | 0 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු - කාර්ය මණ්ඩලය | | 2,086,843 | 0 |
| 1800 MHZ සංඛ්‍යාත සඳහා ලද අත්තිකාරම් | | 307,635,000 | 307,635,000 |
| පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම් | | 23,403,160 | 21,533,040 |
| එලදායි ආපදා කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සමුළුව | | 34,210 | 34,210 |
| භාණ්ඩාගාරය සඳහා ගෙවිය යුතු 50% විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | | 248,160,197 | 118,458,552 |
| භාණ්ඩාගාරය සඳහා ගෙවිය යුතු ජාත්‍යන්තර සෘජු දුරකථන ඇමතුම් | | 178,142,201 | 0 |
| භාණ්ඩාගාරය සඳහා ගෙවිය යුතු විදුලි සංදේශ බද්ද | | 1,420,141,820 | 0 |
| භාණ්ඩාගාරය සඳහා ගෙවිය යුතු ග්‍රාහක බද්ද | | 75,335 | 0 |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු පාරිසරික ආරක්ෂණ බද්ද | | 423,942 | 0 |
| කොකාවිල් පොදු ස්විචිකරණ විදුලි සංදේශ ජාල ඉදිකිරීම | | 4,135,901 | 0 |
| හිමිකම් නොකී කාර්ය මණ්ඩල ප්‍රතිලාභ | | 55,381 | 7,738 |
| | | 5,160,299,727 | 3,517,381,993 |
| ශුද්ධ ජංගම වත්කම් | | 1,984,727,064 | 748,720,147 |
| | | 9,970,970,437 | 9,061,646,529 |
| **නියෝජනය වන්නේ** | | | **2010.12.31** |
| රජයේ දායක මුදල් | | | ප්‍රතිප්‍රකාශිතයි |
| - ලෝක බැංකු ණය ගිවිසුම් | | 298,572,434 | 298,572,434 |
| - එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | | 19,533,906 | 19,533,906 |
| වෙනත් රජයේ දායකයන් | | 208,108,404 | 208,108,404 |

**11. අලුත් වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ වියදම්**

| | | |
|---|---|---|
| කාර්යාල උපකරණ නඩත්තු වියදම් | 1,700,544 | 2,218,855 |
| විදුලි සෝපාන නඩත්තු වියදම් | 179,874 | 364,912 |
| විදුලි උත්පාදක යන්ත්‍ර නඩත්තු වියදම් | 122,831 | 55,412 |
| වාහන නඩත්තු වියදම් | 8,765,098 | 7,151,076 |
| ගොඩනැගිලි නඩත්තු වියදම් | 1,241,978 | 1,387,271 |
| තාක්ෂණික උපකරණ නඩත්තු වියදම් | 528,926 | 106,864 |
| මෘදුකාංග නඩත්තු සහ සංවර්ධන වියදම් | 14,356,603 | 14,468,149 |
| වැඩිදියුණු කළ Lotus Domain සර්වරය | 1,532,024 | 0 |
| වැඩිදියුණු කළ පිරික්සුම් පද්ධතිය | 543,150 | 8,171,037 |
| විවිධ අලුත්වැඩියා හා නඩත්තු වියදම් | 646,275 | 103,839 |
| | **29,617,301** | **34,027,414** |

**12 මූල්‍ය හා අනෙකුත් වියදම්**

| | | |
|---|---|---|
| බැංකු ගාස්තු | 136,575 | 123,745 |
| බැංකු හර බද්ද | 1,178,114 | 7,094,896 |
| මුද්දර බද්ද | 1,549,291 | 1.201,764 |
| | **2,863,980** | **8,420,405** |

**13 ඒකාබද්ධ අරමුදලට දායකවීම**

| | | |
|---|---|---|
| විදුලි සංදේශ පනත යටතේ දායකවීම | 9,050,000,000 | 8,420,405 |
| මුදල් පනත යටතේ දායකවීම | | |
| ගෙවන ලද විදුලි සංදේශ බද්ද | 16,667,767,978 | 0 |
| ගෙවන ලද ජාත්‍යන්තර ලැබෙන ඇමතුම් බද්ද | 125,857,019 | 0 |
| | **26,976,338,17** | **8,420,405** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனதுஇல / My No: TM/E/TRC/FA/2011
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திகதி / Date: 22 August 2012

විගණකාධිපති දෙපාර්තමේන්තුව

මගේ අංකය: ටීඑම්/ඊආර්සී/එෆ්ඒ/2011 ඔබේ අංකය දිනය 2012 අගෝස්තු 22 දින.

සභාපති,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන. 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2012 මැයි 08 දින කොමිෂන් සභාවේ සභාපති වෙත නිකුත් කරන ලදී.

12. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණය ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම
මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka
දුරකථනය / தொலைபேசி / Telephone. 0112887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිත අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ විගණන මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රීලං.ගි.ප්‍ර)
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.:-

(අ) හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය මූල්‍ය ප්‍රකාශනවලට අවශ්‍යම කොටසක් වුවද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 03 හි අවශ්‍යතාවය පරිදි

මෙම ප්‍රකාශනය කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර නොතිබුණි. තවද මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාව මඟින් ද එය කොමිෂන් සභාවේ අවධානයට යොමු කරන ලදී.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 09 ප්‍රකාරව මූල්‍ය හා ආයෝජන කටයුතුවලින් වන මුදල් ප්‍රවාහය පැහැදිලිව හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වෙනම දැක්විය යුතුය. කෙසේ වුවද මෙම කටයුතු වලින් වූ රු. 33,002,372,764 ක මුදල් ප්‍රවාහය වෙනම දක්වනු වෙනුවට ආයෝජන කටයුතු යටතේ දක්වා තිබුණි.

(ඇ) රු. 23,403,160 ක් වූ පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන හා ඒ මත රු. 21,533,040 ක් වූ ආයෝජන මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ප්‍රකාරව ගිණුම්වල විශ්‍රාම ප්‍රතිලාභ සැලසීමට සහ පාරිතෝෂික වගකීම් පිරිවැයට අදාළ හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඈ) 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතට සිදුකරන ලද සංශෝධන අනුව, පොළී ආදායම හා ලාභාංශ හැරුණු විට කොමිෂන් සභාවේ අනෙකුත් ආදායම්, ආදායම් බදු වලින් නිදහස් කර තිබුණි. කෙසේ වුවද ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක 24 ප්‍රකාරව එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණනයේදී නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත දැක්වේ.:-

(අ) බැංකු ගිණුමට සෘජුවම ලැබී තිබුණු සමාලෝචිත වර්ෂයේ විදුලි සංදේශ බදු රු. 11,704,355 ක් සහ ලැබිය යුතු ජාත්‍යන්තර බැහැර ඇමතුම් බදු රු. 31,405,442 ක් ගිණුම්වලින් අත්හැර තිබුණු බැවින් වර්ෂයේ ආදායම රු. 43,109,797 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ මුදල් හා මුදල් සමාන ශේෂය සහ ලැබිය යුතු ගිණුම් පිළිවෙලින් රු. 11,704,355 කින් හා රු. 31,405,442 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ගිණුම්වල දැක්වෙන ගොඩනැගිලි පිරිවැය රු.3,292,300 කින් සාවද්‍යව වැඩියෙන් දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගිලි සඳහා ක්ෂය රු. 164,165 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) අවස්ථා කිහිපයකදී පොලී ආදායම ගණනය කිරීම සඳහා පොලී ආදායම මත ගෙවිය යුතු රඳවා ගැනීම් බදු සාවද්‍යව ඇතුළත් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, වර්ෂය සඳහා පොලී ආදායම හා ගෙවිය යුතු රඳවා ගැනීම් බදු රු. 185,508 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියාමන ධාරිතා ගොඩනැගීමේ ව්‍යාපෘතියට (ICT-RCBP) අදාළ වියදම රු. 3,223,683 ක් සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ වියදමක් ලෙස සලකා තිබුණු හෙයින් එම මුදලින් වියදම වැඩියෙන් දක්වා තිබුණි.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.:-

(අ) ලැබිය යුතු ගිණුම්
2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ රු. 1,948,138,756 ක් විය. මෙයින් වර්ෂ 1 කට වැඩි කාලයක් හිඟ පිට පැවති ශේෂය රු. 318,674,227 ක් වූ අතර, මේ සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාමාර්ග ඉතා දුර්වල මට්ටමක පැවතුණි. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.:

| වර්ෂ 1 කට අඩු | වර්ෂ 1 ට වැඩි 02 ට අඩු | වර්ෂ 02 වැඩි | එකතුව |
|---|---|---|---|
| රු.1,629,464,534 | රු.47,084,657 | රු.271,589,570 | රු.1,948,138,756 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන්ද කරනු ලැබේ.:-

(i) ලැබිය යුතු ගිණුම් ශේෂවලින් රු. 1,759,562,017 ක් එනම් 90% ක් ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු මත ලැබිය යුතු මුදල් ශේෂ නියෝජනය විය. මෙයින් රු. 105,727,791 ක් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් (SLBC) ලැබිය යුතු ශේෂ විය. කෙසේ වුවද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ගිණුම්වලට අනුව 2011 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවට ගෙවිය යුතු ශේෂ ලෙසට කිසිවක් නොදැක්වේ. තවද, මෙම දිගුකාලීන හිඟ හිටි ශේෂයන් අයකර ගැනීමට හෝ නිරවුල් කර ගැනීමට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සමඟ කිසිදු විධිමත් සාකච්ඡාවක් සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ii) වර්ෂ 2 කට වැඩි කාලයක් හිඟ හිට පැවති ලෙස රු. 271,577,267 ක් දක්වා තිබුණ ද තථ්‍ය හිඟ හිටි කාල පරිච්ඡේදය වර්ෂ 20 කට වැඩි විය. එබැවින් මෙම ශේෂය අයකර ගැනීම සැක සහිතය. තවද, මෙම දිගුකාලීන හිඟ හිට පැවති ශේෂයන් අයකර ගැනීමට කිසිදු ඵලදායි පියවරක් ගෙන නොතිබුණි.

(iii) විගණනයට ඉදිරිපත් කරන ලද ලේඛනයට අනුව, ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තුවලට අදාළ ණයගැතියන් සංඛ්‍යාව 917 ක් විය. කොමිෂන් සභාව විසින් ණයගැතියන් 200 දෙනෙකුට සනාථ කිරීමේ ලිපි යවා තිබුණද ණයගැතියන් 23 ක් පමණක් එයට ප්‍රතිචාර දක්වා තිබුණි. මේ අතර කොමිෂන් සභාවේ ගිණුම් පොත්වලට අනුව ණය ගැතියන් දෙදෙනෙකුගෙන් ලැබිය යුතු ශේෂ එකතුව රු. 168,812,935 ක් වුවද සනාථ කිරීම් ලිපිවල මෙම ණයගැතියන් රු. 125,198,775 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. 43,614,160 ක වෙනසක් විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) අයකරගත යුතු සේවක ණය

2011 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු සේවක ණය ශේෂ එකතුව රු. 83,725,710 ක්වූ අතර, විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව වර්ෂ 01 කට වැඩි කාලයක් ඉක්ම වූ හිඟ හිට පැවති ශේෂ රු. 2,420,222 ක් විය. විස්තර පහත දැක්වේ.

| ණය සහ අත්තිකාරම් වර්ගය | 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | වර්ෂ 1 කට වැඩි කාලයක් ඉක්මවා, හිඟ හිට පැවති මුදල් |
|---|---|---|
| ආපදා ණය | රු. 21.198,207 | රු. 983,823 |
| උත්සව අත්තිකාරම් | රු. 137,258 | - |
| මෝටර් වාහන ණය | රු. 55,428,682 | රු. 1,294,405 |
| නිවාස ණය | රු. 5,700,209 | - |
| යතුරු පැදි ණය | රු. 1,261,354 | රු. 141,994 |
| | රු. 21.198,207 | රු. 983,823 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයද කරනු ලැබේ.:

2010 වර්ෂය තුළදී සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 474,275 ක් වූ ආපදා හා යතුරු පැදි ණය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.:-

(i) 2011 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ එකතුව රු. 3,255,142,565 ක් වූ අතර, වර්ෂ 1 කට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව හිඟ හිට පැවති ශේෂ රු. 312,059,587 ක් විය.

(ii) 2003 සිට 2008 කාල පරිච්ඡේදය තුළ ආයතන 05 කින් ලැබුණු අත්තිකාරම් රු. 307,635,000 ක් අඛණ්ඩව ජංගම වගකීම් ලෙස ගෙන තිබුණ ද කොමිෂන් සභාවේ ආදායම ලෙස ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 විගණනයට සඳහා සාක්ෂි නොවීම

සනාථ කිරීම්, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම්, ලේඛණය, පරිගණක හා උපාංග වලට අදාළ ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ මෙහෙයවන්නන් විසින් ගෙවන ලද හා ගෙවිය යුතු බදු හා ගාස්තු මත ස්වාධීන ඇගයීම් වාර්තා නොමැති වීම හේතුවෙන් එකතුව රු. 30,043,711,925 ක් වූ ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්, ස්ථාවර වත්කම්, ක්ෂය, විදුලි සංදේශ බදු හා ගාස්තු සහ සෙස් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

### 2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම අවස්ථා පහත පරිදි වේ.:

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරණ මුදල් පනත<br>(i) 13(8) වගන්තිය. | රාජ්‍ය සංස්ථාවක පාලක මණ්ඩලය විසින් 13(7) (ඒ) වගන්තිය යටතේ වාර්තාව සැළකිල්ලට ගත යුතු අතර, එම වාර්තාව සංස්ථාවට ඉදිරිපත්කර මාස තුනක් ඇතුළත එම වාර්තාවෙන් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විසින් ගන්නා ලද පියවර හෝ ගැනීමට අදහස් කරන ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම් දිය යුතුය. එසේ වුවද 2010 වර්ෂයේ වාර්තාව සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ii) 2000 ජුනි 27 දිනැති අංක පීඑෆ්/පීඊ/09 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11 වගන්තිය හා 2011 ජනවාරි 27 දිනැති අංක පීඊඩී/56 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා අදාළ අනුමැතිය ලබාගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළ දී කොමිෂන් සභාව විසින් රු. 3,120,000,000 ක මුදලක් බැංකුවක ස්ථාවර තැන්පතු ගිණුමක හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. |
| (ආ) 2002 මැයි 24 දිනැති අංක පීඑෆ්/පීඊ/21 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන ඇතුළත් කෙටුම්පත් වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද/ එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය. | පරිගණක හා උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඈ) මුදල් රෙගුලාසි (මු.රෙ.)<br>(i) මු.රෙ. 371 (ඇ) | තත්කාර්ය අග්‍රිම දීමට පෙර අපේක්ෂිත වියදම තීරණය කිරීමට කොමිෂන් සභාවට නොහැකි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස දෙන ලද රු. 1,021,250 ක් වූ අත්තිකාරම් වලින් රු. 496,664 ක මුදලක් එනම් 49% ක් අදහස් කළ කාරණයන්ට යොදා ගැනීමෙන් තොරව දින 3 සිට 71 ක කාලයක් ප්‍රමාද වීමෙන් පසුව මුදලින් පියවා තිබුණි. |
| (ii) මු.රෙ. 371 (2)(ආ) | නිශ්චිත සීමාව වන රු. 20,000 ඉක්මවා දෙන ලද තත්කාර්ය අතුරු අග්‍රිම 83 ක එකතුව රු. 4,519,175 ක් විය. |
| (iii) මු.රෙ. 757 (2) | කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී සමීක්ෂණ මණ්ඩලයක් පත්කර එහි වාර්තාව විගණකාධිපතිවරයාට ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ මෙහෙයුම්වලින් ප්‍රතිඵලය රු. 29,350,461,445 ක අතිරික්තයක් වූ අතර, එයට අනුරූපව ඉකුත් වර්ෂයේ රු. 5,378,271,498 ක අතිරික්තයක් වූ බැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 23,972,189,947 ක වර්ධනයක් දැක්වුණි.

වර්ෂයේ විදුලි සංදේශ බදු හා ගාස්තු ආදායම රු. මිලියන 23,836 කින් විශාල ලෙස වැඩිවීම හා බොල් හා අඩමාන ණය ප්‍රතිපාදනය රු. මිලියන 138 කින් අඩුවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) කොමිෂන් සභාවේ ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පෙර වර්ෂය සමග සසඳා පහත දැක්වේ:

| විස්තර | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | |
|---|---|---|---|---|
| | 2011 දෙසැම්බර් 31 | 2010 දෙසැම්බර් 31 | විචලනය හිතකර/ (අහිතකර) | විචලනයේ ප්‍රතිශතය |
| | රු. 000 | රු. 000 | රු. 000 | % |
| ආදායම | | | | |
| විදුලි සංදේශ බදු | 28,185,372 | 5,704,938 | 22,480,434 | 394 |
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | 1,774,458 | 418,436 | 1,356,022 | 324 |
| වෙනත් ආදායම | 91,803 | 7,187 | 84,616 | 1,177 |
| මුළු ආදායම | 30,051,633 | 6,130,561 | 23,921,072 | 390 |
| වියදම | | | | |
| නියාමන වියදම් | 107,504 | 63,894 | (43,610) | (68) |
| මෙහෙයුම් වියදම් | 593,668 | 688,396 | 94,728 | 14 |
| මුළු වියදම | 701,172 | 752,290 | 51,118 | 7 |
| මූල්‍ය ප්‍රතිඵලයට ශුද්ධ බැලපෑම | 29,350,461 | 5,378,271 | 23,972,190 | 446 |

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ කාරක ප්‍රාග්ධනයට පෙර වර්ෂය සමඟ සැසඳීමේදී 165% කින් වැඩි වී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුල එක දිගට අනවශ්‍ය ද්‍රවශීල වත්කම් කොමිෂන් සභාව තබාගෙන තිබූ බව එයින් පෙනී යයි. තවද, 2011 දෙසැම්බර් 31 දින ද්‍රවශීල අනුපාතය 1.4:1 වූ බවත්, එය 2010 දෙසැම්බර් 31 දිනට 1.2:1 වූ බවත් නිරීක්ෂණය විය.

3.3 කාර්ය සාධන සමාලෝචනය
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.:-

(අ) උතුරු පළාතේ විදුලි සංදේශ, ගුවන් විදුලි විකාශන හා රූපවාහිනී විකාශන කටයුතු සිදු කිරීම සඳහා පහසුකම් සැපයීමේ අරමුණින් කොමිෂන් සභාව රු. මිලියන 292.3 ක් වැය කරමින් කොකාවිල් හා වවුනියා හි කුළුණු දෙකක් ඉදිකරන ලදී. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ මෙම ප්‍රාග්ධන වියදම මත කොමිෂන් සභාව කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

(ආ) 1996 අංක 27 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතට යොමුවන පරිදි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ අරමුණින්, සොරකම් කරන ලද හෝ අස්ථානගත වූ ජංගම දුරකථන සම්බන්ධයෙන් මහජන පැමිණිලි භාරගැනීමට හා ඒ පිළිබඳ විමර්ශනයක් සිදු කිරීමට 2010 අප්‍රේල් සිට බලපැවැත්වෙන පරිදි වැඩ සටහනක් දියත් කරන ලදී. කෙසේ වුවද ඉහත පැමිණිලි වලට ප්‍රතිචාර දැක්වීමට විධිමත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාවට නොහැකි වී තිබුණි. පසුගිය වර්ෂ දෙක සඳහා මහජන පැමිණිලිවලට ප්‍රතිචාර දැක්වීම පිළිබඳ ප්‍රගතිය පහත දැක්වේ.:

| වර්ෂය | වර්ෂය ලැබී තිබුණු පැමිණිලි සංඛ්‍යාව | දක්වන ලද ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිචාර පිළිබඳ ප්‍රතිශතය |
|---|---|---|---|
| 2010 | 5,600 | 1,200 | 21.4 % |
| 2011 | 5,400 | 1,900 | 35.2 % |

මේ සම්බන්ධයෙන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා මා වෙත මෙසේ දන්වා තිබුණි. "එවැනි සිදුවීම් ඉහළ යමින් පැවතීම යටතේ කොමිෂන් සභාව මෙම පහසුකම් අඛණ්ඩව කරගෙන යාමේ තත්ත්වයක් නොමැත."

(ඇ) 1996 අංක 27 දරණ පනතින් සංශෝධිත 1991 අංක 25 දරණ විදුලි සංදේශ පනතේ 21 වගන්තිය යටතේ ඕනෑම විදුලි සංදේශ උපකරණයක් නිෂ්පාදනය, විකිණීම, ආනයනය කිරීම, විකිණීමට ඉදිරිපත් කිරීම, ගණුදෙනු කිරීම, පැවරීම, කුලියට ගැනීම, බදු දීම, ප්‍රදර්ශනය කිරීම, නඩත්තු කිරීම හෝ අලුත්වැඩියා කිරීම කරන පුද්ගලයෙකු කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් ලබා ගත යුතුය. එසේ වුවද, එසේ බලපත්‍ර ලබාගැනීමෙන් තොරව රට තුළ විවිධ ස්ථානයන්හි එවැනි ව්‍යාපාර පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාර පවත්වා ගෙන යන ආයතන විමර්ශනය කර සොයා ගැනීමට හා අදාළ ගාස්තු අයකර ගැනීමට කොමිෂන් සභාවට විධිමත් යාන්ත්‍රණයක් හෝ දත්ත පදනමක් නොවූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඈ) ඇතුල්වීමේ ආලින්දය හා ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ වැඩ නිම කිරීමෙන් තොරව අලුත්වැඩියා කිරීම් ලෙස රු. 180,000 ක මුදලක් පසුගිය වර්ෂ 6 ක කාලයක් කෙරීගෙන යන වැඩ ගිණුම් යටතේ අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් තිබුණි.

3.4 මෙහෙයුම් සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.:-

(අ) 2010 දෙසැම්බර් 27 දිනැති අංක 1686/4 දරණ අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව, සෑම විදුලි සංදේශ මෙහෙයුම් කරුවකු විසින්ම 2011 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි නව "සෙස්' බදු ගෙවිය යුතුය. කොමිෂන් සභාවට සෙස් බදු ගෙවීමට කාල සීමාවක් පනවා නොතිබූ බැවින් මෙහෙයුම්කරුවන් විසින් ඔවුන්ගේ සෙස් බදු කලින් කලට ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කොමිෂන් සභාවට ලැබිය යුතු සෙස් බදු සැළකිය යුතු ප්‍රමාදයකින් පසු ලැබී තිබුණි. පවතින නීති අනුව ප්‍රමාද ගෙවීම් මත අධිභාර පැනවීමට නීතිමය බලතල නොවූ බව කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා මා වෙත දන්වා තිබුණි.

(ආ) 1996 අංක 27 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතේ 22 (උ) වගන්තිය ප්‍රකාරව, සෑම විදුලි සංදේශ මෙහෙයුම්කරුවෙකුම ඔහුගේ බලපත්‍රය සඳහා සෙස් බදු ගෙවිය යුතු අතර, ඔහුට නිශ්චිත වර්ෂයට අදාළව මෙහෙයුම් බලපත්‍ර ගාස්තු ඊළඟ වර්ෂයේ ජනවාරි 31 ට පෙර ගෙවිය යුතුය. කෙසේ වුවද එවැනි ඒකක 13 ක් විසින් ගෙවිය යුතු රු. 206,384,147 ක් වූ සෙස් බදු සහ ඒකක 08 ක් විසින් ගෙවිය යුතු රු. 393,808,974 ක් වූ මෙහෙයුම් ගාස්තු පිළිවෙලින් දින 21 සිට 275 දක්වා හා දින 23 සිට 275 දක්වා කාල පරිච්ඡේදයක ප්‍රමාදයකින් පසු ගෙවා තිබුණි. ප්‍රමාදයන් සඳහා අතිරේක ගාස්තුවක් පැනවීමට හැකි බව බලපත්‍රයෙහි සඳහන් කර තිබුණද, එය තීරණය කිරීමට හා අතිරේක ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද ප්‍රමාදයන් වෙනුවෙන් හෝ මෙහෙයුම් බලපත්‍ර ගාස්තු හා සෙස් නොගෙවීම වෙනුවෙන් අතිරේක ගාස්තුවක් අයකර ගැනීමට පවත්නා පනතේ විධි විධාන නොමැති බවත්, නීතිමය බලතල තහවුරු කර ගැනීමට ඉදිරියේදී විදුලි සංදේශ පනතට ක්‍රමවේදයක් ඇතුළත් කිරීමට කටයුතු කරන බවත්, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2011 ජුනි 28 දින විගණකාධිපති වෙත වාර්තා කර තිබුණි. කෙසේ වුවද 2012 ජුනි 30 දක්වා කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) 2010 නොවැම්බර් 19 දිනැති අංක 1680/29 දරණ අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව සෑම විදුලි සංදේශ මෙහෙයුම්කරුවකුට ජාත්‍යන්තර ඇමතුම් ගාස්තු බදු ප්‍රකාශිත දිනට හෝ ඊට පෙර ගෙවිය යුතුය. එහෙත් මෙහෙයුම්කරුවන් 4 දෙනෙකු විසින් ගෙවිය යුතු එකතුව රු. 29,089,578 ක් වූ ජාත්‍යන්තර ඇමතුම් ගාස්තු බදු දින 18 සිට දින 135 ක ප්‍රමාදයකින් පසුව ගෙවා තිබුණි.

3.5 මානව සම්පත් කළමනාකරණය

2011 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 265 ක් වූ අතර, තථ්‍ය සේවක සංඛ්‍යාව 203 ක් පමණක් විය. කෙසේ වුවද අනුමත සේවක සංඛ්‍යාව බඳවා ගැනීමෙන් තොරව කොන්ත්‍රාත් පදනම හා අනියම් පදනම මත සේවකයන් 20 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස ඔවුන්ට රු. 11,777,540 ක මුදලක් ගෙවා තිබුණි. විස්තර පහත දැක්වේ.:

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| විධායක මට්ටම | 23 | 08 | 15 | - |
| මාණ්ඩලික මට්ටම | 34 | 20 | 14 | - |
| සහාය සේවක | 166 | 117 | 49 | - |
| කණිෂ්ඨ සේවක | 42 | 38 | 4 | - |
| වෙනත් (කොන්ත්‍රාත් හා අනියම්) | - | 20 | - | 20 |
| | 265 | 203 | 82 | 20 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.:

විධායක මට්ටමේ පවතින පුරප්පාඩු වලට අදාළ නිලධාරීන් තිදෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළදී රු. 208,725 ක මුදලක් වැඩබැලීමේ දීමනා ලෙස ගෙවා තිබුණි.

3.6 වාහන උපයෝජනය

2011 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවට වාහන 36 ක් අයත්ව තිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළදී ඉන්ධන හා වාහන නඩත්තුව සඳහා රු. 13,464,238 ක මුදලක් වැය කර තිබුණි. පෙර වර්ෂය තුළදී දරණ ලද වියදම රු. 12,371,085 ක් පමණක් වූ අතර, පෙර වර්ෂය සමඟ සැසඳීමේදී එම 9% ක වැඩිවීමක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.:-

(අ) කොමිෂන් සභාව විසින් රු. 2,950,000 ක් වටිනාකම වූ වාහන 06 ක් 2010 වර්ෂයේ සිට උපයෝජනය කර නොතිබූ අතර, 2012 අප්‍රේල් 02 දින ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීමක් මගින් වාහන අපහරණය සඳහා කොමිෂන් සභාව විසින් කටයුතු කර තිබුණි.

(ආ) 2004 හා 2010 වර්ෂ තුළදී වටිනාකම රු. 1,850,000 ක් වූ වාහන දෙකක් අනතුරුවලට භාජනය වී තිබුණද, මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 සහ 105 ප්‍රකාර ක්‍රියාමාර්ග ගෙන තිබුණි. තවද කොමිෂන් සභාවේ එක් වාහනයක් පසුගිය වර්ෂ කිහිපයක් උපයෝජනය කර නොතිබුණි. මෙම වාහන අලුත්වැඩියා කිරීමකින් තොරව විනාශ විය හැකි තත්ත්වයකට තබා තිබුණි.

3.7 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

කදිරාන, මීගමුව ප්‍රදේශවල මුළු ඉඩම්වලින් වටිනාකම රු. 45,000,000 ක් වූ ආසන්න වශයෙන් 50% ක් පමණ වූ බිම් වෙනත් පාර්ශ්වයන් විසින් අනවසරයෙන් අල්ලාගෙන සිටි අතර, මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. එබැවින් ගිණුම්වල දැක්වෙන රු. 136,475,809 ක් වූ ඉඩම් පිරිවැයෙහි නිරවද්‍යතාවය එක් එක් ඉඩමෙහි නිවැරදි තත්ත්වය හෙළිදරව් කිරීමක් ලෙස සැළකීමට නොහැකි විය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 සංයුක්ත සැළැස්ම

2007 දෙසැම්බර් 18 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක පීඊඩී/47 දරණ චක්‍රලේඛය ප්‍රකාරව පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන කරන ලද පිටපත් එක් එක් මුදල් වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශයට (ජනාධිපති ලේකම් කාර්යාලයට) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට, මහා භාණ්ඩාගාරයට හා විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවද, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව එසේ කටයුතු කර නොතිබුණි. කොමිෂන් සභාවේ පවත්නා යාවත්කාලීන නොකරන ලද සංයුක්ත සැළැස්මට අනුව මානව සම්පත් පරිපාලනය මූල්‍ය හා සැපයුම් අංශයන් සහ ලබාගත හැකි වර්තමාන සම්පත් වැනි වැදගත් අංගයන් ඇතුළත් කිරිම මගින් කළමනාකරණ වගකීම් හඳුනා ගැනීම සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙළ කිරීමට අවධානය යොමු කර නොතිබුණි. එසේම ක්‍රියාකාරී සැළැස්මක් සහ ඉකුත් වර්ෂ 03 ක මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් සංයුක්ත සැළැස්මට ඇතුළත් කර නොතිබුණි. තවද, කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර හා අරමුණු ඉටුකර ගැනීම සඳහා උපාය මාර්ග ඉහත සංයුක්ත සැළැස්මේ අන්තර්ගත කර නොතිබුණි.

සංයුක්ත සැළැස්මක් පිළියළ කිරීම සඳහා විදේශ සංවිධානයකට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණු අතර, එ.ජ.ඩො. මිලියන 262,980 ක් එනම් රු. මිලියන 22.2 ක් පිළිවෙලින් 2000 දෙසැම්බර් 06 දින, 2000 දෙසැම්බර් 26 දින හා 2001 අප්‍රේල් 19 දින වාරික තුනකින් ගෙවා තිබුණි. කෙසේ වුවද, 2007 ජුනි 19 දින හා 2011 නොවැම්බර් 08 දින පැවැති රාජ්‍ය ව්‍යවසාය කමිටු රැස්වීම්වලදී කොන්ත්‍රාත්කරු විසින් කොමිෂන් සභාවට දී තිබුණු ලියකියවිලි උසස් තත්ත්වයකින් නොවූ බවත්, එසේ හුදෙක්ම වෙනත් සංවිධානයක් සඳහා පිළියළ කර සුළු වෙනස්කම් සිදු කිරීමෙන් පසු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා පිළියළ කරන ලද වාර්තාවක් පමණක් වූ බවත්, එම කමිටුව නිරීක්ෂණය කරන ලදී. එසේ වුවද, මේ සම්බන්ධයෙන් 2012 ජුනි 30 දක්වා කොමිෂන් සභාව විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

2011 නොවැම්බර් 15 වන දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මේ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලද අතර, මේ සම්න්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ඒ අනුව වාර්තාවක් ලබා දෙන ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත නියෝග කරන ලදී.

### 4.2 ක්‍රියාකාරී සැලැස්ම

ඉටුකර ගත යුතු ඉලක්ක සමඟ ප්‍රධාන කාර්ය මණ්ඩලයේ වගකීම් පැහැදිලිව හඳුනාගත හැකි වන පරිදි සහ කාල පරිච්ඡේදය තුළ සිදුකළ යුතු කාර්යයන් සම්බන්ධයෙන් අයවැයගත ප්‍රතිපාදන දැක්වෙන ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා කොමිෂන් සභාව විසින් පිළියෙළ කර නොතිබුණි. එබැවින් සකස් කරන ලද ඉලක්ක ඉටුකර ගැනීමේ අරමුණින් නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ගැනීමට හා අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට සමස්ථයක් වශයෙන් කොමිෂන් සභාවේ ප්‍රගතිය ඇගයීමට නොහැකි විය.

### 4.3 අභ්‍යන්තර විගණනය

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ නිලධාරීන් තිදෙනෙකුගෙන් අභ්‍යන්තර විගණන ඒකකය සමන්විත විය. සමාලෝචිත වර්ෂය සඳහා අතුරු අභ්‍යන්තර විගණන වාර්තා හා අභ්‍යන්තර විගණන සැළැස්ම විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබුණි.

4.4 ප්‍රසම්පාදන සැලැස්ම
සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4.5 අයවැය ලේඛනමය පාලනය
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.:-

(අ) සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල වූ විෂයයන් 24 ක් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කරන ලද අයවැයගත මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා මුදල් අයවැය, පෙර වර්ෂය අවසානයට පැවති තථ්‍ය මුදල් ශේෂය ගෙන සකස් කරනු වෙනුවට පෙර වර්ෂය අවසානයට අයවැයගත මුදල් ශේෂය පදනම් කර ගෙන සකස් කර තිබුණි. එබැවින් වර්ෂය මුළුල්ලේ තථ්‍ය හා අයවැයගත මුදල් ශේෂයන්හි අවම වශයෙන් රු. 1,000,000,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන
විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමිෂන් සභාවේ සභාපතිගේ අවධානය යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අතිරික්ත මුදල් ආයෝජනය
(ආ) ණයගැතියන්
(ආ) විදුලි සංදේශ බදු හා ගාස්තු රැස් කිරීම
(ඇ) වාහන උපයෝජනය
(ඉ) අස්ථානගත වූ හෝ සොරකම් කළ ජංගම දුරකථන පිළිබඳ විමර්ශන

**එච්. ඒ. එස්. සමරවීර**
විගණකාධිපති

www.trc.gov.lk | dgtsl@trc.gov.lk

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

276 ඇල්විටිගල මාවත කොළඹ 8 ශ්‍රී ලංකාව දු: +9411 2689345/ 2689351/ 2689352 ෆැ: +9411 2689341

| | | | |
|---|---|---|---|
| | | 526,214,744 | 526,214,744 |
| අන්තර් ජාතික විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගේ අයබදු අරමුදල | 7ඇ | 6,006,025,299 | 21,254,347,225 |
| අඩු කළා: ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම් | | 0 | (13,815,293,949) |
| | | 6,006,025,299 | 7,439,053,277 |
| එකතු කළා: | | | |
| සමුච්චිත අතිරික්තය | | 3,385,150,394 | 1,042,798,508 |
| නැවත ඇගයූ අතිරික්තය | | 53,580,000 | 53,580,000 |
| | | 9,970,970,437 | 9,061,646,529 |

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සමස්ථ මූල්‍ය ප්‍රකාශනයේ කොටසකි. කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනය මගින් 2011 දෙසැම්බර් මස 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ සිදු කරන ලද කාර්යයන් පිළිබඳව සත්‍ය සහ සාධාරණ සමාලෝචනයක් කර ඇති බවත් කාලපරිච්ඡේදය සඳහා කොමිෂන් සභා අතිරික්ත එතැන් සිට අවසන් බවත් සහතික කරමි.

**ඒ. එස්. හපුආරච්චි**
සහකාර අධ්‍යක්ෂ (ආදායම්)
වැ.බ.අධ්‍යක්ෂ (මුදල්)

මෙම මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම කොමිෂන් සභාව සතුවේ. කොමිෂන් සභාව වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.

**ලලිත් වීරතුංග**
සභාපති

**යූ. එච්. සී. ප්‍රියන්ත**
වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(පරිපාලන, ආයතනික කටයුතු සහ මුදල්)

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
## 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය (ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතයි)

| | සටහන් | | 2010.12.31 ප්‍රති ප්‍රකාශිත |
|---|---|---|---|
| **ආදායම්** | 8 | 10,346,606,662 | 5,713,767,654 |
| අඩුකළා: ජාතිය ගොඩනැගීමේ බදු | | (208,215,714) | (200,055,587) |
| | | 10,138,390,948 | 5,513,712,067 |
| එකතු කළා: විදුලි සංදේශ බදු | | 16,667,767,978 | 0 |
| එකතු කළා: විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | 8ආ | 1,774,458,353 | 418,436,403 |
| එකතු කළා: ජාත්‍යන්තර පිටතට යැවෙන ඇමතුම් බදු | | 1,258,570,192 | 0 |
| **මුළු මෙහෙයුම් ආදායම** | | 29,839,187,471 | 5,932,148,470 |
| අඩු කළා: නියාමන වියදම් | 9 | (107,504,532) | (63,894,040) |
| | | **29,731,682,939** | **5,868,254,430** |
| **අඩුකළා: වෙනත් වියදම්** | | | |
| ආයතන සහ පරිපාලන වියදම් | 10 | 333,067,055 | 287,338,563 |
| අලුත්වැඩියා සහ නඩත්තු වියදම් | 11 | 29,617,301 | 34,027,414 |
| මූල්‍ය සහ අනෙකුත් වියදම් | 12 | 2,863,980 | 8,420,405 |
| බොල් ණය ගැතියන් සඳහා වෙන් කිරීම | | 19,904,080 | 158,553,234 |
| විදේශ විනිමය ගණුදෙනු මත ලාභය/අලාභය | | (1,430,869) | 1,643,316 |
| | | 384,021,548 | 489,982,932 |
| | | **29,347,661,391** | **5,378,271,498** |
| හානි වූ ඇන්වෙනා FMMS ව්‍යාපෘතිය පාඩුව/ලාභ | | 2,800,053 | 0 |
| ආදායම් බදු ගෙවීමෙන් පසු වියදමට වැඩි ආදායම | | **29,350,461,444** | **5,378,271,498** |
| අඩුකළා: ආදායම් බදු | | (31,771,388) | (1,766,905,489) |
| ආදායම් බදු ගෙවීමෙන් පසු වියදමට වැඩි ආදායම | | **29,318,690,056** | **3,611,366,008** |
| අඩුකළා: ඒකාබද්ධ අරමුදලට දායකවීම | 13 | (26,976,338,170) | (3,800,000,000) |
| වර්ෂය සඳහා වියදමට වැඩි මුළු ආදායම | | **2,342,351,886** | **(188,633,992)** |
| එකතු කළා: | | | |
| ඉදිරියට ගෙන ආ අතිරික්තය/(හිඟය) | | 1,042,798,508 | 1,231,432,500 |
| සමුච්චිත අතිරික්තය/හිඟය | | **3,385,150,394** | **1,042,798,508** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ මුදල්** | | | |
| බදු අයකිරීමට පෙර ශුද්ධ ලාභය | | | 29,350,461,445 |
| **ගැලපීම්** | | | |
| දේපළ, පිරියත, උපකරණ මත ක්ෂය වෙන් කිරීම | | 62,114,591 | |
| බොල් ණය හා අඩමාන ණය සඳහා වෙන් කිරීම් | | 19,904,080 | |

| | | |
|---|---|---|
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 2,663,638 | |
| විදුලි සංදේශ බදු සඳහා වෙන් කිරීම් | | |
| ජාත්‍යන්තර පිටතට යැවෙන ඇමතුම් සඳහා බදු වෙන් කිරීම් | | |
| හානි වූ ඇන්ටෙනා FMMS ව්‍යාපෘතියේ ලාභය | (2,800,053) | |
| විදේශ විනිමය ගණුදෙනු මත ලාභය | (1,430,869) | 80,451,387 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය | | 29,430,912,832 |
| | | |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම** | | |
| ප්‍රති ගැණුම් ගිවිසුම යටතේ රජයේ සුරැකුම්පත් වැඩිවීම | (3,034,654,795) | |
| ලැබිය යුතු ගිණුම්වල වැඩිවීම් | 1,006,932,825 | |
| ආපදා ණය වැඩිවීම | 1,967,119 | |
| පෙර ගෙවීම් වැඩිවීම | (198,520) | |
| විශේෂ අත්තිකාරම් අඩුවීම | 13,575 | |
| උත්සව අත්තිකාරම් වැඩිවීම | (13,500) | |
| මෝටර් රථ ණය අඩුවීම | 1,576,784 | |
| නිවාස ණය | 912,400 | |
| යතුරුපැදි ණය අඩුවීම | 839,975 | |
| එකතු කළ අගය මත බදු පාලන ගිණුම වැඩිවීම | (4,408,810) | |
| ගැණුම් අත්තිකාරම් අඩුවීම | 83,296 | |
| ගුවන් ටිකට්පත් වලින් ලැබිය යුතු වැඩිවීම | (367,930) | |
| ගුවන් ටිකට්පත් වලින් ලැබිය යුතු වැඩිවීම - ලෝක බැංකුව | (44,291) | |
| අය කර ගතයුතු වැටුප් අඩුකිරීම් වැඩිවීම | (12,605) | |
| ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොළිය වැඩිවීම | (46,082,224) | |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (රඳවා ගැනීමේ බදු) වැඩිවීම | (8,117) | |
| හිමිවිය යුතු ආර්ථික සේවා ගාස්තුවල වැඩිවීම | (11,153,596) | |
| ලැබිය යුතු විදුලි සංදේශ සංවර්ධන දායක අරමුදල වැඩිවීම | (496,320,394) | |
| ලැබිය යුතු සෘජු දුරකථන ඇමතුම් වැඩිවීම | (178,142,201) | |
| ලැබිය යුතු විදුලි සංදේශ බදු වැඩිවීම | (1,418,062,606) | |
| ගෙවිය යුතු ගිණුම්වල වැඩිවීම | 16,670,997 | |
| විශේෂ අත්තිකාරම් වැඩිපුර අය කර ගැනීම් වැඩිවීම | 4,175 | |
| විලම්භිත ආදායම (ප්‍රදාන) වැඩිවීම | 166,624 | |
| එකතු කළ අගය මත බදු පාලන ගිණුම අඩුවීම | (87,450,766) | |
| අත්තිකාරම් වශයෙන් ලැබුණු ආදායම වැඩිවීම | 182,770,197 | |
| ටෙන්ඩර් සඳහා ආපසු නොගෙවන තැන්පතු වැඩිවීම | 19,520 | |
| ආපසු නොගෙවන තැන්පතු වැඩිවීම කාර්ය මණ්ඩලය | 2,086,843 | |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු 50% විදුලි සංදේශ සංවර්ධන ගාස්තු වැඩිවීම | 129,701,645 | |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු සෘජු දුරකථන ඇතුම් ගාස්තු වැඩිවීම | 178,142,201 | |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු විදුලි සංදේශ බදු වැඩිවීම | 1,420,141,820 | |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු ග්‍රාහක බදු වැඩිවීම | 75,335 | |

| | | |
|---|---|---|
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු පාරසරික ආරක්ෂණ බද්ද වැඩිවීම | 423,942 | |
| පොදු ස්විච්කරණ දුරකථන ජාල කුටි ඉදිකිරීම - කොකාවිල් වැඩිවීම | 4,135,901 | |
| හිමිකම් නොපෑ සේවක ප්‍රතිලාභ වැඩිවීම | 47,643 | (2,390,207,537) |
| | | 27,040,705,295 |
| ලැබිය යුතු රක්ෂණ හිමිකම් | 2,800,053 | |
| ගෙවිය යුතු පාරිතෝෂිකය | (702,667) | |
| ගෙවිය යුතු ආදායම් බදු | (235,021,450) | (232,924,064) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | 26,807,781,231 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ මුදල්** | | |
| ඉඩම් | (2,121,668) | |
| ගොඩනැගිලි | (4,875,683) | |
| පරිගණක | (14,502,046) | |
| වෙනත් කාර්යාල උපකරණ | (892,970) | |
| ජංගම දුරකථන | (79,990) | |
| කාර්යාල ගෘහභාණ්ඩ | (55,944) | |
| FMMS ව්‍යාපෘති උපකරණ | (3,117,726) | |
| කොකාවිල් කුළුන | (40,047,981) | |
| වවුනියා කුළුන | (3,598,126) | |
| ඉදිකිරීමේ වැඩ | (3,057,415) | |
| ඒකාබද්ධ අරමුදල සඳහා වන ප්‍රේෂණ | (26,976,338,170) | |
| ස්ථාවර තැන්පතු | (122,236,660) | |
| රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදල – 1 | 2,526,146,864 | |
| රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදල – 2 | (2,066,859,752) | |
| ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු අරමුදල | (1,433,027,978) | |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් | | (28,144,665,224) |
| මුදල් හා මුදල්වලට සමාන දෑ වල ශුද්ධ අඩුවීම | | (1,336,884,012) |

| මුදල් හා මුදල්වලට සමාන දෑ පිළිබඳ විශ්ලේෂණය | 2011.12.31 | 2011.01.01 | කාලපරිච්ඡේදය තුළ වෙනස්වීම |
|---|---|---|---|
| බැංකු මුදල් | | | |
| මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව | | | |
| ජංගම ගිණුම් අංකය (119-1-001-4-3693169 : එකතුවීම) | 45,134,200 | 694,399,600 | (649,265,400) |
| ලංකා බැංකුව - නාරාහේන්පිට ශාඛව | | | |
| ජංගම ගිණුම් අංකය 2323167 | 10,432,641 | 136,349,004 | (125,916,363) |
| මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව | | | |
| ජංගම ගිණුම් අංකය (119-1-001-4-3693264) | | | |
| (ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද) | 22,913,151 | 588,824,192 | (565,911,041) |

| | | | |
|---|---|---|---|
| මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව | | | |
| 119/ආර්.එෆ්.සී/එස්.ඒ./යූ.එස්.ඩී./0032 | 57,579,486 | 54,881,245 | 2,698,241 |
| | 136,059,478 | 1,474,454,041 | (1,338,394,563) |
| **අතැති මුදල්** | 96,207 | 16,525 | 79,682 |
| මුදල් හා මුදල් සමානුපාත ඉහතින් දක්වා ඇති පරිදි | 136,155,685 | 1,474,470,566 | (1,338,314,881) |
| විනිමය අනුපාතිකය වෙනස්වීමේ බලපෑම පරිදි | 0 | 0 | (1,430,869) |
| මුදල් හා මුදල් සමානුපාත | 136,155,685 | 1,474,470,566 | (1,336,884,012) |

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

ගිණුම් සඳහා සටහන් - 2011.12.31

## 1. ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1.1 ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය මගින් හඳුන්වා දී ඇති ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කර ඇත. මෙම ගිණුම්වලට උද්ධමනකාරී සාධකයන් සඳහා ගැළපීම් කර නැත.

**1.1.2 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්**

ශේෂ පත්‍රයේ දිනට පසුව සිදුවූ සියලු ප්‍රමාණාත්මක සිද්ධීන් සැළකිල්ලට ගන්නා ලද අතර, අවශ්‍ය අවස්ථාවල ගිණුම් සඳහා ගැළපීම් සිදු කර ඇත.

**1.1.3 විදේශ විනිමය පරිවර්තනය කිරීම**

ගනුදෙණු සිදුවූ අවස්ථාවේ පැවති විදේශ විනිමය අනුපාතය සියලු විදේශ මුදලින් වූ ගණුදෙනු සඳහා යොදා ගෙන ඇත. ශේෂ පත්‍ර දිනට පවතින විනිමය අනුපාතිකය අනුව විදේශ මුදලින් ඇති වත්කම් සහ වගකීම් පරිවර්තනය කරයි. ප්‍රතිඵල ලෙස ඇතිවන ලාභය හෝ අලාභය ආදායම් වියදම් ගිණුමේ දක්වා ඇත.

**1.1.4 පෙර වර්ෂ ගැළපීම්**

පෙර වර්ෂය සඳහා ගැළපීම් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 10 (කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය හෝ අලාභය, මූලික වැරදි සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි වෙනස්වීම්) අනුව වරණීය ක්‍රමය යටතේ ගිණුම්වල ඉදිරිපත් කරයි.

### 1.2 වත්කම් අගය කිරීම

**1.2.1 ලැබිය යුතු ගිණුම්**

ලැබිය යුතු ගිණුම්වල වටිනාකම උපලබ්ධිවේ යැයි ඇස්තමේන්තු කර ඇති අගයන් අනුව ප්‍රකාශ කොට ඇත. බොල් ණය සහ අඩමාණ ණය සම්බන්ධව ගිණුම්වල වෙන් කිරීම් සිදු කර ඇත.

**1.2.2 දේපළ, පිරියත සහ උපකරණ**

1.2.2.1 දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයට, මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සහ ඒ මත සිදුවන අනෙකුත් වියදම් අයත් වේ. පහත දක්වා ඇති සටහන් අංක 1, 2, 3, හි දක්වා ඇති ආකාරයට වෙන් කරන ලද සමුච්චිත ක්ෂය පිරිවැයෙන් (හෝ අගය කළ වටිනාකමෙන්) අඩුකළ අගය දේපළ, පිරියත සහ උපකරණ ලෙස වාර්තා කොට ඇත.

1.2.2.2 කොමිෂන් සභාවේ සම්පූර්ණයෙන්ම ක්ෂය කළ වාහන නැවත තක්සේරු කර 2010 ගිණුම් පොත් වලට ගෙන ඇත. වාහන 28 ක් රුපියල් 53,580,000 ලෙස නැවත තක්සේරු කර ඇත.

1.2.2.3 ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය ගිවිසුම යටතේ අත්පත් කරගත් දේපළ, පිරියත සහ උපකරණවල අගය ප්‍රාග්ධනිත කර ඇත.

### 1.2.3 ක්ෂයවීම්

දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය/ප්‍රත්‍යාගණනය කළ අගය, පහත පරිදි ඒවායේ ඇස්තමේන්තු කළ ඵලදායි ජීවිත කාලය පුරා සමාන වාරිකවලින් ලියා හැරීම සඳහා ක්ෂය වෙන් කිරීම ගණනය කර ඇත.

**දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තු කළ ඵලදායි ජීවිත කාලය**

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 20 වැඩි |
| ලී බඩු හා සවිකිරීම් | වසර 10 වැඩි |
| විදුලි සංදේශ කුලුනු | වසර 10 වැඩි |
| කාර්යාල උපකරණ | වසර 10 වැඩි |
| පරිගණක/වෙබ් ස්ර්වර් | වසර 04 වැඩි |
| මෝටර් රථ | වසර 08 වැඩි |
| විදුලි උත්පාදන යන්ත්‍ර | වසර 10 වැඩි |
| කාර්යාල දුරකථන | වසර 10 වැඩි |
| කාර්යාල ලී බඩු | වසර 10 වැඩි |
| කාර්මික උපකරණ | වසර 10 වැඩි |
| වීඩියෝ ඒකක උපකරණ | වසර 10 වැඩි |
| එෆ්.එම්.එම්.එස්. උපකරණ | වසර 10 වැඩි |
| ජංගම නිරීක්ෂණ රථ | වසර 08 වැඩි |

මිලදී ගත් වර්ෂය සඳහා සම්පූර්ණ වෙන් කිරීමක් සිදුකරන අතර, ඉවත් කරන වර්ෂය සඳහා ක්ෂය වෙන් කිරීමක් සිදු නොකරයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ට අනුකූලව ප්‍රදානය කරන ලද වත්කම් සඳහා ක්ෂය ගණනය කර ඇත.

### 1.2.4 ආයෝජන

ආයෝජන, අත්පත් කර ගැනීමේ පිරිවැය මත ප්‍රකාශ කොට ඇත. ආයෝජනයන්හි අගය අඩුවීමක් ස්ථිර ලෙස සිදුවන්නේ යැයි අපේක්ෂා කරන්නේ නම් පමණක් අගය අඩුවීම සඳහා ප්‍රතිපාදනයන් සිදු කරයි.

## 1.3 වගකීම් සහ වෙන් කිරීම්

ශේෂපත්‍ර දිනට පවතින සියළුම ප්‍රමාණාත්මක වගකීම් ශේෂ පත්‍රයේ පෙන්වා ඇති අතර, ශේෂ පත්‍ර දිනට පවතින නමුත් වටිනාකම නිවැරදිවම අගය කළ නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් වෙන් කිරීමක් සිදු කොට ඇත.

### 1.3.1 ප්‍රාග්ධන බැඳියාවන් සහ අසම්භාව්‍ය බැරකම්

ශේෂපත්‍ර දිනට ඇති ප්‍රාග්ධන බැඳියාවන් සහ අසම්භාව්‍ය බැරකම් ගිණුම් සඳහා සටහන් ලෙස හෙළිදරව් කර ඇත.

### 1.3.2 ජාත්‍යන්තර සංවර්ධන සංගමය

ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය ගිවිසුම යටතේ ලැබී ඇති අරමුදල් ශ්‍රී ලංකා ප්‍රමිත අංක 24 (රජයේ ප්‍රදාන සහ රජයේ සහයෝගීතාව සඳහා ගිණුම් කිරීම) අනුව ප්‍රාග්ධන ප්‍රවේශය යටතේ ගිණුම් ගත කොට ඇත.

1.4 ආදායම් හා වියදම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 29 අනුව උපචිත පදනම මත මූලික වශයෙන් ආදායම හඳුනාගෙන ඇත.

1.4.1 සෙස් සහ ක්‍රියාකරුවන්ගේ ගාස්තු පිළිවෙලින් ක්‍රියාකරුවන්ගේ පිරිවැටුම සහ අතිරේක ආයෝජනයන් මත ප්‍රතිශතයක් ලෙස අයකරන අතර, අදාළ ක්‍රියාකරුවන්ගේ මූල්‍ය වර්ෂය අවසානයේදී එකතු කර ගනී.

ක්‍රියාකරවන්ගේ සහ කොමිසමේ මූල්‍ය වර්ෂය අවසාන වන දිනයන් එකිනෙකට වෙනස් වන හෙයින් සෙස් සහ ක්‍රියාකරුවන්ගේ ගාස්තු පවතින අළුත් තොරතුරු භාවිත කර උපචිත පදනම මත හඳුනා ගෙන ඇත.

වර්ෂය තුළ වියදම ඉක්ම වූ ආදායම තුළ ඉහත ගිණුම් ඇස්තමේන්තුවල වෙනස්වීමේ බලපෑම ඇතුළත් කර ඇත.

2010 වසර සඳහා එම බලපෑම පහත පරිදි වේ.

| | 2010 වසර සඳහා ඇස්තමේන්තු ගත ආදායම (රු.) | 2010 වසර සඳහා සත්‍ය ආදායම (රු.) | ගිණුම්කරණ වෙනස්වීමේ බලපෑම (රු.) |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකරු ගාස්තු | 603,406,071.28 | 404,371,295.42 | 199,034,775.86 |
| සෙස් ගාස්තු | 390,933,786.47 | 384,695,021.67 | 6,238,764.80 |

1.4.2 රජයේ ප්‍රදාන

ආදායම හා සම්බන්ධ රජයේ ප්‍රදාන එම ප්‍රදාන ලැබිය යුතු වර්ෂයේ ආදායම් වියදම් ගිණුමේ හඳුනා ගෙන ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව - ගිණුම් සඳහා සටහන් – 2011.12.31
(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතයි)

2 දේපළ, පිරියත සහ උපකරණ

| පිරිවැය | 2011.01.01 දිනට ශේෂය | එකතු කිරීම් | ඉවත් කිරීම්/ මාරු කිරීම් | 2011.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | 2011 වර්ෂය සඳහා | | | |
| ඉඩම් | 136,475,809,75 | 11.759,762 | 0 | 148,235,572 |
| කල් බදු ඉඩම් | 34,502,00 | 0 | 0 | 345,502 |
| ගොඩනැගිලි | 133,274,155 | 4,875,683 | 0 | 138,149,837 |
| කොකාවිල් කුලුන | 0 | 262,497,819 | 0 | 262,497,819 |
| වවුනියා කුලුන | 0 | 29,900,741 | 0 | 29,900,741 |
| වාහන | 104,157,002 | 0 | 0 | 104,157,002 |
| වායු සමීකරණ | 8,972,573 | 0 | 0 | 8,972,573 |
| විදුලි සෝපාන | 4.683,848 | 0 | 0 | 4,683,848 |
| විදුලි උත්පාදන යන්ත්‍ර | 2,665,428 | 0 | 0 | 2,665,428 |
| පරිගණක | 35,407,534 | 14,502,046 | 0 | 49,909,580 |
| වෙබ් සර්වර් | 2,213,661 | 0 | 0 | 2,213,661 |
| වෙනත් කාර්යාල උපකරණ | 17,514,612 | 892,970 | 0 | 18,407,582 |
| කාර්යාල ජංගම දුරකථන | 542,086 | 79,990 | 0 | 622,076 |
| කාර්යාල ලී බඩු | 11,461,760 | 55,944 | 0 | 11,517,704 |
| කාර්මික උපකරණ | 15,601,280 | 0 | 0 | 15,601,280 |
| එෆ්.එම්.එම්.එස්. ව්‍යාපෘති නිරීක්ෂණ වාහන | 5,800,000 | 0 | 0 | 5,800,000 |
| එෆ්.එම්.එම්.එස්. ව්‍යාපෘති උපකරණ | 300,615,202 | 3,117,726 | 2,913,800 | 303,819,128 |
| වීඩියෝ ඒකක උපකරණ | 6,541,475 | 0 | 0 | 6,541,475 |
| | **789,271,927** | **327,682,681** | **2,913,800** | **1,114,040,808** |

| ක්ෂයවීම් | 2011.01.01 දිනට ශේෂය | එකතු කිරීම් | ඉවත් කිරීම්/ මාරු කිරීම් | 2011.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | 2011 වර්ෂය සඳහා | | | |
| ගොඩනැගිලි | 77,237,806 | 7,072,107 | 0 | 84,309,913 |
| කොකාවිල් කුලුන | 0 | 26,249,782 | 0 | 26,249,782 |
| වවුනියා කුලුන | 0 | 2,990,074 | 0 | 2,990,074 |
| වාහන | 30,287,550 | 12,936,813 | 0 | 43,224,363 |
| වායු සමීකරණ | 7,498,608 | 247,394 | 0 | 7,746,003 |
| විදුලි සෝපාන | 4,683,84 | 0 | 0 | 4,683,848 |
| විදුලි උත්පාදන යන්ත්‍ර | 2,665,428 | 0 | 0 | 2,665,428 |
| පරිගණක | 27,247,375 | 7,587,305 | 0 | 34,834,680 |
| වෙබ් සර්වර් | 2,213,661 | 0 | 0 | 2,213,661 |
| වෙනත් කාර්යාල උපකරණ | 12,564,053 | 998,973 | 0 | 13,563,026 |
| කාර්යාල ජංගම දුරකථන | 295,452 | 52,959 | 0 | 348,410 |

| | | | | |
|---|---|---|---|---|
| කාර්යාල ලී බඩු | 6,749,010 | 883,504 | 0 | 7,632,514 |
| කාර්මික උපකරණ | 5,021,056 | 1,366,357 | 0 | 6,387,413 |
| එල්.එම්.එම්.එස්. ව්‍යාපෘති නිරීක්ෂණ වාහන | 725,000 | 725,000 | 0 | 1,450,000 |
| එල්.එම්.එම්.එස්. ව්‍යාපෘති උපකරණ | 301,723,637 | 639,654 | 2,913,800 | 299,449,491 |
| වීඩියෝ ඒකක උපකරණ | 5,537,077 | 364,669 | 0 | 5,901,746 |
| | **484,449,560** | **62,114,591** | **2,913,800** | **543,650,350** |
| **ශුද්ධ පොත් අගය** | **304,822,367** | | | **570,390,458** |

***සටහන්:***

*ඉඩම් සඳහා අගය වන රු. 136,475,809.75 තුළ මීගමුව කදිරාන හි පිහිටා ඇති රු. 45,000,000.00 වටිනා ඉඩම්වල අගය ද ඇතුළත්ය. එම ඉඩමේ විශාලත්වය අක්කර 112 රූඩ් 01 පර්චස් 10.5 කි. ඉඩමේ විශාලත්වයෙන් ආසන්න වශයෙන් 50% ප්‍රමාණයක් කටාන ප්‍රාදේශීය ලේකම් විසින් අත්පත් කරගෙන ඇත. එම අත්පත් කර ගැනීමෙන් වූ බලපෑම් තවමත් ගිණුම්වලට ගෙන නැත.*

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ගිණුම් සඳහා සටහන් 2011.12.31
(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතයි)

**කෙරීගෙන යන වැඩ**

| | 2011 වර්ෂය සඳහා | | | |
|---|---|---|---|---|
| | 2011.01.01 දිනට ශේෂය | එකතු කිරීම් | ඉවත් කිරීම්/ මාරු කිරීම් | 2011.12.31 දිනට ශේෂය |
| තාප්පය ඉදිකිරීම - කදිරාන | 9,638,094 | 2,121.668 | 11,759,762 | 0 |
| ප්‍රවේශ ශාලාව සහ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල | 180,000 | 0 | 0 | 180,000 |
| වවුනියා කුලුන ඉදිකිරීම | 26,302,615 | 0 | 26,302,615 | 0 |
| කොකාවිල් කුලුන ඉදිකිරීම | 222,234,637 | 0 | 222,234,637 | 0 |
| පෑලියගොඩ කුලුන ඉදිකිරීම | 82,716 | 0 | 82, 716 | 0 |
| Wash Room නවීකරණය කිරීම | 0 | 3,057,415 | 0 | 3,057,415 |
| | **258,438,062** | **5,179,083** | **260,379,730** | **3,237,415** |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ගිණුම් සඳහා සටහන් - 2011.12.31

2010.12.31

**4 ආයෝජන**

| | | |
|---|---|---|
| භාණ්ඩාගාර තැන්පතු | 354,000,000 | 354,000,000 |
| ස්ථාවර තැන්පතු (ම.බැ.පාරිතෝෂික වෙන් කිරීම) | 21.533,040 | 19,296,380 |
| රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත | | |
| භාරකාර අරමුදල - 1 | 4,850,222,710 | 7,376,369,574 |
| රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත | | |
| භාරකාර අරමුදල - 1 | 2,066,859,752 | 0 |
| ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 120,000,000 | 0 |
| | 7,412,615,501 | 7,749,665,954 |

**4අ ප්‍රති ගැණුම් ගිවිසුම යටතේ රජයේ සුරැකුම් පත්**

| | කල්පිරෙන දිනය | දින ගණන | කල්පිරෙන අගය | වටිනාකම |
|---|---|---|---|---|
| MIIB - 014065 | 06.01.2012 | 91 | 2,071,685,512 | 2,034,654,795 |
| MIIB - 015372 | 02.02.2012 | 91 | 1,018,075,342 | 1,000,000,000 |
| | | | 3,089,760,854 | 3,034,654,795 |

**5 ලැබිය යුතු ගිණුම්**

| | | |
|---|---|---|
| වෙළඳ ණය ගැතියෝ | | |
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු | 1,759,562,017 | 2,159,744,356 |
| ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු | 0 | 404,371,295 |

| | | |
|---|---|---|
| සෙස් ගාස්තු | 188,558,253 | 390,933,786 |
| ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු | 18,486 | 22,144 |
| | 1,948,138,756 | 2,955,071,581 |
| අඩුකළා: බොල් ණය සඳහා වෙන්කිරීම්** | (276,267,013) | (256,362,932) |
| | **1,671,871,743** | **2,698,708,649** |

**සටහන: ණය ගැතියන් වෙන් කිරීම්**

| | | | |
|---|---|---|---|
| බොල් ණය සඳහා වෙන් කිරීම් | | | |
| වසර 2 වඩා වැඩි | 271,589,570 | 100 | 271,589,570 |
| වසරකට වඩා වැඩි වසර 2 වඩා අඩු | 46,774,427 | 10 | 4,677,443 |
| මාස 6 වඩා වැඩි සහ වසරකට වඩා අඩු | 119,216,585 | 0 | 0 |
| මාස 2 වඩා වැඩි සහ මාස 6 වඩා අඩු | 951,726 | | 0 |
| මාසයකට වඩා වැඩි සහ මාස 6 වඩා අඩු | 209,696,754 | 0 | 0 |
| මාසයකට වඩා අඩු | 1,111,351,446 | 0 | 0 |
| | **1,759,580,508** | | **276,267,013** |

*සටහන:*
*** මෙහෙයුම් බලපත්‍ර ගාස්තු සහ සෙස් ගාස්තු ඇස්තමේන්තු ගත දත්තයන් අනුව ගිණුම්ගත කර ඇති බැවින් බොල් ණය වෙන් කිරීම් සඳහා සැළකිල්ලට ගෙන නොමැත. හඳුනාගත් වටිනාකම ඉහත ණය ගැතියන් ලෙස පෙන්වා දී ඇති අතර, ක්‍රියාකරු ගාස්තු සහ සෙස් ගාස්තු මත වූ ණයගැති සම්බන්ධයෙන් බොල් ණය සඳහා ප්‍රතිපාදන සපයා ඇත.*

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ගිණුම් සඳහා සටහන් – 2011.12.31
ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතයි

2010.12.31

**6 බැංකු ගිණුම්**

| | | |
|---|---|---|
| මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව (තැන්පත් ගිණුම) | | |
| ගිණුම් අංකය: 119/ආර්.එෆ්.සී/එස්.ඒ./යූ.එස්.ඩී. 0032 | 57,579,486 | 54,881,245 |
| මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව (එකතු කිරීමේ ගිණුම) | | |
| ජංගම ගිණුම් අංක 119-1-001-4-3693169 | 45,134,200 | 694,399,600 |
| මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව (ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු) | | |
| ජංගම ගිණුම අංකය: 119-1-001-3-3693264 | 22,913,151 | 588,824,192 |
| ලංකා බැංකුව - නාරාහේන්පිට ශාඛාව | | |
| ජංගම ගිණුම් අංකය – 2323167 | 10,432,641 | 136,349,004 |
| | **136,059,478** | **1,474,454,041** |

**6 ආ අතැති මුදල්**

| | | |
|---|---|---|
| සුළු මුදල් – ප්‍රධාන කාර්යාලය | 10,000 | 6,573 |
| සුළු මුදල් – කදිරාන | 5,000 | 2,075 |
| අතැති මුදල් (එකතු කිරීමේ ගිණුම) | 25,826 | 140 |
| හිමිකම් නොකී සේවක ප්‍රතිලාභ | 55,381 | 7,738 |
| | **96,207** | **16,525** |

**7 ගෙවිය යුතු දෑ**

| | | |
|---|---|---|
| උපචිත වියදම් | | |
| දුරකථන කාර්යාල | 340,250 | 315,499 |
| - නිවාස | 47,472 | 58,339 |
| වැටුප් පාලන ගිණුම් (කොන්ත්‍රාත් පදනමේ සේවකයින්) | 902,833 | 749,020 |
| ගෙවිය යුතු වැටුප් | 112,884 | 74,197 |
| විදුලිය | 2,355,547 | 22,626 |
| ජලය | 79,362 | 14,832 |
| සනීපාරක්ෂක සේවා | 973,023 | 463,237 |
| ආරක්ෂක සේවා | 1,461,411 | 1,375,232 |
| අතිකාල දීමනා | 467,780 | 688,034 |
| සේවක අර්ථසාධක අරමුදල | 177,208 | 134,681 |
| සේවක භාරකාර අරමුදල | 21,265 | 16,162 |
| අන්තර්ජාලය | 0 | 2,894 |
| වෛද්‍ය රක්ෂණ ඉල්ලීම් | 236,586 | 78,064 |
| කාර්ය මණ්ඩල සුභ සාධනය | 203,524 | 174,067 |
| පුවත්පත් සහ දැන්වීම් | 137,485 | 37,080 |
| විගණන ගාස්තු | 1,571,400 | 1,031,400 |
| කල්බදු කුලී | 660,000 | 763,090 |
| ප්‍රසාද දීමනා | 1,421,375 | 0 |
| රඳවා ගැනීම් | 178,864 | 40,595 |
| 2/3 පොලී ප්‍රතිපූරණය | 292,263 | 124,199 |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 22,171,626 | 15,776,220 |
| | | |
| වැටුප්වලින් අඩුකිරීම් | 51,454 | 61,305 |
| අලුත්වැඩියා සහ නඩත්තු වියදම් | 8,743,485 | 2,568,172 |
| ඉන්ධන ගාස්තු | 105,444 | 33,933 |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 0 | 176,140 |
| ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු | 0 | 101,056 |
| ගෙවිය යුතු සභාපතිගේ වේතනය | 0 | 0 |
| විවිධ මිලදී ගැනීම් හා සැපයීම් (ඇමුණුම - 1) | 984,209 | 2,175,510 |
| විවිධ | 100,000 | 70,000 |
| | **43,796,749** | **27,125,752** |

**ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු අරමුදල**

| | | |
|---|---|---|
| ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු අරමුදල ගිණුම් අංක 1 | 5,939,165,547 | 7,439,053,277 |
| ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු අරමුදල ගිණුම් අංක 2 | 66,859,752 | 0 |
| | **6,006,025,299** | **7,439,053,277** |

**8 ආදායම්**

| | | |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර | 24,387,756 | 235,599,831 |
| සෙස් ගාස්තු | 2,377,597,06 | 340,094,900 |
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු | 6,073,987,753 | 5,116,864,419 |
| සංඛ්‍යාත සඳහා ගෙවූ අත්තිකාරම් ගාස්තු | 1.758,967,041 | 0 |
| වෙළඳ බලපත්‍ර ගාස්තු | 11,824,746 | 6,076,575 |
| ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු | 51,556 | 29,513 |
| නාවික මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු | 302,378 | 295,522 |
| ගුවන් යානා මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු | 306,939 | 229,917 |
| රැහැන් රහිත දුරකථන ගාස්තු | 3,738,658 | 1,927,123 |
| විභාග ගාස්තු | 13,293 | 7,462 |
| අයදුම්පත් සැකසීමේ ගාස්තු | 2,244,902 | 206,186 |
| කෙටි සංකේත අංක ගාස්තු | 5,612,292 | 3,608,248 |
| අනෙක් ආදායම් (8 අ) | 87,572,282 | 8,829,957 |
| | **10,346,606,662** | **5,713,767,654** |

අනෙකුත් ආදායම්

8 අ

| | | |
|---|---|---|
| කාර්ය මණ්ඩල ණයවලින් ලද පොලී ආදායම් | 3,624,327 | 3,715,789 |
| තැන්පතු මත පොලී ආදායම් | 83,782,577 | 5,030,159 |
| වෙනත් ආදායම් (ප්‍රදාන) | 55,541 | 0 |
| විවිධ ආදායම් | 109,836 | 84,010 |
| | **87,572,282** | **8,829,957** |

ගිණුම් සඳහා සටහන් - 2008.12.31

ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතයි

| | | |
|---|---|---|
| 8 ආ විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායම | 3,548,916,707 | 836,873,072 |
| අඩුකළා: | | |
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තු වලින් භාණ්ඩාගාරයට ගෙවූ 50% | (1,526,298,157) | (299,978,117) |
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තු වලින් භාණ්ඩාගාරයට ගෙවිය යුතු 50% | (248,160,197) | (118,458,552) |
| | 1,774,458,353 | 418,436,403 |

**9 නියාමන වියදම්**

| | | |
|---|---|---|
| අයි.ටී.යූ. වාර්ෂික සාමාජික මුදල් | 19,671,086 | 17,263,718 |
| ඒ.පී.ටී. වාර්ෂික සාමාජික මුදල් | 1,398,845 | 1,438,896 |
| සෆීර් වාර්ෂික සාමාජික මුදල් | 693,113 | 0 |
| වාර්ෂික පුස්තකාල සාමාජික මුදල් | 5,343 | 95,631 |
| සී.ටී.ඕ. වාර්ෂික සාමාජික මුදල් | 8,674,659 | 3,506,303 |
| ජාතික අංකන සැලැස්ම මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් | 0 | 25,250 |

| | | |
|---|---|---|
| මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් නියාමන කටයුතු සඳහා සහභාගිවීම් | 1,600,780 | 562,156 |
| නියාමන කටයුතු සඳහා සහභාගිවීම් නීති උපදේශන | 13,836,866 | 14,570,323 |
| විදුලි සංදේශ සංවර්ධනය පිළිබඳ මහජනයා දැනුවත් කිරීම | 1,283,957 | 1,458,146 |
| විදුලි සංදේශ සංවර්ධනය පිළිබඳ මහජනයා දැනුවත් කිරීම | 1,102,115 | 79,583 |
| ජාල සංවර්ධන අධීක්‍ෂණ කිරීම | 33,761 | 629,430 |
| පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම | 31,076 | 1,688,751 |
| ජංගම හා කේබල් රූපවාහිනී අධීක්‍ෂණය | 0 | 45,999 |
| පාසල හා ප්‍රජාව සම්බන්ධීකරණය කිරීමේ වැඩසටහන | 258,722 | 0 |
| දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ රැස්වීම | 7,047,306 | 12,561,418 |
| දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා දායකවීම | 0 | 263,973 |
| විදුලි සංදේශ මධ්‍යස්ථාන ව්‍යාපෘතිය | 0 | 1,102,977 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා සන්නිවේදන පහසුකම් සැපයීම | 645,854 | 314,524 |
| විදුලි සංදේශ ආශ්‍රිත සමීක්‍ෂණ | 250,000 | 0 |
| සමාජයීය වගකීම් | 1,010,000 | 0 |
| විදේශ නියෝජිතයන් පැමිණීම | 52,783 | 1,262,63 |
| අධිවේගී අන්තර්ජාල වේගය පරීක්‍ෂා කිරීම | 159,697 | 0 |
| පාසල් සංවර්ධන ව්‍යාපෘතිය | 32,693,760 | 0 |
| කොකාවිල් කුලුන ව්‍යාපෘතිය | 16,265,738 | 0 |
| වවුනියා කුලුන ව්‍යාපෘතිය | 171,235 | 0 |
| නෙලුම් කුලුන ව්‍යාපෘතිය | 617,836 | 7,024,331 |
| | **107,504,532** | **63,894,040** |

**10. ආයතන සහ පරිපාලන වියදම්**

| | | |
|---|---|---|
| වැටුප් | 63,727,279 | 61,610,355 |
| සේවක අර්ථසාධක අරමුදල (15% දායක මුදල්) | 8,827,443 | 8,441,247 |
| සේවක භාරකාර අරමුදල (3% දායක මුදල්) | 1,765,489 | 1,688,250 |
| ජීවන වියදම් දීමනා | 12,698,163 | 11,526,503 |
| ප්‍රවාහන දීමනා | 16,412,699 | 16,636,122 |
| ගෙවල් කුලී දීමනා | 5,349,732 | 5,290,865 |
| වෙනත් දීමනා | 330,298 | 153,831 |
| කාර්ය සාධන දිරි දීමනා | 13,837,417 | 13,810,153 |
| විශේෂ දීමනා | 2,707,415 | 0 |
| පාරිතෝෂික දීමනා | 2,803,518 | 0 |
| අතිකාල | 7,689,920 | 10,094,055 |
| සභාපතිගේ වේතනය | 400,000 | 300,000 |
| පාවිච්චි නොකළ විවේක නිවාඩු දීමනා | 3,434,26 | 3,395,212 |
| විශ්‍රාම වැටුප් සඳහා කොමිෂන් සභාවේ දායකත්වය | 52,353 | 162,860 |
| දුම්රිය ගාස්තු සහනාධාරය | 2,180 | 8,220 |
| නිවෙස් දුරකථන | 487,947 | 623,480 |

| | | |
|---|---|---|
| නිල ඇඳුම් | 328,887 | 248,195 |
| කාර්ය මණ්ඩල ශුභ සාධනය | 5,883,768 | 4,766,961 |
| ක්‍රීඩා ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම | 808,321 | 599,363 |
| කාර්ය මණ්ඩල වෘත්තීය සාමාජික මුදල් දායකය | 275,593 | 332,617 |
| පුහුණු වියදම් දේශීය | 1,126,972 | 611,094 |
| කොමිෂන් සභා සාමාජිකයින්ගේ දීමනාව | 25,500 | 7,341 |
| 2/3 නිවාස ණය පොලිය | 4,107,294 | 3,669,586 |
| ප්‍රවාහන හා යැපීම් දීමනා | 190,052 | 227,856 |
| පාරිතෝෂික | 2,663,638 | 2,368,570 |
| විදුලිය | 26,887,876 | 9,958,682 |
| ජලය | 1,409,645 | 1,282,851 |
| සනීපාරක්ෂක සේවා | 3,383,447 | 2,621,053 |
| ආරක්ෂක සේවා ගාස්තු | 6,729,720 | 5,414,622 |
| වරිපනම් හා බදු | 0 | 0 |
| ආර්ථික සේවා ගාස්තු | 4,172,176 | 16,241,497 |
| පුස්තකාල පොත් | 0 | 350,044 |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 5,414,898 | 4,536,296 |
| ඉන්ධන | 4,699,140 | 5,220,009 |
| විදුලි භාණ්ඩ | 131.802 | 103,781 |
| තැපැල් ගාස්තු | 651,070 | 557,542 |
| දුරකථන,ෆැක්ස් සහ පී.ඒ.බී. එක්ස් | 4,398,443 | 4,417,933 |
| රක්ෂණ (ස්ථාවර වත්කම් සහ වෛද්‍ය) | 41,040,026 | 18,782,690 |
| අන්තර්ජාල ගාස්තු | 78,517 | 169,632 |
| පුවත්පත් සහ දැන්වීම් | 10,367,248 | 5,942,181 |
| උපදේශක ගාස්තු | 0 | 0 |
| සම්මේලන සහ සම්මන්ත්‍රණ | 85,833 | 183,055 |
| විගණන ගාස්තු | 540,000 | 707,059 |
| නීති වියදම් | 129,741 | 10,729 |
| කල්බදු දේපළ සඳහා කුලී | 498,000 | 1,827,814 |
| වාහන කුලී | 1,608 | 2,473 |
| කල්බදු අන්තර්ජාල කුලී | 1,144,216 | 412,360 |
| ක්ෂයවීම් | 62,114,591 | 58,971,222 |
| විවිධ පරිපාලන වියදම් | 2,690,910 | 2,257,648 |
| විවිධ මිලදී ගැනීම් සහ සැපයීම් | 276,209 | 93,905 |
| විවිධ මෙහෙයුම් වියදම් | 285,937 | 750,775 |
| | **333,067,055** | **287,338,563** |